## 2019.12.03 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | ගරුසභාපති |
| කමල් වැල්ලගේ මැතිතුමා | ගරු උප සභාපති |
| ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ශ්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ. ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී.ලක්ෂ්මි හේමන්තා මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදුර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ. සෝභිත රංජිත් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී. ජී. ආර්. පේෂලා කුමාරි මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්. එම්. නිලානි මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ චම්පා සුමුදු කුමාරි මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව. 09.35ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.**

**(01)**

**01.01** **2019 – 11 – 05 දින පවත්වන ලද මාසික සභා රැස්විම් වාර්තාව සභා සම්මත කිරිම**

ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, පසුගිය මාසයේ මාසික සභා රැස්විමට මා පැමිණියා. මාසික සභාවේ නම නැහැ. කපාහැර තිබෙන්නේ මොකද දන්නේ නැහැ.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__
පැමිණීම නැද්ද?

__ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්__
පැමිණීම සටහන් වෙලා නැහැ.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__
එය සටහන් කරන්න. එම අත්සන් ලේඛණය පරික්ෂා කර බලා එය ඇතුළත් කරන්න.

2019-11-05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2019 – 11 – 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාවේ සභාවට පැමිණීමට ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතාගේ නම ඇතුළත් වී සභා වාර්තාව සංශෝධනය විය යුතු බවත් එම වාර්තාව සභා සම්මත විය.**

**(02) සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන : ඇත.**

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන විශේෂ නිවේදන යටතේ ඊයේ දිනයේ අම්බලන්ගොඩ, මහ අම්බලන්ගොඩ ,මානිම්මුල්ල , නිවාස යෝජනා ක්‍රමයේ කාණු බැදීම යන කාර්ය සිදු කිරිමට යාමේදි එම කාණුව කැපිම නිසා කාණුව අසළ තිබුණ තාප්පය කඩා වැටිම නිසා එහි වැඩ කරනු ලැබූ මහ අම්බලන්ගොඩ ප්‍රදේශ වාසියෙක් වන අනුර කියන මහතා මියගොස් තිබෙනවා. ඊයේ රාත්‍රිය වන විට. අපි ඒ සම්බන්ධව ශෝකය ප්‍රකාශ කිරිමට විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කරනවා. මේ අවසනාවන්ත තත්ත්වය උදා වුණේ පනියන්දූව ප්‍රජා මණ්ඩලය අත්සන් කරන ලද ගිවිසුමක් අනුව උපමාන පාදක යටතේ ලබා දී ඇති මුදල් එම නිවාස යෝජනා ක්‍රමයේ කාණුවක් බැදිමට ගිහින් කපන ලද කාණුව නිසා ඒ අසළ තාප්පය මේ තැනැත්තාගේ ඇඟට පෙරළී තිබෙනවා. මොහුගේ හැමදෙනාම දන්නවා කකුළක අබාධ තත්ත්වයේ සිටින පුද්ගලයෙක්. එම නිසා අනික් අය මෙහාට වෙලා තිබෙනවා. එම තැනැත්තාට මෙහාට වෙන්න වෙලා නැහැ. එමනිසා ඊයේ වෙනකොට මරණයට පත්වෙලා තිබෙනවා. අප සභාවේ යතුරුලියන කටයුතු සිදුකරන තරංගනි මහත්මියගේත් මාමා තමයි නැතිවෙලා තිබෙන්නේ.ඉතිං අපි ඒ ගැන කනගාටු වෙනවා සිදු වී තිබෙන දෙය ගැන. ඒ පිළිබඳව සභාව දැනුවත් කරනවා.

__ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්__
මා ඉදිකිරිම් ක්ෂේත්‍රයට සම්බන්ධ නිසා මා ඒ පිළිබඳව ප්‍රකාශ කරන්න කැමතියි. අපේ නගර සභාවේ පමණක් නෙමේ . හැමතැනම ඒ සෙෆටි කියන එක අපි කොන්ත්‍රාතුවක් දුන්නාත් හරියට නියම විදියට කරනවාද කියන ඒක බැලිම අපගේ වගකීමක්.අවධානම් තැනක වැඩ කරනවා නම් අපේ තාක්ෂණසේවා නිලධාරිට පුළුවන් එම අවධානම් තත්ත්වය අඩුවන විදියට කටයුතු සිදු කරන්න කියා ඔවුන්ට උපදෙස් දෙන්න පුළුවන්. මා හිතන්නේ අපි කොන්ත්‍රාතුවක් දුන්නාත් ඒ කම්කරුවන්ගේ වගකීම තිබෙන්නේ නගර සභාව පැත්තේ. ඉතිං ඒ ගැන දැනුවත් වෙන්න අපේ නගර සභාවේන් මොකක් හරි ක්‍රමවේදයක් හදන ලෙසත් , පාරවල් වාහන එකක්

නගර සභාවෙන් කියා වහනවා.එහෙම නෙමේ දැනුම් දීලා ජනතාවට මොනවා හරි ක්‍රමවේදයක් හදලා මෙය ආදර්ශයට ගෙන ඉදිරියට මෙය ක්‍රියාත්මක කරන්න. අපට තිබුණා. ජී.අයි පයිප්ප ටිකක් දීලා මෙය තාප්පයට උදවුවක් වශයෙන් සවිකරන්න කියා මේ තාප්පය කඩා නොවැටෙන්න තිබුණා. එය අපේත් වගකීම වශයෙන් ගෙන ඒ ගැන සැලකිලිමත් වුණානම් හොඳයි කියා මාගේ අදහස.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කිවු කාරණාව ඇත්තටම අපි සභාවක් වශයෙන් බලන්න ඕන. ඇත්තටම කිව යුතුයි . අපේ කාර්මික නිලධාරි මහත්ම මහත්මින් ඇත්තටම උපදෙස් දී තිබෙනවා. අපේ උපදෙස් ලැබෙනතුරු කපන්න එපා කියා. ඒම නිලධාරිතුමා යන්න කලින් වැඩය ආරම්භ කරලා.එම නිසා තමයි මේ කනගාටුදායක තත්ත්වය ඇතිවුයේ. සභාවක් වශයෙන් අපි කනගාටු වෙනවා. ඒ නිලධාරින්ගේ උපදෙස් නැතිව වැඩ කරන්න ගියාම සිද්ධ වෙන දේවල් තමයි මේ. එමනිසා කාර්මික නිලධාරියාගේ උපදෙස් අනුව කරන්න ගියානම් ඔබතුමා කිවු කාරණය සිද්ධ වෙනවා. සාමාන්‍යයෙන් කාර්මික නිලධාරියෙක් උපදෙස් දෙන්නේ නැහැ. ඒ වගේ අවධානම් තත්ත්වයක් තිබෙනවා නම් එහෙම කාණුවක් කපන්න.මා දන්නේ නැහැ කවුරු කොන්ත්‍රාත්තුව ගත්තා ද කියා. නමුත් ඒ වගේ අවධානම් තත්ත්වයක් තිබෙනවා නම් කොන්ත්‍රාත්කරුවාගේ වගකිම වෙනවා එම වැටෙන බිත්ති ආධාර මඟින් වලක්වා ගැනිමට. එහෙම උපදෙස් නැතිකම හෝ කොන්ත්‍රාත්කරුගේ නොදැනුවත්කම නිසා වෙච්ච සිද්ධියක්.කනගාටුව ප්‍රකාශ කරනවා. මා කතා නොකරම හිටියේ . ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා මේ ක්ෂේත්‍රයට සම්බන්ධයි. මාත් මේ සිද්ධියට සම්බන්ධයි. කවුරු හරි ගියොත් එහෙම සභාව අපහසුතාවයකට පත්වෙනවා. විශේෂයෙන්ම කිව යුතුයි ගරු මන්ත්‍රිවරුන්ට. කාර්මික නිලධාරින්ගේ උපදෙස් නැතිව තමයි මෙහි වැඩ ආරම්භ කර තිබෙන්නේ. එම නිසා තමයි මේ කනගාටුදායක සිද්ධිය ඇතිවෙලා තිබෙන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,මා හිතන්නේ වේලාව කියටද දන්නේ නැහැ. දැන් මේ උදේ තමයි අපිත් දන්නේ මෙවැනි කනගාටුදායක සිදුවීමක් සිද්ධ වෙලා කියා.මොකද ගම්වල වැඩ කරන්න යනවිට නගර සභා ව්‍යාපෘති විශාල වශයෙන් ක්‍රියාත්මක වෙනවා. ඒ තුළදි අර කියන්න වගේ ආරක්ෂක වැඩ පිළිවළක් තිබෙනන්න ඕන පුද්ගලයන්ට එම කරන ලද ක්‍රියාවලිය සම්බන්ධව.මා හිතන්නේ සමහරු ඔවා පිළිපදින්නේ නැහැ. හෙල්මට් එකක් දාන්න කිවුවාට දමන්නේ නැහැ. සපත්තු දෙකක් දමන්න කිවුවාට දාන්නේ නැහැ.ඉස්සෙල්ලාම ඕනම කර්තව්‍යයක තිබෙන්නේ ආරක්ෂාවනේ. කියට විතරද මෙය වෙලා තිබෙන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

තාක්ෂණසේවා නිලධාරිතුමනි ,කියටද විතර මෙය වෙලා තිබෙන්නේ. සවස හතරයි ගණනකට වගේ වෙලා තිබෙන්නේ. මොකද මා සවස 5.30 වෙනවිට එතැනට ගියා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, සවස 4.00 වෙනවිට වැඩ අවසන් වන වේලාව.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

වේලා තිබෙන්නේ මෙය වැටෙන විට එතැන සිටි අනික් කට්ටිය අයින් වෙලා තිබෙනවා. එක පුද්ගලයෙකුත් මෙය එන එක වලක්වන්න මෙය අල්ලාගෙන සිට තිබෙනවා. මෙයාගේ

කකුළක අබාධයක් තිබෙන කෙනෙක්නේ. මෙයාට එතැනින් ගොඩ වෙන්න බැරිවෙලා තිබෙනවා. එක තමයි වේලා තිබෙන්නේ. නැතිනම් අනික් කට්ටිය බිරිලා තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

කෙසේවෙතත් අපගේ සියළු ගරු මන්ත්‍රීවරුන්ගේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ අවශ්‍ය කටයුතු වලට සහායෝගය ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව සියළු ගරු මන්ත්‍රීවරුන්ගෙන් විමසීමක් කරන්නේ.මේ අපේම සේවකයෙක් නෙමේ. කොන්ත්‍රාත්කරුවෙක්.යම් ආකාරයකින් මට ඉහළ මට්ටමින් පළාත් පාලන කොමසාරිස්තුමා, සහකාර කොමසාරිස් සහ ආමාත්‍යාංශ මට්ටමින් අනුමැතියක් ගන්න පුළුවන් නම් ,යම් උදවුවක් මේ තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් සිදු කිරීමේදී සභාව අවසරයක් දෙන්න පුළුවන්ද කියා මෙය සිදු කරන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නිත්‍යානුකූල තත්ත්වයක් තිබෙනවා නම් කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නිත්‍යානුකූල තත්ත්වයක් තිබේනවා නම් පමණයි. එම තත්ත්වය තිබෙනවාද කියන එක ගැටළුවක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

තිබේනවා නම් තමයි කරන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

අපේ සේවකයෙක් නම් අපේ රාජකාරියකට ගිහිනින් නම් අපට මුදලක් ගෙවන්න පුළුවනි. මෙතැන අපට තෙරෙනවා . බොහොම කනගාටුදායක සිද්ධියක්. නමුත් මේ සිද්ධිය අපි ගන්න තින්දුවත් එක්ක නගර සභාවේ ඉදිරියේදි පූර්වාදර්ශයක් වෙනවා.එම නිසා වැරදි නිගමන වලට අපි යන්න හොඳ නැහැ.යනවා නම් එය අපේ නගර සභාවේ නිති රාමුවක් තුළ එන එකක් මිස නැතිව වෙනත් තින්දුවකට යන්න එපා. වැරදි පූර්වාදර්ශයක් වෙනවා. පුද්ගලයා නෙමේ. සිද්ධිය නෙමේ. අපි පොඩි කාලේ ඉඳලා දන්න මනුස්සයෙක්.එතුමාගේ අබාධිත තත්ත්වය නොතිබුණානම් ඔබතුමා කිවු පරිදි මේ කරදරයට භාජනය වෙන්නේ නැහැ.නගර සභාවෙන් ගනු ලබන තින්දුව නගර සභාවට හානි නොවන තින්දුවක් විය යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එක තමයි මා කිවුවේ. මෙය නිත්‍යානුකූලව අපට කරන්න බැරි වැඩක් කියලා.යම් ඉහළ මට්ටමින් පළාත් පාලන කොමසාරිස්, සහකාර කොමසාරිස් හා ආමාත්‍යාංශ ලේකම් මට්ටමින් උපදේශයක් ගන්න පුළුවන් නම් එවැනි අවස්ථාවක සභාව එය ක්‍රියාත්මක කිරීමට අනුමැතිය දෙනවා නම් එම උපදේශය දින දෙකක් ඇතුළත ගත යුතුයි. දවසක් ඇතුළත ගත යුතුයි. මා කියන්නේ මරණය වැඩ කටයුතු සිදු කිරීම සම්බන්ධව. වෙන දෙයක් නෙමේ. අපට උදවු කරන්න ඕන. සභාව එය අනුමත කරනවා නම්. මුලින් ඒ අය අනුමත කලොත් විතරයි මට කරන්න පුළුවන් වෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**
පෞද්ගලික කැමැත්ත අනුව මොනවා හරි සහායෝගයක් ලබා දෙන්න පුළුවන් නම් එය කරන්න. එතකොට කිසි ගැටළුවක් වෙන්නේ නැහැ. නැතිනම් එය ඉදිරියට පූර්වාදේශයක් වුණොත් හරි ගැටළුවක්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**
මමත් එම යෝජනාව ස්ථිර කරනවා. අපට පුළුවන් විදියට ගරු මන්ත්‍රීවරු යම් මුදලක් ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**
මොකද අපි දැන් කොන්ත්‍රාත් එකක් නේ දීලා තිබෙන්නේ. ඔහු තමයි ප්‍රධාන වගකිව යුත්තා. එයා වැඩක් කරන විට දැන ගත යුතුයි තාක්ෂණික නිලධාරින් ගෙන්වා ගන්න. එතකොට මෙතැන තිබෙන ස්වභාවික තත්ත්වය බලා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**
එතැන ගැටළු සහගතයි. ප්‍රශ්නයක් තිබෙනවා එතැන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**
දැන් ගරු උප සභාපති කමල් මහතා ප්‍රකාශ කළා. තාක්ෂණසේවා නිලධාරි යන්න කලින් , එයාගේ අවසරය ලැබෙන්න කලින් , බැල්ම ලැබෙන්න කලින්, උපදෙස් ලැබෙන්න කලින් කියා. නමුත් මරණය වෙලා තිබෙන්නේ සවස 4.30 ට පමණ. එතකොට පොඩි පරස් පරයක් තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**
ගරු සභාපතිතුමනි, මාත් මේ ගැන කතා කරන්න අවශ්‍යයි. මොකද මාගේ ජීවත් වන ප්‍රදේශයේ ප්‍රශ්නයක් හින්දා. සභාවේ ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා, ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාගේත් අදහස් මා දැන ගත්තා. ඇත්ත වශයෙන්ම මෙය කනගාටුදායක සිද්ධියක්. මොකද ඊයේ රාත්‍රියේ 10.30 -11.00 වෙනකම් මා සිටියේ බලපිටිය රෝහලේ. ඊයේ ලේකම්තුමියත් රාත්‍රී 7.00 – 8.00 වෙනකම් හිටියා. ඉතිං ඇත්තෙන්ම කනගාටුදායක සිද්ධියක්.නමුත් ඔබතුමා මොනවා හරි දෙයක් ඒ අසරණ අයට කරන්න පුළුවන් නම් නීත්‍යානුකූලව ඒ දෙය කරන ලෙස ඉල්ලා සිටිමින් හා පෞද්ගලිකව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා ප්‍රකාශ කළ ආකාරයට අපි පෞද්ගලිකව යම් උදවු කිරීම සුදුස බවටත් එතුමාගේ මරණය පිළිබඳ සියළුම ගම්වාසින් වෙනුවෙනුත් , මා ශෝකය ප්‍රකාශ කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
නිසි තීන්දුවක් ලැබුණේ නැහැ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**
ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා ප්‍රකාශ කළ ආකාරයට පෞද්ගලිකව යම් උදවුවක් කිරීමට හැකිනම් හොඳ බවයි මාගේ අදහස.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
ඒ විදියට කරන්න සභාවේ අවසරය අවශ්‍ය නැහැ. අපේ එකඟතාවයෙන් කරන්න පුළුවන්.

**(03)** **ලැබී ඇති පැමිණිලි ,පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම**

**03.01 අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ කඩකාමර බදුකුලී සංශෝධනය හා ගිවිසුම් අලුත් කිරීම 2019.12.01 දින සිට ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාගැනීම සඳහා ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ කඩකාමර බදුකුලී සංශෝධනය හා ගිවිසුම් අලුත් කිරීම සම්බන්ධ ලිපිය සභාගත කිරීම. මේ යටතේ මා ලිපි දෙකක් ඉදිරිපත් කරනවා. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ලිපියක් එවා තිබෙනවා. අම්බලන්ගොඩ නගර සභාවට අයත් බස්නැවතුම්පොළ භූමියේ කඩ කාමර තක්සේරු කිරීම. ඒ අනුව මෙන්න මේ විදියට තක්සේරු කර තිබෙනවා. බිම් මහල කඩ කාමර අංක 01 රු.32500/= , කඩ කාමර 02-05 දක්වාත් 08-15, 18-20 දක්වාත් රු.16875/= කි. 06,07,16,17 රු.8000/= , කඩ කාමර 22 රු.45000/= ත් , උඩු මහල කඩ කාමර අංක 25,44 දක්වා 27750/= , 26-43 දක්වා රු.13500/=, 45-42 දක්වා රු.14000/= දක්වාත් , 53-63 දක්වා රු.14500/= කඩ කාමර 64 රු.25000/=, කඩ කාමර 65 රු.11850/=, කඩ කාමර අංක 66 රු.11350/=. මෙම ගොඩනැගිල්ලේ කුලිය වාර්තා කර ඇත්තේ එය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වරිපනම් බදු පදිංචිකරු විසින් හා අළුත්වැඩියා කටයුතු හිමිකරු විසින් දැරිය යුතුය යන පදනම මත වේ. මෙම තක්සේරුව ඉදිරි වසර 03 සඳහා බලපැවැත්වෙන බව ද සැලකේ. ඒ එක්කම ජාතික විගණන කාර්යාලයෙන් අපට ලිපියක් ලැබී තිබෙනවා. අම්බලන්ගොඩ නගර සභාව මෙහෙයුම් හා කාර්ය සාධන විගණන -2019 කළමනාකරණ අකර්යක්ෂමතා. එම ලිපියේ මෙන්න මේවා දක්වා තිබෙනවා.අම්බලන්ගොඩ නගර සභාව සම්බන්ධයෙන් කරන ලද විගණන නියැදි පරික්ෂාවේ දි පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය විය.එහි දුර්වලතාවයක් වශයෙන් දෙවැනි තුන්වෙනි දුර්වලතා වලට තිබෙන්නේ කඩ කාමර බදු දිම. පළාත් පාලන කොමසාරිස්ගේ දපපා/පපාකො/2001/01 චක්‍රලේඛයේ 05 වෙනි වගන්තිය පරිදි සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත් කාලින කළ යුතු නමුත් , නගර සභාවට අයත් බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර බදුදිම පිළිබඳව බදු ඔප්පු පරික්ෂා කිරීමේ දි එම කාලය පහත පරිදි ඉක්මවා ගොස් තිබු බව නිරීක්ෂණය විය.

| කඩ කාමර අංකය | ගිවිසුම්ගත වු දිනය | අවුරුදු ගණන |
|---|---|---|
| 04 | 2008.09.15 | 11 |
| 08 | 2009.01.15 | 10 |
| 09 | 2009.04.17 | 10 |
| 12 | 2010.04.09 | 09 |
| 13 | 2009.03.09 | 10 |

| | | |
|---|---|---|
| 14 | 2008.09.15 | 11 |
| 15 | 2006.10.16 | 13 |
| 16 | 2008.11.11 | 11 |
| 18 | 2008.09.25 | 11 |
| 20 | 2008.11.13 | 11 |
| 22 | 2002.09.11 | 17 |
| 26 | 2010.07.09 | 09 |
| 27 | 2009.05.07 | 10 |
| 28 | 2010.07.14 | 09 |
| 32 | 2010.12.10 | 09 |
| 33 | 2010.02.09 | 09 |
| 34 | 2010.08.25 | 09 |
| 35 | 2010.06.14 | 09 |
| 41 | 2010.07.11 | 09 |
| 44 | 2007.07.03 | 12 |
| 49 | 2010.12.10 | 09 |
| 50 | 2007.09.10 | 12 |
| 51 | 2008.09.16 | 11 |
| 53 | 2010.12.10 | 09 |
| 54 | 2007..02.13 | 12 |
| 55 | 2007.02.13 | 12 |
| 58 | 2010.07.22 | 09 |
| 59 | 2010.10.04 | 09 |
| 61 | 2012.0.12 | 09 |
| 62 | 2010.09.27 | 09 |
| 63 | | 10 |

බස්නැවතුම්පොළ සංකීර්ණයේ කඩ කාමර 31 ගිවිසුම් කාලය අවුරුදු 09 සිට අවුරුදු 17 දක්වා කාලයක් ගත වී තිබුණද චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. චක්‍රලේඛයේ 6 වෙනි වගන්තියේ ප්‍රකාරව 5කට වරක් තක්සේරු මුදල නව තක්සේරුව මඟින් තක්සේරු කළ යුතුව තිබුණද සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණ බවද සහකාර විගණාධිපති අත්සන් කර ලිපියක් එවා තිබෙනවා.ඒ අනුව සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා. නව තක්සේරුව අනුව කටයුතු කරන්න අවසර ඉල්ලා සිටිනවා.කවුද පිටුපස සිට විඩියෝ කරන්නේ. විඩියෝ කරන්න නම් අවසර ගන්න ඕන.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

මගේ බාප්පා කෙනෙකු තමයි විඩියෝ කරන්නේ. ඔහුට මගේ කතා කිහිපයක් අහන්න ඕන කියනවා. මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මාගේ ඥාති සහෝදර දිවාන් සාරධ වීරතුංග කියන අපේ මල්ලි ඇවිත් සිටිනවා. එයා මගේ කතාවේදි පමණක් ගන්න. අනික් ඒවා අවශ්‍ය නැහැ.මගේ කතාවේදි පමණක් විඩියෝ පටය ගන්න අපි අවසර ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>
ගරු මන්ත්‍රිවරුන්ගේ අදහස මොකද ?

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

මේ මගේ කතාව විතරයි. ඒ අපේ ෂඩ් ව්‍යාපාරවලට ප්‍රමුඛත්වය ලබා දිමේ අදහසින්.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>
නැහැ. සාමාන්‍යයෙන් මාධ්‍යවේදින් ගත්තාත් අපෙන් අවසර ඉල්ලා සිටිනවා. ඉල්ලන්නේ නැතිව විඩියෝ කරනවා කියා මට ආරංචියක් ආවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

මා අවසර පතනවා සියළු දෙනාගෙන්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

විඩියෝ කිරිමෙන් පසුව හෝ අවසර පතලා ඉල්ලිමක් කරන ලෙස මා යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවේ සිට මහජන නියෝජිතයෝ සිටින ඕනෑම මාධ්‍ය ආයතනයකට එළියේ විඩියෝ කිරිමේ අයිතිය තිබෙනවා.තොරතුරු දැන ගැනීමේ පණත යටතේ සම්මත කර තිබෙනවා.කටවත් වෙනස් කරන්න බැහැ. එය මිනිසුන්ගේ අයිතියක්. පාර්ලිමේන්තුවේ විවාදය ඒ වේලාවේ අහන්න පුළුවන්. තොරතුරු දැන ගැනීමේ පණතේ තිබෙනවා. එය පසුගිය රජය විසින් ගත් ක්‍රියා මාර්ගයක්.ගරු හිටපු ජනාධිපති හා පසුගිය රජය ගනු ලැබූ තින්දුවක්. එය එසේ ක්‍රියාත්මක කිරිමට පාර්ලිමේන්තුවේ සිට පහළ ඕනෑම ආයතනයක් දක්වා ක්‍රියාත්මක කිරිමට පුළුවනි.එය කිසි ගැටළුවක් නැහැ. අපි දැන් සභාවාර කිහිපයකදිම නගර සභාවට හිමිවිය යුතු ආදායම් මාර්ග නොලැබිම පිළිබඳව හැම ගරු මන්ත්‍රිවරයෙක්ම කරුණු දැක්වුවා. දැන් අපි පසුගිය දින කතා වුණා. නගර සභාවට ලොතරැයි කුඩුවකින් ලැබෙන්නේ රු.1000/= ක් පමණයි ලැබෙන්නේ. හැබැයි දිනකට රු.1000/= ක් එම

බදු දුන් මිනිහා අහිංසක බදු ගෙවන මිනිහාගෙන් රු.1000/= ක් අය කරනවා. එතකොට බහුතර ගරු මන්ත්‍රීවරු ප්‍රකාශ කළා එම ලොතරැයි කුඩු නගර සභාව සතු කරලා රු.15000/= ක් කරන්න. එතකොට අහිංසක මිනිසුන් රු.15000/= දිලා ඒ අහිංසක මනුස්සයකු මේ ව්‍යාපාරය කරගෙන යයි. එවැනි තින්දු වලට අප පැමිණියා. දැනට වුණත් මෙම කඩ බදු දීමේදි . මේ ගිවිසුම හැම ගරු මන්ත්‍රීවරයෙකුටම දී තිබෙනවා. ඇත්තටම පහත මාළයේ අපි ගතහොත් ව්‍යාපාරික වශයනේ ඕනෑම තැනක වැඩි ආදායම් තිබෙන ස්ථාන වන්නේ පහත මාළයයි. ඉහළ මාළයේ තිබෙන්නේ සේවා සැපයීමයි. බොහොම අඩුවෙන් තිබෙන්නේ ව්‍යාපාර වශයෙන් තිබෙන්නේ කොණ්ඩේ කපන තැන්, නැතිනම් මොනවා හරි කාර්යාල තිබේ. නැතිනම් ෆොටෝ ගහන තැන්, වගේ ඒවා. සේවා සැපයීම් තිබෙන්නේ. එම සේවා සැපයිම් සුළු ලාභයක්. එම දෛනිකව ලැබෙන මාසික ආදායමෙන් එය ගත් පලවෙනි අයිතිකරු හෙවත් බදු ගැනුම්කරුට රුපියල් විසි තිස්දාහක් දුන්නාම එම ආයතනයේ වැඩ කරන සේවකයන්ට පඩි දුන්නාම එම ආයතනය පවත්වාගෙන යන්න බැහැ. ඇත්ත කතාව. අපිත් හිටපු ගමන් උඩට යනවා කොණ්ඩය කපා ගන්න.දවසට කොණ්ඩය කපන්නේ කී දෙනාද . එතකොට ඒ අය එම පඩි ගෙව්වාම ඒ අය එම කඩ කාමරය ගත්තේ රු.35000/= යි.ඉහළ මාළයේ කඩයක් ගත් මිනිහාට ගෙවනවා රු.35000/= ක් රු.30000/= ක් ගෙවනවා. මා හිතන්නේ අපි නගර සභාව ගන්නේ රු.15000/= යි.භාගයකටත් අඩුවෙන් ගන්නේ.දැන් අපෙන් කඩය ගත්ත කෙනාට වඩා භාගයකටත් වැඩියෙන් මෙම කඩය බදු දී තිබෙනවා.මා යෝජනා කරන්නේ අපේ අරමුණ විය යුත්තේ නගරයට ලැබිය යුතු මුදල නගරය ලබා ගන්න ඕන. එය දෙවැනි පාර්ශවයකට යන්න බැහැ. එතකොට මෙහිදි සංශෝධනය වෙන්න ඕන අපි කියන්නේ නැහැ. දැන් අරගෙන ඉන්න කෙනාට සම්පූර්ණ බදු බර පටවන්න කියා. නමුත් සාධාරණභාවයක් වෙන්න ඕන.කඩය නගර සභාවෙන් අර ගන්නවා රු.15000/= යි. කඩය දෙනවා අනෙක් මනුස්සයාට රු.35000/= යි. මේ අපේ ගිවිසුම් වල තිබෙන යම් යම් වැරදි. මා මේ කතා කරන්නේ ඉහළ මාලය ගැන. අපි සියළු ගරු මන්ත්‍රීවරු දන්නවා. ඇයි අපි මෙහෙම තියෙද්දි මෙච්චර අපි දැනගෙන තිබේද්දි අම්බලන්ගොඩ වෙළඳ ස්ථානයක වටිනාකම එන්න එන්නම දිනෙන් දිනම වැඩි වෙනවා බව දැනගෙනම ඇයි අපි නගර සභාවට හිමි විය යුතු මේ මුදල නොගෙන අපි වෙනත් පාර්ශවයකට මේ මුදල ගන්න ඉඩ තියන්නේ.මෙයට වැරදි කාරයෝ වෙනවා අපි සියළු ගරු මන්ත්‍රීවරු. මේ තින්දු ගන්නේ ඔබතුමා ඇතුළු අපි. මෙය බලාගෙන ඉන්නවා රාජ්‍ය නිලධාරින්. එක වැරදියි . එමනිසා මා කියනවා චක්‍රලේඛණ තිබෙන්න පුළුවන් . චක්‍රලේඛණ වෙනස් කරන්න මේ ගරු සභාවට නිත්‍යානුකුල බලයක් මේ පොත් වලින් ලබා දී තිබෙනවා. අපි වෙන්න ඕන මේ නගර සභාව සතු ආදායම වැඩි කරගන්න ඕන. දිනෙන් දිනම කළ යුතු කාර්යයන් වැඩිවෙලා තිබෙනවා.දිනෙන් දිනම නගර සභාව වියදම් කරන මුදල වැඩිවෙලා තිබෙනවා. එහෙම මේ වැඩිවන මුදල අපිට ගිණුම් වල ඌනතා යන්න බැහැ. අපිට ණය වෙන්න බැහැ. අපිට තිබෙන ආදායමෙන් සුරක්ෂිතව මෙය කරන්න ඕන. එමනිසා මා යෝජනා කරනවා ලොතරැයි කුඩුවේ ඉඳලා මේ අපි බදු දී තිබෙන සියළුම ගොඩනැගිලි , වෙළඳ සංකීර්ණ වල සාධාරණ මුදලක් නගර සභාවවේ ආදායමට එකතු කර ගත යුතුයි. මා හිතන්නේ කවුරුත් ගරු මන්ත්‍රීවරු එයට විරුද්ධ වෙන එකක් නැහැ. අපිට චක්‍රලේඛ වල තිබෙනවා උපදෙස්. ඔබතුමාට බලය තිබෙනවා. ඔබතුමා ඉදිරිපත් කරන්න. අපි සම්මත කරනවා. එමනිසා ඔබතුමාවත්, ගරු උප සභාපතිතුමාත් , විපක්ෂයේ සිටින මා වත් නැතිනම් අපේ ජනතා විමුක්ති පෙරමුණේ සිටින ගරු මන්ත්‍රීතුමාවත් ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාවත් ගැවෙන්නේ නැහැ. සමස්ත සභාව නියෝජනය කරන්නේ නගර සභාවේ පැවැත්ම. එමනිසා අපි ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. මේ බදු වැඩිකිරිමේදි අම්බලන්ගොඩ පුද්ගලික කඩ හිමියන් බදු දී තිබෙන

විට ඒ ගැනත් සැලකිල්ලට ගෙන අම්බලන්ගොඩත් සැලකිල්ලට ගෙන මෙම බදු කුලිය සංශෝධනය විය යුතු වෙනවා. පහත මාලය වෙනමත්, පහත මාලයට රු.10000/= ක් ගන්නකොට ඉහළ මාලයට රු.8000/= ක් කියන එක සම්පූර්ණ වැරදියි. පහත මාලය බදු දෙනවා රු.100000/= කි. ඉහළ මාලය දැන් ඔබතුමා කියනවා බදු දෙනවා රු.60000/= කි. අපි ගන්නවා රු.15000/= ක්. මෙය කොයි තරම් වැරදි බලවත් ආසාධාරණයක්ද ?මේ ගැන නැවත වරක් බලා සංශෝධන කරන්න තිබෙන දේවල් උපරිම සංශෝධනය කරලා නගරයේ ජනතාවට ගන්න පුළුවන් මුදල ගන්න. නගරයේ ජනතාවට මේ තින්දු තව වසරක් ඉදිරියට යනවා. 2020 වර්ෂයේ සිට 2023 දක්වා අපේ බදු මුදල මේක.2023 පස්සේ එහෙම නැතිනම් 2023 පස්සේ මෙම මුදල කිසිම එකක් ඊළඟ වසර වෙනකම් බදු ගිවිසුම් ගන්නේ 5% කි.5% වාර්ෂික වැඩි කිරීම මත පදනම මත යම්කිසි මුදලක් යම්කිසි මුදලක් තින්දු කරන්න නගර සභාවේ ආදායම වැඩිවන විදියට.නැතිනම් මෙය බලවත් ආසාධාරණයක් වෙනවා නගරයේ බදු ගෙවන ජනතාවගෙන් . අපි මේවා නඩත්තු කරනවා. ඔබතුමා ඇතුළු අප සියළු දෙනා මේ නගරය තුළ ජීවත්වන සියළු ජනතාවගේ සුභ සාධනය උදෙසා විශාල මුදලක් වියදම් කරනවා. එමනිසා අපි එම මුදල් පියවා ගන්නත් අවශ්‍යයි. මෙය සංශෝධනය කළ යුතු වෙනවායි. නැතිනම් මෙය බලවත් ආසාධාරණයක් නගර සභාව පැත්තෙන් සිදුවන.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සංශෝධනය කරලා තමයි තිබෙන්නේ. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් සංශෝධනය කර තමයි දිලා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

තක්සේරු එකෙන් තමයි දිලා තිබෙන්නේ මේ තක්සේරු මුදල කොයි තරම් ආසාධාරණයි කියා. මේ පොතේ තිබෙනවා. ඔබතුමාට අපට අයිතිය තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අයිතිය තිබ්බාට තක්සේරු දෙපාර්තමේන්තුවේ මෙකට බැඳී සිටිනවා. අපිට එහා යන්න පුළුවන්. නමුත් අපට අඩුකරන්න නම් බලයක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

මා කියන්නේ වැඩි කරන්න කියලා. අපිට ඔබතුමා ඇතුළු අපිට බලය තිබෙනවා ආඥා පණත යටතේ. අපිට සංශෝධනය කරන්න. වැඩිකිරීම කරන්න. අඩුකරන්න කතා කරන්නේ ඇයි? බුදු අම්මෝ අඩු කරන්න බැහැ.ඔබතුමා ඇතුළු මේ සියළු දෙනා මේ කරගෙන යන දෙයට.මෙය අඩු කරන්න බැහැ. මෙය වැඩි කළ යුතුයි.මෙය අඩු කරපු නිසා තමයි මේ මෙහි තිබෙන කඩ කොහොල්ලා ගහපු මොකාද වගේ තමයි මෙහි කඩ ගන්න එන්නේ. කඩ 5 – 6 අයිති කර ගන්න හදනනේ. එහෙම අරගෙන තමයි මේ ලක්ෂ 5 – 6 ක මුදලකට කඩ දෙන්නේ. මේක නිකන් ව්‍යාපාරයක් කරගෙන ඉන්නේ දැන්. නගර සභාවට ලැබිය යුතු ආදායම . යන්නේ වෙන මිනිසුන්ගේ සාක්කු වලට. අපි එකට විරුද්ධයි. එන මුදල එන්න ඕන නගර සභාවට.එතකොට තමයි නගරයේ පැවැත්ම වෙන්නේ. එමනිසා ඔබතුමා ඇතුළු අපට පුළුවන් මෙය සංශෝධනය කරන්න. අපි බැදෙන්න ඕන නැහැ. තක්සේරු දෙපාර්තමේන්තුව කියන්නේ එකයි. එයට බැදෙන්න ඕන නැහැ. තක්සේරු දෙපාර්තමේන්තුවට අපට කියන්න පුළුවන් කම තිබෙනවා. මෙන්න මේ ගොඩනැගිල්ල වර්ග අඩියක් දි තිබෙන්නේ රුපියල්

150/=. ඔබතුමලා කියනවා රු.10කට එන්න කියා. එහෙම බැඳිලා නැහැ. පුද්ගලික ව්‍යාපාරික වලට මාගේ ගොඩනැගිල්ල බදු දෙනවිට තක්සේරු දෙපාර්තමේන්තුව කියනවා නම් වර්ග අඩියක් රු.100/= කියා. මා කියනවා ඔබතුමලාට රු.100/= දෙන්න මා බැඳිලා නැහැ. මේ ගොඩනැගිල්ල දි තිබෙන්නේ මෙහෙම . එනවා නම් මේ ගණනට එකඟ වෙනවා නම් එන්න. මං දෙන්නම්.එහෙම තමයි අපි දෙන්නේ. නැතිව අපි කවුරුත් පාඩුවට දෙන්නේ නැහැ. අපිටත් අදහස් ඕන තරම් තිබෙනවා. මෙහි ගොඩනැඟිලි බැංකුවට දි තිබෙන්නේ වර්ග අඩියක් කියද?ඔය ඇඳුම් කඩවලට දිපු වර්ග අඩියක් කියද? ඉදිරිපිට රත්තරං බඩු කඩවලට දිපු වර්ග අඩියක් කියද? එහෙනම් අපි ඒවා සැලකිල්ලට ගෙන අපි දළ වශයෙන් සාධාරණ වශයෙන් අපේ ගණන හදලා නගරයට ආදායම වැඩිවන විදියට අපි හදලා තක්සේරු දෙපාර්තමේන්තුවට යවන්න.පළාත් පාලන කොමසාරිස්තුමා හරහා.අපි ඔබතුමලා සිටින්නේ නිතියක් සම්පාදනය කරන්න. අම්බලන්ගොඩ මිනිසුන් වෙනුවෙන්. ඔබතුමා අපි කවුරුත් කියන දේවල් කරන්න ඕන නැහැ. එකට මැදිවෙන්න මේ ආඥා පණත යටතේ අපට තිබෙනවා. නගර සභාවේ අපි සියළු ගරු මන්ත්‍රිවරුන්ට.තින්දු ගන්න පුළුවනි අපි ගරු මන්ත්‍රිවරුන් ඇතුළු අප සියළු දෙනාටම. අපේ බලය නගරයේ ජනතාව වෙනුවෙන් නිසි පරිදි කළමනාකරණය කරන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙය නගරයේ හදවත බඳු ස්ථානයකි. නගරයේ වටිනාම ව්‍යාපාරික ස්ථානය.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මා මෙයට අදාළවන නිසා 03.02 ලිපියත් කියවන්නම්. මොකද එම ලිපියේ ඉල්ලීමක් තිබෙනවා. එහි තිබෙනවා. අසාධාරණ ලෙස වැඩි කරන ලද කඩ කුළිය පිළිබඳ අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ කඩ හිමියන් විසින් ඉල්ලීමක් කර තිබෙනවා. අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ කඩ හිමියන් වන අප අම්බලන්ගොඩ නගර සභා ලේකම්තුමියගේ 10.31 දින ලිපිය අනුව වැඩිකරන ලද බදුකුලිය හෙවත් කඩ කුළිය වැඩිකිරීම පිළිබඳ අපගේ බලවත් විරෝධතාවය සහ 2019.11.09 දිනෙන් පල කරන අතර ඒ පිළිබඳ ඔබතුමාගේ අවධානය යොමුකරන පිණිස ඉදිරිපත් කරනවා. මෙම කඩ කුළිය සම්බන්ධව අප ගිවිසුම් ගතව ඇත්තේ 5% ක ප්‍රමාණයක් පමණි. නමුත් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් එය අසාධාරණ ලෙස ලබා ගෙන ඇති තක්සේරුව සම්බන්ධයෙන් අප තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඒ පිළිබඳ අප තක්සේරු දෙපාර්තමේන්තුවෙන් විමසා සිටියේ අම්බලන්ගොඩ නගර සභාවේ ඉල්ලීම පරිදි ඒවන විට තක්සේරුවට භාජනය කරනු ලැබුවේ දේපලෙහි වටිනාකම හා එක්වන් වාරිකයේ වටිනාකම , නඩත්තුව හා ලබා දි ඇති පොදු පහසුකම් ගැන නොසලකා හරිමින් මෙම අධිතක්සේරුව සිදුවූ බවය. නගර සභාවේ ප්‍රධාන ආදායම් සපයන්නන් වන අප මේ වෙනුවෙන් ආසාධාරණයක් සිදු වීම පිළිබඳ අප්‍රසාදය පල කරනවා. මේ සම්බන්ධයෙන් කිසිදු දිරි දිමක් නගර සභාව විසින් ලබා දි නොමැති අතර බදු බර පමණක් වැඩි කර ඇත. මෙය සභාවේ යුක්ති මුලධර්ම වලට අනුකුල නොවන බැවින් ගරු මන්ත්‍රිවරුන්ගේ අවධානය යොමු කරමින් , ගරු සභාපති , ලේකම්ගේ අවධානය යොමු කරමින් මෙම තක්සේරුව අහෝසි කරන ලෙස ඉල්ලීම කරමින් ගිවිසුම් ප්‍රකාරව 5%ක පමණක් ගෙවීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටින බවට කඩහිමියන් විසින් දන්වා සිටිනවා.මේ වාර්තාවත් මා සභාවේ අනුමැතිය

පරිදි රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවට විරෝධතාවයක් වශයෙන් යොමු කරනවා. තක්සේරු දෙපාර්තමේන්තුව විරෝධතාවය පිළිගත හොත් අපි විරෝධතාවය පිළිගන්නවා. එතෙක් තක්සේරු දෙපාර්තමේන්තුව ලබාදුන් වාර්තාව අනුව බදු ගෙවීම් සිදු කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මා මුලින්ම ප්‍රකාශ කළේ මෙය නගරයේ හදවත බඳු ව්‍යාපාරික ස්ථාන වලින් එකක්. ඒ අයට හිමිවිය යුතු පහසුකම් ප්‍රමාණයක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම නගර සභාවෙන් ඒවා ඉෂ්ඨ වෙලා නැහැ.ඔරලෝසු කණුව බලන්න. හැමදාම 9.30 වේලාව. දැන් මාස 6ක් විතර 9.30 වේලාව. මා හැමදාම බලා තිබෙනවා. මා දන්නේ නැහැ ඔබතුමා ඔතනින් යනවාද කියා. නමුත් ඔන්න ඔහොම දේවල් තිබෙනවා. වැසිකිළි පහසුකම් නැහැ. තින්ත ආලේප කර නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වැසිකිළි පහසුකම් ලබා දී තිබෙනවා. තීන්ත ආලේප කර තිබෙනවා. බොරු කියන්න එපා. වසර දෙකකට පසු හැමදාම අපි තින්ත ආලේප කරනවා. ඔබතුමා ඔහොම වැසිකිළි පහසුකම් නැහැ කියන්නේ.ඔබතුමා නිකං ඔය විදියට බොරු කියන්න එපා. ඔබතුමා කියපු එක දෙයක් ඔරලෝසුව වැඩ කරන්නේ නැහැ කියන එක මා පිළි ගන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මා සම්පූර්ණ කරන්නම් කතාව. මා මේ ඒ අයටම අඳිනවා නෙමේ. මා කියන්න යන්නේ නගර සභාවෙන් නගරයේ ජනතාවට සැපයිය යුතු සේවාවන් ගොඩක් කරගෙන යනවා. ඒවාට මුදල් ඕන.එතකොට ඒ මුදල් හොයා ගන්න මාර්ගයක් තිබෙන්න ඕන. මා කියන්නෙත් ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කිවූ පරිදි බදු මුදල් අයකරන එක නිසියාකාරව කරන්න ඕන. හැබැයි ඒ අයගේ අත්‍යවශ්‍ය පහසුකම් අප සැපයිය යුතුයි. ඒ දෙක සමබර කරන්න කියා මා කියන්නේ. දැන් මේ ලිපියේ තිබෙනවා එම කාරණය නැහැ කියා. ඒ අනුව තමයි මා මෙය ඉදිරිපත් කළේ. ඔබතුමාට එයට එච්චර උරණ වෙන්න දෙයක් නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා පිළිතුරක් දෙන්නම්. මේ සඳහා අපි වසරකට ලක්ෂ 24ක් ණය ගෙවනවා. ඊට අමතරව අපි පෞද්ගලික ආරක්ෂක සේවාවක් පවත්වාගෙන යනවා. එම ආරක්ෂක සේවය පවත්වාගෙන යාමට ලක්ෂ 2කට වඩා ගෙවනවා. ලක්ෂ 3 ½ ගෙවනවා. ඊටපසු මෙය වටේම තිබෙන විදුලි බිල ගෙවනවා. එම විදුලි බිල ගෙවන ගණන හැමදාම මේ සභාවට ඉදිරිපත් වෙනවා. හැමෝම දන්නවා. දැන් කරන්නේ කඩ හිමියන්ගේ බදු මුදල අහිංසක මිනිසුන්ගේ මුදල් වලින් ගෙවන එක තමයි අපි මෙච්චර කල් කරනු ලැබුවේ. එක සමාන වෙන්න ඕන. අර අහිංසක වැල්ලේ අයිනේ මිනිහාගේ මුදල් දමා තමයි කඩහිමියන්ගේ බදු ගෙවන්නේ . ඒ අයට යන වියදම ඒ අය දරන්න ඕන. එක තේරුම් ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ  මහතා කතා කරමින්</u>**

ජන සමාජය වෙනුවෙන් කරපිංචා පැළයක් වත් හිටවපු නැති ජනතා විමුක්ති පෙරමුණේ  ඒ ගරු මන්ත්‍රීවරයා මේ ජන සමාජය වෙනුවෙන් එවැනි ප්‍රකාශයක් කිරිම ගැන ලැජ්ජාවක් ඇති වෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි මට කතා කරන්න ඉඩ දෙන්න.මා නැවත කියන්න කැමැති නැහැ.

වර්තමානය වන විට මේ අම්බලන්ගොඩ නගර සභාව ඉටුකරන මෙහෙවර ගැන සුපැදුනු නිසා තමයි සිව්වන වරටත් අපේ ගරු නාගරාධිපතිවරයා මහ පුටුවේ සිටින්නේ. එමනිසා තමයි දස දෙනෙකුගෙන් යුක්ත බහුතරයකින් ඒ වගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු නගර සභා මන්ත්‍රී රාහුලල වගේ මේ තුන්පළ වගේ බහුතරයෙන් අප මේ සභාව රංජනය කරන්නේ.මෙතුමන් සහ මේ අපේ පොදුජන පෙරමුණේ නිසා තමයි ඒ ක්‍රියා කරන්නේ . ගරු මන්ත්‍රීතුමනි, අනාවබෝධය නිසා ඔබලා මිට පෙර බොහෝ දේ කළා. තව දුරටත් දූර්මතව සිටින්න එපා කියමින් වැඩිදුර කාලය කන්නේ නැහැ. තව තව දේවල් කියන්න පසුවට තිබෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

මට කතා කරන්න දෙන්න

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඔබතුමා කතා කර තිබෙන්නේ. ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා කතා කරන්න තිබෙන්නේ. නැහැ ඕකට වෙනම පිළිතුරු දෙන්න.පක්ෂයට කිවුවේ. .ඔබතුමාට පුද්ගලික දෙයක් කිවුවේ නැහැනේ. එමනිසා දැන් ඔබතුමා කතා කරලා අවසන්. දැන් මෙතුමා කතා කරන්නේ. නැතිනම් අපිට වේලාවට අවසන් කරන්න බැරි වෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ කඩ කාමර බදු කුළි සංශෝධනය හා ගිවිසුම් අලුත් කිරිම. අපි කෙලින්ම මෙම මාතෘකාවට බැස්සොත් අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ කඩ කාමර තක්සේරු කර තිබෙන්නේ කොයි කාලේද? දැනට තක්සේරුව ඇවිත් තිබෙන්නේ කොයි කාලයේද ?

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ගිය මාසයේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

නැහැ . මා අහන්නේ මිට කලින් තක්සේරු කර තිබුණානේ. ඒ අතර කාලය කොච්චරද ?

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

රජයේ විගණකාධිපති විසින් අපට දැනුම් දි තිබෙනවා මේ බස්නැවතුමපොළේ කඩ කාමර 4 කියන එකේ වසර 11 ක් තක්සෙරු කර නැහැ.අංක 8 වසර 10ක් .09 වසර 10ක්, අංක 12 වසර 09 ක් අංක 13 වසර10, අංක 14වසර11, අංක 15 වසර13, අංක 16,18,20 වසර11, අංක 22 වසර17, අංක 26 වසර 09, අංක 27 වසර10, අංක 28,32 වසර 09, අංක 33,34,35,41 වසර 09, අංක 44 වසර 12, අංක 49 වසර 09, අංක 50 වසර 12, අංක 51 වසර 11, අංක 53 වසර 09, අංක 54,55 වසර 12, අංක 58,59,61,62 වසර 09, අංක 63 වසර 10 ලෙස මේ වාර්තාව තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

රජයේ විගණකාධිපති දැනුම් දෙනකම්ම මතක් වුණේ නැද්ද? ඕක තක්සේරු කරන්න. නිත්‍යානුකුල තත්ත්වය අවුරුදු 5න් 5ට තක්සේරු කරන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔව් තක්සේරු කරන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එය කාගේ වරදක් ද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය සභාවේ වරදක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එය සභාවේ වරදක්. කවුද වැරදි සභාවේ. හිටපු උදවිය තමයි වැරදි. මෙහි වැරැද්ද වෙලා තිබෙන්නේ කලින් තක්සේරු කරපු මුදල එකවර වැඩි වුණාම බදු කරුවන්ට මේ ප්‍රශ්නය එනවා.අවුරුදු 5ක් තක්සේරු කරලා කලින් කලට මෙය වැඩි වුණොතින් ඒක තමයි මේ කැඩළුව වෙලා තිබෙන්නේ. මේ වැඩිකිරීමට එකට නෙමේ මේ ගැටළුව තිබෙන්නේ. අපිට එක ප්‍රශ්නයක් නෙමේ. නමුත් මෙහි අපෙන් කඩ ගත් නගරයේ ව්‍යාපාරිකයෝ කඩ ගත් පසු ඒ කඩ ගත් උදවිය තාම කඩ කරගෙන යනවා එතැන . ඒ නොකරන කොටසක් ඉන්නවා.කඩ දීපු අය. සමහර තැන්වල එක්කොටි 60ලක්ෂයක් කඩය යන්නේ. ඒ වගේ යනවා. අපි කියන්නේ එදා ඉදගෙන කඩ කරන උදවිය සිටිනවා ටේප් රේකෝඩ් කරලා සිඩී තැටියක් විකුණන අවස්ථා. එතකොට සේවකයෝ යොදාගෙන ඇත්තටම කරන්න බැරි තත්ත්වයක් උදාවෙලා තිබෙන්නේ.බදු කුලිය ඔයවගේ යනවිට මුදලින් ගත්විට ගෙවන්න පුළුවන් කට්ටිය ඉන්නවා.නමුත් තක්සේරු දෙපාර්තමේන්තුවෙනුත් කරන්නේ මෙකයි. ගිහින් වටපිටින් ඇහුවා . කරන්නේ මෙකයි. එහෙම අහලා තක්සේරුව ගහලා එවනවා. කරන්නේ එකයි. වෙළඳ ව්‍යාපාරයේ නාමය තුළ වෙළඳ ව්‍යාපාරය අනුව තක්සේරු කරලා යන්න ඕනේ. එහෙම ගෙනා අසාධාරණ තත්ත්වයක් තිබෙනවා. එක අපි අවිවාදයෙන් පිළිගන්නවා. අපටත් ඡන්දය දෙන අය සිටිනවා. සියළු ගරු මන්ත්‍රීවරුන්ට පොහොට්ටුව ද කියා නැහැ. ගරු මන්ත්‍රීවරයෙකුට ලිපියක් දුන්නාම කතා කරන්න අයිතිය තිබෙන්න ඕන. එක තමයි ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ. මෙක ඒකාධිපති පාලනයකට ගිහින් කරන්න බැහැ. අපි එයට සම්පූර්ණ විරුද්ධයි. අතිගරු ජනාධිපති ගෝඨාභය මැතිතුමා පත්කරලා වැට් මුදල 8% අඩු කළා.මේ සභාව යන්නේ අමුතු විදියකට. මා නම් වශයෙන් කියන්න යන්නේ නැහැ. ගරු මන්ත්‍රීවරු සියළු දෙනාටම මෙතැනට පැමිණෙන අභයක් තිබෙනවා.ආත්ම ගෞරුත්වය රැකෙන විදියට කතා කරන්න ඕන. කවුරු වුණත්. අපි කැමති නැහැ එකට. ගරු සභාපතිතුමාට අපි ගරු කරනවා. මොකද එතුමාගේ වැඩ පිළිවෙල අනුව එතුමා ක්‍රියාත්මක වෙනවා. එයට හොඳයි කියනවා. නරක දෙයට නරකයි කියනවා.අපි කියන්නේ මෙකයි. මෙය සංශෝධනයට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් එවන්න ඇති. එය හරි අපි සාධාරණ වශයෙන් කරලා අපිටත් දිය හැකි සහායෝගයක් දිලා කරන්න පුළුවන්නම් එය අඩුකර දෙන්න.කරන්න බැරිනම් හේතු කාරණා

තිබෙනවානේ. ඒ තුළ යන්න.මේ වෙළඳ හා කර්මාන්ත මණ්ඩලයේ ව්‍යාපාරිකයෝ. අපි නෙමේ කැඳවන්නේ. ඔබතුමාගේ ලිපිය යටතේ අපි එන්නේ. පැමිණ එතුමන්ලා කරුණක් ඉදිරිපත් කරනවා . ඔබතුමාම කැඳවනවා නම් බලන්න ඕන මොනවාද තිබෙන්නේ යටිතල පහසුකම් අඩුව . එතුමන්ලා කියනවා නම් ඔබතුමා එය කරලත් තිබෙනවා. මේ එක කමිටුවකටවත් එන්නේ නැති ගරු මන්ත්‍රීවරු ඉන්නවා කැගහන්නේ. එහෙම බැහැ . ඒ අයගෙත් නියෝජනය කරන්න ඕන. ඒ ප්‍රශ්න ගැටළු තිබෙනම් ඒ කමිටුවට ඉදිරිපත් කරන්න ඕන. පක්ෂයක් නැහැ මෙතැන. නගර සභාවට පැමිණියාට පසු මේ පුටු දෙන්නෙත් , මෙහි වාඩි කරන්න කියා තිබෙන්නේ ජේෂ්ඨත්වය අනුවයි. මොකද එහෙම කියන්නේ පක්ෂ පාට භේදයක් නැහැ.කවුරුත් ගරු මන්ත්‍රීවරු පැමිණ තිබෙන්නේ සේවය කරන්න. මහජනතාව යම්කිසි ප්‍රශ්නයක් දුන්නාම ඒ අනුව කටයුතු කරන්න ඕන. එහෙම බැරිනම් ඒ ව්‍යාපාරිකයන්ට හෝ මනුස්සයන්ට එය අවබෝධ කර මෙය කරන්න ඕන. මොකද අපේ මෙය කාගේවත් පෞද්ගලික බුදලයක් වෙන්න බැහැ. එමනිසා මා කරුණාවෙන් ඉල්ලා සිටිනවා , ඔබතුමලාට ඕන දෙයකට අපි සහායෝගය දෙනවා. දිලත් තිබෙනවා. මෙහි මහජනතාව එවන යම් ප්‍රශ්න ගැටළු අවබෝධ කරගෙන එහෙට යවා සංශෝධනය කරන්න පුළුවන් නම් හරි ඔබතුමාගෙන් ඇසුවාත් කමක් නැහැ.මේ බදු මුදල අඩු කරන්න පුළුවන් නම් කරන්න. ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් මහතා කිවු පරිදි ලොතරැයි කුඩුවක් බද්දෙන් බද්ද තුන් හතර දෙනෙකුට දීපු එක නෙමේ. ඒ අදටත් ජීවිකාව කරන ව්‍යාපාරික කරන අම්බලන්ගොඩ වැසියන්ට ඒ අයිතිවාසිකම ඒ ඔවුන් ඉල්ලන අපට ඉටු කරන්න පුළුවන් සේවයක් තිබේනම් එය ඉටුකරන්න කියනවා. මේ සභාව විහළුවකට තහළුවකට යානොදී කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මේ ලිපිය ගරු සභාවේ මන්ත්‍රීවරුන්ට දි තිබුණා. මේහි මාත් උඩ ඇවිද්දා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා දැන් කතා කලානේ. කරන ලද සියළු ඉල්ලීම් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවට යවන්න කියා මා කියා තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

මෙහි කියා තිබෙන දෙයක් තිබෙනවා. දැන් උඩ ගියාම මා එහි කඩහිමියන් දෙනෙක් තුන් දෙනෙකුට කතා කළාම අපේ ගරු සරත් චන්ද්‍ර මහතා පැමිණ කියා තිබුණා පරවියන් ජාරා කරාම උඩ වෙළඳ සංකිර්ණයේ ගන්න දෙයක් නැහැ. ඇත්තටම අපිරිසිදුභාවය පිළිබඳ තත්ත්වයක් තිබෙනවා.පහත තට්ටුවේ ගැටළුවක් නැහැ. මා කතා කරන්නේ උඩ තට්ටුව.මොකද කෙනෙක් වෙළඳ සංකිර්ණයට ඇතුළු වුණාම අපේ හදවත වගේ තැනක් මෙය.ඇතුළු වුණාම ඇත්තටම ජාරා කර ටයිල් එහෙම හරිම අපිරිසිදුයි. ඔබතුමා කිවුවා වගේම අපට මේ ලැබෙන මුදලින් වෙන කොහේවත් සුදු අලියෙක් නඩත්තු කරනවා. එක තමයි මා කිවුවේ. සුදු අලියෙක් නඩත්තු කරන්න එපා වෙන ආදායම් වලින්. ගන්න මෙකෙන් ආදායම. නඩත්තු කරන් ඒ අයට ඕන විදියට පිරිසිදුව. අනෙක් එක අපේ ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා ගියාම තමයි දැකතිබෙන්නේ පරවියන්ට රිංගන්න බැරිවෙන්න දැලක් ගසා තිබෙනවා. දැන් ඒවා කැඩිලා තිබෙනවා. ඒ තැන්වලින් එනවා. එය කරදෙන්න ඒ අයට . මොකද අපේ නගරයට හොඳ නැහැ. එය.අනිත් එක තමයි සුද්ද පවිත්‍ර කිරිමට ගියත් කමක්

නැහැ. මේ මුදල් ඒ අයගෙන් ගන්න. මේ සුදු අලියන් නඩත්තු කරන්න බැහැ අනිත් ආදායම් වලින් . මේ සඳහා පිරිසිදු කිරිමට උඩ සහ පහළ කට්ටියක් දමා මේ මුදල් ඒ අයගෙන් අයකර ගන්න. අපි මෙය ලංකාවේ වෙන නගර වල වෙළඳ සංකිර්ණ වලට යනවා. පිරිසිදු කම තිබෙනවා ඕන තරම්. එහි කැත නාමය එන්නේ නගර සභාවට. එමනිසා මෙයට සාධාරණ මුදලක් ගන්න. මා මූණ ගැසිමට ආවත් කිහිප දෙනෙක්. මා කිවුවා . මා සිටින්නේ කවුරුවත් සනසන්න නෙමේ. නගරයට ආ යුතු මුදල නගර සභාවට ලැබිය යුතුයි. අපි දන්නවා මෙය රු.1000/=ට අරගෙන රු.5000/= ට දිලා තිබෙනවා. එක වෙන්න බැහැ. ඔගොල්ලන්ට රු.5000/=ක් ගෙවන්න පුළුවන් නම් රු.2500/=ක් නගර සභාවට ගෙවන්න. ගෙවලා අපි මෙය නඩත්තු කරන්නම්.අනිත් එක පිරිසිදු කළ යුතුයි. මාගේ දැඩි විරෝධතාවය ප්‍රකාශ කරනවා. ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා ඒ කළ ප්‍රකාශයට. හැම ගරු මන්ත්‍රිවරයෙකුටම ආත්ම ගෞරුත්වයක් තිබෙනවා. විහළු තහළුවට ලක් කරන්න එපා කියා ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.සියව ගරු මන්ත්‍රිවරුනගෙන් ඉල්ලා සිටිනවා. මෙතැන කවුරුත් අපි මන්ත්‍රිවරුන් විහළුකරුවන් කරන්න එපා.මෙතැන පක්ෂ පාට භේදයක් නැහැ. ගරු මන්ත්‍රිවරුන්ට ගෞරුත්වයක් තිබෙනවා. කරුණාකරලා ඒ තත්ත්වයට මේ සභාව පත් කරන්න එපා. කරපිංචා කොළ දමා ගරු මන්ත්‍රිවරුන්ට අපහාස කරන්න එන්න එපා. මේක සභාවක් . මේක සියළු දෙනාටම අයිතිය තිබෙනවා කතා කරන්න . හැමෝටම තිබෙනවා ආත්ම ගෞරුත්වය.අපි ගරු උප සභාපතිතුමාට යම් සිද්ධියක් ඇති වූ අවස්ථාවේ අපි එකාමෙන් එතුමා සමඟ සිටියා. අපි කාගේවත් පැත්ත ගත්තේ නැහැ. එම සිද්ධිය නිසා මා සමඟ පොඩි කාලයේ සිට සම්බන්ධකම් තිබුණ කට්ටියක් මා සමඟ අමනාප වෙලා සිටිනවා.නමුත් මා ගත්තේ අපේ ඒ මන්ත්‍රි කෙනෙකුගේ පැත්ත ගෙන කතා කළේ. එම නිසා කිසිම ගරු මන්ත්‍රි කෙනෙකු හැල්ලුවට ලක් කරන්න එන්න එපා.හැම ගරු මන්ත්‍රිවරයෙකුටම අයිතිවාසිකමක් තිබෙනවා පෙනි සිටින්න. හැම ගරු මන්ත්‍රිවරයෙක්ම මෙහි පත්වුණ කට්ටියයි , දිනුව කට්ටියයි එහෙම එකක් නැහැ. එක්සත් ජාතික පක්ෂය යම්කිසි ගරු මන්ත්‍රිවරු කණ්ඩායමක් පත් වුවානම් එයට හරියන්න ව්‍යවස්ථාවක් සැදි තිබෙනවා. ශ්‍රි ලංකා නිදහස් පක්ෂය යම්කිස මන්ත්‍රිවරු පිරිසක් පත් වුවානම් එයට හරියන්න මන්ත්‍රිවරු පත්වි තිබෙනවා. පාලන පක්ෂය යම්කිසි ගරු මන්ත්‍රිවරු කණ්ඩායමක් පත් වුවානම් එයට හරියන්න මන්ත්‍රිවරු කණ්ඩායමක් පත්වෙලා තිබෙනවා. සැහැල්ලුවට , විවිළුකරුවන් බවට ගරු මන්ත්‍රිවරු පත් කරන්න එපා කියා මා ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, කඩකාමර කුලිය ගැන කතා වුණේ. අදහස් දැක්වූ විදියට පරස් පර අදහස් දැක්විමක් දක්නට ලැබෙනවා. මා මේ සභාවට අලුත්. එහෙත් මා මේ සභාවට යෝජනා කරන්නේ වෙළඳ ප්‍රජාවත් අපේ කට්ටියනේ. එමනිසා හොඳ නැද්ද කමිටුවක් පත් කරලා වෙනම රැස්විමකදි සාකච්ඡාවට භාජනය කරලා එතකොට තේරුම් ගනිවි අපේ තත්ත්වය . අපට පුළුවන් ඒ අයගේ ආදායම ඒ අයට පෙන්වන්න. එහෙම නැතිව ගට්ටනයකට යන්නේ නැතිව වෙළඳ ප්‍රජාවයි, අපියි අතර සාකච්ඡාවකට යාම සුදුසු බවටයි මාගේ අදහස. මොකද ඒ අයත් අපට මුදල් හොයා දෙනවා. අපිත් ඒ අයට උදවු කරනවා. අඩුපාඩු ඇති. එගොල්ලන්ගෙත් ප්‍රශ්න ඇති. සාමුහිකව සාකච්ඡා කරලා කමිටුවක් පත් කරලා අපේත් මෙහෙන් කමිටුවක් පත්කරලා අපේ ඒ වෙළඳ ප්‍රජාවට සහභාගි වන ගරු නගර සභා මන්ත්‍රි ලසන්ත මහතා සිටිනවා. ගරු නගර සබා මන්ත්‍රි ජී. සරත් ශ්‍රි ලාල් මහතා සිටිනවා. ව්‍යාපාරිකයන් හැටියට වැඩකරන ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා සිටිනවා. කට්ටිය

එකතු වෙලා සාකච්ඡා කරලා ප්‍රශ්නයකට යන්නේ නැතිව වෙළඳ ප්‍රජාවත් සමඟ එකඟතාවයකට යන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා පලමුවෙන්ම කියන්න කැමතියි මා ගොඩක් ගරු මන්ත්‍රීවරුන්ට ගරු කරන කාන්තාවක්. ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතාණෙනි, ඔබතුමා මෙතැන විඩියෝවට පෙන්න අඟර දඟර දමා කතා කරන්න ඇති. නමුත් එහෙම කතා කරන්න එපා. නමුත් විඩියෝ දර්ශනයට පෙන්න කතා කළාට කමක් නැහැ. මොකද එතුමාට විඩියෝ දර්ශනයක් ඕන කිවුව නිසා. නමුත් මේ හැම ගරු මන්ත්‍රීවරයෙක්ම මෙතැනට පැමිණෙන්නේ ගෞරුත්වය මත.මෙතැනට එන්නේ නගර සභාවේ නියෝජිත මහත්ම මහත්මීන් වශයෙන්. එතකොට ආත්මය නැතිවෙන්න කතා කරන්න එපා. ඔබතුමා කරපිංචා පැළ ගෙදර හිටවනවා ඇති. සභාවේ නෙමේ. මෙතුමාගේ පක්ෂයේ නායකයා සුනිල් හඳුනෙත්ති මහතා. එහෙම අවතක්සේරු කරන්න එපා. හැම පක්ෂයම නියෝජනය වෙනවා. මෙතැනට ආවාම පක්ෂ භේදයක් නැහැ. අපි ඔබතුමාට ආදරේයි. අපි ඔබතුමා මොනවා හරි කිවුවාම අභය කරනවා.වැරැද්දත් අපි ඒවේලාවේම හෙලා දකින්න ඕන. නැතිනම් අපේ මේ ගරු මන්ත්‍රී කමින් වැඩක් නැහැ. ඔබතුමා යන මග වැරදියි කියා පෙන්වන්න ඕන. මා වැරැද්දක් කළානම් පෙන්වන්න ඕන. මේ යන මග වැරදියි කියා. එය අපේ සහෝදර ගරු මන්ත්‍රීවරුන්ගේ යුතුකම. එමනිසා ඒ වගේ එතුමා පිඩනයට ලක් කරන්න කතා කරන්න එපා. එමනිසා මා ඉල්ලා සිටිනවා මගේ සහෝදර ගරු මන්ත්‍රීවරයෙක් වශයෙන් මා ගොඩක් ආදරය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් ඒ වගේ ප්‍රකාශ කරන්න එපා කියා. මා එම කතාව සම්පූර්ණම හෙලා දකිනවා. මොකද අපේ ගරු මන්ත්‍රීවරු ඕනැම විටක උදවු කරනවා. ගරු සහෝදර මන්ත්‍රීවරුන්ට මෙය කරන්න බැහැ කියා විරෝධතාවයක් දක්වා නැහැ. එමනිසා ඔබතුමාගේ එම කතාව සම්පූර්ණ හෙලා දකිනවා. ඒ වගේ දේවල් මීට පසු කරන්න එපා කියා මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්තටම ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණිය මහතාණෙනි, ඔබතුමාගේ ප්‍රකාශය පිළිබඳව බොහොම කනගාටු වෙනවා . ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ ගෙවල් ගණනේ ගිහින් කරපිංචා පැළ සිටවන පක්ෂයක් නෙමේ කියා මා මේ අවස්ථාවේ කියනවා. ඒ වගේම ඔබතුමාගේ දැනුම් පරාසය පිළිබඳ මා හරිම කනගාටු වෙනවා.මගේ සහෝදර මන්ත්‍රීතුමා, මගේ ගමේ මන්ත්‍රීතුමා, මගේ ගමේ යාළු මිත්‍රයෙක්. අපි බොහොම විනයානුකූල පක්ෂයක්. අපි කාගේවත් ආත්ම ගෞරුත්වය නැති කරන පක්ෂයක් නෙමේ.කාටවත් අපහාස කරන පක්ෂයක් නෙමේ. එමනිසා ඔය අපහාස අපි ගණන් ගන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමා මා බොහොම කරුණාවෙන් ඉල්ලා සිටිනවා මින්පසුව ඔයවගේ කතා කතා කරන්න එපා කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි මෙය වැඩිදුරටත් වාද කරනවාට වඩා හොඳයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා හිතන්නේ අද දිනයේ මේ සභාව ආරම්භයේදිම පලවෙනි මාතෘකාව. ලේකම්තුමියගෙන් අපි ඉල්ලා සිටිනවා මෙවැනි මාතෘකා අන්තිමට ගන්න කියා. සභාව ගෙනියන්නේ කොහොමද මෙහෙම වුණාම. විවාදයකට නෙමේ. මා දන්නා කරුණු ඇත්ත වශයෙන්ම ඉදිරිපත් කිරිමටයි මා නැගි සිටියේ. ඇත්තටම ගරු සභාපතිතුමනි, පලවෙනි යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා යෝජනා කළ පරිදි සභාවේ වරදින් තමයි මේ තක්සේරුව ඉදිරිපත් කිරිමට ප්‍රමාද වෙලා තිබෙන්නේ.මේ තක්සේරුව අපේ තක්සේරුව නෙමේ මාතරින් හරි ගාල්ලෙන් හරි තමයි මේ තක්සේරුව ඉල්ලා ගන්නේ. එතකොට එම තක්සේරුව අනුව තමයි කඩ කාමර හිමියන්ගෙන් අපි තක්සේරුව අය කරන්නේ. ඒ අනුව මොකක් හරි හේතුවක් නිසා මේ වසර කිහිපයක් හරි මේ තක්සේරුව වෙලා නැතිනම් එය කඩහිමියන්ගේ ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. අර කිවුවා වගේ මේ බදු කුලිය එකවර වැඩි කළාම තමයි මේ උද්ඝෝෂණය වගේ ප්‍රශ්න ඇති වෙන්නේ. හැබැයි ගරු සභාපතිතුමනි , අපට කරන්න තිබුණේ ඒ තක්සේරුව නිවැරදිව කරන්න. අවුරුදු ගණනකට ඉස්සර වෙලා. ඒ අය දැනුවත් කරන්න තිබුණා. මේ වසරට ඔබේ කඩයට මේ වසරේ සිට මේ බදු කුලිය මේ වසරේ සිට අපි සභාවට දමා එම කුලිය සභාවේ වෙච්ච වරදක් නිසා සභාවෙන් කපා ඇරිමට කටයුතු කර අළුත් තක්සේරුව තුළ එනම් 2020 වසරේ සිට මෙම බදු මුදල ගැනිම. අපි බදු වැඩි කරලා නෙමේ. මේ නිත්‍යානුකූලව තක්සේරු දෙපාර්තමේන්තුවේ නියමිත මුදලට තක්සේරු කර ඇති බවට සභාවට පෙර දැනුවත් කරන්න තිබුණා. එම පැහැදිලි කිරිම අප අතින් වෙලා නැහැ.විවිධාකාරයෙන් මේ කඩහිමියන් ගැන වර්ගී කරණය කළාට බරපතල තත්ත්වයක් තිබෙනවා. මමත් කඩ හිමියෙක් . මිට වසර 20 කිහිපයකට පෙර මේ කඩහිමියන් මේ මුදල් ගෙවා මෙම කඩ ලබාගෙන තිබෙන්නේ. මිට වසර 20කට පෙර ගරු සභාපතිතුමනි, ලක්ෂ 5ක් ලක්ෂ 10ක් දි ගන්න කඩයක ලක්ෂ 10ක තැන්පත් මුදල් දුන්නොත් අද වෙළඳ වටිනාකමත් එක්ක ඒ මුදල පොළිය සමඟ ගණනය කළහොත් එම පුද්ගලයාට එම ලක්ෂ 10 ලක්ෂ 240ක වටිනාකමක් ගන්නවා වසර 20ක් ගියතැන . එතකොට ඒ කඩය දිලා එතුමා හරි එතුමිය හරි රු.60000/= කට රු.100000/= මෙය දිලා ආදායමක් ලබා ගන්න එක ඉතාම සාධාරණයි. ඒ පැත්තෙන් බැලුවාම. හැබැයි අපි නගර සභාව පැත්තෙන් අපි බැලුවාම පෙනෙනවා නගර සභාවේ දේපල බදු දිලා මෙච්චර මුදලක් ගන්නවා කියා.එම තර්කය හොඳයි අපේ ඉඩම්වල ලොතැරැයි කූඩු බදු දිලා මුදල් ලබා ගැනීමට. අපේම ඉඩම් වල අපි තැන්පතු මුදලක් නොගෙන එම කාරණාව කරනවා නම් . අන්න අපට එකඟ වෙන්න පුළුවන්. එමනිසා හෙට මෙම කඩයක් අපේ නගර සභාවට පැවරුම් ගාස්තු ගෙවා පවරා ගත්තත් ලක්ෂ 160 ක් ගෙවලා එම ලක්ෂ 160 වටිනාකම එයාට එන්න ඕන. එහෙනම් ලක්ෂ 160ක් ගන්න ලක්ෂයකට එම කඩය බදු දෙන්න ඕන.මොකක්ද නැතිනම් කරන වෙළඳාම. එක ඉතිං වෙළෙන්දාගේ ස්වභාවය. අපි එහෙම අවතක්සේරුවෙන් සලකන්න බැහැ. ඊළඟට පළාත් පාලන ආයතන විදියට අපට පණතක් තිබෙනවා. එම පණතට අනුව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් අපි ඒවා තක්සේරු කර ගන්නවා. එම තක්සේරුව තමයි අපේ නිලධාරියා දෙන්නේ. ඉතිං අපේ නිලධාරියා දෙන දේ පිළිගන්න ඕන.ඊට එහා මේ සභාවට අපට අනුමැතියක් දෙන්න බැහැ. ඒ තක්සේරු නිලධාරින්ගේ අනුමැතියට එහා ගිය අනුමැතියක් මට ලබා දෙන්න බැහැ.මා විරුද්ධ වෙනවා. නිත්‍යානුකූල විදියට අපට ඒ තක්සේරු නිලධාරින් ලබා දෙන තක්සේරුව මොනම හේතුවක් නිසාවත් වෙනස් කරන්න හෝ අඩු කිරිමට හේතුවක් නැහැ. එය ආණ්ඩුවේ ලංකාවේ කාටත් රජයේ නිලධාරින් සර්ව සාධාරණව කරන තක්සේරුවකි. එම තක්සේරුවට අනුව මෙම

කඩහිමියන්ගෙන් බදු මුදල් අයකර ගන්නා ලෙස මා ඉතාමත් ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ඒ වගේම මේ ගරු මන්ත්‍රීවරු විවිධ අදහස් ප්‍රකාශ කළා මේ බස්නැවතුම්පොළ සම්බන්ධයෙන්.මාත් නිතර එතැන සොයා බලන නිසා අපි දකිනවා ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා ප්‍රකාශ කළ පරිදි මිට වසර 12කට 15කට පෙර තමයි මේ පරවියන් සඳහමා දැල්ගැසිම හා ලැලි ගැසිම සිදු කළේ. මිට ඉහත කමිටු කිහිපයකදි ඔබතුමා කතා කළා පට පළාත් වලත් වාර්තා ගෙන මෙය සිදු කරන්න කියා. එය පුළුවන් තරම් ඉක්මනට පිළිසකර කර දෙන්න කියා. ඒ වගේ ගිය සෞඛ්‍ය කමිටුවේදි අප තීරණය කළා අර පරවියන් ඡාරා කරන ස්ථාන පිළිබද. සාමාන්‍යයෙන් අපේ කම්කරුවා කරනු ලබන්නේ හොස් එක දමා මේ ස්ථානය සෝදන එක. සෞඛ්‍ය පරිපාලකතුමාට උපදෙස් දුන්නා සම්පූර්ණයෙන් එම ටයිල් එක විම්දමා බ්‍රෂ් එකකින් අතුල්ලා සෝදා දමන්න කියා. එහෙත් ගරු සභාපතිතුමනි එය සිදු වන්නේ නැහැ. ඒ වගේම අපේ කාණුවල යටට දමන ලද යකඩ බාර් ඔක්කොම දිරලා. ඒවා ඇනුනොත් එහෙම පිට ගැස්ම හැදෙනවා. එහෙත් අපෙන් සිදු වුණු අපහසුතා තිබෙනවා.කඩ හිමියන්ට. ඒ වගේම අපි වාහන නතර කිරිමට රථගාලක් ලබා දි තිබෙනවා. දැන් උඩ නාන කාමරය පිළිසකර කර දි තිබෙනවා. ඔබතුමා කිවු පරිදි වසර 2කට පාරක් එය පින්තාරු කරනවා. ඒ වගේම අපි විශාල සේවයක් එයට සපයනවා. වෙනම ආරක්ෂක අංශ සේවාව සපයනවා. ඒ වගේ අඩුපාඩු තිබෙනවා නම් එය දැන්වීම එම කඩහිමියන්ගේ අයිතිය. එ අය නිරන්තරයෙන් අපට දැනුම් දි තිබෙනවා. අපේ සේවකයන් නිරන්තරයෙන් එය සුද්ද පවිත්‍ර කරනවා. අඩුපාඩු තිබෙනවා. දෙපැත්තෙන්ම. දෙපැත්තේම එම කාරණා පිළිගත යුතුයි.විරුද්ධව අදහස් ප්‍රකාශ කිරිමෙන් වැඩක් නැහැ. සියළුම ගරු මන්ත්‍රීවරුන්ට කතා කිරිමේ අයිතිය තිබෙනවා.මට වගේම. මා මේ ගරු සභාවෙන් ඉල්ලා සිටින්නේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් දන්වා එවා ඇති තක්සේරුව අඩු නොකරන ලෙසයි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්තටම න්‍යාය පත්‍රය අනුව තවම සභාව පටන් ගත්තා විතරයි. මේ කඩ කුළි සම්බන්ධව එම කඩහිමියන් දිර්ඝ වශයෙන් පැමිණ අප මුණ ගැසුනා. ඒ අවස්ථාවේ අපි මුණ ගැසිනු අවස්ථාවේ මා කියා සිටියා යම්කිසි වැඩක් කරන කොට නිත්‍යානුකුල පැත්තක් තිබෙනවා. ඒ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් යම්කිසි මුදලක් තක්සේරුවට දමා තිබෙනවා නම් එම තක්සේරුව අසාධාරණයි කියා ඒ අය පිළිගන්නවා නම් ඒ අය කියනවා නම් මා ඒ අයට කිවුවා අභියාචනයක් ඉදිරිපත් කරන්න කියා. එතකොට ඒ අභියාචනා ඉදිරිපත් කර පසු තක්සේරු දෙපාර්තමේන්තුවෙන් පැමිණි අවස්ථාවේ තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්න. විශේෂයෙන්ම කිව යුතු මේ සභාව අපි භාර ගන්න විට සියයට තුන්සියයකින් විතර වරිපණම් වැඩි කර තිබුණා. මා උදාහරණයක් ලෙස කියන්නේ මාගේ නිවසට තිබුණ රු800/= ක් තිබුණ බද්ද රු.2800/= ක් දක්වා වැඩි කළා. අපි ඒ අයටත් කිවුවේ දිගින් දිගටම වරිපණම් වැඩි කරනවා නම් අභියාචනා දමන්න කියා. දැන් ඒ අභියාචනා දැමු අයට සමහර වේලාවට එම මුදල වැඩිවෙලා තිබෙනවා සමහර වේලාවට අඩු වි තිබෙනවා. අපි එම කඩහිමියන්ට කියන්නේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නිත්‍යානුකුලව කිය තිබෙනවා නම් ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කිවු පරිදි අභියාචනා කැඳවා එම අභියාචනා වලින් ලබාදිය හැකි සහනය සලසා දෙන්න කියා. මොකද අපට සභාවක් වශයෙන් තීරණය කරන්න පුළුවන්ද මෙය අඩු කරන්න. අපි ගරු මන්ත්‍රීවරු වශයෙන් තීරණය කරන්න ඕන. ගරු මන්ත්‍රීවරු වශයෙන් අපට මෙය තීරණය කරන් පුළුවන්ද? යම්කිසි මුදලක් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වැඩි කරලා තිබෙනවා නම් මෙය සභාවට කියා අඩු කරන්න බැහැ.

නිත්‍යානුකූල පැත්තක් තිබෙනවා. ඒ අනුව ක්‍රියා කරන මෙන් ඉල්ලා සිටිනවා. මොකද ව්‍යාපාරිකයන් සේම රටේ අනික් පුරවැසියන්. ඒ අය වරිපණම් වැඩිවීම පිළිබඳ නිත්‍යානුකූලව අභියාචනා ඉදිරිපත් කර තිබෙනවා නම් එම ව්‍යාපාරිකයන්ටත් තිබෙන්නේ නිත්‍යානුකූලව අභියාචනා ඉදිරිපත් කර මෙම මුදල අඩු කර ගැනීමයි. මා හිතනවා ගරු මන්ත්‍රීවරු අපට මෙය කරන්න බැහැ. එය පිළිගන්න ඕන. මා එම ව්‍යාපාරිකයන්ට කිවුවා. එමනිසා ඒ අනුව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අපි දිර්ඝ වශයෙන් කතා කරන්න අවශ්‍ය නැහැ. රජයේ විගණන ආයතන මඟින් අපට විගණන වාර්තාවක් ඉල්ලා තිබෙනවා. මෙය වේලාවට තක්සේරු නොකලේ ඇයි කියන එක. අපි මෙය තක්සේරු කර තිබුණ නිසා වාසනාවකට අපට මෙයට පිළිතුරක් යවන්න පුළුවනි. නැතිනම් අපි සියළු දෙනාගෙන්ම අයකරනවා මෙය තක්සේරු කර නියමිත මුදල අයනොකිරිම සම්බන්ධව.එම රජයේ තක්සේරුව ලබා දුන් පසු ඉදිරිපත් කරන ලද අභියාචනා සියල්ලම මා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවට යවා තිබෙනවා. ඒ අනුව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් පරික්ෂණයක් කරාවි. ගරු මන්ත්‍රීවරුන්ට අවශ්‍යතාවයක් තිබේනම් එම තක්සේරු වේලාවට පැමිණ එම නිලධාරින් සමඟ සාකච්ඡා කරන්න කියා ඉල්ලා සිටිනවා. ඒ වගේම කියන්න ඕන අපි බස්නැවතුම්පොල ආරම්භ කරපු අවස්ථාවේදි අපි මෙය සුද්ද කිරිමට අපි සේවාවක් ඇති කළා.එම සේවය ලබා ගත් ආයතනයට අපි රු.114000/= ක මුදලක් ගෙවුවා. ඒ කාලයේ ආරක්ෂක අංශ සේවාව ලබා ගැනිම වෙනුවෙන් ලක්ෂ1 ½ ක මුදලක් ගෙවුවා. විදුලි බිල ගෙව්වා. වියදම් එක්ක සාපේක්ෂව බැලුවාම මට බස්නැවතුම්පොළේ මුදල හරියට මතක නැහැ.මාළු වෙළඳසැලට අපි ණය ගෙවුවා රු.52000/=ක මුදලක්. නමුත් මාළු වෙළඳ සැලෙන් අපට ඒ දිනවල ලැබුණේ රු.26000/= ක මුදලකි. අනිත් එක තේරුම් ගන්න ඕන අපි ව්‍යාපාරිකයන් හැමදාම නඩත්තු කර තිබෙන්නේ අහිංසක ජනතාවගේ මුදල් වලින්. මෙය නතර කරන්න ඕන. අඩුම ගණනේ ව්‍යාපාරිකයා තමන්ගේ වියදමටවත් සලසා ගන්න ඕන.මේ අරගෙන සිටින හැම කෙනාම බදු දි තිබෙන එක නොරහසක් නෙමේ. ඒ වගේම නගර සභාවට රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව කරන තක්සේරුව අභියෝගයකට ලක් කරන්න අපට බලයක් නැහැ. එම අභියාචනයක් ඉදිරිපත් කළාම එම අභියාචනය සම්බන්ධව ජනතාව වෙනුවෙන් කරුණු කියන්න එම අභියාචනයට ගරු මන්ත්‍රීවරුන්ට කරුණු කියන්න පුළුවනි. එතෙක් මේ බද්ද පිළිගැනිමට අපි බැඳි සිටිනවා. ඒ අනුව කටයුතු කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මේ ගිවිසුම කියා තිබෙන්නේ කුමක්ද ?

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ ගිවිසුම අළුත් කිරිම කියන්නේ පළාත් සභාවේදි චක්‍රලේඛයක් දි තිබෙනවා.වසර 3කට සැරයක් ගිවිසුම් ගත වෙන්න ඕන. ගිවිසුමක් වසර 3කට වැඩියේ ගහන්න බැහැ. එම චක්‍රලේඛයේ හැටියට කරන්න වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

චක්‍රලේඛය හරි. වසර 3න් 3ට කිවත් එහි කරුණු කාරණා ටික දැන ගන්න එපැයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමාට එම චක්‍රලේඛයේ පිටපතක් දෙන්නම්

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගිවිසුමේ දිනය වගන්ති වෙනස් වෙනවාද? ඒ කරුණු කාරණා මොනවාද? අළුතින් වගන්ති එකතු වෙනවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහි වෙන තත්ත්වය පිළිබඳ චක්‍රලේඛයේ පිටපතක් සියළු ගරු මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඒ සම්බන්ධව මාධ්‍යවලින් හරි දැනුවත් කරන්න. නැතිනම් ජනතාව හිතාගෙන ඉන්නේ අපි සහ ඔබතුමා මෙය කරනවා කියා. ගරු සභාපතිතුමා මෙහෙම කළා. මට ඇවිත් පෞද්ගලිකව කියා තිබෙනවා. මාධ්‍යයෙන් හරි දැනුවත් කරන්න. මෙය පත්තරයේ ලියන්න කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපට පුළුවන් නීත්‍යානුකූලව පසුබිම තමයි. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව අපට පිළිගන්න වෙනවා. එයට අභියෝගයක් ඉදිරිපත් කර ඇති ලිපි සියල්ලම අපි තක්සේරු දෙපාර්තමේන්තුවට යවා තිබෙන්නේ.ඒ යැව්වාම විරෝධතාවට පැමිණ කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. ඇත්තම කියනවා නම් අපේ කරුණු අපි කියන්න ගියොත් මේ බද්ද මීට වඩා වැඩි වෙන බව මතක තියා ගන්න. මොකද ඊට වඩා අපි වියදම් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

එක තමයි ගරු සභාපතිතුමනි, මාධ්‍යයෙන් හරි පුවත්පත් වල පළ කළානම් හොඳයි මේ පිළිබඳව.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපට වැඩ කරන්න වෙන්නේ පාර්ලිමේන්තුවෙන් පනවන ලද නීතියකට අනුව මිස ඊට පිටතින් කටයුතු කිරිමේ බලයක් අපට නැහැ. අපට හදන්න පුළුවන් නීති හදන්න පුළුවන් . නමුත් මෙකේදි නිතියක් නැහැ. මේ තක්සේරුගත මුදල කියන්නේ රජය මුදල තමයි සලකන්නේ.

**තීරණය-**

අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ කඩකාමර බදුකුලී සංශෝධනය හා ගිවිසුම් අලුත් කිරීම 2019.12.01 දින සිට ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් තක්සේරු දෙපාර්තමේන්තුවේ වාර්තාව අනුව ගාස්තු අයකිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

03.02 **අසාධාරණ ලෙස වැඩිකරන ලද කඩකුලිය අහෝසි කරන ලෙස ඉල්ලීම** යන මැයෙන් අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ වෙළඳ සංකීර්ණයේ කඩහිමියන්ගේ අත්සනින් යුතුව එවන ලද ලිපිය සභාගත කරන ලදී.

ඉහත ලිපියටද 03.01 ලිපිය යටතේ සභාවේ අදහස් දක්වන ලදී.

**තීරණය-**

අසාධාරණ ලෙස වැඩිකරන ලද කඩකුලිය අහෝසි කරන ලෙස ඉල්ලීම යන මැයෙන් අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ වෙළඳ සංකීර්ණයේ කඩහිමියන් විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධයෙන් ඒ සඳහා අභියාචනා ඉදිරිපත් කර ඇති ලිපි තක්සේරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.03 ලොතරැයි කුටි හා දුම්රිය නැවතුමට ප්‍රවේශ මාර්ගයේ ඇති වෙළඳ කුටි පිළිබඳව 2020 වර්ෂයේ අයවැය ලේඛන සංශෝධන කමිටු රුස්වීමේදී ඉදිරිපත් වූ කරුණු අනුව කරන ලද සංශෝධන ගරු සභාවට දැන්වීම සඳහා ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

2020 අයවැය ලේඛණයේ සංශෝධන කමිටු රුස්වීම අනුව එච්.ඩී මෙන්ඩිස් මහතා රු.12000/=, ගර්ලි ෆොන්සේකා මහත්මිය රු.12000/=, කේ.එම්.නන්දසිරි මහතා රු.10000/=,එම්.එම්.මැන්දිස් මහතා රු.10000/=, වයි සුදත් ද සිල්වා මහතා රු.10000/=, එස්.එල් ජයසිංහ මහතා රු.10000/= , කේ.එම්.හේමසිරි මහතා රු.10000/=, වයි.එස්.එම්.ද සිල්වා මහතා රු.10000/=, ජේ.එල්.පියල් මහතා රු.10000/=, ජේ.එල්.පියල් මහතා රු.10000/=, ජේ.එල්.පියල් මහතා රු.10000/= වශයෙන් සංශෝධන කිරීමට ගරු සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

දැන් මේ ලොතරැයි කුඩු අපි දිපු මේවා නේද?

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඔව්. සභාවේ එදා දමන ලද යෝජනා අනුව අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය-**

දුම්රිය නැවතුමට ප්‍රවේශ මාර්ගයේ ඇති වෙළඳ කුටි හා ලොතරැයි කුටි සඳහා 2020 වර්ෂයේ අයවැය ලේඛන සංශෝධන කමිටු රුස්වීමේදී ඉදිරිපත් වූ කරුණු අනුව කරන ලද සංශෝධන අනුව වෙළඳ කුටි සඳහා රු.12000/=ක්ද ලොතරැයි කුටි සඳහා රු.10000/= ක් ලෙස සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.04 තක්සේරු දෙපාර්තමේන්තුව වරිපනම් විරෝධතා පරීක්ෂණයේදී සහන ලබාගැනීම සඳහා ඉදිරිපත්වූ අයගෙන් සහන ලබා දිය යුතු නාමලේඛණය ඇතුළත් ලිපිය 2019 නොවැම්බර් මස මාසික සභාවට ඉදිරිපත් කළද ගරු සභාපතිතුමා විසින් එය 2019 දෙසැම්බර් මස සභාවට ඉදිරිපත් කරන ලෙස කළ යෝජනාව අනුව එය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

තක්සේරු දෙපාර්තමේන්තුව වරිපනම් විරෝධතා පරීක්ෂණයේදී සහන ලබාගැනීම සඳහා ඉදිරිපත්වූ අයගෙන් සහන ලබා දිය යුතු නාමලේඛණය. මොකක්ද මේ. වරිපණම් විරෝධතා පරීක්ෂණය 2019 අම්බලන්ගොඩ නගර සභාව. ලිපිය හා බැඳේ. උක්ත ලිපියට අනුව 2019.06.25 වන දින සිදු කරන ලද වරිපණම් විරෝධතා පරීක්ෂණයට අදාල වාර්තාව මේ සමඟ ඉදිරිපත් කර ඇත. එය ඇමුණුම් අංක 01 පරිදි වේ. මීට අමතරව වරිපනම් අංක හා වාර්ෂික වටිනාකම ලබා දීමේ ක්‍රියාවලිය සිදුකරනු ලබන්නේ තක්සේරු දෙපාර්තමේන්තුව මගිනි. නමුත් විවිධ අවස්ථා වලදී නගර සභාව මගින් වරිපණම් අංක හා වාර්ෂික වටිනාකම ලබා දී ඇත. ඒ සම්බන්ධව තක්සේරු දෙපාර්තමේන්තුවට වගකීමක් ගත නොහැකි බවද දන්වා සිටින බවට ප්‍රධාන තක්සේරුරු විසින් ලිපියක් එවා තිබෙනවා. දේපල 64ක සංශෝධනය වෙච්ච ලැයිස්තුවක් ඒ අය එවා තිබෙනවා. ඒ අනුව ක්‍රියා කරන්න සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

03.05 2019 ජාතික කියවීමේ මාසය අරමුණු කරගනිමින් අම්බලන්ගොඩ මහජන පුස්තකාලය මගින් පවත්වන ලද ශ්‍රී ජිනේන්ද්‍රවංශ ගුණානුස්මරණ තරඟාවලිය සංවිධානය කිරීම සම්බන්ධව කෘතඥතාවය පළකර අම්බලනේගාඩ ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් ස්තුතිය ප්‍රකාශ කර ලිපියක් එවා තිබෙනවා. 2019 ජාතික කියවීමේ මාසය අරමුණු කරගනිමින් අම්බලන්ගොඩ මහජන පුස්තකාලය මගින් පවත්වන ලද ශ්‍රී ජිනේන්ද්‍රවංශ ගුණානුස්මරණ තරඟාවලිය සංවිධානය කිරීම සම්බන්ධව මාගේ කෘතඥතාවය පළකර සිටිනවා. එදින කොළඹ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය සරත් විජේසූරිය මහතා හා තාරකා විද්‍යාඥයින්ට අනුර ශ්‍රී පෙරේරා යන මහතුන් පවත්වනු ලැබූ ඵලදායි දේශන වලට සවන්දීමට විද්‍යාලීයිය දරුවන්ට රැසකට අවස්ථාව උදාකරවීම පිළිබඳ ස්තුතිය පුද කරනවා. මෙවර නට්‍ය අංශයේ ප්‍රථම ස්ථානය ලබාගත් විද්‍යාලීයිය නාට්‍ය කණ්ඩායමට ලබාදුන් රු.25000/= ක මුදලද විවාද අංශයෙන් ප්‍රථම ස්ථානයට ලබාදුන් රු.5000/= ක ත්‍යාගයද සම්බන්ධව ස්තුතිය පුද කර සිටිනවා. මෙවර අප විද්‍යාලයීය ජයග්‍රහණය දරුවන් 72කු සම්බන්ධ හරසරයෙන් මහත් සම්මානයට පාත්‍ර විමත් විද්‍යාලීයිය දරුවන්ට එම දක්ෂතා එළිදැක්විමට අවස්ථාව සම්පාදනය කර දීමත් සම්බන්ධව මා ඇතුළු විද්‍යාලීයිය ආචාර්ය මණ්ඩලය හා පාසැල් ප්‍රජාවගේ ගෞරවනිය ස්තුතිය ප්‍රකාශ කරන බව දන්වා ලිපියක් එවා තිබෙනවා. ඇත්තටම අපි කරන කාර්යය පිළිබඳ විදුහල්පතිවරයෙක් හරි එක්කෙනෙකු හරි අගය කිරිම ගැන සතුටු විය යුතුයි.

**තීරණය-**

2019 ජාතික කියවීමේ මාසය අරමුණු කරගනිමින් අම්බලන්ගොඩ මහජන පුස්තකාලය මගින් පවත්වන ලද ශ්‍රී ජිනේන්ද්‍රවංශ ගුණානුස්මරණ තරඟාවලිය සංවිධානය කිරීම සම්බන්ධව කෘතඥතාවය පළකර අම්බලන්ගොඩ ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවන ලද ලිපිය ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.06 ගඩඩාවේ රාජකාරි කටයුතු සඳහා ලබාදී තිබූ පරිගණකයේ මොනිටරය අක්‍රීයව පවතින බැවින් නගර සභාවේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරී කේ.ටී.රසිනි නිලුෂිකා මිය විසින් පරිගණකය සඳහා මොනිටරයක් ඉල්ලා කරන ලද ඉල්ලීමට අනුව ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ගඩඩාවේ රාජකාරි කටයුතු සඳහා ලබාදී තිබූ පරිගණකය දැනට කැඩී ඇති බැවින් පරිගණකයේ මොනිටරය අක්‍රීයව පවතී. එය අලුත්වැඩියා කිරීම හෝ අලුතින් පරිගණකයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා. සභා අනුමැතියට යටත්ව අලුත් පරිගණකයක් ලබා දීමට කටයුතු කර තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අනුමැතිය දෙනවා . එහි ගැටළුවක් නැහැ. මෙහි මේ මොනිටර්, පරිගණක , ඡායාරූප යන්ත්‍ර ආදි සියල්ලම කැඩෙන්නේ මෙහි මේ දූවිලි නිසා. මේවා තබන ස්ථානය වායුසමීකරණය කර එකතැනකට දමන්න. මෙය වෙන තැනක් ගෙන බද්දට හරි යන්න. මොකද මෙය හරක් ගාල වගේ . අවාම මනුස්සයෙකු යනතැන දන්නේත් නැහැ. කොනක් පටක් නැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

දැනට අපි අලුත්වැඩියා කටයුතු කරගෙන යනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මේ උඩුමහලේ වැඩ තව අවුරුද්දකට කරන්න පුළුවන් වෙයි කියා මා හිතන්නේ නැහැ.තව කොහේද ?

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

තාක්ෂණසේවා නිලධාරි මහතාණෙනි මේ කියන ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න. දැන් උඩුමහලේ අලුත්වැඩියා කටයුතු කිරීම සම්බන්ධව තත්ත්වය පැහැදිලි කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මෙකයි ගරු සභාපතිතුමනි, ඔය පිළිතුරු ඇති අපට. මෙහි දුරකථන අංක ගෙන වැඩක් නැහැනේ. මේ ආයතන තිබෙනවා ඕන තරම්. ඒවා අරගෙන හිහින් මිල ගණන් ගෙන මේවා සභාවට දමන්න. මේ බොරු කතා. මෙය පටන් ගෙන දැන් කොච්චර කාලයක් වෙනවාද?

ඔබතුමලා අවසන් වෙනකම් මෙය උඩට ගන්නේ නැහැ. එහෙම නැතිනම් බද්දට යන්න. නැතිනම් මෙය හදන්න. වාහන තිබෙනවා මෙහි ඕන තරම් අරගෙන ගිහින් දි . මිළ ගණන් කැඳවා විශේෂ ටෙන්ඩර් කමිටුවක් හරි දමා වැඩය කරන්න. නැතිනම් මෙය කවදාවත් කෙරෙන්නේ නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, කාර්මික නිලධාරින් අත වරද පැටවීමට මා විරුද්ධයි. මොකද ඔවුන් යාන්ත්‍රික මිනිසුන් බවට මේ වන විට පත්වෙලා. අරුණ ප්‍රදිප් නම්වූ නායකයාගේ කාර්ය ශූර්ය වැඩ නිසා මේ අය යාන්ත්‍රික මිනිසුන් බවට පත්වෙලා තමයි මේ දෙපල ඉන්නේ. එමනිසා වැඩිපුර වැඩකරන එම නිලධාරින් අපි අභය කළ යුතුමයි. දොස් නොකියූ යුතුයි ඔවුනට.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ගරු ලේකම්තුමියණනි, අපි මේ සුමානේම අපි වාහනයක් දෙනවා . මේ සුමානේම එම වැඩ කටයුතු කර අවසන් කර දමන්න. අපිට මෙය අවසන් කරන්න අවශායි. දැන් අනික් වැඩ කොටස අවසන්. අපට දැන් තිබෙන්නේ මේ ෂැලැබ් එකේ තිබෙන වැඩ කොටස පමණයි. ඇත්තටම පරිගණක ඉතා වේගයෙන් කැඩෙනවා. මටත් ප්‍රශ්නයක්. මෙම පරිගණක සෑදීමට මුදල් ගෙවන එක විශාල ප්‍රශ්නයක්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ඒ දි තිබෙන විස්තර අනුව එක ආයතනයක් නෙමේ. මා තව පින්කෝ ආයතනයට කතා කළා. එම ආයතනයෙන් හෙට දිනයේ හෝ අනිද්දා දිනයේ මෙහාට ඒවි. ඒ අය දින තුනක් ඇතුළත මිළ ගණන් ලබා දෙනවා කිවුවා. ආයතන දෙක තුනක් තිබෙනවා ඔයවගේ විශේෂ දේවල් කරන. ඔය කියන ආයතනයෙන් නෙමේ. පින්කෝ ආයතනයෙන් ඔය කියන ආයතනයෙන් නෙමේ.එතුමන්ලා සභාවට පැමිණෙයි.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මා සභාවට යෝජනාවක් කරන්නම්. දැන් ඔබතුමා එක ආයතනයක් නෙමේ. ඔබතුමා දන්නවානේ තව ආයතන තුන හතරක්. අපි කමිටුවක් වශයෙන් කටයුතු කරන්න කියන්න. ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා , ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා , ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතාගේ කමිටුවකින් සැදුම් යුතු කමිටුවක් ගෙන මෙය සිද්ධ කරන්න බලය පවරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ඇත්තටම මෙය හදන්න ඕන. අපි මේ විවිධ වියදම් දරනවා.දැඩි අපහසුතාවයට පත් වෙනවා. අපි ඔබතුමා කියන වැඩ කරන්න ඕන. අපි මේ නිලධාරින්ට වැඩ කරන්න පුළුවන් පරිසරයක් හදන එක ඔබතුමා ඇතුළු අප සියළු දෙනාගේ වගකීම.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

මෙතැන මේ සභාවක් එන්නේ එක අවස්ථාවක. මගෙන් ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතාණෙනි අහගන්න එපා. කාටවත් සුදුහුණු ගාන්න අපට ඕන නැහැ.

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්

ඔබතුමාට කවි ලියන්න පුළුවන් වුණාට ඔබතුමා මෙය කවි මණ්ඩපයක් කරන්න එපා. මා තව වතාවක් කියන්නේ. අපට ඕනි මේ නිලධාරින්ට වැඩ කරන්න පුළුවන් හොඳ වටපිටවක් සාදා දෙන්න. ගරු සභාපතිතුමනි, ඔබතුමා ඉන්න තැන බලන්නකෝ. මේ නගර සභාවට කවුරුහරි වැදගත් කෙනෙක් ඇතුව වුණොත් ඔබතුමා ඉන්න තැන බලන්නකෝ. ඔබතුමා අරුණ ප්‍රදීප් කියන එකවත් කමල් වැල්ලගේ කියන එක වත් නෙමේ. අම්බලන්ගොඩ නගාරාධිපතිවරයා. ඉන්න තැන හොඳයි ද? අපි කැමති නැහැ. ඔබතුමා හරි තැනක ඉන්න. මේ නිලධාරින්ට ඉන්න පුළුවන් තැනක් හදලා දෙන්න. එමනිසා ඔය නිලධාරිතුමා කියන කතා හැමදාම ඔය බයිලා අහලා වැඩක් නැහැ. ටිකක් ප්‍රායෝගික වෙන්න. ඔබතුමා නගාරාධිපතිතුමාගෙන් වාහනයක් ඉල්ලා ගෙන ගිහින් එය බලන්න. අපේ ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කිවු එම ආයතනය තමයි ලංකාවේ අංක එකේ වොටර්පෲෆින් පිළිබඳ හා ඕවැනි නඩත්තු පිළිබඳ තිබෙන අංක එකේ එකම ආයතනය .ඒ අය තමයි හොඳම කෙමිකල් එක තිබෙන්නේ. ඔස්ට්‍රේලියානු කෙමිකල්. වෙනත් ඒවත් තිබෙනවා. මා කියන්නේ ඒවගේ දේවල් පාවිච්චි කරලා මේ කටයුත්ත කරන්න. මේ නිලධාරින්ට මෙවැනි පිළිතුරු අපි බලාපොරෝත්තු වෙන්නේ නැහැ. මේ සභාවේ. හැමදාම මෙය අන්දවන්න එපා. නිලධාරින් කිහිප දෙනෙක් අතර බිත්තර දමන ලද කුකුළ් පැටව් වගේ කූඩුවල ලැඟලා ඉන්නවා. ඒ අයට ඉන්න මානසික සුවයක් නැහැ. වැඩ කරන්න පුළුවන් පහසුකමක් නැහැ. ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා කියන කතාව සාධාරණයි. එමනිසා අපි බොහොම කනගාටු වෙනවා. ඔබතුමා ඉන්න තැන ගැනත් අපි බොහොම කනගාටු වෙනවා. අපි බලාපොරෝත්තු වෙන්නේ නැහැ එහෙම. නගරාධිපති කෙනෙක් වුණාම එම ගෞරුත්වය තිබෙන්න ඕන. පුද්ගලයා නෙමේ . තනතුරේ ගෞරුත්වය තිබෙන්න ඕන. සභාවක ගෞරුත්වය තිබෙන්න ඕන. එමනිසා ගරු මන්ත්‍රිවරුන්ගේ ගෞරුත්වය ආරක්ෂා වෙන්න ඕන. නිලධාරින්ට වැඩ කරන්න පුළුවන් වටපිටාවක් හැදෙන්න ඕන. කරුණාකරලා අපි ඔබතුමාගෙන් ඉල්ලන මේ පලවෙනි කාරණය . දැන් පිට්ටනිය හැදිගෙන යනවා. කරුණාකරලා මේ සියළු මුදල් යොදා මේ නගර සභා ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණ කටයුතු කර දෙන්න. ඔබතුමාත් නිසි තැනට යන්න. මේ පුස්තකාලය පුස්තකාලයට පවරන්න. අපිත් අතර යන්න. මේ නිලධාරින්ට වැඩ කර දෙන්න වටපිටාවක් සාදා දෙන ලෙස මා ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අපි හෙටම යන්න.

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

මෙහෙම කරන්න බැහැ. මේ ආයතනය මෙතැනට ගෙන්වා ගන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාණෙනි , ඒ අය එන්නේ කවදාද? අපි වගකීම භාර ගන්නවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මේ අය ගෙන්වා ගන්න ඕන. අපි එතැනට ගිහිල්ලා බලන්න බැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි අපි එය කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ විශාල විරෝධතාවයක් මෙයට තිබෙන්නේ. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් කතා කරන්න කලින් ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු විදියට අපි මේ ගැන හොයා බැලුවා. මාස 6ක් තිස්සේ මා ඔය ගොඩනැඟිල්ලට නැග්ගා. නමුත් එය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඉතිං එමනිසා වෙන්නේ නැති කොට මේ කණුව එච්.ආර්. එකට කරන්න දෙයක් නැහැ. ඉතිං කරන්න දෙයක් නැහැ. මේ උළුවහු හදන්න තිබෙනවා. එහෙම නෙමේ ගරු සභාපතිතුමනි, මේ මාසයක වැඩක්. මෙය හදන්න යන්නේ මාසයයි. මේ කොන්ත්‍රාත්කාරයෝත් මේ සභාවේ සිටිනවා. හැබැයි රජයේ නියමයන්ට අනුව මේ කටයුතු කිරිම අනුව තමයි මේ ප්‍රමාදය වන්නේ. මේ කමිටුව දැම්මාත් වැඩක් නැහැ ඒ පිළිබඳ වාර්තාවක් නැතිනම්. අඩුම වශයෙන් සතියක දවසක් හෝ ඊළඟ සභාවට මෙහි වුණේ මොකක්ද කියා වාර්තාවක් ලබා දෙන්න.මෙය කොතනද තිබෙන්නේ කියා. මේ නිලධාරින්ගෙන් ප්‍රධානම වන වරද තමයි පසු විපරමක් නැතිකම. මේ සභාවේ අපි මරලතෝනි දී යනවා. ඊටපසු එය හමස් පෙට්ටියට යනවා. එය වැඩක් නැහැ. එම යෝජනා වෙච්ච ඒවා වත් එවාට ගත් ක්‍රියා මාර්ග වත් පසු විපරමක් නැහැ. මේ කට කැඩෙනකන් කියලා මා මේ කතා කරන්නේ. එක වතාවක් කියා නෙමේ. සියළුම නිලධාරීන් සමඟ මෙය කතා කරලා තිබෙනවා. ඉතිං සමහර අය කොහේ කොහේ හරි හිරවෙලා. ඉතිං අපි මහින් මහටම කියා තිබෙනවා පසු විපරමක් කරන්න කියා. කෙරෙන්නේ නැති වුණාම තමයි මේ සභාව අපහසුතාවයට ලක් වෙන්නේ. ඉතිං මෙය පුවත්පත් වල යෝධ අකුරෙන් වැටුනාම මුළු ලංකාවම දැන ගනිවි ඉන්න සභාවම හදා ගන්න බැහැ කියා. මේක තමයි වෙන්නේ. ඇත්ත තත්ත්වය එක. එමනිසා අද දිනයේ සිට මාසයක් ඇතුළත මෙය හදන තත්ත්වයට පත් කරන්න. අරහෙට කතා කළා. මෙහෙට කතා කළා. මේ ආයතනය ඉන්නවා. මේක තමයි රජයේ නියමයන්ට අනුව අපි වැඩ කටයුතු කරන්න ඕන. ඒක තමයි රජය විසින් සම්පත් ලබා දී තිබෙන්නේ. මේ ආයතනයට වාහන කියක් තිබෙනවාද ගරු සභාපතිතුමනි, මේ නිලධාරින් දෙදෙනෙකු ඒ වෙනුවෙන් මෙය නිම වෙනකම් යොදවන්න පුළුවන්නේ. එමනිසා ලබන මාසේ වැඩ පටන් ගෙන මෙය මෙන්න මේ තත්ත්වයේ තිබෙනවා කියන තැනට ගන්න. කිසිම මූල්‍ය දුෂ්කරතාවයක් නැතිනම් කිසිම අපහසුතාවයක් නැතිනම් එහෙනම් අපේ අකර්මණ්‍යතාවයයි මෙහි පිළිබිඹු වෙන්නේ. ෆින්කෝ ආයතනයෙන් කරනු ලබන්නේ මෙහි බිත්ති සවිකිරිම පමණයි. වහල සම්බන්ධව කටයුතු කරනවාද? හා අසන්නේ ඔබතුමලාගේ ප්‍රධාන ඉංජිනේරුතුමා උපදෙස් පරිදි ඒ ෆින්කෝ ආයතනයෙන් කරනු ලබන්නේ බිත්ත සවිකිරිම පමණයිනේ. වහල සම්බන්ධව කටයුතු

කරන්නේ නැනේ. එහෙනම් ඔබතුමාට පුළුවන් වහල සම්බන්ධව දැන් තිරණය කරන්නේ කුමක්ද කියා හිතන්න. එහි වැඩකටයුතු ඔක්කොම අවසන් වුණාට පසු තමයි වහල ගැන හිතන්නේ. එහෙම ක්‍රමයක් නැහැ. අද තීරණය කරන්න වහලට අවශ්‍ය බඩු ගෙන්වන්න. වහලේත් ප්‍රශ්නයක් තිබෙනවා . අර අපි හිටි ශාලාවේ එච්.ආර්. එකක් තිබෙනවා. මොකද මේ සභාවෙන් මාස 3ක් ගන්නවා සභාවට අවශ්‍ය බඩු ගන්න. කොහොම කොහෙම හරි අපි අත්සන දෙන්නම්. ගන්න අනුමැතිය දෙන්නම්. හැබැයි ඕගොල්ලන්ගේ අනුමැතිය දෙන්න. අඩුම තරමේ ඔගොල්ලන් ඉන්න තැන හදා ගන්නේ නැතිව වෙන මොකක්ද කරන්නේ. එමනිසා ලබන මාසේ මේ සභාව වෙන කොට මෙහි වැඩය පටන් ගෙන තිබෙන්න ඕන.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

මා පෞද්ගලික ආයතනයකට කතා කළා. ඒ අය අලුත්ගම සංචාරක ආයතනයක වැඩකට පැමිණෙනවා කිවුවා. එම සමාගමේ වෝටර්පෘපින් ඉංජිනේරු මහතා හා අනිත් ඉංජිනේරු මහතා ඔබතුමා පැමිණ මුණ ගැසෙන්නම් කිවුවා. බ්‍රහස්පතින්දා දින. ඒ අය ඔක්කොම පැමිණියාම අපට එකතුවෙලා තින්දුවකට යන්න පුළුවන්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

අද ගරු මන්ත්‍රීවරුන්ට ගිහින් බලන්න පුළුවනි. අද 12.30 වන විට එතුමා පැමිණෙනවා කිවුවා.ෆින්කෝ ආයතනයේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

හොඳයි අපි තින්දුවක් ගන්නම්. මේ සම්බන්ධව තින්දු ගැනීමේදි කමිටුවක් වශයෙන් මා , ගරු නගර සභා මන්ත්‍රි ධම්මික කොඩිකාර මහතා,ගරු නගර සභා මන්ත්‍රි රාහුල මහතා, ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා , ගරු නගර සභා මන්ත්‍රි සරත් චන්ද්‍ර මහතා යන අය සැම පක්ෂයක්ම නියෝජනය වෙන ආකාරයට මෙහි තින්දුවක් ගැනිමට සභාවේ එකඟතාවයක් ලබා දෙනවාද? මා යෝජනා කරනවා . කවුරුහරි ස්ථිර කරන්න. ගරු උප සභාපතිතුමාත් එම කමිටුව ඇතුළත් කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

එය මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ නගර සභාවේ කාර්යාල ගොඩනැඟිල්ල සාදා නිම කිරිම සඳහා ඉදිරි කටයුතු සම්බන්ධයෙන් ඒ ටෙන්ඩර් කිරිම්, ඒ ටෙන්ඩර් ප්‍රධානය කිරිම් ඒ සම්බන්ධයෙන් සියළු අවසාන තින්දු ගැනිමේ බලය අදාල කමිටුවට ගැනිම සඳහා සභාව තින්දු කරන ලදි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා මේ මස 11 දා සිට දින 10ක් ලංකාවේ නැහැ. ඊට කලින් එන හැම දෙයකටම මා සහභාගි වෙනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මේ සම්බන්ධව කතා කරන නිසා කිව යුතුයි. මේ වාර්තාව අනුව ඒ සැලසුම් දෙකම එම පෞද්ගලික ආයතනයෙන් ඉටු කර දෙන්න. එම නිසා එච්චර වැඩ කොටසක් වෙන්නේ නැහැ. අදාල ආයතනය සොයා ගැනීම පමණයි සිදු විය යුත්තේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැන් සභාව බලය දුන්නානේ. අපි ක්‍රියාත්මක කරන්න. නැතිනම් අපට සභාව හැමදාම කැඳවන්න ඕන.

තීරණය-

ගඩඩාවේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරී කේ.ටී.රසිනි නිලූෂිකා මිය විසින් පරිගණකය සඳහා මොනිටරයක් ඉල්ලා කරන ලද ඉල්ලීමට අනුව රාජකාරි කටයුතු සඳහා ලබාදී තිබූ පරිගණකයේ මොනිටරය අක්‍රීයව පවතින බැවින් නගර සභාවේ එය ලබාදීම සුදුසු බවටත් , මේ පරිගණක නිතරම අක්‍රියවීමට හේතුව සභා කාර්යාලය දූවිලි සහගත විම නිසාත් මේ කාර්යාලිය ගොඩනැගල්ලේ අළුත්වැඩියා කිරිමේ කටයුතු සිදු කිරිම සඳහා ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා , ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා , ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා,ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පතියන්දුවගේ මහතා , ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා යන පිරිසගෙන් සැදුම් ලත් කමිටුවට , අම්බලන්ගොඩ නගර සභාවේ කාර්යාල ගොඩනැඟිල්ල සාදා නිම කිරිම සඳහා ඉදිරි කටයුතු සම්බන්ධයෙන් ඒ ටෙන්ඩර් කිරිම්, ඒ ටෙන්ඩර් ප්‍රධානය කිරිම් ඒ සම්බන්ධයෙන් සියළු අවසාන තින්දු ගැනිමේ බලය ගැනිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 03.07 2019 ඔක්තෝබර් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව සභාගත කරන ලදී.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව. ඒ අනුව ඉදිරිපත් කරනවා. ආයතනයෙහි සායන තැබූ දින ගණන 22 කි, ආයතනයට මාසය තුළ ප්‍රතිකාර කරනු ලැබූ රෝගීන් සංඛ්‍යාව 448, රෝගීන් පැමිණිමේ දෛනික සාමාන්‍ය ගණන 20, මාසය සඳහා වැය වූ ඖෂධවල මුළු වටිනාකම රු.46096.21, එක් රෝගියෙක් සඳහා වැය වූ මුදල රු.102/=. ඒ අනුව කටයුතු කර තිබෙනවා.

තීරණය-

2019 ඔක්තෝබර් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

**03.08 මාසික සභා රැස්වීමට අදාල රාජකාරි කටයුතු සිදුකිරීම සඳහා නගර සභාවේ සේවයේ නියුතු කළමනාකරණ සහකාර වාසනා ශ්‍රීමාලි මිය විසින් පරිගණකයක් ඉල්ලා කරන ලද ඉල්ලීමට අනුව ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මාසික සභා රැස්වීමට අදාල රාජකාරි කටයුතු සිදුකිරීම සඳහා නගර සභාවේ සේවයේ නියුතු කළමනාකරණ සහකාර වාසනා ශ්‍රීමාලි මිය විසින් පරිගණකයක් ඉල්ලා ඇත. ඒ අනුව කටයුතු කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, දැන් ඔය නිලධාරින් ඉල්ලනු ලබන පරිගණක මිලදි ගැනීමේදි අපේ තාක්ෂණසේවා නිලධාරි කෙනෙකු සිටිනවානේ. එයා විසින් මෙන්න මේ වර්ගයේ මෙන්න මේ ධාරිතාවක් තිබෙන ඒවා කියා ටෙන්ඩර් කරන්න. ටෙන්ඩර් විවෘත කළ පසු අපි අපහසුතාවයට පත්වෙනවා කොයි වර්ගයේ ඒවාද මිලදි ගැනිමට අනුමැතිය දෙන්නේ කියා. එයා විසින් නිර්දේශ ලබා දෙන්න ඕන.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පිරිවිත ගන්නවා .

තීරණය-

මාසික සභා රැස්වීමට අදාල රාජකාරි කටයුතු සිදුකිරීම සඳහා නගර සභාවේ සේවයේ නියුතු කළමනාකරණ සහකාර වාසනා ශ්‍රීමාලි මිය විසින් පරිගණකයක් ඉල්ලා කරන ලද ඉල්ලීමට අනුව එය සභා අනුමැතියට යටත්ව ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාවට ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.09 අම්බලන්ගොඩ නගර සභා ආපන ශාලාවේ ටෙන්ඩර් කාලය 2019.12.31 දිනට අවසන් වන බැවින් ඒ සම්බන්ධව ඉදිරි කටයුතු සඳහා ලිපිගොනුව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ නගර සභා ආපන ශාලාවේ ටෙන්ඩර් කාලය 2019.12.31 දිනට අවසන් වන බැවින් එය 2020.01.01 සිට2020.12.31 දින දක්වා බදු දිම සඳහා මාසික අවම කුළිය රු6518..74 මුදලක් අයකිරිමට යෝජනා කර ඇත. වාර්ෂික බදු මුදල ( අවම ලංසුව රු.78224.88, ටෙන්ඩර් ඇප රු.5000/=, ටෙන්ඩර් පෝරම රු.500/= විදුලිය සඳහා ඇප රු.5000/=, ජල ගාස්තුව සඳහා ඇප රු.3000/= . ඒ සඳහා අනුමැතිය ඉල්ලා සිටිනවා.

තීරණය-

අම්බලන්ගොඩ නගර සභා ආපන ශාලාවේ ටෙන්ඩර් කාලය 2019.12.31 දිනට අවසන් වන බැවින් ඒ සම්බන්ධව ඉදිරි කටයුතු සඳහා ආදායම් පරික්ෂක වාර්තාව අනුව ටෙන්ඩර් කිරිමට සුදුසු ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනි පේෂලා කුමාරි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.10 2019.11.08 දින අයවැය කෙටුම්පත් සාකච්ඡාවේදී ප්‍රචාරණ ගාස්තුව හා විනෝද බදු ප්‍රතිශතය සංශෝධනය කිරිම 2020.01.01 දින සිට ක්‍රියාත්මක කිරිමට ගැසට් පත්‍රයේ පළ කිරිමේ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2019.11.08 දින අයවැය කෙටුම්පත් සාකච්ඡාවේදී ප්‍රචාරණ ගාස්තුව හා විනෝද බදු ප්‍රතිශතය සංශෝධනය කිරිමේ උප ලේඛණය පහත පරිදි වේ. තාවකාලික දැන්වීම් සඳහා සති 01ක් සඳහා වර්ග අඩියකට රු.100/=, සති 2ක් සඳහා තාවකාලික දැන්වීම් සඳහා රු.200/=, මාස 3ක් සඳහා තාවකාලික දැන්වීම් වර්ග අඩියකට රු.250/=, ස්ථිර දැන්වීම් සඳහා ආලෝකය සහිතව රු.450/=, එල්ඩීඩී දැන්වීමටක වර්ග අඩියකට රු.1000/= ක් ලෙස එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වගේම අම්බලන්ගොඩ නගර සභා මසික රැස්වීමේ 2019.09.03 දින පැවති සභා තීරණ අංක 05.01.03 යටතේ විනෝද බදු ප්‍රතිශත පහත පරිදි සංශෝධනය කරන ලදී. නගර සභා සීමාවේ පවතින පරිපාලන සිමාවේ ප්‍රදේශයේ පවතින යම් විනෝද කටයුත්තක් වෙනුවෙන් ගාස්තු ලෙස රු.1000/= ක් සඳහා 10% ක්ද , රු.1000/= ට වැඩි වන විට 15% ක් ලෙසත් මේ විනෝද බදු ප්‍රතිශත විෂයභාර ආමාත්‍යතුමා විසින් ගැසට් පත්‍රයේ පලකරන දිනයේ සිට ක්‍රියාත්මක කිරිමට අනුමත කරන අතර මෙතෙක් පැවති විනෝද බඳ ප්‍රතිශතය අනුව සිනමා ශාලාවලින් 10% ගාස්තු ප්‍රතිශතයක් වන අතර අනික් විනෝද බදු කටයුතු වෙනුවෙන් අයකිරිම 25% ක් වේ. ඒ අනුව 2020.01.01 අනුව ක්‍රියාත්මක විමට නියමිත ගැසට් පත්‍රයේ පලකරන ආකාරයෙන් පළ කිරිමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

2019.11.08 දින අයවැය කෙටුම්පත් සාකච්ඡාවේදී ප්‍රචාරණ ගාස්තුව හා විනෝද බදු ප්‍රතිශතය සංශෝධනය කිරිම 2020.01.01 දින සිට ක්‍රියාත්මක කිරිමටත් විෂයභාර ආමාත්‍යතුමා විසින් ගැසට් පත්‍රයේ පලකරන දිනයේ සිට ක්‍රියාත්මක කිරිමට අනුමත කරන අතර මෙතෙක් පැවති විනෝද බඳ ප්‍රතිශතය අනුව සිනමා ශාලාවලින් 10% ගාස්තු ප්‍රතිශතයක් වන අතර අනික් විනෝද බදු කටයුතු වෙනුවෙන් අයකිරිම 25% ක් ලෙස අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.11 අම්බලන්ගොඩ , එඬේරමුල්ල , අංක 15 නිවසේ පදිංචි සී.එච් ලියනගේ මහතා විසින් ආගමික කටයුත්තක් සඳහා නොමිලේ බැනරයක් ප්‍රදර්ශනය කිරිමට අවසර ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

සී.එච් ලියනගේ මහතා, අංක 15, අම්බලන්ගොඩ , එඬේරමුල්ල ප්‍රදේශයේ පදිංචි ආගමික කටයුත්තක් සඳහා නොමිලේ බැනරයක් ප්‍රදර්ශනය කිරිමට අවසර ඉල්ලා තිබෙනවා. අම්බලන්ගොඩ ශ්‍රී මහින්දාරාමයේ නොමිලේ පැවැත්වෙන අභිධර්ම පන්තිය පිළිබඳ පිංවතුන් දැනුවත් කිරිම පිළිබඳ අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ ඉදිරිපිට පුංචිපොළට හැරෙන තැන අඩි 3,4 බැනරයක් ප්‍රදර්ශනය කිරිමට අවසර ඉල්ලා සිටිනවා.2019 වසරේ අපට මෙම අවස්ථාව ලබා දී අතර ඒ පිළිබඳ ස්තුතිය ප්‍රකාශ කරනවා. එය ගාස්තුවෙන් තොරව බැනරය ප්‍රදර්ශනය කිරිමට අවසර ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ , එඬේරමුල්ල , අංක 15 නිවසේ පදිංචි සී.එච් ලියනගේ මහතා විසින් ආගමික කටයුත්තක් සඳහා නොමිලේ බැනරයක් ප්‍රදර්ශනය කිරිමට අවසර ඉල්ලා ඇති ලිපිය අනුව ආදායම් පරීක්ෂක මහතාගේ නිර්දේශය පරිදි සහා බල ප්‍රදේශයේ ඇති ස්ථිර දැන්වීම් පුවරු තුළ පමණක් ප්‍රදර්ශනය කිරිමට අවසර ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව අනුව නගර සභා සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.12 මහ අම්බලන්ගොඩ ග්‍රාමීය වැඩිහිටි සංවිධානයේ සුහද හමුව 2019.12.10 දින අම්බලන්ගොඩ ධීවර සංකීර්ණයේදී පැවැත්වෙන බවත් ඒ සඳහා ප්ලාස්ටික් පුටු 100 ක් ලබාදෙන ලෙසත් ප්‍රවාහන පහසුකම් සලසා දෙන ලෙසත් ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදි.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

මහ අම්බලන්ගොඩ ග්‍රාමීය වැඩිහිටි සංවිධානයේ සුහද හමුව 2019.12.10 දින අම්බලන්ගොඩ ධීවර සංකීර්ණයේදී පැවැත්වෙන බවත් ඒ සඳහා ප්ලාස්ටික් පුටු 100 ක් ලබාදෙන ලෙසත් ප්‍රවාහන පහසුකම් සලසා දෙන ලෙසත් ඉල්ලා සිටිනවා.

**තීරණය-**

මහ අම්බලන්ගොඩ ග්‍රාමීය වැඩිහිටි සංවිධානයේ සුහද හමුව 2019.12.10 දින අම්බලන්ගොඩ ධීවර සංකීර්ණයේදී පැවැත්වෙන බවත් ඒ සඳහා ප්ලාස්ටික් පුටු 100 ක් ලබාදෙන ලෙසත් ප්‍රවාහන පහසුකම් සලසා දෙන ලෙසත් ඉල්ලා ඇති ලිපිය අනුව එය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව අනුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.13 අම්බලන්ගොඩ , හිරේවත්ත සුනාමි නිවාස ආරක්ෂා වීමට ඉදිකර තිබූ ගල්වැටිය සුනාමි අවස්ථාවේදී ගැලවී යාම හේතුවෙන් කොන්ක්‍රීට් අතුරා හෝ ගල්වැටිය ආරක්ෂා කරදෙන ලෙස අම්බලන්ගොඩ,හිරේවත්ත,අංක 53 ලිපිනයේ පදිංචි ආර්.එම්.ඥාණසිරි මහතා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ , හිරේවත්ත සුනාමි නිවාස ආරක්ෂා වීමට ඉදිකර තිබූ ගල්වැටිය සුනාමි අවස්ථාවේදී ගැලවී යාම හේතුවෙන් කොන්ක්‍රීට් අතුරා හෝ ගල්වැටිය ආරක්ෂා කරදෙන ලෙස අම්බලන්ගොඩ,හිරේවත්ත, අංක 53 ලිපිනයේ පදිංචි ආර්.එම්.ඥාණසිරි මහතා . ඉහත ලිපිනයේ පදිංචි මා 2019.01.10 දින රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා මේ වනවිටත් ලිපියකින් දැනුවත් කර ඇත.2004.04.26 දින පැවති මුහුද ගොඩගැලූ අවස්ථාවේ ගල්වැටියේ අඩි 03ක් ඇතට විසිවී මීටර් 15ක් ඇත ගල්වැටියේ නිවාස අඩි 2ක පමණ ප්‍රමාණයකට මුහුදු ජලයෙන් වැසි ගියේය.එම ගල්වැටිය තුළින් අතුරා ඇති රෙද්ද පවා විවෘතව පෙන්වා දීමට මුහුදු ජලය පැමිණ ඇති බව ගල්වැටිය පරික්ෂා කිරිමේදි ඔබතුමාට දැකගත හැකිවිය. එබැවින් ගල්වැටියේ ගල් ආරක්ෂා වීමට අඩියක් පමණත් අඩි හයක් පමණ පළලටත් කොන්ක්‍රිට් අතුරා අවශ්‍ය පරිදි සකස් කිරිම ගම්වැසියන්ගේ ස්ථිර විසඳුමයි. මේ ආකාරයෙන් ආරක්ෂා කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටි. අපි සභාව මගිනුත් මේ ඉල්ලිම කරන බව අපි දන්වා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

වෙරළ රක්ෂණ දෙපාර්තමේන්තුවට මේ සම්බන්ධව දන්වා යවා තිබෙනවා. රළ ගහන අවස්ථාවල ජලය පැමිණියාම නිවෙස්වලට තමයි එය බලපාන්නේ. මා ඉල්ලා සිටිනවා එම ගල්වැටිය තාවකාලිකව හරි කොන්ක්‍රිට් දමා අතුරා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි මෙම ඉල්ලිම වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට දන්වා යවන්න.

**තීරණය**

අම්බලන්ගොඩ , හිරේවත්ත සුනාමි නිවාස ආරක්ෂා වීමට ඉදිකර තිබූ ගල්වැටිය සුනාමි අවස්ථාවේදී ගැලවී යාම හේතුවෙන් කොන්ක්‍රීට් අතුරා හෝ ගල්වැටිය ආරක්ෂා කරදෙන ලෙස අම්බලන්ගොඩ,හිරේවත්ත,අංක 53 ලිපිනයේ පදිංචි ආර්.එම්.ඥාණසිරි මහතා විසින් එවා ඇති ලිපිය අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමුකිරීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.14 සංචාරක කර්මාන්තශාලාවලින් 1% ක බදු මුදලක් අයකිරීම යන මැයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් 2019.11.26 දාතමින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පළාත් පාලන කොමසාරිස් කාර්යාලය .ගාල්ල. සංචාරක කර්මාන්තශාලාවලින් 1% ක බදු ගාස්තු පැනවීම.උක්ත කරුණ සම්බන්ධ මා අමතන ලද පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය හා බැඳේ.එම ලිපිය මඟින් ආමාත්‍යාංශ හොටෙල් සංගමේ සභාපති 2019.08.19 දිනෙන් සංචාරක හොටෙල් සහ නවාතැන් සඳහා බලපත්‍ර ගාස්තු අයකිරිම මහ නගර සභා නගර සභා ආඥා පණතේ ප්‍රකාරව ඔවුන්ගේ ආදායමෙන් 1% ගාස්තු අයකිරිම ගැටළු සහගත බැවින් ඉහත

කර්මාන්ත වලට සාපෙක්ෂව බදු මුදල් අයකිරිම හෝ එම බදු මුදල් නිදහස් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. ඒ අනුව බදු මුදල් ප්‍රමාණය සංශෝධනය කිරිම කළ යුතු අතර ඊට අදාල ප්‍රතිපත්තිමය තින්දුව සොයා ඔබ පළාත් පාලන ආයතනයේ ආදායම් උත්පාදනය කිරිමට යෝජිත සංවර්ධනය කිරිමට සිදුවන බලපෑම් පිළිබඳ යථෝක්ත ඉල්ලිම පිළිබඳ ඔබගේ නිරික්ෂණ හා නිර්දේශ ලිඛිතව ආමාත්‍යාංශය වෙත දැනුම් දිම පිළිබඳ නොපමාව වාර්තා කරන ලෙස ඉල්ලා ඇත. ඒ අනුව හොටල් වලින් 1% බද්දක් අර ගන්නවා අපේ බදු වශයෙන්. එය සංශෝධනය කිරිමට පළාත් පාලන ආයතනයෙන් අදහස කුමක්ද කියා අසා තිබෙනවා. මෙය ලංකාවේම කළ යුතු දෙයක්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

මෙයට අපට බලපාන බලපෑම කුඩා වුවත් මෙය විශාල දෙනෙකුට බලපානවා. අනිත් පැත්තට ගරු සභාපතිතුමනි කාමර 52ක හරි 60ක හරි සංචාරක හොටලයක අපට නගර සභාවෙන් කුණු ඇදිම සම්බන්ධව අපට ලැබෙන ආදායම කුමක්ද? බලපත්‍රය විතරයි. පණතින් විතරයි. එමනිසා ඔය පණතේ තිබෙන 1% අය නොකරන එක වෙනම කතාවක්.නමුත් එය තිබෙන්න හරින එක තමයි කියන මතයේ තමයි මා සිටින්නේ. අනාගතයේදි යම් විදයකට මේ අයකිරිම නෙමේ මා කියන්නේ පණතේ තිබෙන විදියට පණතේ තිබෙන්න හරින කියන එක . අනාගතයේ සංචාරක හොටල් කර්මාන්තයත් එක්ක ඒ පහසුකම් නගර සභාව සපයන්න ඕනනේ. එහෙමනම් රු.3000/= කට මේ සියළු දේවල් සුපිරි හොටල් වලටත් ලබා දෙන්න. ඉතිං ඒ 1% අපට තිබෙන ආදායමක් පණතේ. එය තිබෙන්න හරින එක තමයි මගේ යෝජනාව.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

දැන් මෙය අම්බලන්ගොඩ මේ බද්ද ගෙවන්නේ සෙනෙත්ක්වින් ආයතනය , අම්බලන්ගොඩ සමන් රෙස්ටුරන්ට් ආයතනය , බ්ලූ හොරයිසන් හෝටලය ගෙවනවා. ආර් කියන සමාගම ගෙවනවා.ජුසි ආයතනය ගෙවන එක පැහැර හරිනවා. ඒ සම්බන්ධව ඉදිරියට නඩු දමන්න බලාපොරෝත්තු වෙනවා. එ ගොල්ලන් විතරයි ගෙවන්නේ . අනික් කිසි කෙනෙකුට මේ බද්ද පැනවෙන්නේ නැහැ. ඒ අය මෙහි බලපත්‍රය ගන්න ඕන නිසා මේ මුදල ගෙවනවා. අපට ගෙවිම් නොකර ඒ අයට බලපත්‍රය ගන්න බැහැ. මේ සම්බන්ධව අපේ එකඟතාවයක් නොමැති බව ප්‍රකාශ කරනවා.

තීරණය-

**සංචාරක කර්මාන්තශාලාවලින් 1% ක බදු මුදලක් අයකිරීම** යන මැයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් 2019.11.26 දාතමින් එවා ඇති ලිපිය ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කළ අතර ඒ සම්බන්ධව එකඟතාවයක් නොමැති බවට තීරණය විය.

**03.15 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනය සම්බන්ධව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය හා අම්බලන්ගොඩ නගර සභාව අතර ඇතිකර ගන්නා අවබෝධතා ගිවිසුම සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ මහජන ක්‍රිඩාංගනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ගිවිසුම සංශෝධනය කරන්න කියා පැමිණ තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපට මේවා උදේ ලැබුණේ. කියවන්න වුණේ නැහැ. මෙහි එකින් එක කියවන්න ඕන. හිමින් සැරේ කියවන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

1987 අංක 18 දරණ නගර සභා ආඥා පණතේ 255 වන අධිකාරිය යටතේ විධිමත්ව සංස්ථාගත කල හා වරින් වර සංශෝධන සහිත සකස් කරන ලද හා සකස් කරනු ලබන අම්බලන්ගොඩ නගර සභාවේ අතුරු ව්‍යවස්ථාව හා ඊට අදාල කොන්දේසි වලට අනුව කොන්දේසි ටික විතරක් කියෙව්වාම ඇතිනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

කොන්දේසි නෙමේ. උඩ එකේ සටහන් වෙන්නේ නැද්ද දින වකවානු.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තිබෙනවා. ඉන්න කියවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එක කියෙව්වේ නැහැ. බලපවත්වනු ලබන කාලය.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

උඩ විස්තර කරන්නේ දෙපැත්තේ නම්දෙක තමයි. අංක 01 දෙවන පාර්ශවය විසින් ප්‍රදේශයේ ක්‍රිකට් ක්‍රිඩාවේ නිරත වන පාසැල් සහ ක්‍රිඩා සමාජයන් හි ක්‍රිඩකයන්ගේ අභිවෘද්ධිය උදෙසා ප්‍රදේශයේ ක්‍රීඩකයන් හට  පුහුණු විම් , තරඟ පැවැත්වීම් සහ ඒ ආශ්‍රිත ක්‍රිකට් ක්‍රිඩාවේ නිරත වීම සඳහා නිර්මිත  පහසුකම් වලින් අනුන ක්‍රිකට් ක්‍රිඩාංගණයක් ලබා දීමේ අරමුණ ඇතිව පලමු පාර්ශවයේ හිමිකම් දරන ක්‍රිඩාංගණය නවීකරණය කර පහසුකම් සැලසිම උදෙසා මෙම එකගතා ගිවිසුම  අරමුණ කර පලමු ඉදිකිරිම්  සහිතව මෙම එකගතා ගිවිසුම අරමුණු කර ගනී. ඒ සඳහා පලමු පාර්ශවය විසින් සිය හිමිකම් දරණ  ක්‍රිඩාංගණය තුල අදාල සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා දෙවන පාර්ශවය හෝ එහි බලයලත් නියෝජිත සහ හෝ කොන්ත්‍රාත් ආයතනය වලට ක්‍රීඩාංගනය තුලට පිවිසීමටත්, අවශ්‍ය ඉදිකිරිම් සහ සංවර්ධනය කිරිම් කටයුතු කිරීමටත් මෙයින් බලය ලබා දීමට එකඟවේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් මෙහි ක්‍රිකට් ක්‍රිඩාව විතරයි සටහන් වෙලා තිබෙන්නේ.එතකොට අනිකුත් ක්‍රිඩා ගැන සඳහන් වෙලා නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ ක්‍රිකට් ආයතනයනේ. ඒ ගොල්ලන් ක්‍රිකට් ගැන විතරයි කතා කරන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඒ ගොල්ලන් කතා කලාට අපට දැමිය හැකියි කොන්දෙසියක්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහි එපැයි කියා නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එක තමයි අපි අසන්නේ

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. එහෙම කිසිම තැනක එපා කියා නැහැ. එහි එල්ලෙන්න එපා. එල්ලිලා මෙයට මුදල් ගැනිමට බාධා ඇතිවෙනවා. 2 කරුණ දෙවැනි පාර්ශවය විසින් ක්‍රිඩාංගණයේ තණ තිලි 03ක් ( Turf Wicket ) ක්‍රිකට් කළාල එළන ලද විකට් 01ක් ( Matting Wicket 01) හා අනෙකුත් ආශ්‍රිත සංවර්ධන සහ ඉදිකිරිම් කටයුතු සහ ක්‍රීඩාංගණයේ තණකොළ වැවීමේ කටයුතු යනාදිය සඳහා මුදල් සම්පාදනය කර එම කටයුතු සිදු කිරිමට එකඟ වේ. තුන්වන කරුණ නම් ක්‍රිඩාංගණයේ නවීකරණය කටයුතු සඳහා නගර සභාවේ නාගරික ඉංජිනේරුවරයාගේ අධික්ෂණය යටතේ එම කටයුතු අදාල විෂා සම්බන්ධයෙන් දෙවන පාර්ශවය විසින් යොදවනු ලබන නිපුනත්වයකින් සහ ප්‍රාගුනාක් සහිත පුද්ගලයින් යටතේ සිදු කිරිමට පළමු පාර්ශවය එකඟ වේ.හතරවෙනි කරුණ ක්‍රීඩාංගණ භූමියේ සංවර්ධන කටයුතු සඳහ උපදේශකයෙකු ලෙස අම්බලන්ගොඩ නගර සභාව කටයුතු කරන බව දෙපාර්ශවය පිළිගනී. ක්‍රීඩාංගණයේ සංවර්ධන සහ ඉදිකිරිම් කටයුතු වලට අදාල තත්ත්ව සහතික කිරිම, තත්ත්ව පාලනය, සහතික කිරිමේ බිල්පත් සහ සියලුම අනුමත කිරිම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මග පෙන්විම යටතේ අම්බලන්ගොඩ නගර සභාව විසින් සිදු කරනු ලබන බවට එකඟ වේ. පස්වන කරුණ ඉහත කී දෙවන පාර්ශවය විසින් ක්‍රීඩාංගණයේ නවීකරණය සඳහා සිදු කරනු ලබන දායකත්වය සැලකිල්ලට ගෙන එම පාර්ශවයේ සාමාජිකයන් වන අම්බලන්ගොඩ රියෝ ක්‍රීඩා සමාජය හා අම්බලන්ගොඩ රියෝ ක්‍රීඩා සමාජය හා අම්බලන්ගොඩ සිංහ ක්‍රිඩා සමාජයේ ක්‍රීඩකයන්ටද අම්බලන්ගොඩ නගරය තුළ ක්‍රීඩා කරනු ලබන ගා/ධර්මාශෝක විද්‍යාලය, ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලය, ගා/ පී ද එස් කුලරත්න විද්‍යාලය ,ගා/ශ්‍රී බුද්ධදත්ත විද්‍යාලය,හා ගා/ගාමිණි මහ විද්‍යාලය සහ අනෙකුත් විද්‍යාල සහ ආයතනයන්හි ක්‍රීඩා කරන ක්‍රීඩකයන්ට එකී ක්‍රිඩාංගණය භාවිතා කිරිමට අවසර ලබා දීමටත් , එසේ ලබා දීමේදි සාමාන්‍ය ගාස්තුවෙන් 2/3 ක් පමණක් හෝ නාමික ගාස්තුවක් ( යන දෙකෙන් අඩු අගය ) අය කරමින් , ක්‍රිඩාංගණය සහනදායී පදනම මත කුලියට ලබා දීමටත් සහ ඉහත කී විද්‍යාලය සහ ආයතන විසින් සිදු කරනු ලබන ඉල්ලිම සඳහා ප්‍රමුඛත්ය ලබා දීමටත් පළමු පාර්ශවය මින් එකඟ වේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එතකොට ගරු සභාපතිතුමනි, ප්‍රදේශයේ පවතින අනිකුත් ක්‍රිඩා සමාජවලත් ගැටළුවක් නැද්ද? ක්‍රිඩා කරන්න පුළුවන්ද?දැන් රියෝ එක සිංහ එක නෙමේ .තවත් තිබෙනවාද ක්‍රිඩා සාමාජ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ අයට ප්‍රමුඛත්වය දෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අනිත් කට්ටියටත් දෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හයවෙනි කරුණ මෙම ක්‍රීඩාංගණය සෑදීමෙන් සහ හෝ නවීකරණය කිරිමෙන් පසු එහි නඩත්තු හා පරිපාලන යනාදි සියලු කටයුතු පළමු පාර්ශවය විසින් සිදු කිරිමටද ඒ සම්බන්ධයෙන් වන සියලු වියදම් පළමු පාර්ශවය දැරීමට එකඟ වේ. හත්වෙනි කරුණ මෙම ගිවිසුම අවම වශයෙන් වසර 30ක කාලයක් සඳහා බලාත්මක පවතින බවට පාර්ශවයන් විසින් එකඟ වන අතර, ගිවිසුම ක්‍රියාත්මක වන දින සිට වසර 15ක් ගත වනතුරු කිසිඳු පාර්ශවයක් හට මෙම ගිවිසුම ඒකපාර්ශවික ලෙස අවසන් කල නොහැකි බවට දෙපාර්ශවයම පිළිගෙන එකඟ වේ. අටවෙනි කරුණ මෙම ගිවිසුම පහත සඳහන් දිනයේ සිට ක්‍රියාත්මක වන බව දෙපාර්ශවයම පිළිගනී.පොදු කොන්දේසි

a) මෙම ගිවිසුමට එළඹීම සඳහා මෙහි අත්සන් කර පිළිගැනීම සඳහා අවශ්‍ය නිසි අවසරය මෙහි අත්සන් කරන පාර්ශවකරුවන් වෙත අදාල නීතිමය ප්‍රතිපාදන යටතේ සහ හෝ නිසි ක්‍රමවේදය යටතේ ලබා ඇති බව දෙපාර්ශවය වෙනුවෙන් පිළිගනී.

b) පාර්ශවයන් විසින් සිය සියලු සන්නිවේදනයන් පහත ලිපිනයන් වෙත ආමන්ත්‍රණය කර යොමු කල යුතුය. පලමු පාර්ශවය ගරු සභාපතිතුමා, අම්බලන්ගොඩ නගර සභාව. දෙවන පාර්ශවය ගරු ලේකම්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය, නො 35, මේට්ලන්ඩ් පෙදෙස , කොළඹ 07

c) මෙම ගිවිසුම යටතේ වූ අයිතිවාසිකම් , වගකීම් හෝ බැඳීම් අනෙක් පාර්ශවයේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව තෙවන පාර්ශවයන් පැවරීම සුදු කල නොහැකි බව දෙපාර්ශවය පිළිගනී.

d) මෙම ගිවිසුම වෙනස් කිරීම සහ හෝ සංශෝධනය කිරීම ඒ සඳහාම සකසන ලද සහ සියලු පාර්ශවයන් විසින් අත්සන් කරන ලද වෙනත් ලිඛිත ලියවිල්ලකින් මිස සිදු නොකළ යුතු බව දෙපාර්ශවයම පිළිගනී.

e) මෙම ගිවිසුම මගින් මෙයට අදාල සියලු කරුණු සම්බන්ධයෙන් පාර්ශවයන් අතර වූ අවසන් එකඟතාව නිරූපණය වන අතර පාර්ශවයන් අතර ඇති කර ගනු ලැබූ සියලුම පූර්ව ලිඛිත ගිවිසුම් හෝ එකඟතාවන් ( ලිඛිත හෝ වාචික) කොන්දේසි හෝ නියම අභිභවා මෙම ගිවිසුම බලාත්මක වන බව පාර්ශවයන් විසින් පිළිගනී.

f) මෙම ගිවිසුමේ අඩංගු විධිවිධානයන්ගෙන් එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අදාල නීතින් යටතේ හෝ වෙනත් කිසිදු ආකාරයකින් වලංගු හෝ නීති විරෝධි හෝ බලාත්මක කළ නොහැකි නම් , එම ප්‍රතිපාදනයන් හැර මෙහි අඩංගු ඉතිරි සියලු ප්‍රතිපාදන වල වලංගුභාවය , නිත්‍යානුකුලභාවය සහ හෝ බලාත්මක කිරීමේ හැකියාව එලෙසම පවතින බව පාර්ශවයන් පිළිගනී.

g) මෙම ගිවිසුමට ගිවිසගත් පාර්ශව හා ඔවුන්ගේ අනුප්‍රාප්තිකයින් ද මෙම ගිවිසුමේ කොන්දේසි සහ නියම ආරක්ෂා කිරීමට බැඳි සිටින බව පිළිගනී. ඕක තමයි තිබෙන්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

මේ කොන්දේසියක් කැඩුවොත් එහෙම එක පාර්ශවයකින් හරි .

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මෙය හදලා අවසන් වු පසු කැඩෙනවානම් කැඩෙන්නේ අපෙන් විතරයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, දැන් මෙහෙමයි මෙය අවුරුදු 30කටනේ දෙන්නේ. දෙන එක ගැටළුවක් නැහැ කියන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

දැන් මෙහෙමයි. මේ ගරු මන්ත්‍රී මණ්ඩලයට මා පැහැදිලි කළ යුතුයි. ඒ අයට මේ සභාවට මුදල් දිමේ බලයක් නැහැ. ඒ අයගේ ව්‍යවස්ථාව අනුව. ඔවුන්ට මුදල් වියදම් කිරිමේ බලය තිබෙන්නේ අදාල ඔවුන්ගේ සාමාජිකයන්ට විතරයි.අම්බලන්ගොඩ රියෝ ක්‍රිඩා සාමාජයටත් , සිංහ ක්‍රිඩා සාමාජයටත් විතරයි මුදල් දෙන්න පුළුවන්. එතකොට ඒ දිම සඳහා ඒ අය සාධාරණ පදනමක් ගැනිම කරන්නේ. ඒ ක්‍රිඩකයන් වෙත යම්කිසි සහන ගාස්තුවක් දෙනවා කියන පදනම මත කියන එක තමයි කියන්නේ. එතකොට පරිපාලනය තිබෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

මෙකට ඒ අය වියදම් කරන ගණන කියද?

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ලක්ෂ 148යි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ලක්ෂ 148යි . අපි දැනට වියදම් කර තිබෙන ගණන කියද?

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අපේ වියදම ළිං සඳහා කියක් ගිහින් තිබෙනවාද?

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

ළිං විතරක් නෙමේ . දැන් කොපමණ වැඩ කර තිබෙනවාද?

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ලක්ෂ 12 ක් විතර . පැවිලියන් ටිකක් හදන්න පටන් ගන්නවා. කොහොම ගියත් අපිත් ලක්ෂ 200ක් විතර වියදම් කරනවානේ.

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, මමත් ලක්ෂ 125ක මුදලක් අරගෙන දුන්නා. මමත් ක්‍රිඩා ආමත්‍යාංශයේන්.හිටපු ක්‍රිඩා ඇමතිතුමාගෙන් . අපි හිටියේ නැහැ එතකොට. මා අරගෙන දුන්නා. නගර සභා නිලධාරින්ගේ වරදින් තමයි එය ලක්ෂ 68ක පැවතියේ. ඒ මුදලුත් මෙයට අයිතියි. එතකොට අපි මෙහි වැඩ කළේ ලක්ෂ 68යි ගණනක් .

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

මගේ මතය තුළ මෙය දිර්ඝ කරන කාලය පොඩ්ඩක් අඩුකළහොත් හොඳයි කියන එකයි මගේ මතය. මොකද ලක්ෂ 147 කියන්නේ අද කාලයේ හැටියට ඔබතුමාට නිකම්ම හොයා ගන්න පුළුවන් ඔබතුමාගේ දක්ෂතාවය අනුව.මේකට මේ වැද වැද ඉන්න ඕන නැහැ. එකයි මා කියන්නේ. අනිත් එක තමයි මේ ක්‍රිඩා සමිති දෙකයි තිබෙන්නේ ප්‍රමුඛ පෙළේ.ක්‍රිඩා මේවා එකේ හාඩ් බෝල් ගසන්නේ දෙකයි කියන්නොකෝ. මෙහි ලියාපදිංචි වෙලා කියන්නොකෝ. එහි නගර සභා දේපලක් මෙහි තිබෙනවා. මෙහි නඩත්තු වෙන ඒ අයගේ ව්‍යවස්ථාව තුළ කොයි ආකාරයෙන් මෙය සිදු වෙනවාද කියන එක . අපිටත් ඒවා එන්න ඕන.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ගරු මන්ත්‍රිතුමා ඒ අය නෙමේ නඩත්තු කරන්නේ . අපියි.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

නඩත්තු කරන්නේ අපි. අපි ලබා දී තිබෙනවා කෝටි ගණනක ඉඩම් කැබැල්ලක්. දැන් එය ලබා දී තිබෙන්නේ ක්‍රිකට් ආයතනයෙන් හදන ඒවාටනේ. පාලනය වන ක්‍රිඩා සාමාජවලටනේ.මේ වගන්ති තිබුණාට. දැන් අපට එය මූලික සුදුසුකමක් වෙලා තිබෙනවානේ.මා අහන්නේ කාලය පොඩ්ඩක් අඩු කර ගන්න පුළුවන්නම්. අපේ මූලික අරමුණ වෙන්නේ රියෝ ක්‍රිඩා සාමාජය , සිංහ ක්‍රිඩා සාමාජය විතරක් වත් අම්බලන්ගොඩ නගරයේ තිබෙන අනෙකුත් ක්‍රිඩා සාමාජ වලටත්, අනෙකුත් ක්‍රිඩා වලටත් ප්‍රමුඛත්වය දෙන ලෙස කොයි දේ කළත් කමක් නැහැ කියන එකයි අපි කියන්නේ. මෙහි අනිත් ගරු මන්ත්‍රිවරුත් අදහස් පළ කරන්නේ.මගේ ඉල්ලිම තිබෙන්නේ . එය අපේ පක්ෂයේ කරන ඉල්ලීම. ඒ තුළ කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා. ඔබතුමාට ඔය ලක්ෂ 148ක් ගන්න කියන එක එච්චළ ආමාරු කාර්යයක් නෙමේ.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් . සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මට තිබෙනවා ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න. ගාමිණී විද්‍යාලය සහ අනෙකුත් විද්‍යාලවල අනෙකුත් ආයතන වල ක්‍රිඩා කටයුතු කරන වෙනත් ඕනෑම ක්‍රිඩාවක් කියන වචනය ඇතුළත් වෙනවා නම් ඉදිරිපත් කළානම් හරි. මෙහි වෙනත් ක්‍රිඩා සඳහා එක වචනයක්වත් සඳහන් වෙලා නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ඒ අය අදහස් කරන්නේ මෙච්චරයි. ඒ ගොල්ලන් අදහස් කරන්නේ ක්‍රිකට් ක්‍රිඩකයෝ වෙනුවෙන් සහන ගාස්තුවක් පනවන්න විතරයි.අනෙක් ක්‍රිඩා වෙනුවෙන් පනවනවාද නැද්ද කියන එක ඒ අයට අදාල නැහැ.එක සභාවේ තින්දුවක්.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් . සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

මොකද මෙය තනායම් ගිවිසුමෙ මල්ලි වෙන්න පුළුවන්. එහෙම වෙන්න බැහැ.මා එකයි කියන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අදාල නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමා, අර ඔබතුමා කිවු පරිදි පැහැදිලිව මෙය කියෙව්වොත් අවුරුදු 30 කියන එක එතරම් ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. මොකද ඒ අය සල්ලි නෙදෙන නිසා. හැබැයි තව එක දෙයක් තිබෙනවා. කුමන හේතුවක් නිසා වත් මෙක ඇතුළේ වෙන අභ්‍යාන්තර දේවල් තියලා ඒ ගොල්ලන්ට මේ පාසැල් වලට මේ ක්‍රිඩා සමාජ වලට කියන්න කිසිම අයිතිවාසිකමක් නැහැ. පැහැදිලිවම නැහැ.මොකද අම්බලන්ගොඩ නගර සභා ක්‍රිඩාංගණය. මෙය නම්විය යුත්තේත් අම්බලන්ගොඩ නගර සභා ක්‍රිඩාංගණය මිස වෙන නමකින් බැහැ. මෙය අම්බලන්ගොඩ නගරයේ තිබෙන අනෙකුත් සියළුම ක්‍රිඩා සාමාජ වලට තමන්ගේ ක්‍රිකට් තරඟයක් පැවැත්විමට , පුහුණු විම් වීමට ඒ අයිතිවාසිකම් තිබෙන්න ඕන. තණනිල්ල හැදුවා කියා තණනිලි ටික වට කරන්න පුළුවන්.හැබැයි තණතිල්ල හැදුවා කියා අනෙකුත් ක්‍රිඩකයන්ට එහි සෙල්ලම් කරන්න ඉඩ දෙන්න ඕන. මොකද ඔබතුමලා අපි පොඩි කාලයේ මෙම ක්‍රිඩාංගණයේ පාපන්දු ක්‍රිඩාව කළා.එම නිසා එම අයිතිවාසිකම නැති කරන්න බැහැ මෙම මොන ගිවිසුම ගැසුවත්. ඊට අමතරව මළල ක්‍රීඩා ද පාපන්දු ක්‍රීඩාවද අපේ තරුණ පිරිස කරන අනෙකුත් සියළුම ක්‍රිඩා වලට මෙම අයිතිවාසිකම තිබිය යුතුයි. ඊට අමතරව රියෝ සහ සිංහ ක්‍රිඩා සාමාජ වලට අපේ තිබෙන අයිතිවාසිකම , ඔබතුමාට තිබෙන බලය , ගරු මන්ත්‍රිවරුන්ට තිබෙන බලය ඒ ගොල්ලන්ට මේ ක්‍රිකට් සංගමයෙන් මුදල් දුන්නා කියා මේ එක්කෝටි ගණනක් මෙය දඩම්මා කරන්න කොයිම වේලාවක වත් දෙන්න බැහැ.මෙය නගර සභාව සතු අපේ නගර සභාවේ ක්‍රිඩාංගණය මිස ක්‍රිකට් බෝඩ් එකේ ක්‍රිඩාංගණය නොවන බව බොහොම පැහැදිලිව අපි මේවා කළ යුතුයි. අර ඔබතුමා කිවු පරිදි වසර 30 තිබෙන එක ඒවා ප්‍රශ්න නෙමේ. මොකද ක්‍රිකට් බෝඩ් එකකට මුදල් නිදහස් කරන්න බැහැ. එය අපි අවබෝධ කරගන්න ඕන. මේ කොහේවත් තිබෙන ක්‍රිකට් ක්‍රිඩාංගණයක් ඉදිකරන්න මුදල් දෙන්න බැහැ.

ඒ අයට විගණන විමසුම් පැමිණෙනවා. ඉතිං එමනිසා ක්‍රිකට් බෝඩ් එක දෙන්නේ මෙතැන ඒ අයගේ ක්‍රිකට් සංගම් දෙකක් තිබෙන නිසා නම්කරලා තමයි ඒ දෙක ලබා දෙන්නේ. ඒ පිළිබඳ ගැටළුවක් නැහැ නමුත් අරවා අපේ මූලික දේවල් නගර සභා ක්‍රීඩාංගණය සහ වෙනත් සමිති වලට සෙල්ලම් කරන්න අයිතිවාසිකම. කුඩා පාසැල් වලට යම්කිසි කුඩා පාසැල් වලට උත්සව පැවැත්විමට අවසර දෙන්න ඕන. නැතිනම් මෙය එක පාර්ශවයක් බවට පත්වෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මා හිතන්නේ මෙහි පරිපාලනය සහ නඩත්තුව කෙලින්ම භාර දී තිබෙන්නේ කෙලින්ම නගර සභාවට. මෙහි ඒ අයට කිසිම අයිතියක් නැහැ පරිපාලනයට ඇඟිලි ගැසීමට . මේ ගිවිසුමේ හැටියට. ඉතිං මා හිතන්නේ මෙහි නඩත්තු කටයුතු සිදු කරන්න පුළුවන් අපිට කිසිම බලපෑමක් නැහැ ක්‍රිකට් බෝඩ් එකට.අනිත් එක ක්‍රිකට් බෝඩ් එකෙන් කියා තිබෙන්නේ ප්‍රමුඛතාවය අර අයට ලබා දෙන්න කියන එක විතරයි. අනෙක් පාසැල් වලටත් දෙන නොදෙන එකක් අපේ කාරණයක්. එකත් නගර සභාවට කරන්න පුවවන්. මට ලොකුවට ගැටළුවක් නම් තෙරෙන්නේ නැහැ.මා නම් හිතන්නේ අපට ඔක්කොම බලය තිබෙනවා මෙහි. ඒ අය මුදල් දුන් පසු සම්පූර්ණ බලය අපේ අතේ තිබෙන්නේ. එතනින් පසු ඒ අයට කිසිම බලයක් නැහැ.මෙයට යටත් වුණා කියා මට හිතෙන්නේ නැහැ . ලොකු අපදාවක් වෙයි කියා.අර ගරු නගර සභා මන්ත්‍රී කිවු පරිදි ප්‍රමුඛතා කියා තිබෙන නිසා ඒ අයට පුද්ගලිකව දෙන්න වෙනවා. එහෙත් නගර සභාව තීරණය කළ යුතුයි පෞද්ගලිකව දිය යුත්තේ කොහොමද කියා. එකත් අපිනේ තීරණය කරන්නේ. ඒ අයට කිසිම තීරණ ගැනිමේ හැකියාවක් නැහැ මුදල් දුන් පසු.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙය තේරුම් ගන්න සියළුම ගරු මන්ත්‍රිවරු.මෙම මුදල් ලබා දිම සඳහා ක්‍රිකට් බෝඩ් එක අම්බලන්ගොඩ නගර සභාවට මුදල් වියදම් කිරිමේ කාලයකදි විගණන විමසුම් ප්‍රශ්නයක් ඇති වෙනවා. එම විගණන විමසුමට පිළිතුරක් ලෙස තමයි මෙම ගිවිසුම දමා තිබෙන්නේ.මෙම ගිවිසුමේ මුල් ආරම්භය දිහා බැලුවොත් එහෙම ඔය අයට පෙනේවි. ඒ අය විස්තර කරනවා එය.අම්බලන්ගොඩ නගරයේ ක්‍රියාත්මක වන ප්‍රධාන ක්‍රිඩා සාමාජ වන රියෝ ක්‍රිඩා සාමාජය , සිංහ ක්‍රිඩා සාමාජය නියෝජනය කරන පුද්ගලයන් සහ මහජනයා ක්‍රිකට් ක්‍රිඩාවේ යෙදෙන අම්බලන්ගොඩ නගරයේ පිහිටි ධර්මාශෝක විද්‍යාලය, දේවානන්ද විද්‍යාලය,ගා/ පි ද එස් කුලරත්න විද්‍යාලයට ක්‍රිඩාංගණය සහනදායි පදනම යටතේ සහ නොමිලේ ලබා දීමට මෙම එකඟතා ගිවිසුම ආරම්භ කෙරේ. තවද අම්බලන්ගොඩ ගෘහස්ථ ක්‍රිඩාංගණය අම්බලන්ගොඩ ක්‍රිඩාංගණය සාදා ගැනීමට දැනට නගර සභාව සතු ඉඩමක් ලබා දී ඇති අතර දැනට එය සිංහ ක්‍රිඩා සාමාජය මඟින් පාලනය කරනු ලබයි. රියෝ ක්‍රිඩා සාමාජය සඳහා ක්‍රීඩාංගණගොඩනැඟිල්ලක් නගර සභාව විසින් ලබා දී ඇති අතර එම ක්‍රිඩා සාමාජයේ සාමාජිකයන්ද පරිසර ක්‍රිඩා කටයුතු සඳහා භාවිතා කරයි. ඒ අය විස්තර කර තිබෙන්නේ ඒ අයගේ සාමාජිකයන්ට මෙය කරනවා කියන එක තමයි. වෙන දෙයක් නැහැ.මේ ඒ අයගේ ලිපි ගොණුවට දමා ගැනිම සඳහා පමණයි.සම්පූර්ණ පාලනය නගර සභාවට භාර දි තිබෙන්නේ. අපි භාර ගන්න ඕන එක. හැබැයි මෙහෙම දෙයකුත් තිබෙනවා . නගර සභාව අපේ තාක්ෂණය මත මේ විදියට හැදුවානම් මේ පිට්ටනිය මේ විදියට හදන්න බැහැ. ඒක තේරුම් ගන්න. ලංකාවේ ක්‍රිකට් ක්‍රිඩාංගණ සැදීමේ නියැලෙන උපරිම දක්ෂතාවයක් තිබෙන

කොන්ත්‍රාත්කරුවෙකු තමයි මෙය හදන්නේ. අපි මෙය හොයා ගත්තා නම් වෙන්නේ තණකොළ වවා ට්‍රප් එක දමන එක විතරයි. ඊට වැඩියේ දෙයක් මෙතැන තිබෙනවා. මෙතැන වැඩපිළිවළ බැලුවාම ඒ අය විශාල වැඩ කොටසක් කරගෙන යනවා කියා මටනම් පෙනෙනවා.මට හැමදාම දකින නිසා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙහි දෙවැනි කොන්දේසියේ තිබෙනවා. 01 දෙවන පාර්ශවය විසින් ප්‍රදේශයේ ක්‍රිකට් ක්‍රිඩාවේ නිරත වන පාසැල් සහ ක්‍රිඩා සමාජයන් හි ක්‍රිඩකයන්ගේ අභිවෘද්ධිය උදෙසා ප්‍රදේශයේ ක්‍රිඩකයන් හට පුහුණු විම් , තරඟ පැවැත්වීම් සහ ඒ ආශ්‍රිත ක්‍රිකට් ක්‍රිඩාවේ නිරත වීම සඳහා නිර්මිත පහසුකම් වලින් අනුන ක්‍රිකට් ක්‍රිඩාංගණයක් ලබා දීමේ අරමුණ ඇතිව පලමු පාර්ශවයේ හිමිකම් දරන ක්‍රිඩාංගණය නවීකරණය කර පහසුකම් සැලසිම උදෙසා මෙම එකඟතා ගිවිසුම අරමුණ කර ඒ සඳහා පලමු පාර්ශවය විසින් සිය හිමිකම් දරණ ක්‍රිඩාංගණය තුල අදාල සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා දෙවන පාර්ශවය හෝ එහි බලයලත් නියෝජිත සහ හෝ කොන්ත්‍රාත් ආයතනය වලට ක්‍රීඩාංගනය තුලට පිවිසීමටත්, අවශ්‍ය ඉදිකිරිම් සහ සංවර්ධනය කිරිම් කටයුතු කිරීමටත් මෙයින් බලය ලබා දීමට එකඟවේ. එය මා හිතන්නේ ටිකක් ගැටළු සහගතයි කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එන්නේ නැතිනම් කොහෙමද කරන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

නැහැ ගරු සභාපතිතුමනි, දෙවන පාර්ශවය. දෙවැනි පාර්ශවය කියන්නේ මතක තියා ගන්න ඒ අය.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හරි ඒ කොන්ත්‍රාත් කරන කාලය ඇතුළත ඒ ගොල්ලන් ඇවිත් වැඩ කිරිම.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එහෙම කියලා නැහැ මෙහි. එහි එහෙම කියවිලා නැහැ. මා ගැටළුවකට කියනවා නෙමේ. නමුත් එය ඇතුළත් විය යුතුයි. මෙය කියවි නැති නිසා කොයි වේලාවේ හරි ක්‍රිඩාංගණයට ඇවිත් මෙය සිදු කිරිමට. එම කොන්දේසිය තමයි මෙහි දමා තිබෙන්නේ. එහෙම කාලයක් දමා නැහැ. එය ඉතා වැදගත්. එය අනිවාර්යයි. මෙහි බලන්න දෙවන පාර්ශවය හෝ එහි බලයලත් නියෝජිත කියන එක කෙලින්ම කියනවා. එම නිසා එය සංශෝධනය විය යුතු බවට මා ගරු සභාවෙන් ඉල්ලිමක් කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙහි ඇතුළත් කරන්න ඉදිකිරිම් කාලය තුළ

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අන්න එය ඇතුළත් කරන්න . එතකොට කිසි ගැටළුවක් නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අංක 1 දෙවන පාර්ශවය විසින් ප්‍රදේශයේ ක්‍රිකට් ක්‍රිඩාවේ නිරත වන පාසැල් සහ ක්‍රිඩා සමාජයන් හි ක්‍රිඩකයන්ගේ අභිවෘද්ධිය උදෙසා ප්‍රදේශයේ ක්‍රීඩකයන් හට පුහුණු වීම් , තරඟ පැවැත්වීම් සහ ඒ ආශ්‍රිත ක්‍රිකට් ක්‍රිඩාවේ නිරත වීම සඳහා නිර්මිත පහසුකම් වලින් අනූන ක්‍රිකට් ක්‍රිඩාංගණයක් ලබා දීමේ අරමුණ ඇතිව පලමු පාර්ශවයේ හිමිකම් දරන ක්‍රිඩාංගණය නවීකරණය කර පහසුකම් සැලසිම උදෙසා මෙම එකඟතා ගිවිසුම අරමුණ කර ගනී. ඒ සඳහා පලමු පාර්ශවය විසින් සිය හිමිකම් දරණ ක්‍රිඩාංගණය ඉදිකිරිම් කරන කාලය තුල අදාල සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා දෙවන පාර්ශවය හෝ එහි බලයලත් නියෝජිත සහ හෝ කොන්ත්‍රාත් ආයතනය වලට ක්‍රීඩාංගනය තුලට පිවිසීමටත්, අවශ්‍ය ඉදිකිරිම් සහ සංවර්ධනය කිරිම් කටයුතු කිරීමටත් මෙයින් බලය ලබා දීමට එකඟවේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඉදිකිරිම් කාලය තුළ කියන්නේ මේ ඉදිකිරිම් කාලය විතරයිනේ.මෙයින් ඒ අය ඇත්තටම අවංකම අදහස් කර තිබෙන්නේ එය නෙමේ. මේ වසර 30 ඇතුළත මේ ක්‍රිඩාංගණය තුළ මේ අයට ඕනෑම ඉදිකිරිමක් කරන්න පුළුවන් කියන එක. එකයි මේ අදහස් කර තිබෙන්නේ. අපි මේ වචන දැම්මාට ඒ අය කොහොමත් එකඟ වෙනනේ නැහැ. ඇත්තටම අපට අගතියක් වෙනවාද කියන එක බලා ගන්න පුළුවන්හොඳම ක්‍රමවේදය තමයි ගාල්ල මහ නගර සභාව මේ විදියට ක්‍රිඩා පිටිය දුන්නා. වසර 30කට . ක්‍රිකට් බෝඩ් එකට.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එය අපි පරිශිලනය කරන්න ඕන. ඒ ගිවිසුම නෙමේ මේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

හරි එකද කියා බලන්න.එම ගාල්ලේ ගරු නගාරාධිපතිතුමා සමඟ සාකච්ඡා කර එය පරිශිලනය කරන්න. ඒ අය පත්වෙච්ච තත්ත්වයක් තිබෙනවා. ඒ ගිවිසුමයි මෙයයි දෙක එක වෙන්නේ නැහැ. ගොඩක් වෙනස්. නමුත් එය සම්පුර්ණයෙන්ම ක්‍රිකට් බෝඩ් එකට පවරන ලද තත්ත්වයක් තිබෙන්නේ. නමුත් මේ ගිවිසුම් ප්‍රකාරව , මේ ගරු උප සභාපතිතුමා ඉදිරිපත් කළ ආකාරයට මෙතැන බරපතල තත්ත්වයක් තිබෙනවා. ඒ කියන්නේ ඒ අයට ඕනෑම අවස්ථාවක පැමිණ ඉදිකිරිමක් කරන්න ඕන. අපි එය අවස්ථාව ලබා දෙන්න ඕන. එකත් පැත්තක තියාන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මිට අමතරව තව ඉදිකිරිම් 2ක් සඳහා අපේ අනුමැතිය ඉල්ලා තිබෙනවා. ලකුණු පුවරුව සහ දර්ශන පථය ඉදිකිරිමට අවසර ඉල්ලා තිබෙනවා. ඒ අය මුදල් ලබා දෙනවා. ඊට අමතරව මෙයට රෝලින් මැෂින් එකක්, කටින් මැෂින් එකක්, අවශ්‍ය වෙනවා. ඇත්තටම ඒ අයට අපට

ලබා දෙන්නේ නැහැ. ඒ අය දෙන්නේ රියෝ ක්‍රිඩා සාමාජයට. එතැනින් අපට ඉ ල්ලා ගන්න කියා තමයි තිබෙන්නේ. ඒ විදියට තමයි එකගතාවය තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, සභා අනුමැතියට යටත්ව ලබා දෙන්න. ඒ අවස්ථාවේ ඉදිකිරීමක් කරන්න කොහොමත් සභාවේ අවසරය ලබා ගන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභාවේ අහලා තමයි දෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මොකද හෙට තිබෙන ක්‍රිකට් බෝඩ් එකක් ගැන අපට කියන්න බැහැනේ. දැන් මේ ක්‍රිකට් බෝඩ් එකෙක් ටර්ෆ් විකට් 3ක් ලබා දෙනවා. ටර්ෆ් ක්‍රිකට් කියන්නේ ක්‍රිකට් ගහන අයට හදවත වගේ. එතකොට ටර්ෆ් විකට් ක්‍රිඩා කරන කොට අනිත් ක්‍රිඩා කරන කොට මෙයට බාධාවක් තහංචියක් නොවී තිබෙනවාද? කරන්න පුළුවන්ද? මමත් ඔබත් ක්‍රීඩකයෙක්. ඔබතුමාත් හොඳටම දන්නවා. සවස 5න් පසු පාපාන්දු ක්‍රිඩාවේ නියැලීමට පිට්ටනිය නොදී කොච්චර ගහගෙන තිබෙනවාද කියා. මෙය තිබෙන්නේ ඔක්කොම එකටනේ. මා සම්පූර්ණ එකඟයි ටර්ෆ් විකට් 5ක් හරි දමා ක්‍රිකට් ක්‍රිඩාංගණය හදනවාට. හැබැයි ඒ සමානව පාපන්දු හා අනෙක් ක්‍රීඩා සඳහා ඒ හා සමානව විකල්පයකට යන්න ඕන. මේ ටර්ෆ් විකට් එක හරහා මීටර් 100 ට්‍රැක් එක අඳින්න පුළුවන්ද? මීටර් 500 අඳින්න පුළුවන්ද? පාපන්දු ක්‍රිඩාවේ නියැලෙන්න පුළුවන්ද? ක්‍රිකට් බෝඩ් එකට අපි දුන්නාට පසු අපි කරනවා වගේ නෙමේ . ගරු සභාපතිතුමනි, විශාල නිත්‍යානුකූල තත්ත්වයකට මෙය ඇතිවෙයි. ඉතිං එකටත් අපි විසඳුම් සොයා ගන්න තිබෙනවා.ගරු මන්ත්‍රිවරු දිගින් දිගටම ප්‍රකාශ කරනවා අපි වෙනත් කිසිදු ක්‍රිඩාවකට එක්ක මෙය යන්න කියන එක. අපේ යුතුකම හා දක්ෂතාවය තමයි එම විකට් තුන ආරක්ෂා කරගෙන අනික් ක්‍රිඩා සඳහා මෙය ලබා දෙන එක. හැබැයි ක්‍රිකට් බෝඩ් එක මෙය කොන්දේසියක් විදියට මෙය දැම්මොත් එහෙම කිසිම දෙයක් කරන්න බැරි වෙයි. ඒ ළමයි අසරණ වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැනට දාලා නැහැ.ඒ දමා ඇති ඒවා තමයි තිබෙන්නේ . මෙහිදි අනෙක් ක්‍රිඩා කරන්න කිසිම දෙයක් කරන්න එපා කියා නැහැ. එතකොට අපට මෙය කරන්න පුළුවන් . වැඩ කොටස කරන්න පුළුවන්. ඇත්තටම දැන් ක්‍රිකට් ක්‍රිඩාව තිබෙන තැන් වල දැන් උදාහරණයක් කොළඹ සීසීටී ආයතනයේ ක්‍රිඩාංගණයේ රගර් ක්‍රිඩාව කරනවා. හැමදාම හවසට රගර් ක්‍රිඩාව කරනවා. හැබැයි හැමදාම හවසට මෙය නඩත්තු කරනවා. එමනිසා අපට මෙය කරන්න බැරි කමක් නැහැ. කරන්න පුළුවන්. පාපන්දු ක්‍රිඩාවක් තිබ්බොත් ඒ දවසේ එය හදන්න ඕන පැය දෙකක්වත්. ඒ දවසේම හදන්න ඕන. එක තමයි කරන්න ඕන. එක තේරුම් ගන්න ඕන. මෙහි අපේ නඩත්තුව සවුත්තු වුණොත් මෙය සවුත්තු වෙලා යනවා. අපේ නඩත්තුව හොඳට තිබ්බොත් දැනට සාරේවී ක්‍රිඩාංගණයේ ක්‍රිකට් ක්‍රිඩාවට වුණත් මැටින් එක පාවිච්චි කරන්න දෙන්නේ දවස් 12යි. ඉතිරි දවස් 18ට ගහන්න දෙන්නේ නැහැ.නැතිනම් නඩත්තු කරන් බැහැ. මෙය හදන්න බැහැ.ඉතිං එම තත්ත්වය තුළ අපි ආරක්ෂා කරන්න ඕන. මෙහි තිබෙන ප්‍රධාන ප්‍රශ්නය නම් මේ තාක්ෂණය සහිත අපට තවම පුද්ගලයෝ නැහැ. එම තාක්ෂණය අපි අරගෙන

මෙය සකස් කරන්න ඕනේ. එය අපට අභියෝගයක්. අභියෝගය භාර ගන්න ඕන.එක තමයි කරන්න තිබෙන්නේ. මෙහිදි අපි එකඟතාවයක් තිබෙනවා. මා පසුකාලීනව මෙය ඉදිරිපත් කරනවා. දැනට සිංහ ක්‍රිඩා සාමාජය සඳහා ලබා දි ඇති අක්කර 17ක ඉඩම එය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට සම්පූර්ණයෙන් පවරන්න අපි එකඟතාවයකට එමට බලාපොරෝත්තු වෙනවා. ඊට පසු ජාත්‍යාන්තර මට්ටමේ ක්‍රිඩාංගණයක් හදා ගැනිමේ හැකියාව තිබෙනවා. මීටර් 90 ක පරිධියක් තිබෙන ක්‍රිඩාංගණයක් අපට හදා ගන්න පුළුවන්. දැනට මීට වසර 10කට පමණ උඩදි අප සිංහ ක්‍රිඩා සාමාජයට ලබා දී තිබෙනවා. නමුත් එය අපට කරන්න බැරි වුණා. නමුත් ඒ දේ කරන්න ශ්‍රි ලංකා ක්‍රිකට් ආයතනයෙන් භූමියක් හොයනවා. ඒ ගොල්ලත් එක්ක කතා කරලා තිබෙන්නේ. ඒ ක්‍රීඩාංගණය සම්පූර්ණම ශ්‍රි ලංකා ක්‍රිකට් ආයතනයට දිලා එය ක්‍රිකට් ආයතනයෙන්ම හදලා සම්පූර්ණයෙන්ම පවත්වාගෙන යාමට ඒ අයට ලබා දෙන්න. අපට යම්කිසි බද්දක් ගත්තාම ඇති. ඒක හොඳයි . මෙහි අපට ඕන දෙයක් කළ හැකි ඊට පසු. ජාත්‍යාන්තර මට්ටමේ ක්‍රිඩාංගණයක් අපට අම්බලන්ගොඩ ඉදිකරන්න පුළුවන්. දැනට එය කතා කරලා තිබෙන්නේ. එයට සභාපති ශම්මි සිල්වා මහතාත් එකඟ වෙලා නොබෝ දිනකින් ඇවිත් බලන්නම් කියා මට පොරොන්දු වෙලා තිබෙන්නේ. එය මට මේ තිබෙන බෝඩ් එක යටත් මේ කාලය තුළ කරගන්න පුළුවන්. එය කිසි ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. එය මගේ එක ඉලක්කයක් බවට පත් වෙනවා. එයට ගරු සභාවේ අනුමැතියක් ඉල්ලන් බලාපොරෝත්තු වෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දූවගේ  මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මෙය ගරු උප සභාපතිතුමා කිවූ පරිදි ඉදිකිරිම් මේ ගිවිසුම් කාලය තුළ වුණත් මේ පළමු ඉදිකිරිම් කාලයේදි පමණයි . එහෙම නොවුණහොත් මෙය අපෙන් ගිලිහෙනවා. අර ගාල්ලේ වෙච්ච සිද්ධියම මේ නගර සභාවටත් සිද්ධ වෙනවා. මෙය දමන්න පළමු ඉදිකිරිම් කාල සීමාවේ පමණයි.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

එකඟයි.

**තීරණය-**

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනය සම්බන්ධව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය හා අම්බලන්ගොඩ නගර සභාව අතර ඇතිකර ගන්නා අවබෝධතා ගිවිසුම සංශෝධනය කළ යුතු බවත් එහි පළමු පරිච්ජේදයෙහි ක්‍රීඩාපිටිය නවීකරණය හෝ සංවර්ධනය කිරීමට <u>**පළමු ඉදිකිරීම් කාලය තුළ පමණක්**</u> යන්න ඇතුළත් විය යුතු බවත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු අනුව නගර සභාවේ සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.16 ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම යන මැයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම. දකුණු පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය හා බැඳේ. ඒ අනුව මෙරට භූමි සම්පත පරිහරණය කිරිම ජාතික ඉඩම් පරිහරණය කිරිම ප්‍රතිපත්තිමය මිට වසර 11කට පෙර සම්මත කරගත්තක් හෙයින් ප්‍රතිපත්තිමය සංවර්ධන ප්‍රතිපත්ති හා **උපාය මාර්ගය ආර්ථික සැලැස්මට අදාලව සංශෝධනය කිරිමේ අවශ්‍යතා පැන නැඟි ඇත. ඒ සඳහා දැනටමත් ආමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී අතර මෙය සංශෝධනය කිරිම මුලික විෂය කෙටම්පත් කර ඇත. මෙකි ජාතික ඉඩම් පරිහරණය කිරිමේ ප්‍රතිපත්තිය සංශෝධනය කිරිමේ කෙටුම්පත් මේ සමඟ යොමුකරන අතර එම පරිහරණය කිරිම හා තීරණ ගැනිම ඔබ පළාත් පාලනයට මුලික ප්‍රඥාප්තිය නගර සභා ආඥා පණත , නාගරික සංවර්ධන පණත හා නිවාස අධිකාරි පණත ආඥා පණත මඟින් පැවැත්විමට බලතල ප්‍රකාරව ඔබ ආයතනය කටයුතු කරන බැවින් ඔබ ආයතනයේ අදහස් යෝජනා ඉදිරිපත් කරන්න කියා තිබෙනවා. ඒ අනුව මෙහි පිටපත් සියල්ලම ගරු මන්ත්‍රිවරුන්ට ලබා දෙනවා. මේ සම්බන්ධව අදහස් තිබෙනවා නම් ගරු ලේකම්තුමිය අමතා කටයුතු කරන්න කියා .**

තීරණය-

**ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම** යන මැයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් එවා ඇති ලිපිය ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් සභාවට ඉදිරිපත් කළ අතර ඒ සම්බන්ධව යම් අදහසක් ඇත්නම් ලේකම්තුමිය සමග සම්බන්ධව අවශ්‍ය කටයුතු කරන ලෙස තීරණය කරන ලදී.

**04.** **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** :- නැත

**05.** **යථා පරිදි කල් දී ඇති යෝජනා :-** ඇත

**05.01.01 අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ සිටින පාසල් ළමුන් සඳහා 2020 වර්ෂයට අවශ්‍ය වන අභ්‍යාස පොත් නොමිලේ ලබාදීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ සිටින පාසල් ළමුන් සඳහා 2020 වර්ෂයට අවශ්‍ය වන අභ්‍යාස පොත් නොමිලේ ලබාදීම සුදුසු බවට යෝජනා කරනවා.

ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්

පාසැල් පොත් ලබා දීම ගැටළුවක් නැහැ. එම පාසැල් පොත් ලබා දීමට ප්‍රථම එම පාසැල් පොත් සාම්පලයක් ලබා දීම පිළිබඳ ඔබතුමාට මිට මාස දෙකකට ඉහත සභාවකත් මතක් කළා. එම සාම්පල් ගරු මන්ත්‍රිවරුන්ට දකින්න කටයුතු කරන්න. ඊට අමතරව මා එහි

විරෝධතාවයක් ප්‍රකාශ කරනවා ගරු මන්ත්‍රීවරයෙක් කියන්නේ ඡන්දය ඉල්ලා පත් වුණාද පක්ෂය ලබා ගන්නා ඡන්ද පදනම මත පත් පත්වුණාද නිර්වචන කෙසේ වුවත් ගරු මන්ත්‍රීවරයා මන්ත්‍රීවරයාමයි.පාර්ලිමේන්තුවේත් එකයි, පාළාත් සභාවේත් එකයි, පළාත් පාලන ආයතනවලත් එකයි. එතකොට මේ පොත් බෙදා දීම පිළිබඳව මට දැනගන්නට ලැබුණේ කොට්ඨාශය දිනූ ගරු මන්ත්‍රීවරයාට 150කුත් අනික් ගරු මන්ත්‍රීවරයාට 75කුත් ලබා දුන් බව. එයට දැඩිසේ විරුද්ධයි.මේ ගරු මන්ත්‍රීවරු ඔක්කොම මන්ත්‍රීවරු.කොට්ඨාශයක් දිනුවත් අනික් විදියට ගියත් ගරු මන්ත්‍රීවරයා . මන්ත්‍රීවරයාමයි. මේ කොහේවත් පොතක අර්ථ කථන කර නැහැ මන්ත්‍රීවරයා දෙකට බෙදලා. එය පාර්ලිමේන්තු ව්‍යවස්ථාවේත් නැහැ.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේත් නැහැ.පළාත් සභා ව්‍යවස්ථාවේත් නැහැ. එහෙමනම් එයට දැඩි සේ විරුද්ධයි. එය සංශෝධනය විය යුතුයි. එහෙම නම් 75 නම් 75මයි. 150 නම් 150යි. මා ගණන් හැදුවා ඔබතුමා දුන් මේවත් එක්ක.59ලක්ෂයක් යනවා. දැන් 59 ලක්ෂයක් පොත් බෙදන්න වියදම් කරන අපි අපේ නගර සභාවේ අර නිලධාරි ටික කොටුවෙලා ඉන්නවා.කුකුල් පැටව් ටික වගේ. එතකොට මේ නගර සභාවේ 2020 අදායම් එකතු කර දිපුවා සැලකිල්ලට ගත්තාට පසු 19, 20 වර්ෂවල එක්කෝටි 19 ලක්ෂ90000ක් විතර යනවා මේ පොත් බෙදා දීමට , දහම් පාසැල් උත්සව, පෙර පාසැල් උත්සවයි , පෙර පාසැල් වලට බෑග් දෙන්නටයි. එක්කෝටි 19 ලක්ෂයක් විතර යනවා. එතකොට අපේ මේ ගොඩනැඟිල්ල හදන්න මෙයින් ලක්ෂ 80 ක් වියදම් කළහොත් මෙන්න මේ නිලධාරින් ටික අතපය ටික දිග ඇරගෙන තමන්ගේ වැඩටික මනස කෙලින් තියාගෙන බුද්ධියෙන් වැඩ කරයි. අපිත් රජයේ සේවකයෝ. අපි වැඩ කළ තැන්වල අපට හොඳට මේසය තිබුණා. පුටුව තිබුණා.වායු සමීකරණය කර තිබුණා. වායුසමීකරණ නොමැතිව ගස්යට වැඩ කර කාලයකත් අපි වැඩ කළා.මේ වැඩකරන වපසරිය තුළ තමයි මේ අයගේ බුද්ධිය මෙහෙය වන්න පුළුවන්. තමන්ගේ හැකියාව ගන්න පුළුවන්, තමන්ට දිනකට කළ හැකි වැඩ කොටස කරන්න පුළුවන්. දහඩිය දමාගෙන කකුල් හිරිවැටිලා වැඩකරන්න බැරි වෙනවා. එමනිසා අපේ නගර සභාවේ ආදායම් තිබෙනවා. ගන්න. අපි ඒවාගෙන් ගන්න ඕන. අපි ඒවා කරන්න ඕන. අපි ඔබතුමාට සහායෝගය ලබා නොදී ඉන්නේ නැහැ . හැබැයි මා කියන්නේ මේන්න මේ අපේ මේ පුස්තකාල භූමිය පාවිච්චි කරන ඒ මිනිසුන්ට එය දිලා අර නගර සභාවට පිටුපසින් අර තිබෙන වාහන ටික නතර කරන්න. තට්ටු තුන හතරකට ගොඩනැඟිල්ලක් ගහන්න. සුවපහසු විදියට රජයේ නිලධාරින්ට වැඩ කරන්න නගර සභාවේ කාර්යක්ෂමතාවය වැඩි වෙද්දි අපේ ආදයම වැඩි කරගනිද්දි මේවා මෙහෙම නෙමේ කෝටි තුනක් වියදම් කළත් කමක් නැහැ. උපයන්නේ නගර සභාවට තුළ අපේ නගර සභාවේ සිටින අහිංසක දරුවන් සඳහා. . අපි ඒවාට එකඟයි . එහෙම නැතිව මේවාට නෙමේ මුල්තැන දෙන්නේ. දැඩි සේ විරුද්ධයි. මා හිතනවා මගේ ගරු මන්ත්‍රීවරුත් විරුද්ධයි.එක තමයි මතේ. අපි ඔබතුමාට සහායෝගය දෙනවා. අපි කිසි දවසක ඔබතුමාගේ කකුලෙන් අදින්නේ නැහැ. අපි ඒ ජාරා දේශපාලනය කරන්නේ නැහැ. මේ සහෝදර ගරු මන්ත්‍රීවරු අපි ඔක්කොම එකයි. නැතිනම් අපි යාළුවෝ. මචං කියා කතා කර ගන්නේ. එමනිසා අපි මෙතැන මත දරයි.එමනිසා බොහොම කරුණාවෙන් කියන්නේ . මේවා කරන්න කලින් අන්න ඒ දෙය කරන්න. නිවැරදි කරන්න. ගරු මන්ත්‍රීවරයා මන්ත්‍රීවරයා. දිනලා ආ ගරු මන්ත්‍රීවරයායි, කොට්ඨාශයෙන් පත්වෙලා ආ මන්ත්‍රීවරයායි හැල්ලුවට ලක් කරන්න බැහැ. පක්ෂ සහ මේවා මේ මිනිසුන්ට ගරුත්වය දිලා වැඩ කරන්න. එහෙම නැතිව නම් විරුද්ධයි. එහෙම නම් එකඟයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, විපක්ෂනායකතුමාගේ කතාවට මා විරුද්ධ වෙනවා. මොකද එතුමා ජනතාවට සහන දීම පිළිබඳව තමයි මේ විරුද්ධතාවය දක්වන්නේ. මා හිතන්නේ ගරු මන්ත්‍රිවරු නිලධාරිවරු සුවපහසු කාමර වල ඉන්නවාට වඩා වටිනවා අපේ පාසැල් ළමුන්ට ජනතාවට සහන දීම පිළිබඳව.මා හිතන්නේ මා එතුමාගේ කතාවට විරුද්ධ වන අතර මා ප්‍රකාශ කරනවා මගේ අදහස්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ  මහතා කතා කරමින්</u>**

දරුවන්ගේ දියුණට , අධ්‍යාපනික නවෝදයට පතපොත දිමට එරෙහි වන ජනතා නියෝජිතයෙකු වේ නම් ඔහු කවරේක්ද? ගරු නගාරාධිපතිතුමා කටයුතු කර ඇත්තේ නගර සභා ආඥා පණතට අනුවයි. එයට අභියෝගයක් කරනවා නම් ඔහු අන්ධ බාලයෙක්. එහි ඇති පටු බවයි අපට වැටහෙන්නේ. මේ වනවිට අම්බලන්ගොඩ නගර සභාව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ ශ්‍රි ලංකා පොදුජන පෙරමුණ යටතේ නිතිඥ අරුණ ප්‍රදිප් නම් වූ පරිණත නිතිවේදියගේ නායකත්වයෙන් ආ ගමන සාධා අනුස්මරණීයයි.  අප පසුගියදා ඒ උත්තම ජයග්‍රහණයෙන් ප්‍රමෝධයට පත්ව සිටින මේ මොහොතේ මේ දරුවන් වෙනුවෙන් කරනු ලබන සත්කාරයට අපේ ප්‍රණාමය යෝජනාකරුට පුද කරනවා. එ වගේම ගරු නගාරාධිපතිතුමනි මේ පොත පිළිබඳව අපේ ඒ ඇතැම් අය ඉදිරිපත් කරන අදහස් මා හෙලා දකිනවා. එපමණක් ද නොවේ මට මතකයි පසුගිය දිනයේ ඔබතුමාගේ පරිණත මුහුණ යොදා තිබුණා මෙන්න මේ පොතේ පසුපිටේ. සත්‍ය වශයෙන්ම යෙදිය යුතුමයි. මොකද මකර  ලාංඡනය අපේ තේමාවයි. අපේ සංඥාවයි, අපේ චින්නය. ඔබතුමිය චින්නය කියන වචනය තෝරා ගන්න. මෙන්න මේ මකර ලාංඡනය හැරුනු කොට අපේ සලකුණ ඔබතුමා හැරුනු කොට ඔබතුමායි. ඔබතුමා පොදු ලාංඡනය වී හාමාරයි.අනික් 20 දෙනා අපේ පොදු සමූමිතියෙන් පත්කොට හමාරයි.එමනිසා මා ඉල්ලා සිටිනවා කරුණාකර ලක්ෂ 59 නෙමේ ලක්ෂ 65ක් ගියාත් ඔබතුමාගේ අලංකාරත්වය මේ පොතේ මුද්‍රණය විය යුතුමයි කියා. එමනිසා ගරු නගාරාධිපතිතුමනි, වැඩියමක් දේ මා පවසන්නේ නැහැ. මෙන්න මේ දේවල් නිසා. මේ පොත් බෙදිමේ වැඩපිළිවල කියවුණා දෙපාරක් කියවුණා පාලක පක්ෂයට 150කුත් විපක්ෂයට 75කුත් වශයෙන්. ගරු සභාපතිතුමනි, මෙය දේශපාලන ආයතනයක්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රිතුමා එහෙම නෙමේ කළේ. කොට්ඨාශයකින් දිනපු ගරු මන්ත්‍රිවරයෙකුට 150ක් ලබා දුන්නා. එක්සත් ජාතික පක්ෂයෙන් දිනපු ගරු නගර සභා මන්ත්‍රි සෝභිත රංජිත් මහතා, ගරු නගර සභා මන්ත්‍රි අතුල මහතාටත් , ඔබතුමාටත් ලබා දුන්නේ එකම ගණන. අනිත් ගරු මන්ත්‍රිවරුන්ට ලබා දුන්නේ 75 ගණනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ  මහතා කතා කරමින්</u>**

පැහැදිලියි ඔබතුමාගේ මතය මේ වනවිට ඔබතුමාන් සිදුකළ සාධාරණී කළ මෙම බෙදිම. එය සර්ව සාධාරණයි.එමනිසා මා කියනවා දරුවන්ගේ පොත් බෙදාදීම පිළිබඳ කිසිම ගැටළුවක් නැහැ.ඉදිරියටම යන්න. නොනත්වාම ඉදිරියට යන ලෙස ඇරයුම් කරමින් සුලු තරය ප්‍රජාතන්තවාදිව ඔවුන්ට ඇහුම්කන් දෙන අතරම බහුතරයම සමඟ මේ ගමන පෙරටම

යනලෙස ඇරයුම් කරමින් ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා ප්‍රමුඛ ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවිය, ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මහතා ප්‍රමුඛව ඉදිරියටම යන ලෙස ප්‍රකාශ කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එතුමා වීඩියෝ එක දිහා බලාගෙන කතාකරනවා. අනේ මන්දා මොනවහරි බීල ආවද දන්නේ නැහැ. ගරු සභාපතිතුමනි , විපක්ෂ නායකතුමා ප්‍රකාශ කළේ පොත් දෙනවට විරුද්ධත්වය නෙවෙයි. පොත් දෙනවට අපි හැමෝම කැමතියි. ළමයින්ගෙ දැස් පාදන්න අපි ඒ සඳහා ඔබතුමාට ශක්තිය ධෛර්යය දෙනවා. මන්ත්‍රීවරු වශයෙන් හැමෝටම එක අයිතිය තිබෙනවා. අපි ඔබතුමා ගන්න තීරණවලට උදවු කරනවා වගේම ලබාදෙන හැම දෙයක්ම හැම මන්ත්‍රීවරයෙකුටම සමසේ ලබාදෙන්න. ගම්පෙරළිය නෙමේ. ඔබතුමාගේ ප්‍රතිපාදන වලින් ලබා දෙන්න.ගම්පෙරළියයි නගර සභාවයි දෙක එකට පටලවා ගන්න එපා. අපහාස කළා ගම්පෙරළිය. මා ඔබතුමාට තිබෙන නගර සභාව සතු සියළුම දේවල් ගරු මන්ත්‍රීවරුන්ට දෙන විට මං කියන්නේ.අප සියළු දෙනාටම සමසේ ලබා දිය යුතුයි. එය අපි පොදුවේ හැමදෙනාටම ලැබිය යුතුයි.මා එය ඔබතුමාට තරයේ කියා සිටිනවා.අපි ඔබතුමා ගරු සභාපතිතුමා වශයෙන් ගන්නා තීරණ වලට උදවු කරනවා වගේම හැම ගරු මන්ත්රිවරයෙක්ම මන්ත්‍රීවරයෙක්ම අසුන්ගෙන සිටින්නේ ගරු මන්ත්‍රීවරයෙක් වශයෙන්.තීරණ ගන්න විට හැම මන්ත්‍රීවරයාටම ලබාදෙන හැම දෙයක්ම සමසේ හැම මන්ත්‍රීවරයාටම ලබා දෙන්න.මේ නගර සභාවේ මුදල් වලින් අපි යමක් කරනවාද ? ඒ සම විදියටම ලැබිය යුතුයි. එය අපේ අයිතියක්. එය අපට ලැබිය යුතුයි. ඒ නගර සභා මුදල් වලින් . ඒ ඔබතුමලාගේ රජයෙන් දෙන අනං මනං මුදල් නෙමේ. දැන් මෙතුමා කියන්නේ පාසැල් දරුවන්ට පොත් පත් දෙනඑක , දහම් පාසැල්වලට පොත්පත් දෙනඑක.අපේ සිහිති ළමයිගේ ප්‍රසංග බලා ඒ අයට උදවු කරන එක . අපි සම්පූර්ණ සහායෝගය ලබා දෙනවා. විරුද්ධත්වයක් නෙමේ කියන්නේ .අද නගර සභාවට ගියාම මන්ත්‍රීවරියක් වශයෙන් අපිට වාඩිවෙන්න පුටුවක් නැහැ. මම එදා ගිහිල්ල ගණකාධිකාරිතුමියගේ පුටුවෙ වාඩිවෙලා තමයි වවුවරේ ලිව්වේ. ඇත්තටම කනගාටු වෙනවා. අපි පැමිණියාම සභාවේ වාඩිවෙන්න පුටුවක් නැතිනම් ගරු මන්ත්‍රීවරියක් වශයෙන් එහි අපි ටිකක් හරි ගතකරන්න වෙනවා . එවිට වඩිවෙන්න නැතිනම් ඒක ලොකු අඩුවක්.නගර සභාව සකස් කළ යුතුයි කියලයි මෙතුමා කිව්වේ එකයි. අද නගර සභාව වශයෙන් ගොඩනැඟිල්ලක් නැහැ. අද පුස්තකාලෙට එක ළමයින්ට කොච්චර අපහසුතාවයක් ඇත්ද අපි උඩ තට්ටුවෙ මේ වැඩසටහන කරද්දි. එම නිසා මෙය අපේ ලොකු අඩුවක්. එතුමා කියන්නෙ ඒකයි.වසර දෙකක් යනකන් මේක හදාගන්න බැරිවුණ එක ගැන අපි කණගාටු වෙන්න ඕන.ලක්ෂ ගණන් කෝටි ගණන් වැය කරනවා. ඔක්කොම දේවල් කරනවා. නමුත් අපේ සභාව සතු කාර්ය මණ්ඩලයට වැඩ කරන්න ස්ථානයක් නැහැ.ඔබතුමා ගරු සභාපතිතුමා වශයෙන් වැජඹෙන්න , ඔබතුමා සිටිය යුත්තේ ඒ ආකාරයෙන්. ඒ ඔබතුමාගේ නිලය. ඔබතුමා වැජඹෙන්න ඕන. උප සභාපතිතුමා එහෙම ඉන්න ඕන. ඔබතුමාට විරුද්ධව නෙමෙයි කියන්නේ.මේ කවුරුත් අවතක්සේරු කරන්න එපා. එතුමා කියන්නේ අපි මෙච්චර වියදම් කරනවා මේ දේවලුත් කරන ගමන් ඒවත් අපේ සභාව සතු කාර්ය මණ්ඩලයට වැඩ කටයුතු කරන්න නිසි තැනක් නැහැ කියා. ඒ ගැන එක අතකින් අපි කනගාටු වෙන්න ඕන. එමනිසා ඔබතුමාට විරුද්ධව නෙමේ කියන්නේ. මේ දේවලුත් කරන ගමන් ඒ දෙයත් කරන්න කියලයි එතුමා කියන්නේ. එමනිසා ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් මහත්තයට මං එදත් කිව්වා කවුරුත් අවතක්සේරු කරන්න එපා. විපක්ෂ නායකතුමා මේ කරුණු දක්වන්නේ එතුමා මේ සභාවට අපි

වගේම ආදරෙයි. එතුමා කැමතියි අම්බලන්ගොඩ නගරය දියුණු වෙනවට.ලස්සන වෙනවට.එතුමා අම්බලන්ගොඩ ඉපදිච්ච අම්බලන්ගොඩ හැදිච්ච අම්බලන්ගොඩ සෙල්ලම් කරපු කෙනෙක්.අපි හැමෝම කැමතියි අම්බලන්ගොඩ නගරයේ පුරවැසියන්ගේ දියුණුව ඇති කරන්න. එතුමා කැමතියි මේ අම්බලන්ගොඩ නගරය ලස්සන කරන්න. අපි ඔක්කොම කැමතියි නගර සභාවේ පුරවැසියන් විදියට වැඩ කරන්න. ඔබතුමාට විරුද්ධව කතා කරනවා නෙමේ. ඒ නිසා අනිවාර්යෙන්ම ගොඩනැගිල්ල හදන එක අනිවාර්යෙන්ම කරන්න ඕන. මං කියන්නේ මේවට කෝටිගණන් වියදම් කරනවා වගේ ගොඩනැගිල්ල හදන්න කියලයි.ළමයින්ට පොත් දෙනවා වගේම මෙයත් කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් මේ පෙළ පොත් බෙදා දෙන එක අපි අගය කරනවා. එය අනුමත කළ ගරු මන්ත්‍රිවරු සමගම .මෙතැන ලොකු ගැටළුවක් තිබෙනවා. මා දකින ගැටළුව අපි දිනපු මන්ත්‍රීවරු කියලා වෙනසක් කළ යුතු නැහැ.ජන්දෙන් තේරුණත් එකයි.නැතත් එකයි. එක එක දෙයක් . අපට 150ක් දෙනවිට 150 දිය යුතුයි කියන තැන මා සිටිනවා. ඇත්තටම තල්ගස්ගොඩ කොට්ඨාසෙ උප සභාපතිතුමාට අයදුම්පත් 150 ක් දෙනකොට එතුමාගෙ ජන්ද සංඛ්‍යාව දෙදහස් ගානක් මං හිතන්නේ. දිනපු මන්ත්‍රීවරයෙක් විදියට අපේ කොට්ඨාසෙ නියෝජනය කරන්න ඉන්නේ මං විතරයි.තලගස්ගොඩත් එතුමා විතරයි. අනිත් හැම කොට්ඨාශයටම ගරු මන්ත්‍රිවරු දෙන්නා තුන්දෙනා විතරයි.ගරු ලසන්ත මන්ත්‍රීතුමාටත් එහෙමයි.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ඔබතුමා අපේ කොට්ඨාශයේ ගරු නගර සභා මන්ත්‍රි පේෂලා මහත්මියගෙනුත් ඉල්ලා ගියා කිවුවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

මා 5ක් හෙප්පුමුල්ලටයි තල්ගස්ගොඩයි දුන්නා.

<u>**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

තමන්ගේ කොට්ඨාශයේ දුන්නානම් හරි . සියලු මන්ත්‍රීවරුන්ට මං මේක පැහැදිලි කරලා දෙන්නම්. කලින් පොත් බෙදද්දී මන්ත්‍රීවරු 12 යි හිටියේ. අපි 150 ගානෙ දුන්නම 1800 යි දුන්නේ. අද ඔබතුමාල වැඩියෙන් ඉන්න 75 ගණනේ දුන්නාම 1800 ට වැඩියේ අමතරව තව 825 කටත් දෙන්න වෙලා තියෙනවා.ඔබතුමාල දීල තියෙනවා සමහර ඒවා හොඳට සල්ලි තියෙන තැන්වලට.ග්‍රාමසේවක මහත්වරු කියලා තියෙනවා. එහෙම වෙච්ච තැන් තිබෙනවා. සල්ලි නෑ කියලා අත්සන් කරන්න බැහැ කියලා. ඇත්තටම අම්බලන්ගොඩ මෙච්චර දුප්පතුන් නැහැ. අපට 1800 කින් 2000 කින් ගොඩඑන්න තිබුණා. දැන් ඊට වැඩියේ ගාණක් දෙනවා. මෙතන මන්ත්‍රීවරු වැඩිවීම නිසා 2800 ක් විතර දෙන්න වෙලා තියෙනවා.අන්න එක තේරුම් ගන්න . මන්ත්‍රීවරු 12 ඉන්න කාලෙ මෙච්චර අයදුම්පත් ගැහුවෙත් නැහැ. උපරිම 2000ක් තමයි ගහන්න ඇත්තේ.

**ගරු නගර සභා මන්ත්‍රී  මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, දේශපාලනෙන් තොරවයි අපි ඒ කටයුත්ත කළේ. මං අයදුම්පත් 150 න් 140 ක් තමයි බෙදුවේ. මොකද තල්ගස්ගොඩට අපේ නියෝජනය මදියි ඇත්තටම. අපේ අයටත් සමසේ දුන්නාද දන්නේ නැහැ. 150 140ක් පමණ තමයි මා දුන්නේ . මා ගරු නගර සභා මන්ත්‍රි පේෂලා මහත්මියගෙන් අයදුම්පත් 05ක් පමණ ලබා දුන්නේ. කොහොමත් මේ කර්තව්‍ය පිළිබඳව අගය කිරීමක් කරනවා. ඒක හොඳයි. එය කළයුතු දෙයක් .අඩුපාඩු තියෙනවා.වැඩක් ප්‍රායෝගිකව කරන්න අමාරුයි.මීට වඩා සාධාරණ විදියට ඉදිරියට කරන වැඩසටහන් කරන්න කියල මං ඉල්ලනවා ඔබතුමාගෙන්.

**ගරු නගර සභා මන්ත්‍රී  රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , හොඳ මාතෘකාවක්.අපිත් කලින් ඔබතුමාගේ මූලිකත්වය යටතේ පොත් බෙදාදීල තියෙනවා. මමත් සභාව නියෝජනය කරලා බෙදල තියෙනවා. නමුත් මේ යෝජනාවට  අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. අපි කැමතියි.නමුත් අපි රජයෙ මුදල් වැයකරන්නේ.මං හිතන්නෙ ලේකම්තුමිය දන්නවා මේකට ඇස්තමේන්තගත මුදලක් වෙන්කරන්න ඕන.යෝජනාවක් සම්මත කරගන්න ඕන.හැබැයි සතුටු වෙනවා මොකද යෝජනා සම්මත වෙන්න කලින් මා මේ පොත් අයදුම්පත් ලබා දි තිබෙනවා.ඔබතුමා තමයි මට කිව්වෙ පොත් අයදුම්පත් තියෙනව කියලා. ඒවා අපේ සමහර මන්ත්‍රීවරුන්ට හම්බවුණේ පාලක පක්ෂයේ මන්ත්‍රීවරුන්ට බෙදුවට පස්සෙ. ඒ පිළිබඳ ඔබතුමා මා හට දැනුම් දිම ගැන ස්තුති වන්ත වෙනවා. එතකොට අම්බලන්ගොඩ බල ප්‍රදේශය තුළ 2020 වර්ෂයට පාසල් ළමුන් සඳහා නොමිලේ අභ්‍යාස පොත් ලබාදීම තමයි මාතෘකාව. 5.1.3 යටතේ තියෙන්නෙ මේකෙ යෝජනාවනෙ. සභාපතිතුමනි මං අහන්න කැමතියි මේ අයදුම් පත් එක් එක් මන්ත්‍රිවරුන්ට දුන් ආකාරය. ඉදිරිපත් කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මං ඒකතමයි කිවුවේ කොට්ඨාසෙන් දිනපු මන්ත්‍රීවරු ඉන්නවනෙ.ඒ අයට 150කුත් අනෙක් අයට 75කුත් ලබා දී තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

නැහැ. එහෙම නෙමේ දි තිබෙන්නේ. මට ඉදිරිපත් කරන්න විෂය භාර නිලධාරී ඔබතුමාට කියද ? උප සභාපතිතුමාට කීයද? සරත් මන්ත්‍රීතුමාට කීයද?ශ්‍රේෂන් මන්ත්‍රීතුමාට කීයද?ඒ ඒ ප්‍රමාණ  ඉදිරිපත් කරන්න .

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒක තමයි කිවුවේ. කොට්ඨාශයෙන් දිනපු ගරු මන්ත්‍රිවරු ඉන්නවානේ. අපේ මන්ත්‍රීවරු 10 යි.සෝභිත මන්ත්‍රීතුමාට අතුල මන්ත්‍රීතුමාට 150 ගානෙ යවලා තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී  රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

එතකොට සම්පූර්ණ අයදුම්පත් ගණන කියද?

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

150යි. එතකොට අනෙක් ගරු මන්ත්‍රීවරුන්ට 75ක් ලබා දෙනවා

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

එක තමයි එකතු කරලා ගත්තාමනේ. ඔබතුමාත් ගන්න ඇති.

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හරි මටත් 150.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මන්ත්‍රීවරුන්ට ගණන් හදාගන්න පුළුවන්නේ. එතකොට කොච්චර මුදල් වැයකරලා තියෙනවාද?

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ අනුමැතිය අපි ගන්නවා. ඔයගොල්ලො අකමැති නම් නොදී ඉන්නම්. ඔච්චර කතාකරන්න දෙයක් නෑ. ළමයින්ට දෙන සහනයක්. මේක දීලදාමු.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

අපි සහනෙ දෙනවා සාධාරණ විදියට කෙරෙන්න ඕන. ඒකයි මේ කතා කරන්නේ. නමුත් පාර්ලිමේන්තුවේ 225 ක් ඉන්නකොට දිනල ආපු අය 189 ක් ඉන්නවා. ජාතික ලැයිස්තුවෙන් අනිත් අය . අරයට හම්බෙන ප්‍රතිපාදන තමයි අනෙක් කෙනාටත්. මං ඇත්තටම සතුටු වෙනවා මගේ කොට්ඨාසෙ ඉන්නවා ගරු නගර සභා සරත්චන්ද්‍ර මන්ත්‍රීතුමා , මම , අයිරාංගනී මන්ත්‍රීතුමිය, ධම්මක මන්ත්‍රීතුමා.මං හිතන්නෙ තුන්සිය ගාණක් .මගේ අයදුම්පත් බෙදාගන්න බැරිව මං කිව්වා ඕන කෙනෙකුට බෙදාදෙන්න කියලා. ඔබතුමාගේ වැඩපිළිවළ අපි අභය කරනවා. එහි ගැටළුවක් නැහැ. ඔබතුමාට කරන්න තිබුණේ 100 ගානෙ වගේ බැලන්ස් කරලා බෙදලා දෙන්න.මීට පස්සේ කරනකොට එහෙම කරන්න.මට නම් අයදුම්පත් දුන්නාත් එකයි නොදුන්නාත් එකයි.මගේ කොටස ඔක්කොම බෙදලා ඉවරයි. කොඩිකාර මන්ත්‍රිතුමා කෙටසක් බෙදලා තිබෙනවා.

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඉතිරි තිබෙනවා නම් අනිත් ගරු මන්ත්‍රිවරුන්ට බෙදලා දෙන්න. ඔක්කොටම දිලා තිබෙන්නේ. මා හිතන්නේ ගරු උප සභාපතිතුමා ඔක්කොටම බෙදලා තිබෙන්නේ. මා හිතන්නේ එතුමා 250 කට වැඩියේ බෙදලත් තිබෙනවා.

**ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ඔව් මං ඉල්ල ඉල්ල බෙදුවා .

**<u>ගරු නගර සභා මන්ත්‍රී  රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්</u>**

ඔයගොල්ලො දන්නෑ මේකෙ යට තියෙන ගේම් එක. පොත් බෙදා දීලා ඉවර කරන්නකෝ. මං පසසෙ කතාකරන්නම් ඒ සම්බන්ධයෙන්. ඔබතුමාට අපි ස්තුති වන්ත වෙනවා මේ වගේ වැඩසටහනක් කිරිම සම්බන්ධව. යෝජනාවට අපේ සියළු සහායෝගය ලබා දෙනවා. පොඩි අතපසු කිරීමකුත් කරල පොඩි ප්‍රශ්නෙකටත් ආවා. ඒව ඉතින් නීතිඥ මහත්තුරුන්ගේ ගැටනේ.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමා දන්නවානේ ඕක බෙදන විදිය. වෙනදා කරන ලද ක්‍රමයටම කළා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී  රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්</u>**

හැබැයි මෙහෙම දෙයක් තියෙනවා අයදුම්පත නගර සභාවෙන් පිට අයට බෙදල තිබුණොත් වහාම ක්‍රියාමාර්ගයක් ගත යුතුයි.අපට දැන ගන්න තිබෙනවා දැනටත් .අපේ කොට්ඨාස 13 යි තියෙන්නෙ.කොට්ඨාස දහතුනේ නැතිබැරි ළමයින්ට ඒ පොත් ලැබෙන්න ඕන.ඒ නිසා ගරු සභාපතිතුමනි,ඔබතුමා වගකීමෙන් කටයුතු කරන්න කියලා මං නිහඬ වෙනවා.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

රාහුල මන්ත්‍රීතුමා ඇත්තටම සතුටු වෙන්න ඕන.ඔබතුමාගෙ කොට්ඨාශයට 375 ක් හම්බවුණා.ගරු නගර සභා මන්ත්‍රි පේෂලා මහත්මිය තමයි මුලින්ම ගෙන ගියේ. වාද විවාද කරන්න දෙයක් නෑ.අපේ බලප්‍රෙද්ශයේ දරුවන්ට දෙන දෙයක්.අපි කොට්ඨාශ වලට සමව  දී තිබෙනවා. විශේෂයෙන් අපි සතුටු වෙන්න ඕන. ගරු නගර සභා මන්ත්‍රි රාහුල මහතාගේ කොට්ඨාශයට 375ක් හම්බ වුණා. මා බෙදුව එක්ක ඇත්ත. මට ස්තුතියක් කරන්න ඕන. මගේ කොට්ඨාශෙ විශාල ප්‍රමාණයක් ඉන්නවා.දීපු අයදුම්පත් ප්‍රමාණය මදියි.ගරු සභාපතිතුමා මට අයදුම් පත් 20ක් එවා තිබුණා. සරත් ශ්‍රීලාල් මන්ත්‍රීතුමාගෙන්,ජගත් මන්ත්‍රීතුමාගෙන්,ධම්මික මන්ත්‍රීතුමාගෙන් ඉල්ල ගත්තා.මා ගරු නගර සභා මන්ත්‍රි රාහුල මහතාගෙනුත් ඉල්ලුවා. එතුමා දුන්නේ නැති වුණාට . මං මගේ සහෝදර මන්ත්‍රීවරුන්ගෙන් 100 ක් ඉල්ල ගත්තා.ඇත්තටම එතුමන්ලා මට සහයෝගය ලබාදීම පිළිබඳව ස්තුතිය පුදකරනවා.මේ සඳහා සියලු දෙනාගේ සහයෝගය ලබාදෙන්න කියල මං ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රනී  ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ඇත්තටම සද්භාවයෙන් නගර වැසියන් වෙනුවෙන් ඔබතුමා කරන කාර්යය පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. නමුත් ඒ ප්‍රතිලාභය අපේ ජනතාවට ලබා දෙනවා නම් නියම සුදුස්සන්ට ලැබිය යුතුයි.ඒක සභාපතිතුමාගේත් මන්ත්‍රීවරුන්ගේත් යුතුකමක් හා වගකීමක් වශයෙන් මා විශ්වාස කරනවා. .ලේකම්තුමිය ඇතුළු කාර්යමණ්ඩලය අපහසුතාවයට පත්නොවන විදියට අපි ඒ යුතුකම ඉෂ්ඨ කරන්න ඕන. විපක්ෂ නායකතුමාට ග්‍රේෂන් මන්ත්‍රීතුමා කතාකිරීම සම්බන්ධව කණගාටු වෙනවා.අද උපාධිධාරියෙකු වුවත් විකටයෙක් වගේ ග්‍රේෂන් මන්ත්‍රීතුමා අද සභා තුළ පත්විම ගැන.මොකද කලින් සභාවක මා ගරු මන්ත්‍රිවරියක් වශයෙන් එතුමා සමඟ මා මේ සභාව  නියෝජනය කළා. මං ලොකු විශ්වාසයකින් හිටියේ එතුමා න මං නිතරම කිව්වෙ ඔබතුමාට තියෙන්නේ නියම  උපාධියක්  ඔබතුමා උපසභාපති හෝ සභාපති වෙන්න ඕන කියලා. නමුත් අද මන්ත්‍රීකමටත් නුසුදුසු තත්ත්වෙට පත්වෙච්ච එක ගැන සභාවේ

අප්‍රසාදය කනගාටුවෙන් ප්‍රකාශ කරනවා.ඒ වගේම මා ගරු සභාපතිතුමාටත් කිව යුතුයි අපි මහජන නියෝජිතයෝ වුණාට ඒ කියන්න ඕන ටික ගරු විපක්ෂනායකතුමාත් මාගේ ගරු සහෝදර මන්ත්‍රී රාහුල මහතාත් ප්‍රකාශ කළා. මොකද අපි ඔබතුමාව නිකං මුරුංගා අත්තේ තියා වැඩ කරන්න ගියාම මෙතැන ඉන්න ගරු මන්ත්‍රීවරු දන්නවා ඒ අය වැඩකරගත යුතු ආකරය ගැන. අපට එහෙම මුරුංගා අත්තේ තබා වැඩ කරගන්න ප්‍රසංඥා කරලා වැරැද්දට වැරැද්ද කියන්න තමයි අප පුරුදු වෙලා තිබෙන්නේ. ඒ අනුව තමයි කටයුතු කරන්නේ. පොත් ටික මං දෙන්නේ සුදුසු අයට.අයදුම්පත් 75 ට ඒක නොලැබුණත් මං පෞද්ගලිකව හරි මගේ සේවාදායකයෙකුගෙන් අරගෙන හරි මම කරනවා. ඔබතුමා දැනගන්න ඕන.මන්ත්‍රීවරු සියලු දෙනාම එකයි.අපිත් යම්කිසි ප්‍රතිශතයක් අරගෙන තමයි පක්ෂෙන් නම්කරල තියෙන්නේ.ඔබතුමන්ලා කොට්ඨාස මට්ටමෙන් ආවත් අපි පක්ෂෙන් ආවත් අපි එකම සේවය කරන්නේ. සමහරවිට ඔබතුමාගෙ පක්ෂෙ ඉන්න අයට වඩා කැපවෙලා මේ අම්බලන්ගොඩ ජනතාවට අපි සේවයක් කරනවා. පහුගිය කාලෙ මම මන්ත්‍රීවරියක් විදියට කටයුතු කරද්දි මහ අම්බලන්ගොඩ ලක්ෂ දාහක විතර වැඩකරන්න මං ඔබතුමාට ශ්‍රමය දුන්නා.ඒ වෙලාවෙ ඔබතුමා ප්‍රශංසා කළා නිලානි හොඳයි කියලා.මගේ කාලය වෙන වැඩවලට යෙදවුවේ නැහැ. ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් කැපකළා.නිවසින් මගේ සහෝදරයින්ගෙන් බැනුම් ඇහුවා.නගර සභාවේ සේවකයෙක් වගේ වැඩකරනවා කියලා. ඒ වගේ තත්ත්වයට මා පත්වුණා. ලක්ෂ්මී මන්ත්‍රීතුමිය මහ අම්බලන්ගොඩ පාරක තාර දාන්න නියම කරලා. මා මෙය මා වර්ණා කරන්න කියන දෙයක් නෙමේ. කර්මාන්ත අංශයේ සේවකයින්ට තේ ටිකක්වත් දෙන්න ඒ පාරේ කිසිකෙනෙක් කටයුතු කරලා නැහැ.ඔවුන් කැන්ටින් එකට ගිහින් එන්න පැයක් 1 ½ ක් ගතවෙනවා. එම නිසා අපේ යුතුකම හා වගකීම තමයි එම සේවකයන්ට ඒ තේ ටික හරි අරගෙන දෙන්න. මා හිතන්නේ ගරු නගර සභා මන්ත්‍රී ලක්ෂ්මී මහත්මියගේ පාරේ නම්කළ පාරේ තේ ටිකක් දෙන්න කවුරුත් හිටියේ නැහැ. එහෙම නොසිටිය නිසා මං කඩේට ගිහින් ඔවුන්ට රුපියල් 500 ක ක දේවල් අරගෙන දිලා ඒ අයට කිවුවා යන්න එපා . මං කියන්නෙ ඔබතුමාට ඇත්තටම කරන දේ ඔබතුමා ඉදිරියට යන්න ඕන නම් මෙතැන පැලවෙලා ඉන්න ඕනනම් මේ විදියටම කරගෙන යන්න.අපි කැමතියි ඔබතුමාට . ඔබතුමාගේ පියා, ඔබතුමාගේ පවුල ගැන අපි හොඳට දන්නවා. එමනිසා මේ හැඟීමෙන් කතා කරන්නේ. ඔබතුමාට නිවැරදි මාර්ගයේ යන්න මින් මත්තටවත් නිවැරදිව කටයුතු කරන්න කියලා කියනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රනී ඒ.පී ලක්ෂ්මී හේමන්තා මෙනවිය  කතා කරමින්</u>

දැන් මේ පාසැල් පොත් බෙදා දීම පිළිබඳ මේ ප්‍රශ්නය පැන නැගුනේ. කෙහොම නමුත් ඔබතුමා මේ කරන්නා වූ සත්කාරයට මා ස්තුති වන්ත වෙනවා. පොඩිපොඩි මත ගැටුම් ඇති වුණත් අපි 21නා අපි සාහෝදරයෝ වගේ මෙතැන. ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවිය ඇත්තටම අවේගශීලිව තමයි කතා කළේ හරිම දුකෙන්. එතුමිය අම්බලන්ගොඩ ඕනැම මලගෙදරකට සහභාගි වන ගරු මන්ත්‍රීවරියක්. එතුමියගේ කතාවත් ඇත්ත. මා එදා නිවසේ සිටියේ නැහැ. මා එදා කතරගම යනවිට තමයි කතා කර කිවුවේ. එතුමිය තේ අරගෙන දි තිබුණා. ඉතිං එතුමිය කරන සත්කාරයත් අපි අගය කරන්න ඕන. දැන් මේ වේලා කියන අයදුම්පත් බෙදිම සම්බන්ධව මින් මත්තට ඒ පිළිබඳවත් සාධාරණව හිතලා ඒ කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. අපි පොත් ලබා දෙන්නේ නගර සභා සිමාව තුළ . ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා ප්‍රකාශ කළ පරිදි නගර සභා සිමාවෙන් පිටත ද කියා අපේ ඒ

නිලධාරිතුමියට කියන්න මේ අපේ සීමාවෙන් පිටතද කියා බලන්න කියා. එහෙම අම්බලන්ගොඩ නගර සභා සීමාවෙන් පිටතට නොදීමට වග බලා ගන්නා ලෙස ඉල්ලා සිටිනවා. මේ සත්කාරය කිරිමට ඔබතුමාට තව තවත් ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රර්ථනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මුලින්ම කියන්න ඕන ඉස්සා කියන සතා ඔළුවේ යමක් තියාගෙන තමන් සූදනා කියලා කියනවා.ඒ වගේ තත්ත්වයක් තමයි මෙතන සමහර කතාවලදි ඉස්මතු වෙන්නේ.මොකද ඒව ඇදගන්න ලැස්ති වුණොත් පෞද්ගලික අපි ළඟ තොරතුරු තිබෙනවා.මං කැමති නැහැ කිසිඳු මන්ත්‍රීවරයෙක් අපහාසෙට ලක්කරන්න. මා ළඟ තොරතුරු තිබෙනවා. පුද්ගලික ජීවිත වලත් තොරතුරු තිබෙනවා. ඔය කතා කරන පුද්ගලයෝ ගැන.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමා විෂයට අදාලව කතා කරන්න. පෞද්ගලික දේවල් කතා කරන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මා එහෙම කියද්දි තමයි උදැල්ල දැම්මේ. එහෙමනම් මේ ටික අහගන්න. අභ්‍යාස පොත් බෙදා දීම සත්භාවයෙන් කරනවා නම් එය හරි .නමුත් ඔය අභ්‍යාස පොත් සම්පූර්ණ වටිනාකම රු.1000/= ක් හරි රු.2000/= ක් හරි ඔතැන තිබෙන්නේ. පොතේ ගහන මිළ නෙමේ පොත් ගොඩක් ගන්න කොට තිබෙන්න්.එතකොට මේ සැබෑ වටිනාකම ඔය තක්සේරු කර තිබෙන මුදලට වඩා අඩුවෙයි. අනෙක් කාරණය තමයි මේ පොත් බෙදන කොට ගරු සභාපතිතුමාගේ වත් කාගේවත් ඡායාරූපයක් මේ පොතේ දමන්න එපා. මේවා ජනතාවගේ බදු මුදල්.මේවා අරගෙන අපේ ඡයාරූප දමා ගන්න අවශ්‍ය නැහැ. ඒක වැරදියි. අතිගරු ජනාධිපති නෙමේ කවුරු ගැහුවත් ජනාධිපතිගේ පුද්ගලික දේවල් මේවාට යොදන්නේ නැහැ. මහජන මුදල්.ඔය කාරණා ටික තමයි මට කියන්න තිබෙන්නේ. සභාව යම්කිසි පුද්ගලයෙකුට පුද්ගලිකව හානි වන විදියට කතා කරනවානම් එය තමා හිතලා නතර කර ගන්න. නැතිනම් අපිත් සූදානම් පුද්ගලික මත අනුව කතා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඒ අය ඉල්ලුවා කියා අපිට එහෙම කතා කරන්න ඕන නැහැ. මේ පොත් බෙදා දීම ඉතා හොඳ කර්තව්‍යයක්. ඒ වගේම මටත් පොඩි ගැටළුවක් වුණා. සමහර කොට්ඨාශ වල මන්ත්‍රීවරු තුන් හතර දෙනා සිටිනවා. මාගේ කොට්ඨාශයේ මාත් එතුමාත් විතරයි. කොහොම වුණත් මට ඇත්තටම මදි වෙනවා . තුන් හතර දෙනා සිටින තැන්වලට ගැටළුවක් නැහැ. හත්සිය පනහක් දිපු තැන්වල 150ක් විතර ඉතිරි වෙලා තිබෙනවා. නමුත් අපේ ළඟ එකක්වත් ඉතිරි වෙලා නැහැ.අපට ගැටළුවක් නැහැ.මාගේ කොට්ඨාශයේ සිටින්නේ මාත් ඔබතුමාත් පමණයි. සමහර විට පොත් අයදුම් පත් දෙන්න කලින් දෙමාපියන් අපේ නිවසට පැමිණ අවසන්. දි ගන්න විදියක් නැතිව. ගරු නගර සභා මන්ත්‍රි නිලානි මෙනවිය කිව්වා ඒ අයට පසුව බෙදුවයි කියා. අපටත් කලින් මෙන්න මෙතුමාන්ලා ගත්තේ. අපි ගනු ලැබුවේ පසුවයි.එහෙම විතරක් අපට විතරක් බෙදාගෙන කෙරුවේ නැහැ. එහෙම වැරදි චෝදනා කරන්න එපා.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒවා බෙදද්දි මටත් කලින් ගරු නගර සභා මන්ත්‍රී අතුල මහතා ගෙනගිහින් තිබුණා.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මටත් කලින් අතුල මන්තුතුමා අරන් ගිහින් තිබුණා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එහෙම කියන්න එපා. මේ අය දැන් කියන්නේ එහෙම කළා කියා.කොහොම වුණත් හොඳ වැඩක් . තවදුරටත් මේ වැඩසටහන් කරන්න කියලා කියනවා.අපි සහයෝගය ලබාදෙනවා.මොකද අපි මේව කරන්නෙ නගරෙ ජනතාවගෙ බදු මුදල්වලින්. එම නිසා මේ නගරයේ ජනතාවට අපෙනුත් යම්කිසි කාර්යයක් කළ යුතුයි. ඉතිරි වසර වලත් මෙම කාර්ය කිරිමට ඔබතුමාට ශක්තිය ධෛර්යය ලැබෙන්න කියල ප්‍රාර්ථනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

අපේ විපක්ෂ මන්ත්‍රීවරුන් මුකුත් හිතන්න එපා. මොකද දේශපාලන මුහුණුවරකින් කරන ලද වැඩක් කියා මට හිතෙන්නේ නැහැ. එහෙම නම් මට ගරු සභාපතිතුමා සමඟ රණ්ඩු වෙන්න සිද්ධ වෙලා තිබෙනවා. මට 150 ක් දෙනකොට මගේ හිතවත් අයට විරුද්ධ පාක්ෂිකයින්ට 225 ක් ගිහිල්ල තියෙනවා. ඒ නිසා දේශපාලනික වශයෙන් හිතන්න අවශ්‍ය නැහැ.එහෙම දේශපාලනික හිතනවානම් මට විශාල අවාසියක් සිදු වෙලා තිබෙනවා. ඒ ගැන හිතන්නේ නැතිව අපි මේ වැඩේ කරගෙන යමු කියල මං කියනවා. අපිට පුළුවන් නම් අපි ඔබතුමාලාටත් උදවු කරලා ගමේ වැඩය කළ යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , අමතක වෙච්ච දෙයක් තිබෙනවා. මේ පාසැල් පොත් ලබා දෙන්න අයදුම්පත් දුන්නේ පාසැල් නිවාඩුවට දවස් 2 කට කලින්නෙ. මේ අයදුම්පත් දුන්නෙ. ඒ නිසා අපේ කොට්ඨාසෙ විදුහල්පතිවරුන්ගෙන් අත්සන් කරගන්න බැරිවුණු පිරිසක් ඉන්නවා. තවමත් විදුහල්පතිවරුන්ගේ අත්සන යොදා ගැනීමට නොහැකි පිරිසක් තවමත් සිටිනවා. ඒ ගැන අවධානය යොමුකරන්න කියල මං කියනවා.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නිවාඩු දුන්නට විදුහල්පතිවරු පාසලට පැමිණෙනවා. කොහොමවුණත් අපි අනිවාර්යයෙන්ම මේ දේවල් සලකා බලනවා ඒ ළමයා මෙහේ පාසලක ඉන්නවද කියලා. ස්ථිර පදිංචිය හා අඩු ආදායම්ලාභියෙක්ද කියන එක ග්‍රාම නිලධාරී සනාථ කරනවා. නාගරික මන්ත්‍රී සනාථ කරනවා මෙයා මගේ කොට්ඨාසෙ කියලා.ඒව අපේ නිලධාරීන් බලනවා.එහෙම නොවන අයදුම්පත් අපි අයින් කරනවා.

ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි , ග්‍රාම නිලධාරි මහතුන්ට මේ අඩු ආදායම්ලාභි කියන එක ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. රජයේ සේවයන්ට දි තියෙනවා.ග්‍රාම නිලධාරී විසින් රජයේ නිලධාරීන් දරණ නිලතලය ලියනවා. ඒ වුනාට ඒව ගණන් ගන්න එපා කියල මං කියනවා.

ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මා මේ සම්බන්ධව ගරු ප්‍රාදේශිය ලේකම්තුමිය දැනුවත් කළා. මාත් දන්නවා දෙමව්පියෙක් විදියට මටත් දරුවො තුන්දෙනෙක් ඉන්නවා.ඒ නිසා තුන්දෙනෙකුට පොත් ගන්න ගියාම වියදම කොහොමද කියලා මං දන්නවා.විශේෂයෙන් රජයේ සේවකයන්ට. එහෙම තුන්දෙනෙකුට ගන්න ගියාම විශාල වියදමක් යනවා. මම ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කළා ඒ සම්බන්ධව ග්‍රාම නිලධාරී මහත්වරුන්ට උපදෙස් දෙන්න කරන්න කියලා.ඒ අනුව එන ඕනැම කෙනෙකුට කටයුතු කරන්න කියා. මෙහිදි අපේ සිටින ඕනැම වැසියෙකුගේ දුප්පත් දරුවෙකුගේ අඩුආදායම්ලාභී දෙමව්පියෙකුගෙ ළමයෙක් ඉන්නවනම් මා හමුවට එවන්න ඒක විශේෂ එකක් විදියට දෙන්න පුළුවන්.කිසිම කෙනෙකුට මෙම අයදුම්පත් නොලැබි තිබෙන්න බැහැ. හැබැයි හොඳ රැකියාවක් කරන හොඳට සල්ලි තියෙන අයට දෙන්න එපා.දුප්පත් දරුවන්ට මෙය ලබා දෙන්න. අපි තක්සේරු කර තිබෙනවා මෙය හරියට දෙනවා නම් ළමයි1500 කට වඩා දෙන්න වෙන්නේ නැහැ.මේව හොඳ සල්ලිකාරයොන්ගෙ දරුවොත් ගන්නවා.ඕක තමයි වෙලා තිබෙන්නේ. බෙදන කොට පෙනේවි.මොකද දෙමව්පියො එක්කනෙ පොත් ගන්න එන්නේ.හොරෙන් දෙන්නෙ නැහැ.ගමේ පන්සලේදි තමයි දෙන්නේ. මේකට විරුද්ධව කවුරුහරි ඉන්නවද?

ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්

සභාපතිතුමනි ඕකට තව ඌනපූරණයක් තියෙනවා.මං යෝජනා කරනවා හැකිනම් නගර සභාවේ සේවක මහත්ම මහත්මීන්ටත් දෙන්න.

ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ඔව් .දෙනවා .මේ යෝජනාවට විරුද්ධ කවුද? විරුද්ධව නැහැ.එහෙනම් ඒකමතිකව සම්මත කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ සිටින පාසල් ළමුන් සඳහා 2020 වර්ෂයට අවශ්‍ය වන අභ්‍යාස පොත් නොමිලේ ලබාදීම සුදුසු යැයි ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.02 2019 වර්ෂය සඳහා පරිපූරක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2019 වර්ෂය සඳහා පරිපූරක ඇස්තමේන්තුව ගරු සභාවට ඉදිරිපත් කිරිමට යෝජනා කරන ලදී. ඒ අනුව 05.01.02 මුදල් සපයා ගැනීම සඳහා පරිපූරක අයවැය ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනවා. පුනරාවර්ථන ආදායම රු.10363/= මුදදර ගාස්තු. 2019 වර්ෂයට ආදායම ලක්ෂ දෙසිය පහයි. පරිපූරකයක් ඉදිරිපත් කරනවා ලක්ෂ 50 ක.මේ ආකාරයෙන් මං යෝජනා කරනවා 2019 මුද්දර ගාස්තු ඇස්තමේන්තු කර ඇත්තේ දෙලක්ෂ පනස්දාහකි. 2006 වර්ෂයට ඇස්තමේන්තු කළ මුද්දර ගාස්තු ආදායම ලක්ෂ මිලියන 15 යි. 2016 සඳහා මිලියන 27.124 ක් ලැබී තියෙනවා. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමට වඩා මිලියන 12.12 ක් ලැබී තියෙනවා. එම නිසා නගර සභා ආඥ පනතේ 178(2) වගන්තිය අනුව මුද්දර ගාස්තු මිලියන 05 ක පරිපූරක ඇස්තමේන්තුවක් මම යෝජනා කරනවා. මේ සම්බන්ධයෙන් විරුද්ධවන කවුරුත් ඉන්නවද? නෑ. සම්මතයි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ස්ථිර කරනවා. අම්බලන්ගොඩ දහම් පාසැල් වැඩිහිටි දරුවන් සඳහා හා පිරිවෙන් සඳහා පොත් කට්ටල ලබාදෙන මා ඉල්ලිමක් කරනවා.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය මෙහි තිබෙනවා.

**තීරණය-**

2019 වර්ෂය සඳහා පරිපූරක අයවැය ලේඛනය පිළිගැනීමට සුදුසු බව ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.03 අම්බලන්ගොඩ බල අඩු ආදායම්ලාභි ප්‍රදේශයේ වැඩිහිටි දහම් පාසැල් සිසුන් සහ පිරිවෙන් ස්වාමින් වහන්සේලා කෙරෙහි පොත් කට්ටල ලබාදිමට සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පාසල් සිසුන් හා පිරිවෙන්ගත ස්වාමීන් වහන්සේලා සඳහා අභ්‍යාස පොත් කට්ටල බෙදාදීම සඳහා යෝජනා කරනවා . එය කතා කරන්න දෙයක් නැහැනේ එකහයිනේ.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පාසල් සිසුන් හා පිරිවෙන්ගත ස්වාමීන් වහන්සේලා සඳහා අභ්‍යාස පොත් කට්ටල බෙදාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.04 ඕකන්ද ප්‍රජාශාලාව පිටත පින්තාරු කිරීම හා අලුත්වැඩියාව සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී**

<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඕකන්ද ප්‍රජාශාලාව පිටත පින්තාරු කිරීම හා අලුත්වැඩියාව සඳහා මම යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>

ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

**තීරණය-**

ඕකන්ද ප්‍රජාශාලාව පිටත පින්තාරු කිරීම හා අලුත්වැඩියා කටයුතු සිදුකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.05 පොල්වත්ත ,පියවර පෙරපාසලේ පිටත පින්තාරු කිරීම සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පොල්වත්ත ,පියවර පෙරපාසලේ පිටත පින්තාරු කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>

ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

**තීරණය-**

පොල්වත්ත ,පියවර පෙරපාසලේ පිටත පින්තාරු කිරීමේ කටයුතු සිදුකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ධනසේන මාදුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.06 මහ අම්බලන්ගොඩ , කරෝලිස් වෙද මාවත හරස් පාර තාර දැමීම සුදුසු බවට කරන ලද**

**යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මහ අම්බලන්ගොඩ , කරෝලිස් වෙද මාවත හරස් පාර තාර දැමීම සුදුසු බවට යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>

ස්ථිර කරනවා.

**තීරණය-**

මහ අම්බලන්ගොඩ , කරෝලිස් වෙද මාවත හරස් පාර තාර දැමීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.07 මහ අම්බලන්ගොඩ , තුඩුවෙමුල්ල පාර සිට තොටුපල පාර දක්වා කොටස තාර දැමීම සුදුසු**

**බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මහ අම්බලන්ගොඩ , තුඩුවෙමුල්ල පාර සිට තොටුපල පාර දක්වා කොටස තාර දැමීම සුදුසු බවට යෝජනා කරනවා .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි ලක්ෂ්මි හේමන්තා මහතා කතා කරමින්</u>**

ස්ථිර කරනවා.

**තීරණය-**

මහ අම්බලන්ගොඩ , තුඩුවෙමුල්ල පාර සිට තොටුපල පාර දක්වා කොටස තාර දැමීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී ද සිල්වා මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.08 මහ අම්බලන්ගොඩ , තුඩුවෙමුල්ල පාරෙන් අතුරු පාර තාර දැමීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මහ අම්බලන්ගොඩ , තුඩුවෙමුල්ල පාරෙන් අතුරු පාර තාර දැමීම සුදුසු බවට යෝජනා කරනවා .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි ලක්ෂ්මි හේමන්තා මහතා කතා කරමින්</u>**

ස්ථිර කරනවා.

තීරණය-

මහ අම්බලන්ගොඩ , තුඩුවෙමුල්ල පාරෙන් අතුරු පාර තාර දැමීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී ද සිල්වා මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.09 මහ අම්බලන්ගොඩ , කරෝලිස් වෙද මාවතෙහි කොන්ක්‍රීට් සපත්තු කාණුව ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මහ අම්බලන්ගොඩ , කරෝලිස් වෙද මාවතෙහි කොන්ක්‍රීට් සපත්තු කාණුව ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි ලක්ෂ්මි හේමන්තා මහතා කතා කරමින්</u>**

ස්ථිර කරනවා.

තීරණය-

මහ අම්බලන්ගොඩ , කරෝලිස් වෙද මාවතෙහි කොන්ක්‍රීට් සපත්තු කාණුව ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී ද සිල්වා මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.10 අම්බලන්ගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සිසු නිපුනතා ත්‍යාග ප්‍රදානෝත්සවය පැවැත්වීමට සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සිසු නිපුනතා ත්‍යාග ප්‍රදානෝත්සවය පැවැත්වීමට සුදුසු බවට යෝජනා කරනවා .

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

**අම්බලන්ගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සිසු නිපුනතා ත්‍යාග ප්‍රදානෝත්සවය පැවැත්වීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණිය මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව ඉදිරිපත් කරන්න.

**05.02 ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණිය මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව**

05.02.01 ලක්දෙරණ ප්‍රමෝදයට පත්කරවමින් දැයේ පිනට පහළ වූ දැහැමි පොදුජන ජනපතිඳුන්ට ශුභාසිරි එක්කිරීමට සුදුසු බවට ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණිය මහතා කතා කරමින්**

ලක්දෙරණ ප්‍රමෝදයට පත්කරවමින් දැයේ පිනට පහළ වූ දැහැමි පොදුජන ජනපතිඳුන්ට ශුභාසිරි එක්කිරීමට සුදුසු බවට මෙම සභාවට යෝජනා කර සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව ස්ථිර කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණිය මහතා කතා කරමින්**

මේ වනාන්තරයේ බොහෝ ගස් ඇතත් සඳුන් ගස් දුර්ලභයි. එසේම ලොව මිනිසුන් බොහෝ වෙතත් උත්තමයෝ අති දුර්ලභයි. නව නායකත්වයක් හමුවේ ප්‍රජාතන්ත්‍රවාදයක් තහවුරු වී තිබෙන මේ මොහොතේ මාතෘභූමියේ දෙපයින් හිටගෙන ඔබ අමතන්නට ලැබීම මාගේ ජීවිතයේ ලද භාග්‍යයක් කොට මම සලකනවා. සත්‍ය වශයෙන්ම රෑ දුටු සිහිනයක් වගේ වගේ අප දුටු සිහිනය ගරු නගරාධිපතිතුමනි සිහිනය සැබෑ වෙලා. මේ මොහොතේ අප සත්‍ය වශයෙන්ම අපේ පිනට රටදැය සමය නැංවීමට මේ මතුව ඇත්තේ වලාම්පුරියක් බද්ධ ගැටයක් ,සුරභිදෙණක් මා හිතන හැටියට ඒවගේම ගෝඨාභය රාජපක්ෂ නාමය සිංහල රාජ්‍ය නාමාවලියේ එතරම් උස්තැනක නැති වග ඉතිහාසඥයන්ගේ මතයයි. එම මතය හම්බණය කරමින් නූතන ගෝඨාභය රාජපක්ෂයන් ධර්මිකත්වයේ ප්‍රතිමූර්තියක් බවට පත්වී තිබෙනවා. නූතනයේ මතු වූයේ ධම්මපදයේ හඬයි.නොබෝදා මතුවූයේ මහා පිරුවානා පොත් වහන්සේගේ සංගුහිත ඒ මහ ශ්‍රී සද්ධර්ම සාගරය, පන්සිය පනස් ජාතකය බෝසත් පාරමිතාවයි මෙයින් උත්පාද වුණේ. මේ අවස්ථවේ මා කියන්න කැමතියි. මා ඔබලාට උසුළු විසුළු කරන්න කැමති නැහැ. මොකද අප සියළු දෙනා මනුස්සයෝ.මගේ කිසිඳු පව්ටු චේතනාවක් තිබුණේ නැහැ. මේ සංසාර ගමනේ අද අප එක්ව සිටින්නේ අපේ භව ගමන පුරා එකිනෙකාට හට විටින් මව , පියා, දුව , පුතා විටින් විට ඤාතියා, මිතුරිය, මිතුරා වෙමින් දිගින් දිගටම පැවත ගෙන අපි අද මේ ඇවිල්ලා තිබෙන්නේ. ඒ වගේම අපට උසුළු විසුළු කරන , අපව හෙලා දකින අපිට නින්දා කරන අපට අවමන් කරන ඇත්තන් පවා පෙර ආත්භව වල දුව, පුතා වී ඇති. එම නිසා මගේ හිත කිසිදු කොටසක වත් ආල්ප මාත්‍ර වූ කම්පාවක්, තැලීමක් හෝ දුකක් හෝ එවන් හැඟීමකට ඉඩ නැත. විඩියෝ පසකට යාද්දාවේ. මා කියන්නේ අප දන්නා නොදන්නා සියා සත්වයෝ , මස් පිණිස දැල් දමා ගොඩ අදින සියළු සත්වයෝ . මේ සසර ගමනේ අපට මව, පුතා, දුව වෙලා ඇති. ගරු නගරාධිපතිතුමනි අපි සතුටු වෙනවා. විශ්මය මෙයයි, පුදුමය මෙයයි. සාර්වඥ ධාතුන් පිහිටි , දෝණයක් පමණ ඒ මහා සෑ රඳුන් අභිමුව සිය රාජාභිෂේකය කරන්නට තරම් සිත් පහද ගත්තේ මින් පෙර කවරෙක්ද? ඔබලා දන්නවා ද එයට හේතුව. ඔබලා මා සිතන්නේ සත්‍ය වශයෙන්ම පාපි සිතුවිලි ඇතිකර ගෙන පව් පුරවා ගන්නවා. සිනා සෙන්නට එපා මෙය බොහොම සංවේදි මොහොතක්. එය අද මේ ගෞරවණීය සභාවේ එළි කරනවා. ඒ වගේම ආරක්ෂකයින් ඉවතලා ජම්බුද්පයේ ගමන් කළේ ඒ අසහාය නායකයා. සියළු අදමිට කුරුරු බලවේග ගෝඨාභය රජුන් හමුවේ දණ නැමුවේ ඇයි? විමසා බැලිය යුතුමයි. හංසයෝ , බැලුම් බෝල , මාලිමා විවිධ අත පැතිරි ගියා. ඇස් කණ්ණාඩි, පාට කණ්ණාඩි, විදුලි බුබුළු බැටළුවෝ , ටයර් ආදිය සොයා ගන්නට නොහැකි වුණා. එසේ වූයේ ඇයි? මේ මොහොතේ මා සඳහන් කරනවා. මිත්‍යා විශ්වාස වලට එතුමාගේ සිතේ ඉඩක් නැහැ. කන්‍යාවන් ලවා නාවා ගැනීම්, ඒ වගේම වෙනත් මිසදුටු පැවතුම් ගෝඨාභය රාජපක්ෂ රජුන්ට ඇවැසි නොවේ. එතුමා යුක්ති ධර්මය තුළ පිහිටි සැබෑම රජතුමාණෝයි. මේ

මොහොතේ එතුමා සමඟ තරඟ කළ ආත්ම වර්ණනා කළ , පියගුණ වැණුම්, එපමණක්ද නොව පියගුණ වණමින් සිදු කරනු ලැබූ අපේක්ෂකයිනට සිදු වූයේ කුමක්ද? ඒ වගේම මේ අවස්ථාවේ මේ අසහාය දෙන නායකත්වයට පත්වූ අපේ උදාරතමයා අනාගතයේදි දානං, සිලං, පරිත්‍යාගං ආදි දසරාජ ධර්ම වලට අනුව යථාර්ථයක් කරන බවට නොඅනුමානයි. ඒ වගේම දානය , ප්‍රිය වචනය , අර්ථ චරියාව , සමානාත්මතාවය සිවු සඟරා වත එතුමන් සත්‍යයක් බවට ඔප්පු කරාවි . එපමණක් නොවේ හිතවතුනි, ජේතවනාරාවේ සෙල්ලිපියේ සඳහන් පරිදි තුණුරුවන්ට යුක්තනයට ගැඹුරු , වියත්මග සපිරි ආදි වශයෙන් ඒ රාජ දහම එතුමා අඩු නැතිව ඉටු කරාවි. මේ මොහොතේදි මා කියනවා ප්‍රාදේශිකයන් හැටියට ඔබ සැමට ආරාධනා කරනවා එම ශිලා ලේඛණ අධ්‍යයනය කරන්න. යම් නායකයෙක් වන වානම් මේ උත්තම නායක ගුණ කඳ මේ කෙටි මොහොතින් වණා නිම කළ නොහැකියි. එ වගේම මා රහසක් එළි කරනවා කිවුවා. මේ නායකත්වය ගැන මට විශ්වය විශේෂ වරමක් දි තිබෙනවා. එය කුමක්ද? එතුමන්ගේ ජීවිතය සුරක්ෂා කිරිමේ වගකිමක් පෙර අත්හිහි පැවත එන එක්තරා වගකිමක් මට පැවරිලා තිබෙනවා. මේ සංසාරය යනු එක්තරා ගනුදෙනුවක්. එමනිසා හෙට රාත්‍රියට පෙර මා අතිගරු ජනාධිපතිතුමන් හමුවට යාමට අපේක්ෂා කරනවා. එම රහස එලි කිරිමට.මා යම් කොටසක් හෙලි කරනවා. අතිගරු ජනාධිපතිතුමන්ගේ මෑණියන් වහන්සේ ධන්දිරා සමරසිංහ මැතිණිය මේ වන විටත් මේ රන්වැලි සෑයට අධිගෘහතව සිටියේ. දෙවඟණක්. ස්වර්ණමාලි දෙවඟණ මේ සර්වඥධාතුන් නිසා මේ පුදබිම මහ පිංකදක් ඇසු තැනක්. මේ පුදබිමට වැඩවාසය කරන දෙවගණක් ලෙස චිත්ත ධර්ම විද්‍යාවට අනුව එය ලියවි ඇත්තේ. ඒ අනුවයි අතිගරු ජනාධිපතිතුමන්ට සිත් පහළ වුයේ අර අවස්ථාව ලබා දීමට.ඒ හැර තව බොහෝ දේ තිබෙනවා එතුමන් සමඟ කතා කිරිමට. මා වැඩිදුර විස්තර කතා කරන්නේ නැහැ. මෙය දුර්ලභ මොහොත කණ කැස්බැවා විය සිදුරෙන් එළිය දකිනවා වගේ අවස්ථාවක්. ඉදිරි වර්ෂ 5 මා සිහිබුද්ධියෙන් අපේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් සමඟ ගත කළ යුතුමයි.ඔබේ මාගේ ජයග්‍රහණය ඇත්තේ එතැනයි. මේ උත්තම ශ්‍රී ලංකා භුමියේ ජය ඇත්තේ එතනයි.සුරක්ෂාව ඇත්තේ එතනයි. ඒ පිළිබඳව ඔබට නැවත මතක් කරමින් මේ පිළිබඳව සිතිමට ඔබට විඥාණය නුවණ පහළ වේවායි සිතමින් වැඩියමක් දේ තව දුරටත් ප්‍රකාශ කරන අතරම ශ්‍රී සිංහලය එක්සේසත් කළ ගරු මහින්ද රාජපක්ෂ සිමතාණන් බිහිකළ ඒ මාතාව නුතන ජනපතිඳුන් නුතන වියලුලෙන් රට බේරා ගත්ත ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් බිහිකළ ඒ උත්තම මාතාව , එපමණක්ද නොවේ මේ වසර 5 ගිය කල තුන්කල් දුටු ජනපතිඳුන් මතුවෙනවා වන වගයි. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නිර්මාතෘ වන ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මැතිඳුන් රජවන බවටයි අනාවැකි පල වි තිබෙන්නේ. ඒ පිළිබඳ කෙටි ඉඟියක් පල කරමින් මා නවතිනවා. මා මාධ්‍යයට ඇරයුම් කරනවා මේ රහස ඉඟියක් කොට එළි කරන ලෙස. හෙට දින රාත්‍රිය වන විට මා අතිගරු ජනාධිපතිතුමා මුණ ගැසිමට නියමිතයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදි අභිනවයෙන් මේ රටේ නායකත්වයට තේරි පත්වූ අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ට අපගේ සුභාසිංශන මේ අවස්ථාවේදි පිරි නමනවා. ඒ වගේම එතුමන්ට දිර්ඝායුෂ ප්‍රාර්ථනා කරන අතර එතුමා මේ නායකත්වයට පත්කළ ජනතාවට මේ අවස්ථාවේ ස්තුතිය පුද කරන්න ඕන.මොකද ලක්ෂ 69කට වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබාගෙන එතුමා මේ රටේ අතිගරු ජනාධිපති කරවිම පිළිබඳව අපගේ ජනතාවට ස්තුතිය පුද කිරිම අපගේ යුතුකමක් හා වගකිමක් වෙනවා.අපි මේ අවස්ථාවේ අපේ මහා සංඝරත්නය මතක් කළ යුතු වෙනවා. මහා සංඝරත්නයේ ප්‍රමුඛතාවය මැද තමයි ජනතාව මේ අවස්ථාවේ

මේ කාර්ය භාර්ය කරනු ලැබුවේ. අපි දන්නවා සිංහල ජනතාව මෙතුමා ජනාධිපතිතුමා කරවන්න සැහෙන්න වැඩ කටයුත්තක යෙදුනා.උතුරු නැගෙනහිර ගත්තොත් උතුරේ ජනතාව එතුමාට විරුද්ධව සැහෙන ඡන්ද ප්‍රමාණයක් ලබා දුන්නා. මා හිතන්නේ යාපනය , වන්නි දිස්ත්‍රික්කයේ ජන්ද 49000 ක ප්‍රමාණයක් තමයි එතුමාට ලැබුණේ. ඒ උතුරු ප්‍රදේශයේ ඡන්ද 486000ක් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට විරුද්ධව ලැබුණා. ඒ වගේම නැගෙනහිර ප්‍රදේශයේ ඡන්ද හයලක්ෂ ගණනක් එතුමාට දෙන විට ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ඡන්ද 227000 වගේ තමයි ලැබුණේ.ඒ දිසාමඩුල්ල , අම්පාර ප්‍රදේශවල සිංහල ඡන්ද ප්‍රමාණයක් තිබුණ නිසා. එතකොට දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කය ගතහොත් වැඩි ඡන්ද 248000 ගණනකින් තමයි දිනුවා.ලංකාවේ එතුමා දිනපු දිස්ත්‍රික් 17න් දෙවැනි ස්ථානයට ගාලු දිස්ත්‍රික්කය පත් වුණා.එ වගේම අම්බලන්ගොඩ ආසනයෙත් වැඩි ජන්ද 23000 ගණනකින් අපි ජයග්‍රහණය කළා. ඒ වගේම සිංහල ජනතාව එකා මෙන් එක්සිත්ව පෙරමුණ ගෙන සිටියා. කොළඹ දිස්ත්‍රික්කයේ එක්සත් ජාතික පක්ෂයට බරව සිටියත් වැඩිම ඡන්ද ප්‍රමාණයක් එතුමාට ලැබුණේ හෝමාගම ආසනයෙන් .106000ක ප්‍රමාණයක්. ඒ වගේම කඩුවෙල ආසනයෙන් 98000ක වගේ ඡන්ද ප්‍රමාණයක් ලැබුණා.කැස්බෑව ආසනයෙන් 99000ක් දුන්නා. එම ජනතාව එකරාශි වෙනවා. එතකොට මෙතැන පක්ෂ භේදයක් තිබ්බේ නැහැ. අපි දන්න තරමට එක්සත් ජාතික පක්ෂයේ බොහෝ දෙනෙක් ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට දුන්නා. ඒ වගේම ජනතා විමුක්ති පෙරමුණෙත් ඡන්දය දුන්නා.උදාහරණයක් විදියට හෙප්පුමුල්ල ප්‍රදේශයේ පසුගිය කාලයේ ජනතා විමුක්ති පෙරමුණට ලැයිස්තු හදන්න හෙප්පුමුල්ල ප්‍රදේශයේ පවුල් 7කින් ඡන්ද ලැයිස්තුවට ඉදිරිපත් කළා. එම පවුල් 7න් ම පවුල් 4ක් මෙවර අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ඡන්දය ලබා දුන්නා. එක්සත් ජාතික පක්ෂයෙන් ඡන්දය දුන් ඒ අයටත් ස්තුති වන්ත විය යුතුයි. ඒ අය පක්ෂ භේදයකින් තොරව සිංහල ඡන්දය පාවිච්චි කළා.ඒ වගේම දැන් එතුමා ප්‍රකාශ කර සිටියා ඔබතුමලාගේ යුතුකම ඉෂ්ඨ කරනවා. මා මගේ යුතුකම ඉෂ්ඨ කරනවා. දැන් ජනතාව ජනතාවගේ යුතුකම ඉෂ්ඨ කර තිබෙනවා. දැන් එතුමාගේ යුතුකම ජාති භේදයෙන් තොරව, ආගම් භේදයෙන් තොරව ඉෂ්ඨ කරාවි යන බලාපොරෝත්තු ඇතිව අප සිටිනවා. මේ අවස්ථාවේදි මා ප්‍රර්ථනා කරනවා එතුමාට මේ කාර්ය ඉෂ්ට කර ගැනිමට ශක්තිය , ධෛර්ය වාසානව උදාවෙලා . චිරත්කාලයක් එහි වැජඹෙන්නට වාසනාව උදා වේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරණයේදි ලක්ෂ 69 කට වඩා වැඩි ප්‍රමාණයක් ලබා ගෙන ලංකාවේ ජනාධිපතිතුමා බවට පත්වුණා. මේ සම්බන්ධයෙන් අපි ගොඩක්ම සංතෝෂ වෙනවා. එතුමා 2010 වසරේ තමයි මාගේ නිවසට පැමිණියේ ආරක්ෂක ලේකම් වෙලා සිටින විට. රැස්විමක් කළා. සම්මන්ත්‍රණයක් ලෙස. ඒ වේලාවේ මා කිවුවා ඉඟියක් ලෙස යම් දවසක නායකත්වයට පැමිණෙයි කියා. එතුමා හිනාවෙලා නිහඩව සිටියා. මා එදා හිතුවා මෙතුමා මේ රටේ ජනාධිපතිතුමා වෙයි කියා. ඒ එදා මගේ යටිහිතේ තිබුණ බලාපොරෝත්තුව ඉෂ්ඨ වුණා සේ එතුමා ජනාධිපති වුණා. අපේ ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා මෙය කියද්දි අප ඇත්තටම එතුමාට අපහාසයක් උපහාසයක් කරන්න හිනා වුණා නෙමේ. එතුමාගේ කතා ශෛල්‍යයට තමයි අප හිනා වුණේ. කෙසේ වෙතත් එතුමා චිත්ත ධෛර්ය ප්‍රගුණ කරමින් මේ විශ්වයේ තිබෙන යම් යම් බලයන් සම්බන්ධ කරමින් යම්කිසි මතයක් ඉදිරිපත් කළා. එතුමා මේ දේ වෙයි කියා. එතුමාගේ ඒ දෙය පිළිබඳව

සතුටු වෙනවා. මොකද අපිත් සමඟ සිටින ගරු මන්ත්‍රීවරයෙක්ට එහෙම දෙයක් තිබ්බ පිළිබඳව. කෙසේ නමුත් ශ්‍රී ලංකාව තුළ අපි ජයග්‍රහණය කරනු ලැබුවේ අපි සිංහල අය.එය මා මේ අවස්ථාවේ කියන්න ඕන. මොකද සිංහලයන්ගේ බලවේගයක් තමයි. සිංහලයන් තමයි ජයග්‍රහණය කළේ. එමනිසා අපි පක්ෂ , පාට , භේද කිසි දෙයක් නැතිව ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට මේ රට ගෙනයන්න උදවු කරන්න ඕන සිංහලයන් වශයෙන්. මොකද උතුරේ ඡන්ද වලින් පෙනුනා අනික් දෙමළ හා අනික් ජනතාව සිටින්නේ කොහේද කියලා. එමනිසා සිංහල ඡන්ද වලින් ජයග්‍රහණය කළ ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට අපේ සුභාෂිංසනය පුද කරමින් සිංහලයන් වශයෙන් නැවතත් පක්ෂ පාට භේද දුරලා නැවතත් එකතු වෙන ලෙසත් එතුමාට දිර්ඝායුෂ පතන අතර මේ රට ඉදිරි වසර 5තුළ නිදහස් සෞභගමත් රටක් ලෙස පත්කිරිමට එතුමාට ධෛර්ය ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණිය මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, තුති පල කරන්නට මෙය අවස්ථාවක් කර ගන්නවා.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අභිනවයෙන් තේරි පත්වූ නව ජනපති දේශපාලන පක්ෂ මතිමතාන්තර කෙසේ වෙතත් එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් විදියට එතුමාගේ ජයග්‍රහණය ගැන එතුමාට සුභාෂිංශනය එක් කරනවා.සියළුම ගරු මන්ත්‍රීවරුන් විදියට.ඒවගේම එතුමාගේ සරල බව මේ දින 14 ඇතුළත අප දුටුවා . අප මේ රටක් හැටියට අපි මේ ගමන එකට යන්න ඕනේ. මේ ගමනේදි දේශපාලන පක්ෂ භේද කොහොම වෙතත් මහජන ඡන්දයෙන් තේරි පත් වූ ප්‍රධාන පුරවැසියන් වශයෙන් අපි අභය කළ යුතුයි මේ දින 14 ඇතුළත එතුමාගේ වැඩ පිළිවළ. බදු බර අඩුකරලා මේ නගර අලංකරණය මේ සියළු දේවල් ඒ සරල බව මේ දින 14 තුළ අපි අභය කළ යුතුයි. මේ දින 14තුළ ඉදිරියට කෙහොම වෙයිද කියා දන්නේ නැහැ.නායකයෙක් හැටියට ඉදිරියේදි එම කටයුතු කරගෙන යාවි කියා විශ්වාස කරනවා. ඒ වගේම අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු පොදුජන පෙරමුණේ සියළුම ගරු මන්ත්‍රීවරුන් එතුමාට සුභාෂිංශනය එකතු කරනවා. මොකද එතුමන්ලා අභය කරනවා ඒ ගැන. ඒගැන අවංකවම එතුමන්ට සුභාෂිංශනය පල කරමින් එතුමාට රටක් හැටියට මේ ගමන යාමට හේතු වාසනා ලැබේවා කියා ප්‍රර්ථනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

අපගේ ගරු නාගරික මන්ත්‍රි ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව පසුගිය ජනාධිපතිවරණයේදි පොදුජන පෙරමුණ නියෝජනය කරමින් වත්මන් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති විමෙන් පසු එතුමාට සුභාෂිංශන ගෙන එන මේ මොහොතේ අපි ඇත්තටම හොඳ යෝජනාවක් ලෙස දකිනවා.ගරු මන්ත්‍රිතුමා විසින් ගෙන එනු ලැබු යෝජනාව.මා හිතන්නේ පසුගිය මැතිවරණය තුළ විශිෂ්ඨ ජයග්‍රහණයක් අත්කර ගනිමින් ලංකා වාසි සියළු ජනතාව තමන්ගේ ඡන්දය පාවිච්චි කරලා අදට ඔබින නායකයෙක් ලෙස පිළිගෙන එතුමා ජනාධිපති කළා. ඒ ජනාධිපති වෙනකොට රටේ විශාල වෙනස් කම් රාශියක් එතුමන් විසින් මේ වන කොට සිදු කරලා ඒ එතුමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සටහන් කරලා ඒ යෝජනාවලිය මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මා හිතන්නේ අප සතුටු වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු ජනාධිපති ගරු මෛත්‍රිපාල

සිරිසේන මැතිතුමාගේ සහායෝගය , එ වගේම අප පක්ෂයේ සහායෝගය එතුමන්ට ලබා දිලා අම්බලන්ගොඩ ආසනයේ ප්‍රධාන සංවිධායක හිටපු ප්‍රධාන ආමාත්‍ය ශාන් විජයලාල් මහතාගේ මඟ පෙන්වීම යටතේ අප ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අප ගරු මන්ත්‍රිවරු ටික එතුමන්ට සහායෝගය ලබා දෙන්න තීරණය කරලා එතුමාගේ ජයග්‍රහණය සඳහා අත්වැල් බැඳ ගැනීම සම්බන්ධව. මා හිතන්නේ එතුමන් පැමිණි විගස කියන්න දෙයකුත් නැහැ. සමහර නීති ක්‍රියාත්මක වෙනවා. පොලිසිය ක්‍රියාත්මක වෙනවා. ඒ වගේම උතුරු නැගෙනහිර නීතිය අතට ගත්ත උදවිය දැන් නීතිය ක්‍රියාත්මක වෙනවා. මෙක තමයි මහජනතාවගේ බලාපොරෝත්තුව වුණේ. විශේෂයෙන්ම ජාතික ආරක්ෂාව. දැඩි තර්ජනයක් වෙලා තිබුණ මොහොතක තමයි එතුමා වගකීම භාරගෙන එතුමා තාම නියෝග ක්‍රියාත්මක කරන්න පටන් ගෙනත් නැහැ. එතුමාගේ නිලධාරින් පත් කරලා ඒ අදාල ලේකම්වරුන් ඒ සම්බන්ධව එතුමාගේ උපදෙස් ලබා ගෙන කටයුතු කරන්න මුල ආරම්භ කර තිබෙන්නේ. මා හිතන්නේ හොඳ ප්‍රවේශයක් වෙලා තිබෙනවා. අපි සතුටු වෙනවා. ලංකා වාසි සිංහල බෞද්ධ ආදි අනෙකුත් ආගම් වශයෙන් එතුමාගේ සේවය අපි අභය කරන්න. අපි මෙම යෝජනාවෙන් බලාපොරෝත්තු වෙනවා. අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රි මණ්ඩලය අදහස් දක්වනවා.මේක තමයි වෙන්න ඕන. පක්ෂයක් පාටක් නෙමේ. එතුමා මා හිතන්නේ පක්ෂයක් පාටක් නෙමේ . එතුමා ඉදිරිපත් වුණේ මහජනතාවගේ දැඩි ඉල්ලීම මත. ඒ වගේම එයට සහායෝගය දුන්නා පොදුජන පෙරමුණේ වත්මන් අග්‍රමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා. අපිත් එතුමා සමඟ මැතිවරණ ව්‍යාපාරවලදි වැඩ කරපු අය. අපි දන්නවා මේක සිංහල බෞද්ධ රටක්.යම් විපතක් වෙලාවට කවුරු හෝ ඉදිරිපත් වෙලා මේ රට ආරක්ෂා කරනවා. මොකද අපි දන්නවා උතුරු නැගෙනහිර යුද්ධය වසර 30ක් ගතවෙද්දි යම් යම් කාල වලදි එක එක නායකත්ව යටතේ ඉටු කරගන්න බැරි වුණා. එතුමා එතුමාගේ වගකීම ආරක්ෂක ලේකම් හැටියට ඉටු කළා. එම නිසා වෙන්නැති වැඩි ඡන්ද ලක්ෂ 15කට වැඩි ඡන්ද ප්‍රමාණයකින් එතුමා පත් කළේ. අපි එතුමාට දිර්ඝායුෂ පතනවා. එතුමන්ගේ වැඩකටයුතු ඉදිරියේදි කර ගැනීමට ශක්තිය ධෛර්ය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මෙම යෝජනාව ගෙන එම සම්බන්ධව ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණිය මහතාට ස්තුති වන්ත වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

මා කෙටියෙන්ම අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට සුභාෂිංසනය පුද කරනවා. මා ස්තුතිය පුද කරනවා. පක්ෂ විපක්ෂව එතුමාට සහායෝගය දි අපේ රට ඉදිරියට ගෙන එමට කටයුතු කරන ලෙස මා සහෝදර ගරු මන්ත්‍රිවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. නැවත වරක් අභිනවයෙන් පත්වූ අතිගරු ජනාධිපතිතුමාට එතුමාගේ කාර්ය සාර්ථකව සිදු කර ගැනීමට හැකිවේවායි ප්‍රාර්ථනා කරනවා. එතුමාගේ කර්තව්‍ය මේ වනකොට ගරු අපේ නගර සභා මන්ත්‍රි අතුල ප්‍රියන්ත මහතා ප්‍රකාශ කළ පරිදි අපට හිතෙන විදියට සිද්ධ වෙනවා.තව දුරටත් එතුමාට ශක්තිය ධෛර්ය ලැවේවායි ප්‍රර්ථනා කරමින් එතුමාට සුභාෂිංසන එක් කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්</u>

ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණිය මහතාට ස්තුති වන්ත වෙනවා මෙම යෝජනාව ගෙන එම සම්බන්ධව. එතුමා අද දවසේ කැපි පෙනෙන ගරු මන්ත්‍රි වරයා බවට පත්වුණා.මගේ සහෝදර මන්ත්‍රිතුමා. බොහොම ස්තුතියි.මා එහෙම අදහසකින් නෙමේ ප්‍රකාශ කළේ.

අභිනවයෙන් පත් වූ අපේ ශ්‍රී ලංකික ජනාධිපතිවරයා. මේක ශ්‍රී ලාංකික රට. ශ්‍රී ලංකා ජනාධිපතිතුමාට මාගේ පෞද්ගලික උණුසුම් සුභ පැතුම් එක් කරනවා. ජනතා විමුක්ති පෙරමුණද සමඟ.මට අහුණ මා ආස කරන වචනයක් තිබුණා ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මන්ත්‍රීතුමාගේ.දස රාජ ධර්මයෙන් යුක්ත රජ කරන කියන එක. ඇත්තටම එහෙම වෙනවා නම් අපි ඔක්කොම කැමතියි. දස රාජ ධර්මයෙන් යුක්ත නෙමේ මට මතකයි අපේ මැතිවරණ කොමිෂමේ ගරු සභාපතිතුමා ප්‍රකාශ කළා එදින පන්සිල් ගෙන ඉන්න කියා. දස රාජ ධර්මයෙන් කටයුතු කරනවා නම් එය ඉතාමත් වටිනවා. බුදු හාමුදුරුවෝ දේශනා කළ දේශනාවයිනේ.වෙනත් අදහසකින්ම නෙමේ මා මේ කතා කරන්නේ මාගේ මේ හදවතට දැනෙන දේ මා කතා කරන්නේ.මොන පක්ෂයෙන් වුවත් පත්වෙනවා නම් ගරු ජනාධිපතිවරයෙක්. ඒ ජනාධිපතිවරයා ජනතාවගේ රටේ ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් කටයුතු කළ යුතුමයි. අන්න ඒ කාර්ය හෝ එම කාර්යෙන් කොටසක් හෝ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙන් කෙරෙනවා නම් ඇත්තටම එය වටිනවා.මේ අවස්ථාවේ එතුමාටත් සුභ පතමින් , ඔබතුමාටත් සුභ පතනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා ගෙන එනු ලැබූ යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවක්. එයට ස්තුති වන්ත වෙනවා මෙම යෝජනාව ගෙන එම පිළිබඳව. අපේ ලංකාවේ නීති දෙක තුනක් තිබුණ අපේ රට. එක නීතියකට ගෙන ආවා. අපේ දිස්ත්‍රික්කයට උදාහරණයකට ගන්න පුළුවන් . අර වාහන වලට ගහන කාබන් බද්ද අම්බලන්ගොඩ වගේ නගර වලට ඇල්පිටියට පමණක් සීමා වෙලා තිබෙනවා. දිස්ත්‍රික්කයට එම කාබන් බද්ද සීමාවෙලා තිබෙනවා. එක දිස්ත්‍රික්කයට නීති දෙකක් බල පැවා. ඒ වගේම උතුරු නැගෙනහිරත් ඒ වගේ. වාහනයක් ලියාපදිංචි කරන්නේ නැහැ. හෙල්මට් නැහැ. ඒ අයට ඕන ඕන විදියට නිතිය ක්‍රියාත්මක වෙනවා. මෙම රට එකීය රටක් . සිංහල බෞද්ධ රටක්. එමනිසා මෙම ලංකාව එක නීතියකට හැඩ ගැසෙන්න ඕන. අද මා දුටුවා මුහුණු පොතේ දමා තිබෙනවා කාබන් බද්ද ඉවත් කළා කියා. ඇත්තටම හොඳ කටයුත්තක්. දුප්පතා තමයි ගමේ ඉන්නේ. සල්ලි කාරයා තමයි නගරයේ ඉන්නේ. ගමේ සිටින අහිංසක දුප්පතාට තමයි කාබන් බද්ද ගහන්නේ. කොහොම වුණත් ලංකාවට එක නීතියක් ගෙන එම පිළිබඳවත් ඒ අනුව ක්‍රියාත්මක වීම ගැනත්, කොළඹ නගරයත් සුද්ද වෙමින් යනවා. ආයේ කියන්න ඕන නැහැ. කටුනායක ගුවන් තොටුපොළේ ඉදිකරන ලද තොරණත් එතුමා විසින්ම ගලවා දමන්න කියා තිබෙනවා. ඒ වගේම අපේ අම්බලන්ගොඩත් තව බැනර් , පොස්ටර් ටිකක් තිබෙනවා. අපි ඒ ටිකත් ගලවා දමන්න. අපි කැමතියි. නගර සභාවෙන් හරි ගලවා දමන ලෙස ඉල්ලීමක් කරනවා. අපි කැමතියි අපේ නගරයත් ලස්සනට තබා ගත යුතුයි. මා ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතාට ස්තුති වන්ත වෙනවා මේ යෝජනාව ගෙන එම සම්බන්ධව. අතිගරු ජනාධිපතිතුමාට ඉතා හොඳින් නීරෝගීව මේ කටයුත්ත කරගෙන යාමට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මම කියන්න හදපුදේම තමයි අපේ ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කිව්වෙ. සරත්චන්ද මන්තුතුමා එදා කාබන් බද්ද ඉවත් කරන්න කියලා යෝජනාවක් ගෙනාවා.අපේ කණ්ඩායමේ සහයෙන් එදා සම්මත වුණා. එදා එක්සත් ජාතික පක්ෂයත් ශ්‍රී ලංකා නිදහස්

පක්ෂයත් අපට විරුද්ධව ඡන්දය දුන්නේ. නමුත් අද ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සමස්ථ ලංකාවෙන්ම ඒ කාබන් බද්ද ඉවත් කර තිබෙනවා. අපි ඒ ගැන සතුටු වෙනවා. අපේ නගර සභාවෙන් යෝජනාවක් ගෙනැල්ල ඒ යෝජනාව සඵලවීම සම්බන්ධව ඒ යෝජනාව ගෙනාපු සරත් මන්ත්‍රීතුමාටත් ඔබතුමාටත් සතුටු වෙන්න පුළුවන්.එදා අපි ඒ යෝජනාව ගෙනාවෙ සද්භාවයෙන්. නොයෙකුත් රටට හිතකර වූ යෝජනා ගෙන එමින් යම් ප්‍රතිපත්තියක් ඇතිකරමින් නව දේශපාලන සංස්කෘතියක් ඇතිකරලීම සඳහා එතුමා පියවර ගැනීම පිළිබඳව අපි ඇත්තටම සතුටු වෙනවා. ශ්‍රී ලංකාව තුළ විශිෂ්ඨ නායකයෙක් ලෙස පත්වෙලා උපරිම සේවාවක් කරන්නට එතුමාට ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

පළමුවෙන්ම ශ්‍රී ලංකාවේ අභිනවයෙන් තෙරි පත්වූ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට සුභාශිංසන පිරිනමනවා. ඇත්තටම ස්වාධින කොමිෂන් සභා පත් කිරිම නිසා කිසිම ප්‍රචාණ්ඩ ක්‍රියාකාරි තත්ත්වයක් නැතිව මැතිවරණ කටයුතු කරන්න ලැබුණා. ලංකාවේ බොහොම සමකාමිව කරන්න ලැබුණ පලවෙනි මැතිවරණය මෙයයි.ඒ ගැන බොහොම ආඩම්බර විය යුතුයි. එම කොමිසම් සභා ඇතිකර 19 සංශෝධනය කිරිම ගැන හිටපු අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා, ගරු රනිල් වික්‍රමසේකර මැතිතුමාටත් ස්තුති වන්ත විය යුතුයි. රජය මඟින් කරන්න ලැබුණ විශිෂ්ඨ ප්‍රතිඵලයක් මත තමයි එවැනි මැතිවරණයක් පැවැත්වීමට ලැබුණේ. ශ්‍රී ලංකික සියළු දෙනා. මා හිතන්නේ ගරු ගෝඨාභය රාජපක්ෂ මහතාට සියළුම ශ්‍රී ලංකික සිංහල ජනතාව පමණක් නෙමේ දෙමළ ජනතාවත් ඡන්දය පාවිච්චි කළා.ඔය දැන් ගරු තොන්ඩමන් මැතිතුමාගේ පක්ෂයේ වගේ. ඒ වගේ දෙමළ අයගේ ඡන්දයත් ලැබුණා.ඒ ඔක්කෝම ලංකාවේ ශ්‍රී ලංකිකයන්. සෑම කෙනෙකුටම අයිතිය තිබෙනවා මැතිවරණයක් සඳහා ඡන්දය පාවිච්චි කිරිම. ඒ වගේම තව අයිතියක් තිබෙනවා පවතින රජයේ අඩුපාඩුවක් තිබෙනවා නම් නව රජයක් පත් කර ගැනිමට. දැන් ගරු මහින්ද රාජපක්ෂ මහතා යුද්ධය කොච්චර දිනුවත් තමන්ගේ ක්‍රියාකාරිත්වය නැති නිසා එතුමා පැරදුනා. මේ පක්ෂයේ අඩුපාඩු නිසා පැරදුනා. ආපහු ඔය කියන දේවල් කරන්න බැරි වුණොත් අපේ ජනතාව මේ සිටින බුද්ධිමතුන් හරියට මැතිවරණයකදි ජයග්‍රහණය කරන එක නොදෙන එක තීරණය කරනවා.එම නිසා පත්වූ අතිගරු ජනාධිපතිතුමා යමක් කරාවි කියා ජනතාව අතර තිබෙනවා. කියපු දේවලි හොඳින් කෙරුණොත් අතිගරුජනාධිපතිතුමා වැඩය හොඳට කෙරෙයි. නැතිනම් වැඩය ඊටත් වඩා වගුරු වෙයි.මා අවංකවම මාගේ හදවතින්ම එතුමාට පෞද්ගලිකවම සුභාෂිංසනය එකතු කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , අපගේ නාගරික මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණිය මහතා ඉදිරිපත් කළ යෝජනාවට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති වශයෙන් අභිනවයෙන් තේරී පත්වූ ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට සුභාශිංසන පමුණුවමින් ඉදිරිපත් කරන ලද යෝජනාවට අනුව කතාකිරීමේදී සභාපතිතුමනි ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ ගමන් මග වෙනස් කරමින් යම් කිසි දේශපාලඥයෙක් මේ ධරණී තලය තුළ දේශපාලනය කළා නම් ඒ ලංකාවට මෙන්ම මුළු ලෝකයටම ආදර්ශයක් දෙමින් ඔහු ඔහුගේ දේශපාලන ව්‍යාපාරය මෙහෙයවනු ලැබුවා. ඒකට ලොකුපොඩි සෑම කෙනෙක්ම

සාක්ෂි දරනවා. මේ දේශපාලන කරලිය තුළ ඔහුගේ අවංක ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් ජන්ද ඉතිහාසය තුළ ජන්ද ව්‍යාපාරයේ යෙදුණු එකම අපේක්ෂකයා ජනාධිපති ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා. අන්න ඒ ආදර්ශය නායකයෙක් විසින් ලෝකෙට රටට ජනතාවට දිය යුතු උතුම් වූ ආදර්ශය දෙමින් කරන ලද නායකත්වය තමයි සභාපතිතුමනි උතුම් වන්නේ. මේ දේශපාලන මඩගොහුරුවේ වැටිලා අනිත් අය වගේ අන්‍යයන්ට අපහාස උපහාස කරගනිමින් මඩ ප්‍රචාර යවමින් නෙමේ එතුමා එකිනෙකාට අපහාස උපහාස කරමින් ජනතාවගේ ආදරයට පත්වුණේ. එතුමා ඉතාමත් පැහැදිලිව වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී පාලකයෙක් විදියට තමයි ජනාධිපතිවරයා විදියට පත්වුණේ. අන්න ඒ උතුම් පත්වීමත් සමඟ මේ දින 14 තුළ ලංකාවේ අර මේ මන්ත්‍රීවරුන් කිව්වා වගේ මුළු ශ්‍රී ලංකාවේම ජනතාවටම ජනාධිපති වශයෙන් යම් යම් ක්‍රියාමාර්ග කරල තියෙනවා.මේ මුළු ලංකාවාසී ජනතාව වගේම ජාත්‍යන්තරයත් එතුමා පැසසුමට ලක්කරලා තියෙනවා. එතුමා ගන්නා ක්‍රියාමාර්ග සම්බන්ධවත්. රටක නායකයෙකු විසින් ගතයුතු ක්‍රියාමාර්ග රටක් පාලනයේදී ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන නායකයෙක් විදියට ප්‍රජාතන්ත්‍රවාදී විදියට රටක් පාලනය කරන්නේ මෙහෙමයි කියන ආදර්ශය දෙමින් එතුමා මේ රට පාලනය කරමින් සිටිනවා.අන්න ඒකයි ගරු සභාපතිතුමනි එතුමාගේ වැදගත්කම. අපේ පොදුජන එක්සත් පෙරමුණේ නායකයාවීම පමණක් නොවේ ගරු සභාපතිතුමනි.ශ්‍රී ලංකා නිදහස් පක්ෂය උදවු කරන කොට ඊළඟ මැතිවරණය වන මට සහතිකයක් තියෙනවා එක්සත් ජාතික පක්ෂයත් ගොඩක් පිරිසක් එතුමාට සහයෝගය දේවි කියලා.විපක්ෂයක් විදියට වුනත් පුද්ගලිකව වුණත්.ඉන් එහාට කිසිඳු දේශපාලඥයෙකුට අමුතුවෙන් යෝජනා කරන්න දෙයක් නැතිවෙයි ගරු සභාපතිතුමනි.එතුමාගේ වැඩ පිළිවළත් එක්ක. මංවිශ්වාසයක් තිබෙනවා ශ්‍රී ලංකා නිදහස් පක්සය උදවු කරන කොට ඊලග මැතිවරණය වෙනකොට මට සහතිකයක් තියෙනවා එක්සත් ජාත්ක පක්ෂයත් ගොඩක් පිරිස් සහයෝගය දේවි කියලා. පුද්ගලිකව වුනත්. විපක්ෂයක් විදියට වුනත්. ඉන් එහාට කිසිදු දේශපාඥයෙකුට අමුතුවෙන් යෝජනා කරන්න දෙයක් නැතිවෙයි ගරු සභාපතිතුමනි. එතුමගේ වැඩපිළිවෙලත් එක්ක. අද වෙනතුරු මං දැක්කෙ නැහැ කිසිම විරුද්ධවාදී දේශපාලඥයෙක් විරුද්ධවාදී අදහසක් ඉදිරිපත් කරනවා. යම් යම් කාරණා තියෙනව රටක් පාලනය කිරීමේදී අපිට 100% ක් එකඟවිය නොහැකි කාරණා තියෙනවා.යම් මතිමතාන්තර තියෙනවා.ඒ හැරෙන්නට, රටක් රටක් වශයෙන් පාලනය වෙමින් තිබෙන බව මුළු රටම එකහඩින් පිළිගන්න කාරණාවක්.අන්න ඒ කාරණාවෙදි, දෙමළ ජනතාව මේ රටේ අපේ ජනතාවගෙන් කොටසක්. මුස්ලිම් ජනතාව මේ රටේ අපේ ජනතාවගෙන් කොටසක්. අපි සිංහල හෝ දෙමළ හෝ බර්ගර් හෝ වේවා මේ අන්තවාදී දේශපාලඥයො හත්අට දෙනෙක් විසින් ඔවුන්ගේ හිස්මොලවල් ඔවුන්ගේ භාෂාවෙන් කියනවානම් විනාශකරල .ඒ ජාතිවාදය ඔවුන්ගේ ඔළුවල වපුරලා තියෙන්නේ දෙමළ හා මුස්ලිම් ජාතිය විසින් බව ඉතාම පැහැදිලි වුණා මේ ඡන්දය තුළින්. සිංහල ජාතියෙන් නොමේ. සිංහල ජාතිය තවමත් ලක්ෂ 55 ක් එක්සත් ජාතික පක්ෂයට ජන්දෙ දුන්නා.දෙකට බෙදිලා ලක්ෂ 69 ක් පොදුජන පෙරමුණට ජන්දෙ දුන්නා. එහෙනම් සිංහල ජාතියේ ඒ ජාතිවාදය නැහැ.වපුරලා තියෙන්නේ දෙමළ ජනතාවගෙයි මුස්ලිම් ජනතාවගෙයි ඔළුවලට අන්තවාදී නායකයින් කියලා මං මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.ඒ ටික කිවයුතුයි ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සම්බන්ධයෙන් කතාකරද්දී. ඒකෙයි වටිනාකම තියෙන්නේ. මොකද අනාගතයේ දවසක අන්න ඒ දෙමළ ජනතාවගෙයි මුස්ලිම් ජනතාවගෙයි ඔළුවල තිබෙන ඒ අන්තවාදී නායකයන් විසින් වපුරන ලද විසබීජ ඉවත් කරලා ගම් නගර සංවර්ධනය වෙනකොට ඔවුන් කල්පනා කරාවි සිංහල,දෙමළ,මුස්ලිම් බේදයක් නෑ මේකෙ තියෙන්නේ

ජාතිබේදය විතරයි අපි ශ්‍රී ලාංකික ජාතිය කියලා. ශ්‍රී ලාංකික ජාතියට අවමානයක් වෙනකොට අපි ඒකට නැගීසිටිනවා.හොඳම උදාහරණය තමයි ක්‍රිකට් මැච් එකක් ගහද්දි මුත්තයියා මුරලිදරන් අපි හිස්මුදුනින්ම පිළිඅරගෙන අපේ ක්‍රිකට් නායකයා කියලා අපි අත්පොඩි ගහනවා. අදටත් අපි ඔහුට ගරු කරනවා. අදටත් ඔහු උතුරු පළාත් ආණ්ඩුකාරතුමා විදියට පත්කරල තියෙනවා. ඒකයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙ දර්ශනය. ඒකයි ගරු සභාපතිතුමනි රටක වියයුත්තේ. අන්න එතුමාටත් බැරිනම් උතුරු නැගෙනහිර ප්‍රශ්නය විසඳන්න එතකොට කොහොමද සිංහල,මුස්ලිම්,දෙමළ බේදයක් කියල කියන්නේ. එතුමා උපතින්ම දෙමළ ජාතිකයෙක්.ඒකයි ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ආණ්ඩුකාරතුමා විදියට උතුරු නැගෙනහිර භාරදුන්නේ.මේ වගේ මේ රට පාලනය කිරීමේදී ගරු සභාපතිතුමනි, ලංකාවේ වියතුන් උගතුන් බුද්ධිමතුන් අදහස් කරන දේ සිදු වෙමින් පවතිනවා.. ඉතිහාසය ගත්තොත් අපි අහල තියෙන විදියට දකුණු ආසියාවේසියලුම රටවල් පරිපාලනය පිළිබඳව , නගර අලංකරණය පිළිබඳව දැනගන්න ආවෙ ලංකාවට. විශේෂයෙන් මැලේසියාව,සිංගප්පූරුව වගේ රටවල්. අද අපිට වඩා විශාල ගුණයක් ඉදිරියෙන් ඉන්නේ මෙන්න මේ අයහපත් රාජ්‍ය පාලනය නිසා කියලයි මගේ දැනීම. අන්න ඒවට තිත තියමින් අනාගත හොඳ ශ්‍රී ලංකාවක් , හොඳ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක්, ස්වයිරී ශ්‍රී ලංකාවක් කාටවත් ගැති නැති මේ රට ගැති ශ්‍රී ලාංකිකයන්ට විතරයි. අන්න ඒක සපථ කරමින් ගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ආණ්ඩු කරනවා.ඒකට මේ සියලු පක්ෂ විපක්ෂ හැමෝගෙන්ම ආශිර්වාදය එතුමාට අනාගතයේදී ලැබෙනවා. එහෙම වුණොත් මේ රට වැටී තිබෙන ආගාධයෙන් ගොඩනැගී අපේ මතු පරම්පරාවට ශ්‍රී ලංකා අනන්‍යයක් තියෙන වැදගත් සංස්කෘතික ලක්ෂණ තියෙන රටක් කොහොමත් ඉතිහාසය පුරාවට අපට තියෙනවා වැදගත් සංස්කෘතියක්. මේ දැනට තියෙන වැරදි ආකල්පවලින් මේ ජනතාව මුදවගෙන නිවැරදි ආකල්පවලට මේ ජනතාව ගෙනැල්ල ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා චිරාත් කාලයක් මේ රට පාලනය කරාවි. සියලුම මහජනතාවගේ කැමැත්තෙන්.අකමැත්තෙන් නෙමේ.අන්න ඒ එතුමාට එය කරගෙන යාමට සඳහා ශ්‍රී ලංකාවේ වාසනාවට පහලවෙච්ච ඒ රාජ්‍ය නායකයාට කිසි කරදරයක් නැතිව මේරාජ්‍ය පාලනයෙ සඳහා ශක්තිය ධෛර්යය නිරතුරුවම ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මේ සම්බන්ධව යෝජනාව ගෙන ආ ගරු ග්‍රේෂන් කෙරමිණිය මන්ත්‍රීතුමාට ස්තූතිය පලකරමින් මා නිහඩ වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු ග්‍රේෂන් මන්ත්‍රීතුමා ගෙන එන ලද යෝජනාව පිළිබඳව ඇත්තෙන්ම කිව්වොත් ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් ප්‍රකාශ කළා ඔබේ යුතුකම ඉෂ්ඨ කරන්න මංමගේ යුතුකම ඉෂ්ඨ කරන්නම් කියා. එහෙනම් ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් ඔවුන්ගේ යුතුකම ඉෂ්ඨ කරල තියෙනවා. දගරු සභාවේ සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීවරුන්ගෙන් මං ඉල්ලා සිටින්නේ අප මැතිවරණ කරනවා මැතිවරණයෙන් පස්සේ නිදාගන්නව වගේ ඉන්නවා.එහෙම ඉන්න එපා. මොකද අපි අවදි වෙලා ඉන්න ඕන.ජනතාවගෙනුත් අපි ඉල්ලන්න ඕන අපි ජන්දය පාවිච්චි කරලා අපි ජනාධිපතිවරයෙන් අගමැතිවරයෙක් අමාත්‍ය මණ්ඩලයක් පත්කරලා අපි පාලනය භාරදුන්නම එය නිවැරදි මාර්ගයට ගන්න අපි අවදියෙන් ඉන්න ඕන. පුරුදු වෙන්න ඕන පිදිය යුත්තො පුදන්න මේ අවස්ථාවෙ ගරු ග්‍රේෂන් කෙරමිණිය මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට අපගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් පක්ෂ බේදයකින් තොරව අපි දන්නවා. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිණිය ජනාධිපති වෙලා ඉන්නකොට කදිරගාමර් ඇමතිතුමා විදේශ ඇමති ලෙස පත්කළා.එතුමා දෙමළ ජාතිකයෙක්.අර සරත් මන්ත්‍රීතුමා කිව්ව

වගේ මුරලිදරන් දෙමළ ජාතිකයෙක් වුවත් අපිත් අර ගරු කදිරගාමර් ඇමතිතුමා පිළිඅරන් එතුමා ගැන ලොකු විශ්වාසයක් අපේ තිබුණා. අන්න ඒ ගේ තමයි අපි දෙමළද සිංහලද මුස්ලිම්ද කොල පාටද නිල් පාටද රතු පාටද කියල නෙමේ අපි සියලු දෙනා අවදියෙන් ඉඳලා පිදිය යුත්තන් පුදලා ඒ අවශ්‍ය කරන සංවර්ධන වැඩවලදී අපගේ ගරු සභාපතිතුමාටත් නගර සභාව දියුණු කරන්න යම්කිසි විදියකින් මොනයම් හෝ කාර්යයක් කිරීමට ඒ රජයෙන් ගත හැකි ක්‍රියාමාර්ගවලදී අපි සියලු දෙනා ඒ සඳහා සහයෝගය ලබාදෙමින් අපේ නගරයත් ඒ නගර සංවර්ධන වැඩපිළිවෙලට ඔබතුමා විසින් අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත යොමුකරලා අම්බලන්ගොඩ නගරය දියුණු කරන්න සංවර්ධනය කරන්න සූදානම් වෙන්න කියමින් මේ යෝජනාව ගෙනාපු අපගේ ග්‍රේෂන් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඩ වෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ග්‍රෙෂන් කෙරම්ණිය මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව සම්බන්ධව මං මුලින්ම ස්තුතිවන්ත වෙනවා.මොකද 7 වන විධායක ජනාධිපතිවරයා දින 14 කට 15 කට කලින් පත්වුණා. අපි දන්නවා එතුමාගේ මැතිවරණ ව්‍යාපාරය ගෙනිච්චෙ කොහොමද කියලා. එතුමා කිසිම චෝදනාවක් නොකර මඩ පහරක් ගහන්නැතිව තමයි එතුමාගේ මැතිවරණ ව්‍යාපාරය ගෙනගියේ. එතුමා අපි කැඳවලත් උපදෙස් ලබාදුන්නේ විරුද්ධවාදීන්ට හෝ කිසිම ආකාරයකින් නගරය අවලස්සන නොවන විදියට මැතිවරණ කටයුතු කරන ලෙසයි. අපි හොඳින්ම දන්නවා එතුමා මැතිවරණ දින හතලිස්පහේ රුස්වීම් පැවැත්වූ ආකාරය කොහොමද ජනතාව ආමන්ත්‍රණය කළ ආකාරය කියලා පැවැත්වූ ආකාරය. අපි විශේෂයෙන්ම කියන්න ඕන සිංහල බෞද්ධයො වැඩිකොටසක් ජීවත් වන රටේ බෞද්ධ ජන්දවලින් තමයි එතුමා ජයග්‍රහණය කළේ. එතුමා බය නැතිව ඒ බව දිවුරුම් දීමේ උත්සවයේදී ප්‍රකාශ කළා. ඒකතමයි මුළුමහත් ශ්‍රී ලංකා ජනතාවම එතුමා වටා එක්රොක් වුණේ. මෙතන කියවුණා හොඳින් අප රට පාලනය කළොත් මොකද වෙන්නේ කියලා.හොඳින් රට පාලනය කළොත් මං හිතන්නේ අවුරුදු 20 කට වත් එතුමගෙන් රට ගලවගන්න බැරිවෙයි. ඒක කාටවත් වළක්වන්න බැරිවෙයි.අපි ප්‍රාර්ථනා කරනවා ඒ වගේ නායකයෙක් රටට බිහිවෙන්නේ ඉතාමත් කලාතුරකින්. අපි හිතනවා කිසිම දේශපාලඥයෙකුට හොරකම් වංචා කරන්න ඉඩදෙන එකක් නැහැ.මොකද මේ දින ගණනට එතුමා ගත් ක්‍රියාමාර්ග මොනවද කියලා අපි දැක්කා.මේ රට දින දෙකක් තුනක් ඇතුළත බදුබරෙන් නිදහස් කළා. මේ වන විට විශාල ආන්දෝලනයකට තුඩුදුන් කාබන් බද්ද ඉවත් කළා.විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, මේ රටේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කියලා පක්ෂයක් හදලා වසර 02 ක් වැනි කෙටිකාලයක් තුළ මං හිතන්නෙ ඉතිහාසයේ ජනාධිපතිවරයෙක් බිහිකරපු රටක් මේ ලෝකෙ නැහැ ඒ නිසා අපි විශේෂයෙන්ම එතුමාට වගේම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ බිහිකරපු බැසිල් රාජපක්ෂ මැතිතුමා ගැන විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕන.එතුමා පක්ෂය හදපු නිසා තමයි අද ගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා බිහිවුණේ.නැතිනම් ගෝඨාභය මැතිතුමාට මේ රට පාලනය කරන්න වෙන්නෙ නැහැ. ඒ නිසා ලංකාවේ සියලු ජනතාවට ස්තුතිවන්ත වෙනවා මේ රට මේ තත්ත්වයට ගේන්න හැටනම ලක්ෂයක් ජන්දය දුන්න නිසා. මේ යෝජනාව ගෙනා ග්‍රේෂන් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වන අතර , ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට රට පාලනය කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඩ වෙනවා.

- ගරු සභාපතිඑම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා පස්වරු 1.00 ට සභාවෙන් නික්ම ගියේය.

ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා මූලාසනය ගන්නා ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>

මේ මොහොතේ සෝවාන් ඵලයෙහි පිහිටි උතුමෙක් රජවෙච්ච අවස්ථාව ගැන මම කලින් මතක් කළේ නැහැ. සෝවාන් යනු බෞද්ධ ලෝකයේ පළමු අධිගම තත්ත්වයයි.ඒ අධිගම තත්ත්වයට පත්වුණු ඒ අපේ නායකයා පිළිබඳව දෙමළ භාෂාවෙන් යම් වදනක් යොමුකිරීමට කැමතියි අපේ දෙමළ සහෝදරවරුන්ට දැනගැනීමට.තමිල් සහෝදරහළේ, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ අවරහල් උලහම්වෙට්ටි පෙට්ට උතුම් මනිදර්හල් අවර් හලුන්ඩන් සේරින්දු එදිරිකාලම් වෙට්ට්‍රි පෙරලාම් කඩවත්තුලෙයි. ඒවගේම මේ අවස්ථාවේ අපි සමස්ත විශ්ව භාෂාවෙන් යම් අදහසක් එලකරනවා. මෙම සෝවාන් ඵලයේ පණිවුඩය පිළිබඳව විශ්වය පුරා සරන ඒ බොදුණු ලෝකයාට දැනගන්නට.හිස් එක්සලන්සිද ප්‍රසිඩන්ට් ගෝඨාභය රාජපක්ෂ ඉස් අ පර්සන් හූ හැස් ඇටන්ස් සෝවාන්. මයි ඩියර් මාසස් ඔෆ් ද යුනිවර්ස් හී ප්‍රොසෙසස් ද ස්ට්‍රෙන්ත් ඔෆ් සක්සීඩ් ඉන් ද යුනිවර්ස්.තැන්ක් යූ.හැම බල්ලෙකුටම උගෙයි කියා දිනයක් තියෙනවා. ඒ අනුව මම මතක් කරනවා ඔබ සැමදෙනාටම තමන්ගේ විශිෂ්ඨත්වයට පත්විය හැකි දිනයක් තියෙනවා.අපේ ජනාධිපතිතුමන් සදාකල් සුදිලේවා. එතුමාගේ චින්තනය රජවේවායි පතමින් මා නවතිනවා.

තීරණය

ලක්දෙරණ ප්‍රමෝදයට පත්කරවමින් දැයේ පිනට පහළ වූ දැහැමි පොදුජන ජනපතිඳුන්ට ශුභාසිරි එක්කිරීම පිළිබඳ ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණිය මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට ගරු සභාවේ මන්ත්‍රිවරු සුභාශිංසන එක් කරන ලදී.

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

05.02.01 ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතාණෙනි , ඔබගේ යෝජනාව ඉදිරිපත් කරන්න.

**05.02.02 පින්නදූව , කෙරමිණිය දූදරුවන් වෙනුවෙන් විවේක කාලය ගත කිරීම සඳහා අවශ්‍ය ක්‍රීඩා කටයුතු වෙනුවෙන් යම් ස්ථිර ස්ථානයක් සකසා දීමේ අවශ්‍යතාවයක් පවතින බවට ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

05.02.02 ඔබතුමාගේ ඊළඟ යෝජනාව ඉදිරිපත් කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>

කෙරමිණිය,පින්නදූව දූ දරුවන් වෙනුවෙන් විවේක කාලය ගතකිරීම සඳහා අවශ්‍ය ක්‍රීඩා කටයුතු වෙනුවෙන් යම් ස්ථිර ස්ථානයක් සකසාදීමේ අවශ්‍යතාවයක් පවතින බවට මම යෝජනා කරන අතරම ඒ සඳහා නව ක්‍රීඩාංගනයක් තැනවීමට මේ ගරු සභාවෙන් අවශ්‍ය ප්‍රතිපාදන සලසමින් ඒ සඳහා ඉඩහසර පතනවා ඔබලාගෙන්. යෝජනා කරනවා ඒ සඳහා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ස්ථිර කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

මේ අවස්ථාවේ කාලය බොහොම ඉක්මනින් කැරකැවෙනවා.මෙමක්‍රීඩාපිටිය දිගු කාලයක පටන් අපේ පැතුමක්.මෙම කුඩාපිටිය ඉදිකිරීමට ලක්ෂ 13 ක පමණ තැන්පතුවක් තියෙනවා. එම තැන්පතුවද යොදමින් මේ වන විට නව රාජ්‍ය නායකත්වයේද සම්මාදම ලබාගනිමින් මා හට හැකියාවක් තියෙනවා ඒ සම්බන්ධව පෙරමුණ ගැනීමට. අප කෙරමිණිය පුස්තකාලය පසුපස ඇති අක්කර 5 ක භූමියෙන් එක් අක්කරයක් ලබාගෙන එම ක්‍රිඩාපිටිය ඉදිකිරීමට මා අදහස් කරනවා.ඔබ සමස්තයේම අවධානය සහ අනුග්‍රහය පතනවා.

**ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමා මූලසුන ගන්නවා.

- **පස්වරු 1.10ට පමණ ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා සභාවේ මූලාසනයට පැමිණියහ.**

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ශ්‍රේෂන් මන්ත්‍රීතුමා විසින් කරන ලද යෝජනාවම මම දන්නෙ නැහැ මම කලින් කරාද එතුමා කලින් කරාද කියලා. මේ ගැන මම 2019 .11.24 දින මේ වගේ යෝජනාවක් කරල තියෙනවා.

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

යෝජනාව කියෙව්වද? ඒකශ්‍රේෂන් මන්ත්‍රීතුමාගෙ නෙවෙයි. ඔබතුමිය විසින් කරපු යෝජනාවක් .මේක වැරදිලි යතුරු ලියන වෙලා නැහැ.න්‍යායපත්‍රය සංශෝධනයක් විය යුතුයි.05.02.02 කියන යෝජනාව මහගේ චම්පා සුමුදු කුමාරි මන්ත්‍රිතුමිය විසින් ඉදිරිපත් කල යොජනාවක්.

**ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්**

පින්නදූව, කෙරමිණිය දූ දරුවන් වෙනුවෙන් විවේක කාලය ගතකිරීම සඳහා අවශ්‍ය ක්‍රීඩා කටයුතු වෙනුවෙන් යම් ස්ථිර ස්ථානයක් සකසාදීමේ අවශ්‍යතාවය දැඩිව පවතී.තරුණ විය අභියස සිටින දරුවන් අනපේක්ෂිත ලෙස අධ්‍යාපනය , ක්‍රීඩාව හා සමාජ සේවය වෙනුවට වෙනත් විකපල්පයන් සෙවීමේ අවධානමක පවතින බැවින් මේ පිළිබඳව අවධානය යොමු කිරීමට යෝජනා කරමි.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමිය කතා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්</u>**

මම මේ යෝජනාව කරන්න හේතුවුණේ පහුගිය කාලෙදි දැනගන්න ලැබුණු යම්යම් කාරණා හේතුකොටගෙන.මම ඒවා ප්‍රසිද්ධියෙ කියන්න කැමති නැහැ. ඇත්තටම ගමේ දරුවො පිළිබඳව යම්කිසි අවධානමක් තිබෙනවා.විශේෂයෙන් තරුණ දරුවො සහ ළමා වියේ පසුවන අයගැන.අපිට ඒ දෙමව්පියන් දැනුවත් කරන්න හැකියාවක් නැහැ. ඒවගේම තමයි ඒ දරුවො ඒවායින් මුදවාගැනීමේ අවශ්‍යතාවය දැඩිව පවතිනවා.පාසලින් පසු කාලයේදී ඔවුන් ඛේදජනක පැත්තට යොමුවෙමින් පවතිනවා.එම ප්‍රවනතාවය අඩුකරවීමට තමයි මම මේ යෝජනාව ඉක්මනින් ගෙනාවේ. ඔබතුමා මේ පිළිබඳව විශේෂයෙන් සලකා බලන ලෙසත් ගරු විපක්ෂ නායකතුමාගෙන් සහ සියලුම මන්ත්‍රීවරුන්ගෙන් මෙම යෝජනාව සම්මත කිරීම සඳහා සහයෝගය ලබාදෙන ලෙස මා ඉල්ලනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මීට පෙර ධූරකාලයන් කිහිපයකදී ඒ යෝජනාවම මා විසින් කරනු ලැබුවා. චම්පා මහත්මිය පිළිබඳව අපි උරණ වන්නේ නැහැ. මේ සඳහා දානපති එස්. එම්. මල්ලිකා මැතිණිය පරිවස් 34 ක බිම්කඩක් ඔබතුමා හරහා අපට ලබාදුන්නා. අපි ඇතැම් වෙලාවට නීත්‍යානුකූල නොවන අයුරින් හෝ පර්චස් 30 ක ප්‍රමාණයක් ගොඩකරලයි තියෙන්නේ.මේ වෙනුවෙන් කළ හැකි ඕනෑම දෙයක් කිරීමට අපත් සුදානම්.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බනධව ඉත්හාසය මා මතක් කරන්න ඕන. අපි ඉඩමක් ගන්න බලාපොරොත්තු වුණා කෙරම්ණිය පොර පාසලතිබෙන යාබද ස්ථානය.ගර්ලින් මහතාගේ ඉඩම.ඒක ගැනීමට ලක්ෂ 8 ක මුදලකට එකඟතාවයකට ආවා.හිටපු ප්‍රධාන අමාත්‍යතුමා ලක්ෂ 08 ක මුදල අම්බලන්ගොඩ නගර සභාව වෙත එව්වා.ගර්ලින් මහතා ඊට පස්සෙ ගාන වැඩිකළා. අපේ තක්සේරු මුදල ඊට අඩුවුණු නිසා ගන්න බැරිවුණා.අපේ ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතාත්, ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මියත් සාකච්චා කර තීරණයක් ගන්න. ඒ මුදල් තවම ස්ථිර තැන්පත් යටතේ තියෙනවා.කවදාහරි කෙරම්ණිය ප්‍රදේශයේ හරි පින්නදූව ප්‍රදේශයේහරි ඉඩමක් මිලදී ගැනීමට තැන්පත් කරලයි තියෙන්නේ.මං හිතන්නෙ දැන් ලක්ෂ 15 ක් 16 ක් විතර වෙලා තියෙන්න පුළුවන්.තියෙන ප්‍රායෝගික ප්‍රශ්නෙ ඒක නෙමෙයි. මේ ඉඩම දැන් වනජීවී දෙපාර්තමේන්තුව යටතට අරන් වනජීවී ප්‍රදේශයක් බවට ගැසට් කරලා තියෙන්නේ. මේක ගත්තත් අපට ගොඩකරන එක ප්‍රශ්නයක් වෙනවා.ඒ නිසා මුලින්ම තියෙන ගැසට් පත්‍රය අවලංගු කරන්න වෙනවා. මේ තත්ත්වෙ උඩ ඉදිරියට තියෙන සංවර්ධන වැඩ ඔක්කම ඇණහිටිනවා.ඇත්ත වශයෙන්ම මුදල් ලබාදීම පිළිබඳව හිටපු ප්‍රධාන අමාත්‍යතුමාට ස්තූතිවන්ත වෙනවා. හැබැයි අපිට පාවිච්චි කරන්න විදියක් නැහැ. ගත්තත් හදන්න විදියක් නැහැ.ඒ නිසා මේ සියල්ල අවබෝධ කරගෙන අපි වෙන ඉඩමක් හෝ නිතියට පටහැනි නොවන ආකාරයට ගන්න හෝ ගැසට් එක වෙනස් කරගන්න හෝ බලන්න. මේ ප්‍රශ්නෙ තියෙනවා ක්‍රිකට් ආයතනය හා සම්බන්ධව ඇතිකරගත් ඉඩම සම්බන්ධවත්.මේ

ප්‍රශ්නෙ තියෙනවා මහඅම්බලන්ගොඩත්.පින්නදූවෙත් තියෙනවා. සමහරවිට ඔබතුමී පදිංචි නිවස වුණත් වනජීවී කාර්යාලයට ඇතුළත් වෙලා ඇති.ඔවුන් ඒව අරගෙන තියෙන්නේ ජී.පී.එස්.යන්ත්‍ර මගින්.නිවැරදි විදියට නෙමේ.ඇත්තටම ජීවිතකාලෙට කවදාවත් පින්නදූවෙවත් කෙරමිණියෙවත් කැළයක් තිබුණෙ නැති බව අපි හැමෝම දන්නවා.මොකද අපි උපන්නෙ ඔය ගමේ නිසා. ඉස්සර හොදිනු කුඹුරු කරපු ප්‍රදේශ . කුඹුරු නොකළ නිසා මේඅය වනජීවී ප්‍රදේශයක් බවට පත්කරල තියෙනවා.හේතුව ඇයි ද කියන එක ප්‍රශ්නයක්.ගමට ප්‍රශ්නයක්.මොකද ගමේ මිනිස්සුන්ට පිට්ටනියක් හදන්න හෝ මොනවහරි දෙයක් කරන්න තිබුණු ඉඩකඩක් නැතිවෙලා තියෙනවා. ඕකට යාබද පර්චස් 34 මන්ත්‍රීතුමා කිව්ව වගේ ඒ මහත්මයා අපිට ළඟදි පැවරුවා.ගර්නල් මහත්තයා සතුව තියෙනවා අක්කරේකට වැඩි කොටසක්.ඒකට සල්ලි තියෙනවා අපි සතුව. හිටපු ප්‍රධාන අමාත්‍යතුමා එවපු සල්ලි දැනුත් තියෙනවා. ගත්තත් අර ප්‍රශ්නෙට මුහුණ දෙන්න වෙනවා. ඒ ප්‍රශ්නෙත් විසඳාගෙන මන්ත්‍රීවරු දෙන්නම සහභාගී වෙලා මේක වෙනස් කරගෙන ඒ මිනිස්සුන්ට අවශ්‍ය දේ කරන්න සූදානම් විය යුතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, දැන් වනජීවී ගැසට් එක පිළිබඳව අපි අවස්ථා කීපයකදී සාකච්ඡා කළා. බලන් ගියාම අපේ බස් නැවතුම්පොළ දක්වාත් වනජීවී ගැසට් එකට .ඒ ගැසට් එක හදපු නිලධාරීන්ගේ තියෙන වගකීම් රහිත ක්‍රියාකලාපය නිසා අපේ නගරෙට ප්‍රශ්නයක් වෙලා තියෙනවා.මේ අවස්ථාවේදී මං ඔබතුමාට යෝජනා කරනවා අතිගරු ජනාධිපතිතුමා සාමානයෙන් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ යුගයේදීත් වැඩකරද්දි එතුමා ගත්ත සමහර තීන්දු කාටවත් යටත් නොවී බොහොම බුද්ධිමත්ව ගත්ත තීන්දු තිබුණා.ඔබතුමාගෙන් මං ඉල්ලා සිටිනවා අම්බලන්ගොඩ ගැසට් එක පිළිබඳව ජනාධිපතිතුමා දැනුවත් කරන්න ප්‍රායෝගිකව සහ ලිඛිත සියලු සාක්ෂි ඇතුලත්ව.වනජීවී ගැසට් එකට අම්බලන්ගොඩ නගර සභාව ඇතුළත් වෙලා තියෙනවනම් එතුමාට මේක ඉදිරිපත් කළාම කියාවි මේ හදල තියෙන්නෙ පිස්සො රංචුවක් කියලා.අපේ තල්ගස්ගොඩ ඉඳලා කෙරමිණිය,මහඅම්බලන්ගොඩ,කැටන්තොට,පින්නදූව මේ ලයින් ඔක්කොම ඇතුළත් කරලා තියෙන්නේ . අපිට කවදහරි දවසකදි ගංවතුර පාලනය කරන්න හල්වතුර යෝජනා ක්‍රමයත් එක්ක ඇලදොළ සුද්ද කරලා අම්බලන්ගොඩ නගර සභාව සංවර්ධනය කරන්න ඉඩම් අවශ්‍ය වෙනවා.මේක හොඳම අවස්ථාවක්.න්‍යායනුකූලව අතිගරු ජනාධිපිතතුමා නිවැරදිව සුදුසු තීන්දුව ගනීවි.ඔබතුමා පැහැදිලිව මේ ගැසට් එකේ කොපිත් එක්ක සියලු ලිපිලේඛනත් එක්ක අත්පත්කර ගත්ත ප්‍රදේශත් මාක් කරලා මෙන්න මේ අපට අයිති නගර සභාව සතු ඉඩම් ප්‍රමාණය වනජීවී කලාපයෙන් නොපමාව ඉවත් කරදෙන්න කියල කියන්න. මං හිතනවාකෙටිකාලයකින් ජනාධිපතිතුමා මාර්ගයෙන් ගැසට් එක සංශෝධනය කරලා දේවි.මෙතුමිය ඉල්ලන්නේ සාධාරණ ඉල්ලීමක්.මොකද අපි ගත්තොත් මහ අම්බලන්ගොඩට පනියන්දූවට පොඩි හරි පිට්ටනියක් තියෙනවා.පොල්වත්තට කරිත්තක්නදටත් පොඩි හරි පිට්ටනියක් තියෙනවා. අපි බැලුවම කෙරමිණිය පින්නදූවෙ අලුත් පරම්පරාවෙ තරුණයන්ට සෙල්ලම් කරන්න කුඩා දරුවන්ට සෙල්ලම් කරන්න තැනක් නැහැ. එතුමියගෙ කටින් කියවුණේ නැහැ. මෙම ස්ථානයට යාබද ඉදිකැටිය පැත්තෙන් ඉතා ප්‍රබල විදියට මත්ද්‍රව්‍ය අම්බලන්ගොඩ ප්‍රදේශයට එනවා. අපි වැදගත් තොරතුරු දැනුම් දීලයි තියෙන්නේ අවශ්‍ය ස්ථානවලට. අපි දන්නවා කරන පුද්ගලයෝ.ඒ නිසා මේ තරුණ පරම්පරාව ආරක්ෂා කරගැනීම බලා ගැනීම ඒවට ගොදුරු නොවී ඔවුන් ආරක්ෂා කරගැනීම ඔබතුමා ඇතුලු අපේ

සමස්ථ මන්ත්‍රීවරුන්ගේම වගකීමක්.ඔබතුමා කරුණාකරලා වැඩිපුරකාලය ගන්නේ නැතිව අපේ මුදලුත් අරගෙන රජයේ මුදලුත් අරගෙන මේ පින්නදූව කෙරමිණියට ක්‍රීඩාපිටියක් හදලා දෙන්න ඔබතුමාට ශක්තිය ධෛර්යය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. ඔබතුමා ඉතා වගකීමෙන් මේ දේ කරන්න. ගැසට් එක සංශෝධනය කරදෙන්න කියලත් ඉල්ලනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු නගර සභා මන්ත්‍රී චම්පා මන්ත්‍රීතුමියගේ යෝජනාව කෙරමිණිය පින්නදූව දූදරුවන්ට විවේක කාලය ගතකිරීමට ක්‍රීඩාපිටියක් සකස් කිරීම පිළිබඳවයි. අපි ඇත්තටම ඒ යෝජනාවට ස්තූතිවන්ත වෙනවා.මං හිතන්නේ ඔබතුමා මීට කලිනුත් ක්‍රීඩාපිටෙක් ඉදිකරන්න උත්සාහ ගත්තා.මේක ඉදිකරන්න ඔබතුමා කිව්වා වගේ ප්‍රධාන ලේකම්තුමා ලක්ෂ 08 ක් ද කොහොද එව්වා. මං හිතන්නේ ඒක තියෙනවා.ඉඩමට වැලිව් එක වැඩිවුනාම තක්සේරුව අඩුවෙන් තමයි ඇවිල්ල තිබුණේ.දීපු ගාන තමයි එවලා තිබුණේ.

<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එකඟත්වයට පත්වුණු මුදල තමයි ලක්ෂ 08.වැලිව් එක අඩුවෙන් ආවෙ. අඩුවෙන් තමයි ගෙවන්න වෙන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ඉතිරි මුදල හොයාගන්න පුළුවන් නම් අර මුදලුත් එක්ක දාල ගන්න පුළුවන්.

<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

වැඩිමුදලක් ගත්තත් දැන් වනජීවි ප්‍රශ්නයක් තියෙන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

එහෙනම් මූලික වශයෙන් ඒක කරන්න වෙනවා. නීත්‍යානුකූලව තමයි කරන්න වෙන්නේ. දැන් අර පින්නදූව පහල කැල්ලේ උමායා හෝටලයට පිටිපස්සෙ වෙල අයිති වෙනවද ඔය වනජීවි කලාපයට.

<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කරන්දෙණිය දක්වා අත්පත් කරගෙන තියෙන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ඒක නිසා අපි ඉල්ලා සිටිනවා. නීත්‍යානුකූලව වනජීවී කලාපයෙන් ඉවත් කරන්න කියලා.

<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

දැන් ඔබතුමාට කියන්නේ පොල්වත්ත පොඩි පාලම ළඟ තියෙන ඇළ සුද්ද කරගෙන යනකොට වනජීවී එකෙන් ඇවිත් මගදි නැවැත්තුවා. වනජීවී ප්‍රදේශය ඇතුළෙ තියෙන ඇළ සුද්ද කරන්න එපා කිව්වා.

**ගරු නගර සභා මන්ත්‍රී  රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්**

මේකයි සභාපතිතුමා ඔය ප්‍රශ්න ගැටලු සම්බන්ධව සාකච්ජාවක් ඉල්ලන්න.ඔබතුමා සහභාගී වෙලා ඒ අයට පැහැදිලි කරදෙන්න.නගර සභාව තුළ තියෙන්නෙ ගොඩක් පහත් බිම්.මොකද හැමතැනම පොඩි පිට්ටනි  හරි තියෙනවා.ඒ නිසා ඔබතුමා සාකච්ජා කරලා මේ සඳහා දායකත්වය දෙන්න කියල අපි ඉල්ලනවා.ගරු නගර සභා මන්ත්රි ඩෙනට් පනියන්දුවගේ මහතා කිවු පරිදි හැමතැනටම පොඩි පොඩි ක්‍රිඩාංගණ තිබෙනවා.එම නිසා මෙහෙට නැහැ. එමනිසා මේ සඳහා දායකත්වය දක්වන්න කියා ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී  රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අර ෆින්කෝ එකේ කට්ටිය පැමිණ තිබෙනවා.

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සභාව විනාඩි 15 කට කල්තබනවා.

- ගරු සභාව පස්වරු 1.20 ට පමණ සභාව විනාඩි 15කට කල් තබන ලදී.
- පස්වරු 1.45ට පමණ ගරු සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**තීරණය -**

කෙරමිණිය,පින්නදූව දූ දරුවන් වෙනුවෙන් විවේක කාලය ගතකිරීම සඳහා අවශ්‍ය ක්‍රීඩා කටයුතු වෙනුවෙන් යම් ස්ථිර ස්ථානයක් සකසාදීමේ අවශ්‍යතාවයක් පවතින බවට ගරු ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් යෝජනාව ඉදිරිපත් කරනු ලැබුවත් එය න්‍යාය පත්‍රයට ඇතුල් කිරිමේදි වැරදි ලෙස සටහන්ව ඇති බවත් එය ගරු නගර සභා මන්ත්‍රී මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය විසින් ඉදිරිපත් කරන ලදයෝජනාවක් ලෙස සංශෝධනය විය යුතු අතර,  මේ සඳහා තෝරාගෙන ඇති භූමි ප්‍රමාණය වනජීවි කලාපයක් බැවින් අවශ්‍ය කටයුතු මන්ත්‍රීවරු දෙන්නම සහභාගී වෙලා මේක වෙනස් කරගෙන එම ජනතාවට අවශ්‍ය දේ ඉටුකිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු එස්.එම්.සරත් චන්ද්‍ර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.** කාරක සභා වාර්තා :-

**06.01 2019.11.25** දින පැවති පුස්තකාලකමිටු වාර්තාව සභාගත කරන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්.**

ගරු සභාපතිතුමනි මාත් යෝජනාවක් දි තිබෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

එම යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් වෙලා නැහැ. ඊළඟ  සභාවට දමන්නම්.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2019.11.25 දින පැවති පුස්තකාලකමිටු වාර්තාව යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2019.11.25 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.02 2019.11.20 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2019.11.20 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2019.11.20 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.03 2019.11.25 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2019.11.25 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.ජී. ආර්. පේෂලා මහත්මිය කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

තීරණය

2019.11.25 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ජී.ජී. ආර්. පේෂලා කුමාරි ද සිල්වා මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.04 2019.11.28 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2019.11.28 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

තීරණය

2019.11.25 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.05 2019.11.28 දින පැවති වෙළඳ සංගමයේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2019.11.28 දින පැවති වෙළඳ සංගමයේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.ජී. ආර්. පේෂලා මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

තීරණය

2019.11.28 දින පැවති වෙළඳ සංගමයේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ජී.ජී. ආර්. පේෂලා මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.06 2019.11.29 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

**මෙම කමිටුව මේ මසයේ නොපැවැත්විණි.**

**06.07 2019.11.26 දින පැවති ක්‍රිඩා කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2019.11.26 දින පැවති ක්‍රිඩා කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2019.11.26 දින පැවති ක්‍රීඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**_06.08 2019.11.28 දින පැවති රථවාහන හා ත්‍රී රෝද රථ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

2019.11.28 දින පැවති රථවාහන හා ත්‍රී රෝද රථ කමිටු වාර්තාව යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. සෝභිත රංජිත් මහතා කතා කරමින්**

එම යෝජනාව ස්ථිර කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

සභාපතිතමා ත්‍රීවිල් කමිටුවෙන් පොල්වත්ත හන්දියේ බෝඩ් එකක් ගහලා තියෙනවා. ඒක මරණ දැන්වීම් ගහන්නද දන්නෑ තියෙන්නේ. අනවසරව ත්‍රි රෝද රථ නතර කර ඇති අය ඒකේ මරණ දැන්වීම් ගහලා ඒක ප්‍රතික්ෂේප කරනවා. ඒකට ගන්න පියවර මොකක්ද?

**ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපි සභාවෙන් ගන්න ක්‍රියාමාර්ග හැල්ලුවට ලක්කරලා ඒකෙ ඕනකමින්ම ඒක වැහෙන්න අලවලා තියෙනවා.එක ත්‍රීරෝද රථ රියදුරෙක් තමයි මේ පෝස්ටර් අලවලා තියෙන්නේ. දෙක තුනක් අලවලා තියෙනවා මාත් දැක්කා.ඒ නිසා සභාපතිතුමා අපේ නිලධාරියෙක් යවලා හරි මේකට දැඩි ක්‍රියාමාර්ගයක් ගන්න.

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අලවපු ත්‍රීරෝද රථ රියදුරා හොයල උසාවි දාන්න.

තීරණය

2019.11.28 දින පැවති රථවාහන හා ත්‍රී රෝද රථ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 07. ටෙන්ඩර් හා මිළ ගණන්

07.01 ටෙන්ඩර්

07.02 මිළ ගණන්

## 08. ගෙවීම්

08.01 2019 නොවැම්බර් මස 01 -15 දක්වා VAT මුදල වන රු.103248.97 ක මුදලක් දේශිය ආදායම් කොමසාරිස් වෙත සහා අනුමැතියට යටත්ව ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.02 තාක්ෂණ සේවා නිලධාරී (පුහුණු) බී.පෘථලී මදාරා මියට 2019 නොවැම්බර් මස දීමනා රු.36138/- ක් සහා අනුමැතියට යටත්ව ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

08.03 අම්බලන්ගොඩ නගර සභා මහජන පුස්තකාලයේ පොත් 125 ක් බැඳීම වෙනුවෙන් අම්බලන්ගොඩ, ශ්‍රී මේධානන්ද මාවත,නො.15/1 ලිපිනයේ පදිංචි එස්.ඩබ්.හරිස්චන්ද්‍ර මහතා වෙත රු.88825/- ක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.04 කර්මාන්ත අංශයට ඇණවුම් අංක 2286 යටතේ ඇණවුම් කරන ලද අඟල් 1 ½ හා ¾ කොන්ක්‍රීට් වෙනුවෙන් පී.එච්.සී.සී. ද සිල්වා මහතා හට රු.85050/- ක් සහා අනුමැතියට යටත්ව ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.05 ඇණවුම් අංක 2261 හා 2262 යටතේ ඇණවුම් කරන ලද අඟල් 1 ½ හා ¾ කොන්ක්‍රීට් ගල් වෙනුවෙන් අම්බලන්ගොඩ නන්දන පී.වී.සී. ඇන්ඩ් සෙරමික් ට්‍රේඩර්ස් වෙත රු.53710/- ක් සහා අනුමැතියට යටත්ව ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.06 ඇණවුම් අංක 2208 යටතේ ඇණවුම් කරන ලද ලෝක ළමා දින වැඩසටහන සඳහා ආරාධනා පත්‍ර හා බැනර් මුද්‍රණය වෙනුවෙන් සක්වා ප්‍රින්ටර්ස් ආයතනය වෙත රු.24625/- ක් සහා අනුමැතියට යටත්ව ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.07 ඇණවුම් අංක 2264 යටතේ ඇණවුම් කරන ලද 125W මර්කරි බල්බ් 100 ක් මිලදී ගැනීම වෙනුවෙන් චානක එන්ටර්ප්‍රයිසස් ආයතනය වෙත රු.68000/- ක් සහා අනුමැතියට යටත්ව ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්

මෙහි චෝට් එක පරික්ෂා කරන්න.

ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

තාක්ෂණ සේවා නිලධාරීගෙ උපදෙස් පරිදි තමයි අපි මේක කරන්නේ.ගේන ඒව අපි බලන්නෙ නැහැ කවදාවත් . තාක්ෂණ සේවා නිලධාරී තුමා හෝ තුමිය ඒකෙ වාර්තා දෙනවා.

08.08 ඇණවුම් අංක 2249 යටතේ මුද්‍රණය කරන ලද ලිපිද්‍රව්‍ය වෙනුවෙන් සක්වා ප්‍රින්ටර්ස් ආයතනය වෙත රු.26500/- ක් සහා අනුමැතියට යටත්ව ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.09 ඇනවුම් අංක 2248 යටතේ ඇණවුම් කරන ලද ලිපිද්‍රව්‍ය වෙනුවෙන් ලූමිනෙක්ස් බුක්ෂොප් ආයතනය වෙත රු.12150/- ක් සහා අනුමැතියට යටත්ව ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

0810 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ ළිඳ ඉදිකිරීම 03 ඕකන්ද ජ්‍යෙෂ්ඨ පුරවැසි කමිටුව වෙත සහා අනුමැතියට යටත්ව රු.402198.23 ක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්

8.10 8.11 8.12 සම්බන්ධව එකම දේ.

ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මන්ත්‍රීතුමිය මේක තේරුම් ගන්න. ළිං 3 ක්. අපි මේක හදිසි කාරණයක් වශයෙන් ඉක්මනින් සිදුකරන්න අවශ්‍යතාවය තියෙනවා. අපේ තාක්ෂණ නිලධාරී කෙනෙකුට අනුමත කිරීමේ බලය තියෙන්නේ ලක්ෂ 05 යි. මේක හදල යැව්වොත් පළාත් පාලනයට තව මාස 08 ක් වත් යනවා.ළිඳ හදන්න බැරිවෙනවා.අපේ පරිපාලනයේ දුර්වලකම්.ඒක ඉස්සරහට විසඳගමු.අපට දැනට ඉන්නේ තුන ශ්‍රේණියේ කාර්මික නිලධාරීන් විතරයි.අඩුම තරමේ එක ශ්‍රේණියේ කෙනෙක්වත් ඉන්න ඕන.

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මහතා කතා කරමින්

ගරු සභාපතිතුමා අයිිහාරයට අහුනොවෙන විදියට ගෙවීම කටයුතු කරද්දි දෙපාරකට විතර ගෙව්වනම් හරි.

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නීත්‍යානුකූල පනදම මත තමයි කරල තියෙන්නේ.මේකෙ කිසිම වරදක් නැහැ. ඒ අයට සෑදිය හැකි උපරිම මුදලට තමයි හදල තියෙන්නේ. මෙතන ළිං 03 ක් තියෙනවා. කර්මාන්ත 03 ක්. මූල්‍යාමය ගැටලු එන කිසි දෙයක් කරන්නේ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

කර්මාන්ත 3 ගෙවීම් කරන්න කියන්නේ එකම විදියට නෙමේ.දෙපාරකට තුන්පාරකට වගේ.

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එහෙම බැහැ. ඒ අය වැඩ කරලා තිබෙනවා නම් ගෙවන්න ඕන.මූල්‍යාමය ගැටළු එන කිසිම දෙයක් අපි කරන්නේ නැහැ. එතකොට අනිත් පැත්තෙන් තිබෙන සියළුම දේවල් බලා තමයි ගෙවීම් කරන්නේ.

08.11 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ ළිඳ ඉදිකිරීම 02 ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත සහා අනුමැතියට යටත්ව රු.208348.73 ක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රීනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.12 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ ළිඳ ඉදිකිරීම 01 ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත සහා අනුමැතියට යටත්ව රු.175883.75 ක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රීනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.13 මහජන ක්‍රීඩාංගනයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ කාණුවේ දකුණු පැතිබැම්ම ඉදිකිරීම දෙවන අදියර සඳහා ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත සහා අනුමැතියට යටත්ව රු.457684.33 ක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රීනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.14 මහජන ක්‍රීඩාංගනයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ කාණුවේ දකුණු පැතිබැම්ම ඉදිකිරීම පළමු අදියර සඳහා ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත සහා අනුමැතියට යටත්ව රු.438563.67 ක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රීනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.15 මහජන ක්‍රීඩාංගනයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ කාණුවේ වම් පැතිබැම්ම ඉදිකිරීම පළමු අදියර සඳහා ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත සහා අනුමැතියට යටත්ව රු.414217.35 ක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.16 මහජන ක්‍රීඩාංගනයේ දේවානන්ද විද්‍යාලය දිශාවේ කාණුවේ වම්පැතිබැම්ම ඉදිකිරීම දෙවන අදියර සඳහා ඕකන්ද ජෞෂ්ඨ පුරවැසි කමිටුව වෙත සහා අනුමැතියට යටත්ව රු.198358.51 ක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

08.17 අම්බලන්ගොඩ නගර සභාවේ ගරු නාගරික මන්ත්‍රිවරුන්ගේ නොවැම්බර් මස ගමන් වියදම් ලෙස රු.69000/= ක මුදලක් සභා අනුමැතියට යටත්ව ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.18 පෙර පාසැල් තෑගි උත්සවයේ තෑගි සඳහා අවශ්‍ය පොත් වෙනුවෙන් ගෙවන ලද රු. 67766/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි චාමර බුක් ෂොප් වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ස්ථිර කරන ලදි.

08.19 පෙර පාසැල් තෑගි උත්සවයේ තෑගි සඳහා අවශ්‍ය සපත්තු වෙනුවෙන් ගෙවන ලද රු. 138525/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි එස්.අයි.එස් FOOTWARE වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ස්ථිර කරන ලදි.

08.20 පෙර පාසැල් තෑගි උත්සවයේ තෑගි සඳහා අවශ්‍ය සපත්තු වෙනුවෙන් ගෙවන ලද රු. 81475/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි YASIKALA LETHER WORKS වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ස්ථිර කරන ලදි.

**09. ගිණුම් :-**

09.01 2019 ඔක්තෝම්බර් මාසයට අදාළ වියදම් වාර්තාව , පොදු ගිණුම් හා වියදම් වැය විශ්ලේෂණය සභාගත කරන ලදී.

**තීරණය**

2019 ඔක්තෝම්බර් මසයට අදාළ පොදු වියදම් වාර්තාව , වියදම් වැය විශ්ලේෂණය හා 2019 ඔක්තෝම්බර් මස ලැබීම් විග්‍රහය පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

## 10. ඇස්තමේන්තු :-

**10.01 2019 වර්ෂය සඳහා රු.430000/= ක ඇස්තමේන්තු පරිපූරක අයවැය ලේඛනය සභාගත කරන ලදී.**

**තීරණය**

2019 වර්ෂය සඳහා පරිපූරක අයවැය ලේඛණය සභාගත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකිර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.02 අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභි පාසල් සිසුන් හා පිරිවෙන්ගත ස්වාමින් වහන්සේලා සඳහා අභ්‍යාස පොත් කට්ටල බෙදාදීම සඳහා වූ රු5,000,000ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේහි ඇස්තමේන්තුවේ මුදල දමා නැහැ.

<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ප්‍රජා සංවර්ධන නිලධාරීට එන්න කියන්න ඇස්තමේන්තුව ඇතුළත් කරන්න ඕන. ඇස්තමේන්තුව තියෙනවා මගෙ අතේ.අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ ජීවත් වන නගරවැසියන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව අඩුආදායම්ලාභී පවුල්වල අධ්‍යාපනය ලබන පාසල් දූවාදරුවන්ට නොමිලේ පොත් බෙදාදීමට අපේක්ෂා කෙරේ.ඉලක්කගත කණ්ඩායම අඩු ආදායම් ලාභී පාසල් දූවාදරුවන්,අම්බලන්ගොඩ නගරයේ පිරිවෙන්වල වෙසෙන ස්වාමීන් වහන්සේලා, අම්බලන්ගොඩ දහම් පාසල්වල දූවාදරුවන් දල ඇස්තමේන්තුව පොත් කට්ටල සඳහා වියදම හතලිස් අට ලක්ෂ දහදාහයි.පොත් කට්ටලයක වියදම එක්දහස් තුන්සීයයි.ප්‍රතිලාභීන් ගණන තුන්දහස් හත්සීයයි.පොත් කට්ටල පාර්සල් කිරීමට රුපියල් තිස්දාහයි.සැරසිලි,උත්සව,ශබ්ද විකාශන යන්ත්‍ර ,සංග්‍රහ, පරිපාලන වියදම් එක්ලක්ෂ හැටදාහයි. මුළු එකතුව ලක්ෂ පනහයි.ඒ යටතේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍ර දේශයේ අඩු ආදායම් ලාභි පාසැල් සිසුන් හා පිරිවෙන් ගත ස්වාමින් වහන්සේලා සඳහා අභ්‍යාස පොත් කට්ටල බෙදා දිම සඳහා ඉදිරිපත් කරන ලද රු5,000,000ක ඇස්තමේන්තුව ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභාමන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.03 ඔකන්ද ප්‍රජාශාලාව පිටත පින්තාරුව හා අලුත්වැඩියාව සඳහා රු 224000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

ඕකන්ද ප්‍රජාශාලාව පිටත පින්තාරුව හා අලුත්වැඩියාව සඳහා රු.224,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.04 පොල්වත්ත පියවර පෙර පාසලේ පිටත පින්තාරුව සඳහා රු240000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

පොල්වත්ත , **පියවර පෙරපාසලේ පිටත පින්තාරුව සඳහා** රු.240,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.05 මහ අම්බලන්ගොඩ කාරෝලිස් වෙද මාවත හරස් පාර තාර දැමීම සඳහා රු 160000/=ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී**

**තීරණය-**

මහ අම්බලන්ගොඩ , කරෝලිස් වෙද මාවත හරස් පාර තාර දැමීම සඳහා රු.160,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී හේමන්තාද සිල්වා මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.06 මහ අම්බලන්ගොඩ තුඩුවමුල්ල පාර සිට තොටුපල පාර දක්වා කොටස තාර දැමීම සඳහා රු.930,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී**

**තීරණය-**

මහ අම්බලන්ගොඩ , තුඩුවෙමුල්ල පාර සිට තොටුපල පාර දක්වා කොටස තාර දැමීම සඳහා රු.930,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී හේමන්තාද සිල්වා මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.07 මහ අම්බලන්ගොඩ තුඩුවමුල්ල පාරෙන් අතුරු පාර තාර දැමීම සඳහා රු.300,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී**

**තීරණය-**

මහ අම්බලන්ගොඩ , තුඩුවෙමුල්ල පාරෙන් අතුරු පාර තාර දැමීම සඳහා රු.300,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී හේමන්තාද සිල්වා මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.08 මහ අම්බලන්ගොඩ කරෝලිස් වෙද මාවතෙහි කොන්ක්‍රීට් සපත්තු කාණුව ඉදිකිරිම සඳහා රු 240,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී**

**තීරණය-**

මහ අම්බලන්ගොඩ , කරෝලිස් වෙද මාවතෙහි කොන්ක්‍රීට් සපත්තු කාණුව ඉදිකිරීම සඳහා රු.240,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී හේමන්තාද සිල්වා මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.09 අම්බලන්ගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සිසු නිපුනතා ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා රු.150000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී**

**තීරණය-**

අම්බලන්ගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සිසු නිපුනතා ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා රු.150000/-ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී පේෂලා කුමාරි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**11. වෙනත් කරුණු :-**

**12. න්‍යාය පත්‍රයට ඇතුළත් නොවූ කරුණු :-**

**12.01 පොදු වෙළඳපොලෙහි සුළු මසුන් ව්‍යාපාරකයන්ට බලපෑ ප්‍රශ්නය සම්බන්ධව යන මැයෙන් සුළු ධිවර ( මසුන්) වෙළඳ සංගමය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

සුළු ධීවර මසුන් සංගමය,පොදු වෙළඳපොළෙහි සුළු මසුන් ව්‍යාපාරිකයන්ට බලපෑ ප්‍රශ්නය සම්බන්ධවයි. සුළු වෙළඳ ව්‍යාපාරිකයන් අප සැම පාරම්පරිකව මෙම මසුන් ව්‍යාපාරය කරගෙන යන බැවින් අවුරුදු 40 ක පමණ කාලයක්.ඒ අතරතුර අම්බලන්ගොඩ නගරයේ පොදු වෙළඳපොල සුපර් මාර්කට්යන නාමයෙන් මසුන් ව්‍යාපාරය ආරම්භ කළේය.එතැන් සිට අපගේ වෙළඳපොලෙහි කරගෙන ආ මසුන් ව්‍යාපාර කඩා වැටුණේය.එයට මූලික හේතුව සුපර් මාර්කට්වල ඇති මසුන් වෙළඳාමයි.සුළු ව්‍යාපාරිකයන් හට කඩකාමර 13ක් නගර සභාව සතුව තිබූ නමුත් එම සුපර් මාර්කට් අවුරුදු 15 ට පෙර මසුන් ව්‍යාපාරය පටන් ගැන්මේ සිට පාරිභෝගිකයන් මසුන් ගැනීමට පහල කඩකාමර ඇති පෙදෙසට පැමිණියේ නැත. එම නිසා අප විසින් ව්‍යාපාරය කරගෙන යැම සඳහා මහවීදියේ පොදු වෙළඳපොළ අසල පාර අයිනේ ව්‍යාපාරය කරගෙන ගොස් ඇති නමුත් නගර සභාවට අයවිය යුතු මුදල් මේ වන තෙක් ගෙවා ඇත.අප දන්නා තරමින් නගර සභා ආඥා පනත යටතේ මීටර 500 ක් දුරින් පොදු

වෙළඳපොලක් අසල මසුන් සහ එළවලු වෙළඳාම තහනම් බවය.එහෙත් එමආඥා පනත නගර සභාව මගින්ම සංශෝධනය කර අතුරු ව්‍යවස්ථාවක් මගින් මෙම සුපර් මාර්කට්වලට මසුන් විකිණීම සඳහා බලපත්‍ර දී ඇත.අප දන්නා තරමින් නම් මසුන් විකිණීමට සුපර් මාර්කට්වලට අවසර ඇත්තේ පැකට් කර පොලිතින්වලට දැමීමෙන් පමණයි.එහෙත් සුපර් මාර්කට්වල මසුන් ව්‍යාපාරය කරගෙන යන්නේ කඩකාමරවල ව්‍යාපාරය කරගෙන යන අයරින්මය. අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත මුලු දිවයිනටම බලපාන පරිදි මාර්ග පිරිසිඳු කිරීම නිසා අම්බලන්ගොඩ මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමාගේ නියෝගය පරිදි එතුමාට ගරු කිරීමක් වශයෙන් පහල ඇති කඩකාමරවලට මසුන් ව්‍යාපාරය සඳහා යොමු විය. ගරු සභාවෙන් අප ඉල්ලා සිටින්නේ අපගේ පහල මසුන් ව්‍යාපාරය රැකගෙන යාමටනම්පවුල් සමග ජීවත් වීමට සුපර් මාර්කට් ගැන සොයාබලා මසුන් වෙළඳාමට දී ඇති බලපත්‍රය අහෝසි කරන ලෙස ඉල්ලා සිටියි.නගර සභා ආඥාපනත යටතේ 152 දරණ වගන්තියේ 80 පිටුවේ තිබෙන ආකාරයට ගරු සභාවට මේ ගැන තීරණයක් ගැනීමට හැකි බව අප පෙන්වා දෙයි. මෙම කරුණු ගැන සානුකම්පිතව සොයාබලා අපගේ සියලු දරු පවුල් ජීවත් කරවීම සඳහා මෙම මසුන් ව්‍යාපාර ඉදිරියට කරගෙන යාමට අවස්ථා සලසා දෙනමෙන් ගරු සභාපතිතුමා ඇතුලු ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා බව කුඩා ධිවර ව්‍යාපාර කරන සංගමයේ ලේකම් අශෝක මහතා විසින් ලිපියක් එවා තිබෙනවා.මේ සම්බන්ධව සුපර් මාර්කට් සම්බන්ධව පරීක්ෂණයක් කරල තියෙනවා. වාර්තාව ඉදිරිපත් කරනවා.අම්බලන්ගොඩ නගරයේ පොදු වෙළඳපොළෙන් බැහැරව මාළු විකිණීමේ ස්ථානයන්හි ක්ෂේත්‍ර පරික්ෂාවකට අදාළ වාර්ථාව. ක්ෂේත්‍ර පරීක්ෂාව කළ දිනය 2019.12.02. ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කළ ස්ථාන.ආර් ටී එස් ෆුඩ් සිටි,සුමනදාස ෆුඩ් සෙන්ටර්,අම්බලන්ගොඩ අළුත් මාළු,සහන සේල් මාළු පොළ,ෆුඩ් සිටි අම්බලන්ගොඩ 1,ෆුඩ් සිටි අම්බලන්ගොඩ 2

01.1989 අංක 12 දරණ පළාත් සභා අනුෂංගික විධිවිධාන පනතේ දෙවැනි වගන්තියේ පලමුවන උප වගන්තියේ (අ) ඡෙදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතතන සම්මත අකුරු ව්‍යවස්ථා පනතේ දෙවන වගන්තියේ පලමුවන උප වගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1811 හා 2013.05.17 දිනැති ගැසට් පත්‍රයේ 1V අ කොටසේ නිවේදනය කරනු ලැබුවා වූද දකුණු පළාත් සභාව විසින් අනුමත කර ඒ බව අංක 1878 හා 2014.08.29 දිනැති ගැසට් පත්‍රෙය් මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා මාලාවට අනුව ඉහත සඳහන් කළ මාළු 1V අ කොටසේ නිවේදනය කරනු ලැබුවා වූ ද මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා මාලාවට අනුව ඉහත සඳහන් කළ මාළු විකිණීමේ ස්ථාන අප විසින් පරීක්ෂා කරන ලදී.

02.එහිදී එක් එක් ස්ථානයන්හි අතුරු ව්‍යවස්ථාවේ සඳහන්ව ඇති කොන්දේසි උල්ලංඝනය කර ඇති ආකාරය පහත පරිදි වේ.

1. ආර්.ටී.එස්.ෆුඩ් සිටි ,නො 273/ ඒ, මහාවීදිය, අම්බලන්ගොඩ.

03. (ආ) මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ සිමෙන්ති බදාමයෙන් බැඳීම කර පිහන් ගඩොල් අල්ලා නොතිබීම.

(ඇ) අපජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිගන් ගඩොල් ඇල්ලූ කාණු නොතිබීම.

(ඇ) ඇ ඡේදයේ සදහන් කාණු තුළින් ගලාගෙන යන අපජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාම වැලැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා නොතිබීම හා එකී අපජලය උරාගන්නා වලකට ගලායාමට ඉඩ සැලසීම පිලබඳ පැහැදිලිව නිරීක්ෂණය නොවීම.

06. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක සහ එහි අවට ඇති පැති කාණුද මාළු ගබඩා කිරීම සකස් කිරීම හෝ විකිණීම හා සම්බන්ධව පාවිච්චි කරන සියලු භාජන සහ උපකරණද මනා අලුත්වැඩියාවෙන් තොරව සහ දුර්ගන්ධයකින් යුතුව තබාගැනීම.

07.අතුරු ව්‍යවසථාවේ 07 වන වගන්තියට අනුව දෛනික වෙළඳාමේ කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන මාළු අධිශීතකරණයක ගබඩා කළ යුතු වුවත් මෙම ස්ථානයේ අධිශීතකරණයේ ගබඩා නොකරන අතර අයිස් දමා සසඵජුෆෝම් පෙට්ටි තුළ ගබඩා කර තැබීම.

09. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක බල්ලන් , බළලුන් ,කෘමින්ගෙන් තොරව තබාගත යුතු වුවත් මෙහි අධිකව මැස්සන් සිටීම.

10. (ඇ) මාළු වෙළඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය නොකිරීම.

11. මාළු වෙළඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙතම ආරක්ෂිත මුව වැසුම් අත්වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා නොතිබීම.යන කාරණා 11ක් අසම්පූර්ණ බව කියා තිබෙනවා. ඒ ආර්.ටී .එස්ලා.ඊළඟ සුමනදාස ෆුඩ් සෙන්ටර් නො 233, මහ විදිය , අම්බලන්ගොඩ

03 ඇ ඡේදයේ සඳහන් වෙන ඇ) ඇ ඡේදයේ සදහන් කාණු තුළින් ගලාගෙන යන අපජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාම වැලැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා නොතිබීම හා එකී අපජලය උරාගන්නා වලකට ගලායාමට ඉඩ සැලසීම පිලබඳ පැහැදිලිව නිරීක්ෂණය නොවීම.

07.අතුරු ව්‍යවසථාවේ 07 වන වගන්තියට අනුව දෛනික වෙළඳාමේ කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන මාළු අධිශීතකරණයක ගබඩා කළ යුතු වුවත් මෙම ස්ථානයේ අධිශීතකරණයේ ගබඩා නොකරන අතර අයිස් දමා සසඵජුෆෝම් පෙට්ටි තුළ ගබඩා කර තැබීම.

(ඇ) මාළු වෙළඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය නොකිරීම.

11. මාළු වෙළඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙතම ආරක්ෂිත මුව වැසුම් අත්වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් පැළඳිම සහතික විය යුතුය කියන කාරණා අඩුබවට වාර්තා කර තිබෙනවා. ඊළඟට අම්බලන්ගොඩ අළුත් මාළු වෙළඳ සැල අංක 229 මහ විදිය , අම්බලන්ගොඩ

03ඇ) අපජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිගන් ගඩොල් ඇල්ලූ කාණු නොතිබීම.

ඇ ඡේදයේ සඳහන් වෙන ඇ) ඇ ඡේදයේ සඳහන් කාණු තුළින් ගලාගෙන යන අපජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාම වැලැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා නොතිබීම හා එකී අපජලය උරාගන්නා වලකට ගලායාමට ඉඩ සැලසීම පිලබඳ පැහැදිලිව නිරීක්ෂණය නොවීම

උ) ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් තරම් වැසිකිළි පහසුකම් සපයා නොතිබිම සහ වැසිකිළි භාවිතයෙන් අනතුරුව සුදුසු සනීපාරක්ෂක ද්‍රව්‍ය සපයා නොතිබිම.

06) බලය ලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක හෝ ඒ අවට ඇති කාණුද මාළු ගබඩා කිරිමට හෝ සකස් කිරිමට විකිණිම සම්බන්ධව පාවිච්චි කරන සියළු භාජන අළුත් වැඩියාවෙන් යුතුව දුර්ගන්ධයෙන් තොරව පවත්වා ගෙන නොතිබිම.

07.අතුරු ව්‍යවසථාවේ 07 වන වගන්තියට අනුව දෛනික වෙළඳාමේ කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන මාළු අධිශීතකරණයක ගබඩා කළ යුතු වුවත් මෙම ස්ථානයේ අධිශීතකරණයේ ගබඩා නොකරන අතර අයිස් දමා සසඵුෆෝම් පෙට්ටි තුළ ගබඩා කර තැබීම.

09. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක බල්ලන් , බළලුන් ,කෘමින්ගෙන් තොරව තබාගත යුතු වුවත් මෙහි අධිකව මැස්සන් සිටීම.

10. (ඇ) මාළු වෙළඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය නොකිරීම.

11. මාළු වෙළඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙතම ආරක්ෂිත මුව වැසුම් අත්වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් පැළඳිම සහතික විය යුතුය කියන කාරණා අඩුබවට වාර්තා කර තිබෙනවා. එහි කරුණු 8ක් තිබෙනවා. ඊළඟට සහන වෙළඳ පොළ 4වන හරස් විදිය අම්බලන්ගොඩ.

03. (ආ) මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ සිමෙන්ති බදාමයෙන් බැඳීම කර නොතිබිම හෝ පිඟන් ගඩොල් හෝ මළ නොබැඳෙන ලෝහයෙන් සකසා නොතිබිම .

(ඇ) අපජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිගන් ගඩොල් ඇල්ලූ කාණු නොතිබීම.

(ඇ) ඇ ඡේදයේ සඳහන් කාණු තුළින් ගලාගෙන යන අපජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාම වැලැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා නොතිබීම හා එකී අපජලය උරාගන්නා වලකට ගලායාමට ඉඩ සැලසීම පිලබඳ පැහැදිලිව නිරීක්ෂණය නොවීම.

06) බලය ලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක හෝ ඒ අවට ඇති කාණුද මාළු ගබඩා කිරිමට හෝ සකස් කිරිමට විකිණිම සම්බන්ධව පාවිච්චි කරන සියළු භාජන අළුත් වැඩියාවෙන් යුතුව දුර්ගන්ධයෙන් තොරව පවත්වා ගෙන නොතිබිම.

07.අතුරු ව්‍යවසථාවේ 07 වන වගන්තියට අනුව දෛනික වෙළඳාමේ කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන මාළු අධිශීතකරණයක ගබඩා කළ යුතු වුවත් මෙම ස්ථානයේ අධිශීතකරණයේ ගබඩා නොකරන අතර අයිස් දමා සෘජුෆෝම් පෙට්ටි තුළ ගබඩා කර තැබීම.

08) බලපත්‍ර ස්ථානයේ මාළු විකිණීම හෝ සකස් කිරිම හෝ භාණ්ඩයක් හෝ උපකරණ හෝ අඳුමක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා නොතිබිම.

10. (ඇ) මාළු වෙළඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය නොකිරීම.

11. මාළු වෙළඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙතම ආරක්ෂිත මුව වැසුම් අත්වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් පැළඳිම සහතික විය යුතුය කියන කාරණා අඩුබවට වාර්තා කර තිබෙනවා. එහි කරුණු 7ක් තිබෙනවා.

ෆුඩ් සිටි අම්බලන්ගොඩ 01 අංක 100, ගාලුපාර ,අම්බලන්ගොඩ

11. මාළු වෙළඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙතම ආරක්ෂිත මුව වැසුම් අත්වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් පැළඳිම යන කරුණ එහි තිබෙනවා.

ෆුඩ් සිටි අම්බලන්ගොඩ 02 අංක 38, ගාලුපාර ,අම්බලන්ගොඩ

10. (ඇ) මාළු වෙළඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය නොකිරීම.

11. මාළු වෙළඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙතම ආරක්ෂිත මුව වැසුම් අත්වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් පැළඳිම යන කරුණ දෙක එම ෆුඩ් සිටි අංක 02හි තිබෙනවා . ඊළඟට වාර්තා කරනවා මෙම සියළුම ස්ථාන වල අපද්‍රව්‍ය බැහැර වන ස්ථාන හා ආහාර ගබඩා කිරිම පිළිබඳ වැඩි දුරටත් මහජන සෞඛ්‍ය පරීක්ෂක මගින් ලබා ගැනිම සුදුසු බව යෝජනා කරනවා. මෙම කරුණු වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරනවා. ඒ අනුව අදාළ මාළු විකිණීම අදාල පාර්ශව වෙත දන්වා යැවීම සුදුසු බව වාර්තා කර තිබෙනවා. අද තමයි මට මේ වාර්තාව ලැබුණේ.මේ සම්බන්ධව සභාවේ අදහස විමසා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

ඔබතුමා අපි කුඩාකාලෙ නෙමේ ඉන් එහාට ගිහිපු අවුරුදු පනහක් විතර ගිය මං හිතන්නෙ මේ හතරවෙනි පරම්පරාව වෙන්න ඕන. මේ ක්‍රමයට අම්බලන්ගොඩ මාළු විකුණන්නෙ.මේකෙ වැදගත්කම වෙන්නෙ මේ අය ඉල්ලන ඉල්ලීම් කොච්චර සාධාරණද ?යුක්ති සහගතද? පවුල් කීයක් මේකෙන් අම්බලන්ගොඩ ජීවත් වෙනවද? ඔබතුමාත් මාත් අවුරුද්දෙ ඉදල ඉදුල් කටගෑ දවසෙ ඉදලා ලැල්ලෙ මාළු මිස අයිස් පෙට්ටියෙ මාළු කාල පුරුදු පුද්ගලයො නෙමෙයි.මෙතන ඉන්න සියලු වැඩිහිටියො ඒ අයම තමයි. අපි කවුරුවත් අම්බලන්ගොඩ මාළුගෙන කා නැත. මම ඊයෙ කොළඹ යනකොට අරන් ගියෙත් අද කොළඹ යනකොට අරන් යන්නෙත් ලැල්ලෙ මාළු තමයි.මොකද අපට කාල පුරුදු මේ ලැල්ලෙ මාළුම තමයි.මේ අය ඉල්ලන ඉල්ලීමේ ඉතාම සාධාරණ බවක් තියෙනවා.ඔබතුමා දැන් ලැයිස්තුවක් කිව්වා. 1987

අංක 18 දරණ නගර සභා ආඥා පනතේ තිබෙන කරුණු අනුව මං ඊයෙ කියවල තේරුම් ගත්තා. මේ වගේ තිබෙන කරුණුත් සමඟ මේ අය ඉල්ලන ඉල්ලීමට අපි තීන්දු කරන්න ඕන එක් පුද්ගලයෙක් සමාගමක් නඩත්තු කරනවද? සමස්ත අම්බලන්ගොඩ ඉතිහාසය පුරාවට පරම්පරා පහක් පමණ වූ ජනතාව ජීවත් වූ ආදායම් මාර්ගය සලස්වනවද? කියන එක.ඒක තමයි අපි ගතයුතු මූලික තීන්දුව.තරාදියෙ දෙපැත්තයි.එක පැත්තක් තනි පුද්ගලයෝ පෝෂණය කරනවද?සමාගම් පෝෂණය කරනවද? එහෙම නැත්නම් සමස්ත බෝට්ටුවෙන් ගිහිල්ල මාළු ටික අල්ලන් ඇවිත් අසරණ විදියට ජීවත් වන ඒ අසරණ පවුල් ජීවත් කරවනවද කියන එක.මං හිතන්නෙ එක ලැල්ලෙ පවුල් 03 ක් 04 ක් ඉන්නවා.ඒ මිනිස්සු ජීවත් වෙන්නෙ මාළු ලැල්ලෙන් ලැබෙන ආදායමෙන්.අපි තීරණය කරන්න ඕන.මේකද ගන්න ඕන.මොවුන් පෝෂණය කරනවද කියන එක. මම නගර සභා මන්ත්‍රීවරයක්වත් දේශපාලඥයෙක්වත් නොවෙන විදියට මා කතා කළොත් මා කියන්නේ  මම අම්බලන්ගොඩ පුරවැසියෙක් විදියට කතාකරොත් අපි තීරණය කළ  යුත්තේ අවුරුදු 40 කටත් එහා ගිය හතරවෙනි පරම්පරාව විතර මෙම වෘත්තියෙන් ජීවත්වෙන මිනිස්සු ජීවත් කරවීම මිස සල්ලිකාරයෝවත් සමාගම්වත් පෝෂණය කිරීම නොවන බවයි.එමනිසා  වෙළඳපොළ යන 1987 අංක 18 දරණ නගර සභා ආඥාපනතේ 250 වන අධිකාරයේ 2014 අංක 35 සහ 2017 අංක 21 සංශෝධිත සහිතව මේ පොතේ වෙළඳපොළ පිළිබඳව ඉතා පැහැදිලි නිර්වචනයක් දි තිබෙනවා. වෙළඳපොළවල් සම්බන්ධව සභාවේ කාර්යය . මේ කාර්ය පිළිබඳව මා වැඩි වේලාවක් ගන්නේ නැහැ. කාලය නොතිබෙන නිසා. නමුත් එහි 136 (ආ) වගන්තිය යටතේ ඉතා පැහැදිලි විග්‍රහයක් තිබෙනවා.මේ ඔබතුමා දැන් කිවුව ගරු මන්ත්‍රිවරු අහලා ලියා ගත්ත එක එක තැන්වල තිබුණ දුර්වලතාවයන් හා අඩුපාඩු පිළිබඳව මෙහි කියනවා. ඊළඟට  අලුත් පුද්ගලික වෙළඳපොළවල් සඳහා බලපත්‍ර දිම සම්බන්ධව 137(1) යටතේ පැහැදිලි විග්‍රහයක් තිබෙනවා.පවත්නා පුද්ගලික වෙළඳපොළවල් සඳහා බලපත්‍ර දීම 138(1) යටතේ  පැහැදිලිව තිබෙනවා බලපත්‍ර කොන්දේසි යටතේ සහ කොන්දේසිවලට අනුකූලව හැර තවදුරටත් පවත්වාගෙන නොලැබිය යුතු බව .එසේනම් මේ කිච්ච ආයතන 06 ම මේ වගන්ති අනුව ක්‍රියාකරන්නේ නැත්නම් ඔබතුමා ඇතුලු මේ සභාවට බලය තියෙනවා  ඒ මාළු විකිණීම ඉවත් කිරීම සඳහා.අපි කියන්නෙ සුපර් මාර්කට් වහන්න කියලා. නමුත් මිනිස්සු ජිවත් විය යුතුයි. මූලික කරුණ මිනිස්සු ජිවත් විම. මේ අසරණ මිනිස්සුන්ට මූලිකත්වය දිය යුතුයි. කෝටිපති ව්‍යාපාරිකයෝ ඔය එක් එක් සමාගම් නෙමේ. ඔය සමස්ත ලංකා ජාලයේ තිබෙන ෆුඩ් සිටිවත් නෙමේ. එහෙම නැතිනම් මහා පරිමාණයට කරන සුපර් මාර්කට් වත් නෙමේ.මා කියන්නේ සමස්තව මේ ජනතාවට මූලිකත්වය දිය යුතුයි කියන එක. එතකොට මෙහි පැහැදිලිව තිබෙනවා බලපත්‍රයක කොන්දේසි කඩකරනවනම් එය නතර කිරීමට සම්පූර්ණ බලය සභාපතිතුමා ඇතුලු ගරු සභාවට තිබෙනවා. අතුරු ව්‍යවස්ථානුකූල නොවන්නා වූ විශේෂ කොන්දේසිවලට යටත්වෙන්න ඕන කියලත් තියෙනවා. එහෙනම් මෙහි පැහැදිලි නිර්වචනය දෙනවා මාළු ව්‍යාපාරය හරියට කරගෙන යන්නෙ නැත්නම් ඒකට ගතයුතු ක්‍රියාමාර්ගත් මේ පොතේ තියෙනවා. 142 වගන්තියෙ තියෙනවා යම් අලුත් පුද්ගලික වෙළඳපොළක් සඳහා ආඥාපනත යටතේ දෙනු ලබන සෑම බලපත්‍රයක්ම එකී පුද්ගලික වෙළඳපොළ වෙනුවට පොදු වෙළඳපොලක් පිහිටුවීම මහජන යහපතට ඉවහල් වේ යැයි සභාව විසින් තීරණය කළහොත් එකී සභාවේ සභාපතිවරයා විසින් එකී පුද්ගලික වෙළඳපොළේ බලපත්‍රය අලුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.මා ගරු සභාවේ ගරු මන්ත්‍රිවරු ඇතුළු ගරු සභාපතිවරයාගේ අවධානය යොමු කරනවා. අපි අම්බලන්ගොඩ පුරවැසියන් හැටියට මේ ආඥා පණතේ ගොඩක් තිබෙනවා. එකින් එක කියන්න යන්නේ නැහැ. මම ඊයෙ රෑ 11.30 විතර වෙනකන් මේ ගැටළුව පිළිබඳව සම්පූර්ණව

අධ්‍යානය කළා. මේ පොත් කියවලා. ඒක අපේ වගකීමක් එය. මේ ජනතාව සම්පූර්ණම ගෝඨාභය මහත්තයට ජන්දෙ දුන්නද සජිත් ප්‍රේමදාස මහත්තයට ජන්දෙ දුන්නද අනුර කුමාර දිසානායක මහත්තයට ජන්දෙ දුන්නද කියන එක නෙමෙයි.අපිට තියෙන ගැටලුව මේ මිනිස්සු ජීවත් වෙන ආකාරය පිළිබඳවයි. මම මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා ඔබතුමා ඇතුලු ගරු මන්ත්‍රීතුමන්ලා ට ආඥාපනත යටතේ ලැබී ඇති වරප්‍රසාදය උල්ලංඝනය නොකර අම්බලන්ගොඩ ජනතාවට කුඩාකළ සිට දන්නා ජනතාවට පරම්පරා ගණනාවක් මේ ජීවන වෘත්තිය කරගෙන යන්න ඔවුන්ට ඒ අවශ්‍ය කරන පහසුකම් ටිකත් හදල දෙන්න මේ නගර සභාවේ වගකීමක් තිබෙනවා . ඊට අමතරව දැන් පුංචි පොළ කියලා අර අනගාරික රයිටර් තිලකසේකර හදන ලද අම්බලන්ගොඩ නගරයේ වටිනාකමක් ඇති අර වටිනා සමූපකාර ගොඩනැගිල්ල ඇතුළට පුංචිපොළ දාගෙන තියෙනවා. කරුණාකර මා කියනවා මේ පුංචිපොළ මෙම ස්ථානයෙන් ඉවත් කරන්න. කරුණා කරලා අපි මේ නගර සභා ගොඩනැඟිල්ල හදනවා වගේම මිලියන ගණන් කෝටි ගණන් අරවට වියදම් කරනවා වගේම අපි ලැජ්ජා විය යුතුයි මේ අම්බලන්ගොඩ ඉපදුණු මිනිස්සු විදියට ලැජ්ජවෙන්න ඕන 2004 දි සුනාමියට ගිහිපු මාර්කට් එක අපිට තවම හදාගන්න බැරිවෙච්ච පරපුරක් අපි. අපි ඒ ගැන ලැජ්ජා වෙන්න ඕන. අම්බලන්ගොඩට අපි.අපි ඒ ගැන කනගාටුවෙන්න ඕන. මේ සුදු ඇඳගෙන ඇවිත් කතා කළාට.එමනිසා ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. අපි පුළුවන් තරම් ඉක්මනට ඔබතුමා හැකි ඉක්මනට රජයේ සහයෝගය ලබාගෙන ජනාධිපතිතුමාගේ අවධානයට යොමුකර සුනාමියෙන් අපිට අහිමි වූ මාර්කට් එක ප්‍රතිසංස්කරණය කර අම්බලන්ගොඩ ලස්සන නගරයක් හදන්න ඔබතුමාගෙ කාලය තුළ අපි වගකීමෙන් වැඩකරන්න. මම ඉල්ලීමක් කරනවා පුංචි පොළ එතනට ගෙනියන්න.එතන වෙළඳාම් කරන්න පුළුවන් විදියට අලුත්වැඩියා කරන්න. මේ පොතේ තියෙනවා. මාර්කට් එක එතන තියෙනවනම් එතන මාළු විකුණන්න බැහැ . සුපර් මාර්කට්වල විකුණන , භාවිත කරන ආකාරය පිළිබඳව ඒ නිරික්ෂණ වාර්තාව එවත් අපි සැලකිල්ලට ගෙන ඒ අයට අණපනත් දාන්න වෙනවා .පැදැදිලි සිංහල නිර්වචනය භාවිතා කරලා ඒ අයට මාළු විකුණන්න පුළුවන් කියා. මෙහි පැහැදිලිව තිබෙනවා මාර්කට් එක එතැන තිබෙනවානම් අළුත් මාර්කට් එකක් හදන්න බැහැ. මාළු අළුත් මාර්කට් එකක විකුණන් බැහැ. අන්න ඒවාගේ ඒවා තහනම් කරලා ඒවාට පාලනයක් දමා ක්‍රමවේදයක් දමා අපි කියන්නෙ නැහැ ඒවා වසා ඒ මිනිසුන් ගෙදර යවන්න කියලා.ඒවත් තියෙන්න ඕන.ඒවට යන පිරිසකුත් ඉන්නවා. අපි කියන්නෙ පල්ලෙහා මාළු විකුණන මිනිසුන්ගේ ජීවිතවලට අගතියක් නොවන පරිදි, ඒ අයගේ පවුල් ජීවිත වලට අගතියක් නොවන පරිදි . මේ ආඥාපනතේ තියෙන නීති ප්‍රකාරව කටයුතු කරන්න කියලා. ගරු සභාපතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා අම්බලන්ගොඩ පුරවැසියෙක් විදියට අම්බලන්ගොඩ ලේ තැවරිච්ච මාළු කාපු පුද්ගලයෙකු හැටියට දේශපාලනයෙන් තොරවයි මා මේ ඉල්ලීම කරන්නේ මේ සම්බන්ධව කඩිනම් ක්‍රියාමාර්ග ගතයුතුයි කියලා මා ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අද දින වෙනත් කරුණු යටතේ අපිටත් මේ ලිපිය ලබාදී තිබෙනවා. අශෝක මහත්මා ඇතුලු සුළු ධීවර ව්‍යාපාරිකයින්ගේ සංගමයට මුලින්ම අපි ස්තූතිවන්ත වෙන්න ඕන ඔවුන් එම ස්ථානයෙන් සිය කැමැත්තෙන්ම ඉවත්වෙලා පහළ ඇති ස්ථානයකට අනුගතවීම සම්බන්ධව.ඔවුන් එම කටයුත්ත කළා වගේම ව්‍යාපාරික කටයුතු යම්තාක් දුරට අඩුවෙන ස්වභාවයක් පවසා තිබෙනවා ඊට හේතුව ලෙස ඔවුන් පවසා තිබෙන්නේ ෆුඩ් සිටි සහ

වෙනත් වෙළඳ පොළවල් පවත්වාගෙන යාමයි.මං හිතන්නෙ සභාපතිතුමා ෆුඩ් සිටිවල මාළු විකුණන්න නම් පෙති කපල පොලිතින් ක්‍රමයකට අසුරන්න ඕන කියල නීති පොත්වල තියෙනවා නේද? මීටර් 500 ක් තුළ මාළු එළවළු විකුණන්න බෑ කියල කලින් තිබුණා නේද සභාපතිතුමා.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒක ඉවත් කරල තියෙන්නෙ.

**<u>ගරු නගර සභා රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ෆුඩ්සිටිවල ඕල්සේල් වෙළඳාම වෙනවා.සිස්ටම් එකේ වෙනසක් තියෙනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි කොහොම වුණත් දීර්ඝව කතාකරනවට වැඩිය හොඳයි ෆුඩ්සිටිවලට අවශ්‍ය නීතිය ක්‍රියාත්මක කරන්න.මුලින් දැනුවත් කරන්න. එම කාලය තුළ මේ වෙනස සිදුවුණේ නැත්නම් ෆුඩ්සිටි සීල් කරන්න .

**<u>ගරු නගර සභා රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා මේ වාර්තා අනුව අපේ නිලධාරින්ගේත් වැරදි තියෙනවා.නීතිය ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව.

**<u>ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි හරි මේ සුළු මසුන් ව්‍යාපාරිකයින්ගේ ලිපිය අනුව තමයි පරීක්ෂණය කළේ.මේ සුළු මසුන් ව්‍යාපාරිකයින්ගේ ලිපිය අනුව මං ආදායම් පරීක්ෂක මහත්වරුන්ට නියෝග කළා.හැම ෆුඩ්සිටියකටම ගිහිල්ල බලලා වරදක් තියෙනවනම් පැහැදිලිව ලිඛිතව අපට ඉදිරිපත් කරන්න කියලා. මට තියෙන්නෙ මේකට වැරදි නිවැරදි කරන්න පණත අනුව සතියක් හෝ දෙකක කාලයක් දෙන්න කියල තමයි තියෙන්නෙ.ඉතින් මං සභාවට ඉදිරිපත් කළා ඔබතුමන්ලාගේ දැනගැනීමට.

**<u>ගරු නගර සභා රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එහෙමනම් මේක ක්‍රියාත්මක කරන්න.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ක්‍රියාත්මක වෙනවා.

**<u>ගරු නගර සභා එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි, දැන් ඉදිරිපත් කරන ලද මේ වගන්ති සම්පූර්ණ කරොත් මේ සුපරි මාර්කට්වල වෙළඳාම නවත්තන්න අවට බැහැ.මේ වෙළෙඳුන් ඉදිරිපත් කරන මේ වෙළඳාමේ කඩාවැටීමේ ස්වභාවය ඒතුළින් අපට නවත්තන්න බැහැ.

ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මං හිතන්නෙ මෙතන සියලු දෙනා අලුත් දියුණු තත්ත්වයට පත්වෙන්න ඕන. අලුත් දියුණු තත්ත්වයට පත්වෙනවනම් සභාව විසින් මං දකින්නෙ සභාව විසින් අපට කරන්න පුළුවන් දේ තමයි මේ අයටත් ඒ මට්ටමේ වෙළඳාමක් කරන්න පුළුවන් දෙයක් ඇති කිරීම.උදාහරණයක් විදියට මාළු ශීතකරණවල දාල තියන්න කියනවනම් අපට පුළුවන් සභාවෙන් ශීතකරණ අරන් දෙන්න.අපට ඒ මුදල මේ අය ගෙවන්න ඕන.කිසිම ලැල්ලක එක්කෙනෙක්වත් දැනට සභාවට සත පහක්වත් ගෙවන්නෙ නැහැ. නමුත් මේ අය නගර සභාවට ගෙවනවා. අනෙක විදුලියටවත් ගෙවන්නෙ නැහැ.ඊයෙ රෑ මම 8.30 ට ගියා බල්බ් එකක් දැල්වෙනවා.ඕෆ් කරලවත් ගිහින් තිබුණෙ නැහැ. මේ ගොල්ලොත් නීතිගත වෙන්න ඕන. මාළු මාර්කට් එක කියන්නෙ නීතිය කඩන්න තියෙන අයිතියක් තියෙන පිරිසක් නෙමෙයි.මං මේ පුටුවට ඇවිල්ල අවුරුදු 25 ක් වෙනවා.මේ අවුරුදු 25 ම මම උත්සාහ ගත්තා මේක වෙනස් කරන්න.බැරිවුණා. මට ඉහළින් දේශපාලන තලවල හිටපු අය මේක නැවැත්වුවා.මට මේ පාර ආපු නිලධාරීන් කිවුවෙ ගිය පාර මේක ක්‍රියාත්මක කරන්න හැදුවම ඩෙනට් මහත්තය ඒක ක්‍රියාත්මක කරන්න එපා කියල කිව්වා කියලා.ඒ නිසා දැන් මට ඉහලින් මේ අම්බලන්ගොඩ කතාකරන්න කවුරුවත් නෑ.ඒ නිසා දැන් මම මේ තීන්දුව අරන් ඉවරයි. රජය දෙන ප්‍රතිපත්ති තින්දුව අනුව දැන් මට මිනිස්සු විශාල ගණනක් හොඳ කියනවා. මේ අයත් ඒ තත්ත්වයට ගෙන්න.ඒ අය එම තත්ත්වයට ගෙන්න උදවු කරන්න අරගොල්ලෝ වරදක් කරනවනම් ඒ අයට දඩුවම් දෙන්න ඕන.

ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්

සභාපතිතුමා දැන් මේ පිරිස යම් මට්ටමකින් එකඟත්වයට පැමිණිලා තියෙනවා....

ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ඔව් ඒක තමයි අපි කිව්වේ ශීතකරණ ඕන්නම් සභාවෙන් අනුමත කරලා අරන් දෙන්න. හැබැයි මේ ගොල්ලොන්ට වාරික වශයෙන් ගෙවන්න වෙනවා.

ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්

සභාපතිතුමා අපේ යුතුකමක් තියෙනවා ඔවුන්ට නිසි ස්ථානයක් පිළියෙල කරදීම

ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අපි හදල තියෙන්නෙ ලක්ෂ 84 ක් වියදම් කරල මාළු මාර්කට් එකක්. පිහන් ගඩොල් අල්ලල හදල තියෙන්නේ.ගරු නගර සභා මන්ත්‍රී සෝභිත මහතා කිව්වා පිහන් ගඩොල් කඩනවනම් වෙනත් ස්ථානයකට එක්ක යන්නම් කියලා. ඔබතුමාගෙ ඉල්ලීම පරිදි ලස්සනට අල්ලපු පිගන් ගඩොල් කැඩුවා. ඒත් ඔවුන් එක්ක යන්න බැරිවුණා. සියලුදෙනා නීති කඩලයි මේ දේවල් කරන්නෙ. නීතියට අනුකූලව අපි උදවු කරනවා. පෞද්ගලිකව මං කවදාවත් මාළු ෆුඩ්සිටියෙන් අරන් නැහැ මං ගන්නෙත් මේ ලැල්ලෙන්ම තමයි.ඒ ගන්නෙත් ඒ අය එම ව්‍යාපාරය කරන නිසා එයට පුරුදු වි තිබෙන නිසා.

ගරු නගර සභා රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

සභාපතිතුමා අපි යම් ක්‍රමවේදයක් සකස්කරල දෙන්න ඕන මේ අයට.මං කියන්න ඕන්නෑ ඔබතුමාට ඔබතුමා හොඳට දන්නව මේ ප්‍රදේශයෙ කවුද පුද්ගලයො කියල. ෆුඩ්සිටිවල අයත් වැරදි කරල තියෙනවනෙ.

ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ඒවාට දඩුවම් කරනවා.

ගරු නගර සභා රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

එතකොට මෙතුමන්ලත් දැනුවත්ව හෝ නොදැනුවත්ව වැරදි වෙන්න පුළුවන්. ඒ වැරදි හදාගෙන ඉහල නීතියට අනුගතවෙලා තියෙනවා.

ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

නැහැ. ගරු මන්ත්‍රීතුමා ඒ අය කරලා තිබෙන්නේ උඩ සිට පහළට යන එක විතරයි. මෙහි තිබෙන සියළු වැරදි ඒ අයත් කරනවා.

ගරු නගර සභා රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

ඒ තමයි මා කියන්නේ එම වැරදි නිවැරදි කරගෙන අපේ යුතුකම සහ වගකීම මෙතුමන්ලට ව්‍යාපාරය කරගෙන යන්න ක්‍රමවේදයක් සකසන එක. බෝඩි ගහල මාලු තියෙන තැන් දැනුවත් කරන්න පුලුවන්. මහජනතාව එතෙන්ට යන විදියක්නේ හදලා දෙන්න ඕන. දැනුවත් කරන්න ඕන. මහජනතාව තමයි නීති කඩන්නෙ හැමදේම කරන්නේ.අපි වගකිවයුත්තො හැටියට ඒක නිවැරදි කළ යුතුයි. මාර්ගය ප්‍රතිසංස්කරණය කරදෙන්න.ඔබතුමාට හැකියාව තියෙනවනෙ දැන් ඔබතුමාට ඉහලින් බලයත් තියෙනවා දැන්. ෆුඩ්සිටිත් සීල් කරල නීතිය ක්‍රියාත්මක කරන්න කියන්න.ෆුඩ්සිටි මහා පරිමාණ වෙළඳුන්. ඇත්තටම ෆුඩ්සිටිවලින් නගර සභාවෙ වැඩකටවත් සත පහක්වත් දෙන්නෙත් නැහැ. අපි අර අවුරුදු උත්සවයක් කරන අවස්ථාවේ. අපි නගරවැසියො වෙනුවෙන් කල්පනා කරල ක්‍රමවේදයක් සකස් දෙන්න. මොවුන්ගේ ව්‍යාපාරය සංවර්ධනය කිරීම සඳහා නිත්‍යානුකූල වෙන විදියට. අපි ඔබතුමාගෙන් බැගෑපත්ව ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්

සභාපතිතුමනි, නගර අලංකරණය පිරිසිදුකම සුවතාවය පිළිබදව සලකා බැලුණු නූතන ජනනායකයාගේ මතයට ගරු කරමින් අපේ ධිවර ප්‍රජාව ඉතාම හික්මුණු අය සේ ප්‍රදර්ශනය කරල ඔබතුමා සහ නිලධාරීන් සහ අපේ පොලිස් නිලධාරීන්ගේ මතයට ගරු කරල ඒ නියමිත ස්ථානයට ගිය නිසා අපි ආචාර කරනවා ඔවුන්ට.මොකද ඔබලා එඩිසම්බන්න බලමාලු කාපු ඇත්තො.ඔබලා තමන්ගේ සෘජු මතය නොබියවම එළිදක්වනවා. ඒ වගේමයි එපමණකින්ද නොසැලී මේ සම්භාවනීය පුරවැසියන් හමුවට පැමිණිලා තමන්ගෙ දුක කියන්න. රාජ්‍ය නායකත්වයට සෘජුව නතුවුණු මේ ගැටලුව පිළිබදව ඔවුන් අසරණ බවට පත්වෙච්ච බවක් තමයි මට පෙනෙන්නේ. අපි දකිනවා අම්බලන්ගොඩ පුරවරයේ සරද්දී ඔවුන්ගේ පීඩාව

පිළිබඳව. කුමන නිර්නායක කවුරු ඉදිරිපත් කළත් ඔවුන් කන හැටි ඔවුන්මයි දන්නෙ. ඔවුන්ගේ දුවා දරුවන්ගෙ දුක අඳෝනාව අපට පෙනෙනව මේ නගරෙ. ඒ වගේම ගරු සභාපතිතුමනි තවත් යමක් කිවයුතුයි ධීවර සොයුරනේ දස මසක් කුස දරා අනෙක දුක් ගැහැට විඳ අප ලොකු මහත් කර උත්තරීතර මෑණියන්ට ඔබ අවමන් කරනවා කියල මං අහල තියෙනවා. අන්න එවැනි දේ අපි අවම කරගත යුතුයි. කරන්දෙණියෙ වැසියෙක් මට කියනව අම්බලන්ගොඩ මාළු මාර්කට් එකට ඔවුන් යන්න අකමැතියිලු. මොකද එවැනි අස්සීල යෙදුම් වදන් අහන්නට අපේ කරන්දෙණියේ වැසියෝ කියන නිසා. රජයේ නිලධාරියෙක්. ඔවුන් අකමැතියි. ඒ නිසා තමන්ගෙ මෑණියන්ට මීට වඩා තැනක් දිය යුතුයි. ඔබ ඒ බවත් සිතට නගා ගනිමින් . නගරාධිපතිතුමනි ඔබතුමාගෙ අවධානය මා යොමුකරනවා නගරෙ රජා නුඹයි. මේ විසිදෙනා ඔබ අභිමානයට ලක්කළා. ඔබ ඒ අභිමානය සුරකෙන පරිදි කටයුතු කළ යුතුයි. ඔබට මම අවධානයට යොමු කරනවා **ලබු ඇට බැඳිගල සෙල්ලිපිය** පිළිබඳව.පුරාතන රජෙක් වෙළඳපොල පවත්වාගෙන ගිහිපු ආකාරය පිළිබඳව **ලබු ඇට බැඳිගල සෙල්ලිපියේ** සඳහන් වෙනවා. ඔබතුමාට මා නිදහසේ කරුණු කියාදෙන්නම්. එයිනුත් ආදර්ශයක් අරගෙන අපේ මේ ධිවර හෙලයෙ ඉන්නෙ නැතිව පිරිස වැඩියෙන් ගැවසෙන වාහනයක් ගාල්කළ හැකි පරිශ්‍රයක් වහාම තැනිය යුතුමයි. ඒ වගේම අපේ නගරයේ නගර සභාව සතු ඉඩම් අයාලයේ අල්ලාගෙන ඇතැමුන්. අනිසි විදියට අල්ලගෙන. සුසාන භූමිය අවට පරිශ්‍රය කාගෙ උවමනාවකටද ඒ ඉඩම් අන්සතු වී ඇත්තේ. අපට අයිති අපේ නගරවැසියන්ගේ උරුමය. එවැනි දෑ අප දැකදැක ඇයි ඇස්කන් පියාගෙන ඉන්නේ. කඩිනමින් එවැනි තැනක් ස්ථාපනය කළ යුතුයි. ප්‍රමාණවත් වාහන පහසුකම් ගාල්කළ හැකි බිමක් මේ ධීවර සොයුරක්ට අවශ්‍යමයි. එය නගර මධ්‍යයට සමීපස්ථ විය යුතුයි. මැස්සන් බල්ලන් පූසන් ගැන කියවුණා. මාළු ඇති තැන මැස්සො මදුරුවො බල්ලො නැත්තේ කොහද සභාපතිතුමනි. ඒවාගේම ෆුඩ්සිටිවල අඩුපාඩු ගැන කියැවුණා. අපේ ආදායම් පරීක්ෂක මහත්වරු හොයල බලලා අපි සතුටු වෙනවා එතුමන්ලා ඒ සම්බන්ධව සෙවීම ගැන. ෆුඩ් සිටි ආයතන කරනුයේ බහු ව්‍යාපාර කරන අයයි. අපි ප්‍රමුඛව බැලිය යුත්තේ ඔවුන් ධිවර සොයුරන් ටොලර් යාත්‍රා ඇති අය නෙවෙයි යාන්තම් යතුරුපැදියෙන් ඒ මේ අත සරමින් මේ සේවාවේ යෙදෙන අයයි. මම මේ අවස්ථාවේ කියනවා මට උදාපත්වෙන අවස්ථාව අනුව මේ ඉදිරි වර්ෂය තුළ සභාපතිතුමනි ඔබතුමන් අනියත සැකයක් ඇතිකරගන්න එපා. මම සම්පූර්ණ වැරවැයම ඔබලාගේ පැනය කෙරෙහි මා යොමු කරනවා. ඒවගේම නගරය වෙනුවෙන් මේ ගෞරවණීය සභාව අවදිවන්න. අපේ අම්බලන්ගොඩ උරුමය ඇත්තේ ධීවරයා සතුවයි. බොදුනුවෙක් විදියට මම පංච අසාධාරණ වෙළඳාමෙන් පළමුවැන්න වන මත්ස්‍ය වෙළඳාම අනුමත කරන්නේ නැති බව සැබෑව. එනමුත් ඔබලා මේ පොළොවේ මිනිසුන් සේ සිටිය යුතුයි. ඔබලාට අපි තැනක් දිය යුතුයි. ඔබලා තමන්ගේ අඩුපාඩුත් හදාගෙන මේ බොදු පුරවරය අභිමානයෙන් ඉහල නංවන්නට සිත්හී රඳාගනිමින් නගර සභාවේ රජතුමන් සමග ඉදිරියට යන්න. ඔබට ඒ සඳහා ඥාණය පහල වේවා.තිසරණම සරණයි

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඒ.පී නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි අපේ සුළු මත්ස්‍ය ව්‍යාපාරිකයින් විසින් ඉදිරිපත් කර ඇති ලිපිය දැන් තමයි ලැබුණේ. එකෙ කියල තියෙනවා අපිට 152 වගන්තිය අනුව ක්‍රියාකරන්න හැකියාව තියෙනව කියලා. වාර්තාවල කිවවා ෆුඩ්සිටි පහම අදාළ සියලු කොන්දේසි සපුරා නැති බව. ඔවුන් සතුව එක් අඩුපාඩුවක් හෝ ඇති බව. සුළු මත්ස්‍ය ව්‍යාපාරිකයින්ට ස්ථානය සකසා දී

තිබෙන්නේ නගර සභාවෙන්. ඔවුන්ට වෙන යන්න තැනකුත් නැහැ. ඒ ගොල්ලො බදු මුදලක් දීලනෙ අරන් තියෙන්නෙ. ඔවුන්ට සාධාරණයක් ඉෂ්ඨවිය යුතුමයි .ඔවුන්ට වෙන යන්න තැනකුත් නැහැ. එමනිසා සභාපතිතුමාට මං කියනවා මේකට මැදිහත්වීමක් අවශ්‍යයි. මේකෙන් දරු පවුල් කීපයක් රැකෙනවා. ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය ඒක. ගුරුවරයෙකුගේ ජීවනෝපාය මාර්ගය ගුරු වෘත්තිය වගේම සුළු මත්ස්‍ය ව්‍යාපාරිකයින්ගේ ජීවන වෘත්තිය මේක. ඔවුන් දෛනික ආදායමක් ලබන්නේ.ඒ නිසා ඒ තැනැත්තන් කෙරෙහි විශේෂ අවධානයක් යොමුකරල මේකට පිළියමක් දෙන්න. ඒ වගේම 152 වගන්තිය අනුව හෝ කටයුතු කරල හෝ එම තැනැත්තන්ට සහනයක් ලබාදෙන්න කියල කියනවා. එතන අඩුපාඩු තියෙනවනම් ඒව නගර සභාව මැදිහත්වෙල සකස් කරදීල මේ තැනැත්තන්ට සහනයක් ලබාදෙන්න කියල ඉල්ලනවා. වහාම ඉතා ඉක්මනින් මේ සම්බන්ධයෙන් පියවරක් ගන්න. මොවුන් දෛනික ආදායමක් ලබන්නේ. දෛනිකව ආදායමක් නැතිවුණොත් ඒ පවුල රැකෙන්න බැහැ. ෆුඩ්සිටි වගේ මහාපරිමාණ ව්‍යාපරාකයො නෙමෙයි මොවුන්. ඒ නිසා සභාපතිතුමා ඉක්මනින් තීරණයක් ගන්න කියලා මම ඉල්ලනවා.අපි සහයෝගය ලබාදෙනවා කියල මම නිහඬ වෙනවා.බොහොම ස්තූතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ප්‍රමාද වුණත් වචනයක් කතාකරන්න ඕන. මොකද අපි කාන්තාවන් වශයෙන් මේ පවුල් 40 ක ඉල්ලීමක් තියෙන්නෙ. මේ පවුල් 40 දරු මුණුබුරන් ගත්තම ලොකුප්‍රමාණයක්. අපි අම්බලන්ගොඩ නගරයේ පුරවැසියන් පෝෂණය කිරීම සහ ඔවුන්ගේ අනාගතය දීප්තිමත් කිරීමට අපි මන්ත්‍රීවරුන් විදියට හැමදාම තීරණ ගන්නෙ. මේ ඉල්ලීම සාධාරණ ඉල්ලීමක්. මොවුන්ට වෙන ආදායම් මාර්ග නැහැ. ළමා ළපටි ජීවත් කරවන්නෙ මේ ව්‍යාපාරයෙන්.ළමා ළපටි පෝෂණය කරන්නේ මේ සුළු මසුන් ව්‍යාපාරයෙන්.ඒ නිසා මේක වැදගත්. බහුතරයකගෙ ඉල්ලීමක්. අම්බලන්ගොඩ වෙසෙන බහුතරයකගෙ ඉල්ලීමක්. අපි බලාපොරොත්තු වෙන්නේ බහුතරයකගෙ ඉල්ලීම ඉෂ්ඨ කරන්න. ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා මේ පිළිබඳව සොයාබලා ඉතාමත්ම සාධාරණ තීරණයක් ගන්න.ව්‍යාපාරය කරගෙන යන්න අවස්ථාව දුන්නා වගේම සභාවට අයවිය යුතු බදු ගෙව්වා කියල ලිපියෙ තියෙනවා. ඒවා ගෙවන්න ඇති කියල මං විශ්වාස කරනවා. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මෙතුමන්ලාට වැඩිම සහනයක් ලබාදෙන්න කියල කියනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි මන්ත්‍රීතුමිය පාරෙ වෙළඳාම් කරන අයගෙන් කවදාවත් සල්ලි අරගෙන නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මේ ලිපිය අනුව එහෙම තියෙනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලියුමෙ තිබ්බට එහෙම නැහැ.තේරුම් ගන්න.කඩවලවලින් විතරයි අපි බදු ගන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මෙහෙමයි ඔබතුමා කිව්වා වගේ අපිත් සුපර් මාර්කට් එකට යන්නෙ නැහැ අපිත් මාළු ලැල්ලට ගිහින් තමයි ගෙදර යනකොට මාළු ගන්නේ. මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා ඉතාමත් සාධාරණ විදියට මේ පවුල් ජීවත් කරවන්න ක්‍රම උපායක් හදන්න. තීරණයක් ගන්න කියලා. දරු පවුල් බර ගාණක් ජීවත් කරවන ස්ථානයක්. කඩහිමියන් ලාභ ලබාගෙන උපයාගන්නා ආදායම වගේ නෙවෙයි. දෛනික ආදායමක් ලබා පවුල ජීවත් කරන අයට සහනයක් ලබාදීම තමයි අපේ යුතුකම. ඒ නිසා කාන්තාවන් විදියට පවුල්වල තියෙන ගැටලු මා හොඳට දන්නවා. මොවුන්ට සාධාරණයක් ඉෂ්ඨ කරන්න කියල මම ඉල්ලනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මාත් මේ රැකියාව කරන නිසා මට අදහසක් දක්වන්න පුලුවන්.මට දැන් අවරුදු 57 යි. අවුරුදු 40 ක විතර ඉතිහාසයක් මේ වෙළඳාම ගැන මට කියන්න පුලුවන්. දැනට අවුරුදු 15 ක් 17 කට විතර කලින් මේ කියපු ස්ථානයේ මාළු වෙළඳාම කළා. මොවුන් ලැලි අරන් පාරට ආවා වෙළදාම නැති නිසා සහ සුපර් මාර්කට් දාපු නිසා. එක් සුපර් මාර්කට් එකක් මාගේ සහෝදරයෙකුගෙ. සහෝදරකමට නෙමෙයි මං කතාකරන්නේ සාධාරණයක් ඉෂ්ඨවෙන්න ඕන නිසා. පාරිභොගිකයොත් මාර්කට් එක පල්ලෙහාට යන්න ගියේ නැහැ සුපර් මාර්කට් තුළට ඇදුණා. ඔබතුමාගේ සංකල්පයක් අනුව ඔවුන් නැවත එම ස්ථානයට ගියා. මොවුන් ණයවෙලා තියෙන්නෙ . මං හිතන්නෙ පවුල් ජීවිත 300 ක් විතර ජීවත් වෙනවා ලැලිවල. ෆුඩ්සිටිවල මාළු විකිණීම නවත්වන්න. සභාපතිතුමනි මේ අයගෙන් සභාවට සල්ලි හම්බවෙන්නෙ නැහැ කියන්න බැහැ. පාරෙ මාළු විකුණපු අයගෙ තමයි කාමර. ඔවුන් කාමරවලට සල්ලි ගෙවල තමයි පාරෙ මාළු වික්කේ. මං ඔබතුමන්ට කියන්නෙ දුප්පත් මිනිස්සන්ගෙ ප්‍රශ්නවලට මුහුණ තමයි අපි ඉන්නේ. සල්ලි තියෙන මිනිස්සු ගැන අපි කතාකරන්න ඕන නැහැ. මා නිතරම ඉන්නේ නැති බැරි මිනිහා සමඟ . අපි ඉල්ලන්නෙ ඔබතුමා ඇතුලු සභාවේ සියලු දෙනා එකතුවෙලා ෆුඩ්සිටිවල මාළු විකිණීම නවත්තන්න ක්‍රියාමාර්ගයක් ගන්නවානම් මාත් ඉන්නෙ ඒ තීරණේ එකහෙලා ඉන්නවා කියමින් එයට උදවු කරන ලෙස ඉල්ලා සිටිමින් මම නිහඩ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපේ මන්ත්‍රිතුමා යෝජනා කළා ෆුඩ්සිටිවල මාළු නවත්තන්න පුලුවන්වනම් හොඳයි කියලා. අපිත් ඇත්තටම ඒ අදහසට එකඟ වෙනවා. මෙතුමන්ලාට ධීවර ජනාතාව දුප්පත් අය. දුප්පත් අයට සහනයක් සැලසීම තමයි ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙත් අදහස. අපෙත් අදහස ඒකයි. ගරු නගරාධිපතිතුමනි මං ඔබතුමාට අදහසක් වශයෙන් හා යෝජනාවක් වශයෙන් කියනවා. පුංචි පොළ පරණ මාකට් එකට තාවකාලිකව හරි පිළිසකර කරල ගෙනියනවනම් හොඳයි. මෙතුමන්ලාට වෙළඳාම නැති වෙන්නේ එම ස්ථානයට සෙනඟ නොයාම නිසයි. පුංචි පොළට යන සෙනඟෙන් වෙළඳාමක් ලැබෙනව මාළු ව්‍යාපාරිකයින්ට. එම කටයුත්ත කරන්න පුළුවන්නම් හොඳයි කියලා මං යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , ගොඩක් අදහස් පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කළා. සුළු මත්ස්‍ය ව්‍යාපාරය ගැන ලේකම්තුමා ලිපියක් ඉදිරිපත් කරන තිබෙනවා. සත්‍ය වශයෙන්ම අපි දුප්පත්කම හඳනන මිනිසුන් වශයෙන් සුබෝප්ගී ජීවිත ගතකරන මිනිසුන් ගැන කතාකරනවට වඩා අපි දුප්පතකම අගයන ධිවර ජනතාව ගැන කතාකළ යුතුයි. දැන් මේ වගන්තිවල කතා කරපු දේවල් ඉඩ්සිටිවල අයත් ව්‍යවස්ථාවේ නීති කඩකරල තියෙනවා. මං කියන්නෙ අතුරු ව්‍යවස්ථාව අයින් කරල ඒ මිනිසුනට අසාධාරණයක් කරනවා නෙමෙයි සාධාරණ හේතු මත ඔබතුමාගේ සහ සියලු මන්ත්‍රීවරුන්ගේ විශේෂ අවධානය යොමුකරල මේ ප්‍රජාවට සාධාරණයක් ඉටුකරල දෙන්න කියල මා ඉල්ලා සිටිනවා. ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න. වැඩි විස්තර කතා කරන්නේ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මීටර් 500 කතාව පනතේ තිබුණ නේද . ඒක සංශෝධනය වෙලා තියෙන්නේ කවදාද?

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔබතුමා උප සභාපතිතුමා වෙලා හිටපු කාලේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

නෑ නෑ . ඒ කාලෙ වෙන්න බැහැ. එහෙනම් ඒක ආපහු අලුතෙන් අතුරු ව්‍යවස්ථාවට ඇතුලත් කරන්න.

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔබතුමන්ලා සමහරවෙලාවට කතාකරන්නේ අලුතෙන් උපන්න අය විදියටයි. ඔබතුමාලම තමයි කතාකරලා ඉවත් කළේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

හරි හරි. ඉවත් කළා කියමුකො. දැන් මේ ප්‍රශ්න ගැටලු නිසා ආපහු නැවත ඇතුළත් කරමු. එතකොට හරිනෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**

සභාපතිතුමනි , මමත් අවුරුදු 25 ක් විතර අම්බලන්ගොඩ පොදු වෙළඳපොළේ ව්‍යාපාර කළා. ඔය පුංචි පොළ දැමීම නිසා තමයි ඔය හෙණේ ගැහුවේ. සතියට ලේලන්ඩ් බඩු ලොරි 07 ක් විතර වික්කා මාර්කට් එකේ. ඔය ඔක්කොම සෙනග මාකට් එකට ආවා. එතකොට ඔය ලෑලි පල්ලෙහා තිබුණේ. අද මං හිතන්නෙ ලොරියක්වත් විකුණන්නෙ නැහැ. අම්බලන්ගොඩ නගරෙ අපි කරන කාලෙ හොඳට වෙළඳාම් තිබුණා. ඔය සමූපකාරෙ පොළ දැමීම නිසා තමයි සම්පූර්ණ වෙළඳාම නැති වුණේ. ඊටපස්සෙ තමයි ඉඩ්සිටි වැටුණේ. අනිත් එක තමයි සභාපතිතුමනි ඉඩ්සිටිවල පාකින් එකක් තිබුණා. ඉඩ්සිටිවල වෙළඳාම ගිහිල්ල තියෙන්නෙ පාකින් නිසා. එළවලු මාකට් එකට පාකින් එකක් නැහැ. එගොල්ලන්ට සාධාරණයක් කරන්න පාකින් එකක් හරි හදල දීල .පොළ අරන් යන්න මාකට් එකට. ඒ කාලෙ සතියකට

කිලෝ 70 000 ක් විතර වික්කා. අද කණගාටු වෙනවා අපි හිටිය තැන නේද කියල. කොළඹින් හරි කොහොන් හරි පැමිණියොත් එහෙම නගර සභාවට තමයි මේවා වෙන්නේ. ඒ නිසා සභාපතිතුමනි මේ සම්බන්ධව බලල මේ මිනිස්සුන්ට සාධාරණයක් කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඩබ්.එම්. නිලානි මෙනවිය  කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම ධීවර වැසියන්ගේ ඉල්ලීම ගැන නගර වැසියන්ගේ ඡන්දෙන් පත්වෙච්ච අපි ඒ ගැන අවධානය යොමුකිරීම තමයි අපේ යුතුකම. ඔබ දන්නවා ෆුඩ්සිටි දැමීමෙන් පස්සෙ මේ ප්‍රශ්නෙ ඇතිවුණේ. ඔබතුමා මම හිතන විදියට මුලසිටම මේ ෆුඩ්සිටි දැමීමට විරුද්ධ වුණා. ඔබතුමා විශේෂයෙන් ඒ ගැන අවධානය යොමු කරන්න. අපේ ධිවර ජනතාවට කියනවා වගේම අපේ සාමාන්‍ය වෙළඳන්ගෙනුත් අප ඉල්ලා සිටිය යුතුයි අම්බලන්ගොඩ පුරවැසියන්ගේ සෞඛ්‍ය තත්ත්වය ගැනත් හිතන්න ඕන. ඒ වගේම එතුමන්ලා අධික ලාභයක් ගත්තාට ඒක සාධාරණ විය යුතුයි. පොදු ජනතාවට සහනයක් දෙනව වගේම ඒ අයගෙනුත් අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන් සහයෝගයක් බලාපොරොත්තු වෙනවා. සුළු මාළු විකුණන ධිවරයන් අතරේ ජනතාව අතර චෝදනාවක් තියෙනවා පහසුකම් නැති නිසාද අධික තණ්හාව හින්දාද, අධික ලාභ ලැබීමේ චේතනාවෙන්ද කොහෙද සෞඛ්‍යයට අහිතකර මාළු වෙළඳාම කරන බවට. ඒ නිසා මිනිසුන් පුරුදුවෙලා තියෙනවා ෆුඩ්සිටිවලට යන්න. මං මේ සහෝදරවරුන්ගෙන් සහෝදරත්වයෙන් ඉල්ලනවා ඒ අඩුපාඩු හදාගන්න ඕන.අපි සභාපතිතුමා සහ සියලු නාගරික මන්ත්‍රීවරුන් ලොකු අවධානයක් අරගෙන ගන්න තීරණේට ඔබ සියලු දෙනා සහයෝගය දෙන්න ඕන. අතිගරු ජනාධිපතිතුමා කිව්වා ගරු අමාත්‍යවරුන්ට කම්කරු පත්වීම් සාමාන්‍ය ජනතාවට දෙන්න කියලා. මා හිතන්නේ පොදුජන එක්සත් පෙරමුණත් වැඩිම බලයක් දි තිබෙන්නේ ඒ සාමාන්‍ය ජනතාවගෙන් . ඒ නිසා ඔබතුමාත් සාමාන්‍ය ජනතාවගේ හදවත ගැන හැඟීම් ගැන දන්න කෙනෙක් විදියට අපි ඒ සාමාන්‍ය ජනතාවගෙ පැත්තෙ ඉඳන් තීරණ ගන්න. එමනිසා ඒ සඳහා ඔබතුමාට ශක්තිය ධෛර්යය දෙන්න අපි කටයුතු කරනවා. එතුමලාටත් යම්කිසි නියෝග ටිකක් දාලා කටයුතු කරන්න ඕන. ෆුඩ්සිටි කරන ධනවතුන්ට නොයෙකුත් ආදායම් මාර්ග තියෙනවා. ඒ අයට ටෝලර් යාත්‍රා හය හත තියෙන අය තමයි සමහර අය. මේ අය අතරත් ප්‍රශ්න තියෙන අය ඇති . නමුත් මේ තීරණේ ගන්න අපේ මන්ත්‍රී කණ්ඩායම පූර්ණ සහයෝගය ලබාදෙනවා. මේ සඳහා සියලුම දෙනා එකගතාවය එලකරන ලෙස ඉල්ලා මා නිහඬ වෙනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතිතුමනි, මේ ධීවරයින් විසින් එවන ලද ලිපිය බැලුවම මට පේනවා ලේකම් විදියට අත්සන් කරල තියෙන්නේ ආර්. පී. අශෝක කියල කෙනෙක්. මං දන්න විදියට එයාටත් සුපර් මාර්කට් එකක් තියෙනවා. විශේෂයෙන් කියන්න ඕන මේ සභාව ධනවත් පුද්ගලයො සමග සම්බන්ධකම් පවත්වල නැහැ.ඒ අයගෙ සහයෝගයට අපි ගිහිල්ලත් නැහැ. නගරෙ අවලස්සන පිළිබඳව දීර්ඝව කතා වුණා. අපි මෙය කතා වුණේ ඊයේ පෙරේදා වුණාට දිගින් දිගටම මේ සම්බන්ධව කතා වුණා. එම ව්‍යාපාරිකයෝ එම ස්ථානයට ගියේ නැහැ. අපේ ගරු නගර සභා මන්ත්‍රීතුමා සෝහිත මහතාට යෝජනාවක් ගෙනාවා. මාළු ලැලි කඩනවනම් ඒ ව්‍යාපාරිකයන් පල්ලෙහාට අරගෙන යන්නම් කියලා. ගරු සභාපතිතුමා විරුද්ධව සිටියා . ඒත් ඔවුන් ගියේ නැහැ. සභාපතිතුමා මාළු ලැලි කඩනවට විරුද්ධ වුණාට අපිත් කිව්ව නිසා කැඩුවා.නමුත් අද මාළු ලැලි අයින් කළාට ප්‍රශ්නය විසඳිලා නැහැ. මාළු ලැලිවල වතුර යන්නෙ

කාණුවට.අදත් පැමිණිලි කළා මට මේ ඇයිද කියලා. අනෙක් ව්‍යාපාරිකයින්ට කරදරයි. මං ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ ඔබතුමා මේ සුපර් මාර්කට් වල තිබෙන මාළු අද මෙතුමන්ලා දෙන ලද ලිපිය අනුව තමයි ආදායම් පරික්ෂක මහත්වරු හරහා වාර්තාව ගත්තේ.එක්කෝ මේ වැරදි කරන මිනිස්සු නිවැරදි කරන්න.නැතිනම් මේවා අයින් කළ යුතුයි. නැත්නම් නිවැරදි කරන්න යම්කිසි කාලයක් දෙන්න.නැත්නම් සීල් තියල අයින් කරන්න.මේවා දිගින් දිගටම ගියොත් මේ නගරයේ මෙතුමන්ලා කියනවා මෙතුමන්ලාට අසාධාරණයක් වුණා කියා. 93 කියන තර්කයේ තමයි එතුමන්ලා සිටින්නේ. මොකද හේතුව මාළු ලැලි ටික පහළට ගෙනගිය එක. හැබැයි මා දකිනවා මාළු ව්‍යාපාරිකයන් දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් මෙය පහළ සිටිනවා . මේ පුංචි පොළ මාර්කට් එකට ගෙනියන්න. මේක නගරෙට බරක්. ඔතනින් අපට ආදායමක් එන්නෙත් නැහැ .කුණු ටික ගෙනියන්න තමයි වෙන්නේ හැමදාම. අර ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතා කිවු පරිදි එතුමාට අත්දැකීම් තිබෙනවා වසර ගණනක අත්දැකීම්. එතුමලා ව්‍යාපාර කටයුතු කර නිසා.අපි පොඩි කාලයේ ඔය ව්‍යාපාරිකයන් සියළු දෙනා සිටියේ ඔතන. මොවුන්ට තියෙන ගැටලුව පාරාභෝගිකයො එන්නේ නැති එක. පාරිභෝගිකයො එන්නේ පුංචි පොළෙන් බඩු අරන් සුපර් මාර්කට් එකෙන් මාළු අරන් යන්න. අපිට පුළුවන්කමක් තියෙනවානම් මේ පුංචිපොළ අම්බලන්ගොඩ පොදු වෙළඳපොලට ගේන්න මේ ප්‍රශ්නෙ විසඳෙනවා. නැත්නම් මේ ගැටලුව කවදාවත් විසඳන්න බැරිවෙනවා.එතකොට මේ අයට කියන්න බැහැ අපිට අසාධාරණයක් වුණා කියලා. මූලික කාරණය මේ පුංචි පොළ. මා දකින එක නම් එයයි.. මං ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ අපිටත් වගකීමක් තියෙනවා පාලකයො වශයෙන් නගරයේ මාළු ව්‍යාපාරිකයො වගේම අනෙක් ව්‍යාපාරිකයොත් ආරක්ෂා කරන්න. ඒ නිසා අපිට ඒ වගකීම පැහැර හරින්න බැහැ. ඒ නිසා මං ඉල්ලන්නේ ගරු සභාපතිතුමනි, පුංචි පොළ මෙම ස්ථානයෙන් ඉවත් කරලා පොදු වෙළඳපොළට ගෙනියන්න එතකොට මේ ප්‍රශ්නෙ විසඳෙනවා. එය කරන ලෙස ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, සුළු වෙළෙඳුන්ගේ ඉල්ලීම ඉතාමත්ම සාධාරණයි. ඔවුන් තිස් ගානක් හතලිස් ගානක් අත්සන් කරල තියෙනවා වෙළෙඳුන් නොවුණත් ඒ වෙලදාමට වක්‍රව හෝ අනියම් ආකාරයට සම්බන්ධ වුණු අය.ඔවුන්ගේ පවුල් රැකෙන්නෙ මේ රැකියාවෙන්.ඔවුන්ගේ ජීවනෝපාය මේක. වසර ගණනාවක් තිස්සේ මේ කාරණාව සිදුවෙමින් පවතිනවා. ඒ අයත් උද්ඝෝෂණය කරනවා.අපිත් මාළු ලැලි පල්ලෙහාට දානවා. දේවි මන්ත්‍රීතුමා එක සැරයක් මේ සභාවෙ පොරොන්දු වුණා එතුමාට කරන්න බැරිවුණා. ගරු නගර සභා මන්ත්‍රී සෝභිත මන්ත්‍රීතුමා පොරොන්දු වෙලා මාළු ලැලි කැඩුවා. ඒකත් අසාර්ථක වුණා. එවට අනුගතවෙන්න බැරිවුණා. අවසානයේ දැන් රටේ විධායකය විසින් දෙන ලද නියෝගවලට අනුව පරිසර කාරණා මත සියලුම ආරක්ෂක අංශවල සහයෝගය ඇතිව සභාව මගින් මෙම තීන්දුව අරගෙන තියෙනවා. සභාපතිතුමනි මන්ත්‍රීවරු කතාකරපු කාරණා සම්බන්ධව හා මෙම ව්‍යාපාරිකයින් ඉදිරිපත් කළ කාරණා සම්බන්ධව සත්‍ය සියල්ල මම දන්නවා. මමත් ඔතන පැය 24ම ඉන්න පුද්ගලයා. හැබැයි මං කතා කරන්න යාමේදී මගේ සහෝදරයෙක්ටද ඝුඩිසිටියක් තියෙන නිසා ඒ පැත්තටටත් මේක බර වෙලා යනවා. . නමුත් විරුද්ධව කතාකරන්න මං කැමති නැහැ. හැබැයි එක දෙයක් තියෙනවා සභාපතිතුමනි , මං උපසභාපති වෙලා හිටපු කාලෙ 2004දි හෝ 2005 පොළ කරගෙන ගියා. කඩාලි 52 ක් පුංචි පොළේ වෙළෙඳුන්ට හදන්න වුණා. බිම් මහලේ

තියෙන කඩවලට අමතරව තොග වෙළෙඳුන්ගේ භූමි පවා දෙන්න වුණා. බොහොම සාර්ථකව පැවතුණා. හොඳට වෙළඳාම් තිබුණා. හැබැයි ගරු සභාපතිතු මනි, මොවුන් කියන එක නෙමෙයි මං කියන්නේ මොවුන්ට පෙර සිටි පුද්ගලයින් වෙන්න පුලුවන් මාළු වෙළඳාම් කරන පුද්ගලයන් මේ අයට වෙළඳාම් කරන්න දුන්නෙ නැහැ. එළවලු වෙළඳාම කරද්දී කරන්දෙණියෙ ගැණු කියල බැනල සට්ටනයක් තිබුණා. ඒ අය ස්වභාවිකවම එන එක නැවැත්තුවා හෙට දිනෙත් තියෙන්නෙ මේ ප්‍රශ්නෙමයි. මටත් කියන්න පුලුවන් මේ ෆුඩ්සිටි නවත්තන්න කියල. එහෙමනම් නීතියක් තිබේ නම් මෙය තහනම් කරන්න. එහෙම නීතියක් අපට නැහැ. මේ දීල තියෙන බලපත්‍ර 2019 දක්වා වලංගුයි. හැබැයි 2020 ට නොදී ඉන්න පුලුවන්. 2020 ට නොදී ඉන්න නම් ඔවුන් මේ නීතිවලට අනුගත වෙලා නොතිබෙන්න ඕන. ඔබතුමාටත් බලයක් නැහැ. එතකොට . අපේ මාළු මුදලාලිලට වගේම ෆුඩ්සිටි කරන අයටත් නීතිය තියෙනවා. ෆුඩ්සිටි කරන අයටත් පරමාධිපත්‍ය බලය තියෙනවා. නීතියේ අයිතිය තියෙනවා. මෙතන අපට ඕන නීති ගන්න බැහැ. නගර සභාව කියන්නෙ නීතිය ක්‍රියාත්මක කරන ආයතනයක්. නීත්‍යානුකූලව තීන්දු ගන්න ඕන. නීත්‍යානුකල තීන්දු ගැනීමේදී එක පැත්තකින් තියල මේ අයගෙ ඉල්ලීම ගැන සලකා බලන්න ඕන. මේ අය කියන්නේ වෙළඳාමක් නැහැ කියලා. ඒ අයට ජීවත් වෙන්න ඕන ප්‍රමාණයට වෙළඳාම නැහැ. අන්තිම සාධාරණයි. ඒ අයට ජිවත් වෙන්න අවශ්‍ය ප්‍රමාණයට වෙළඳාම නැහැ. එහි බරපතලම ගැටළුව වෙලා තිබෙන්නේ ඔතන මාළු මුදලාලිලත් ඉන්නවා. අහිංසක ධීවරයෝත් ඉන්නවා. කලවමේ හැමෝම මෙතන ඉන්නවා. මේ කවලමේ මේ හැමෝගෙම ඉල්ලීම තමයි මේ.කෙසේවෙතත් ගමේ ජීවනාලිය ධීවරයො. මේ අසරණ මිනිස්සු පිළිබඳව නගර සභාවක් විදියට යම් උදවුවක් කරන්න පුළුවන් නම් කරන්න ඕන. මේකට විසඳුමක් ලෙස පොළ ගෙනියන්න ඕන ඒක අත්‍යාවශ්‍ය දෙයක්. මාකට් එකේ පොළ නැතිව මේ වෙළඳාම හරියන්නේ නැහැ.මෙතුමන්ලා කිව්වා වගේ ගමේ දේවල් කන්න මිනිස්සු කැමතියි . ගමේ පළා ටික එළවළු ටික කරපිංචා ටික දෙහි ගෙඩිය ගන්නෙ පොළෙන්. අද වෙනකොට එළවළු වෙළඳපොළක් අම්බලන්ගොඩ නැහැ. මේ වෙළෙන්දොන්ගේ ඉල්ලීම පිළිබඳව සලකා බැලුවොත් අපිට තියෙන එකම විසඳුමක් තමයි පොළ ගේන එක. යම් යම් කොන්දේසි යටතේ මෙතැනට ගෙන එම. මේ අයට ඒ සහනය ලබා දෙන්න. අපට කරන්න පුළුවන් උදවු එක තමයි . එකෙත් අපට බාධා තියෙනවා .පරණ ගොඩනැගිල්ලට පොළ ගන්නෙ කොහොමද? ඒ වගේ කාරණා තියෙනවා. නමුත් සමුපකාරෙන් පොළ ගැනිමේ කිසිම බාධාවක් අපට නැහැ. ඒක අපේ අයිතිය. එම නිසා මා ඉල්ලා සිටින්නේ මේ අය වෙනුවෙන් සහනයක් සලසන්න තිබෙන එකම ක්‍රමවේදය මේක. ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා ෆුඩ්සිටිවල මාළු විකිණීම නවත්තන්න කියලා. ඒකත් නීත්‍යානුකූලව කරන්න පුළුවන්නම් මේ සභාවට බලයක් තියෙනවානම් කරන්න කියන ඉල්ලීම මම වෙළෙඳුන් වෙනුවෙන් කරනවා. ප්‍රායෝගිකව අපි සලකා බැලුවොත් සභාපතිතුමනි ඉතිරිවෙලා තියෙන කියන එකම විසඳුම තමයි මන්ත්‍රීවරු වැඩි පිරිසක් කරපු ඉල්ලීම පොළ පවත්වාගෙන යන භූමියය මාර්කට් එකට ගෙනියන එක. එතන ආරක්ෂිත තත්ත්වය ඇතිකරලා වෙළඳාම් කරන්න පුලුවන් තත්ත්වයට පොළ නැවත ප්‍රතිෂ්ඨාපනය කළොත් වසා ඇති සියළු මාළු ලැලිත් අරෙනවා . ඒකත් දැඩි කොන්දේසි යටතේ ඕන කරන්න නැතිනම් ඉස්සෙල්ලා වගේ මසෙන් දෙකෙන් අපට ගිලිහී යන්න පුලුවන් වෙළඳාම නැතිවුණොත්.

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සම්බන්ධයෙන් මෙම ලිපිය අනුව සභාව මගින් අවශ්‍ය පියවර අරන් තියෙනකවා සුපර් මාර්කට් සම්බන්ධයෙන් . එම පියවර අපි ඉදිරියට ගෙන ගිහින් නීතියට අනුගත නොවන ඕනෑම වෙළඳසැලක් අපි අධිකරණයට ඉදිරිපත් කරලා ඒ වෙළඳසැල සීල් කිරීමේ කටයුතු කරනවා. පොළ සම්බන්ධයෙන් යෝජනා කරපු එක ඇත්තටම ඇතිකළේ අපි තමයි. මේ පොළ ඇති කළේ පාරේ ඉන්න සියලු දෙනා එකතු කරලා පොළට දැම්මා. මාකට් එකේ අය ගියේ පස්සෙ තමයි. ස්ටේෂන් රෝඩ් එකේ දාල තිබුණා හිටපු ජී.එම්.එස් ද සිල්වා මහතා. අපි ඒ අය එකතු කරලා සමූපකාර පොළට දැම්මා. පාරෙ තිබෙන සියළුම අවහිරතා ඉවත් කළා. අපි පොළ ඔතනින් අයින් කළොත් පාර තිබුණ තත්ත්වෙටම එනවා. පාරෙ වෙළදාම කියන එකට අත් උදව් දීම සභාව නොකළ යුතු දෙයක්. පොළ ඔය ස්ථානයට ගෙන යන්න මං දෙපාරක් උත්සාහ ගත්තා. හිටපු ජී.එම්.එස් ද සිල්වා මහතා එකපාරක් උත්සාහ ගත්තා. ඒ දෙපාරම මේ මාර්කට් එකේ ඉන්න ඒ මිනිස්සු ඔය මිනිස්සුන්ට ඉන්න දෙන්නෙ නැතුව නැවත පාරට එවපු එක තමයි කළේ. ඒ නිසා මේ වෙළදාම කියන එක සහයෝගීත්වයෙන් කරන්න ඕන දෙයක් මිසක ගහ මරාගෙන කරන දෙයක් නෙමෙයි.ගහමරාගැනීමෙන් සිදුවෙලා තියෙන්නේ තමන්ට හානියක් සිදුවීම පමණයි. ෆුඩ්සිටි සඳහා තියෙන නීතියම තමයි පාරෙ වෙළෙඳුන්ටත් තියෙන්නේ මේ නගර සභාව තුළ. ඒ නිසා තමන් කල්පනා කරලා බලන්න මං මේ වැරදිවලින් කීයක් කරනවද කියලා. සීල් කරනවනම් මුළු අම්බලන්ගොඩම සීල් කරන්න වෙනවා.එම වරද පොදු මාළු වෙළඳ සැලේ වෙළඳුන් කරනවා. හොඳම දේ තමයි මාළු ලැලිවල අය ෆුඩ් සිටි මට්ටමට දියුණු කිරීමට යම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන එක. යම් විදියකින් ඒ අය ෆුඩ් සිටි මට්ටමට දියුණු කරන්න අවශ්‍ය උපකරණ අරන් දෙන්න සභාවට ශක්තියක් තියෙනවා.ඒ සඳහා යන මුදල සභාවට යටත්වෙලා ගෙවීමේ ක්‍රමයට ඔවුන් ගෙවන්න ඕන. අපට ඒ වගේ ක්‍රමවේදයක් ඇති කරන්න පුළුවන්. ආදායම් පරික්ෂක මහත්තයා ෆුඩ්සිටි සම්බන්ධව අවසාන නිවේදන යවන්න. ඒ කාලය ඇතුළත කළේ නැත්නම් එම ස්ථාන සීල් කරල දාන්න.ප්‍රශ්නයක්නැහැ. නීතිය හරියට ක්‍රියාත්මක කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. සෝභිත රංජිත් මහතා කතා කරමින්**

සභාපතිතුමා මේ සම්බන්ධව අපි මේ ව්‍යාපාරිකයින්ට ලබන සභාවේ උත්තරයක් දෙන්න. ඔවුන් බලන් ඉන්නවා.

**ගරු සභාපති ඇම් ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කොහොමටවත් කාටවත් ආයෙත් පාරට නම් එන්න දෙන්නේ නහැ. මේ හේතුව මත. මේකට උත්තරයක් දෙන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

සභාපතිතුමා පොළ ගෙනියනවනම් ඇහේ මට්ටමට වගේ උස්සන්න ඕන. එහෙම හදන්න ඕන.

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පොළ ගෙනියන්න සභාපතිවරු තුන්පාරක් උත්සාහ අරන් තියෙනවා. ඔබතුමාගෙන් ඒ කාලෙ ඇහුවම ඔබතුමා සභාපති කාලෙ විරුද්ධ වුණා. පොළෙන් අපට ලොකු ආදායමක් තියෙනවා අනේ වහන්න එපා කිව්වා. ඒක මතක තියාගන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඔබතුමා පොළට යන්න ගිහිල්ල ලියක් වදින්න ගිහිල්ල ඒ කාලෙ අපි තීන්දුවක් ගත්ත පොළ ඉවත් කරන්න. නමුත් ඒ කාලෙ ඉවත් වුණේ නැහැ. ප්‍රශ්න ගැටලු නෙමේ. අපි මෙතුමාලට විසඳුමක් දෙන්න ඕන. එතුමාලගෙ ඉල්ලීම සාධාරණයි.

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මන්ත්‍රීතුමා මම එකඟයි. එතුමන්ලාත් අසතුටු වෙන්නැතුව ඔයගොල්ලොත් අසතුටු වෙන්නැතුව දෙගොල්ල සමාදානෙන් බිස්නස් එක කරන්න ඕන.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඒක හරි සභාපතිතුමා. වෙළඳාම වැඩි කර ගන්න ඕන.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**

සභාපතිතුමනි, එහෙමනම් අර දොරවල් එහෙම හදන්න

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඇත්තටම කියන්න ඕන. සමස්තම මාර්කට් එකම කඩල හදන්න තමයි අපේ බලාපොරොත්තුව. අලුත්වැඩියා කරන්න බැලුවා අලුත්වැඩියා කරන මට්ටමේ නැහැ. ඒක කඩාගෙන වැටෙනවා. අපි මීට වඩා හොඳ මාර්කට් එකක් හදනවා.පහළට එන්න නෙමේ උඩ තට්ටුවෙ ඉඳලා සියලු වැඩ කරන්න පුලුවන් විදියට හදනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මාර්කට් එකේ බිස්නස් කරන අය ඉන්නවද?

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සම්පූර්ණයෙන් කඩනවානම් අපි මොවුන් අයින් කරන්න ඕන නැහැ. අපි මේක කඩලා අලුතින් හදමු.අපිට දැන් ඉස්සරහට මිලියන 55 ක ණයක් එනවනේ.ඒකෙන් අපි මෙය හදනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මං කියන්නෙ සභාපතිතුමා ව්‍යාපාරිකයො එක්කෙනයි නම් ඉන්නෙ ඔහුට වෙන ස්ථානයක් දීලා මෙය කඩා ඉවත් කර එතනට පුංචිපොළ ගෙනියන්න. ඒ බිමට ගෙනිච්චානම් එකත් හරි. මෙය කඩන් වැටෙනවා කියා ඉන්නවාට වඩා එක හොඳයි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මාර්කට් එක කඩනවානම් සාර්ථකව හදනවානම් ඉස්සරහා තියෙන බිල්ඩින් එක කඩන්න ඕන.වෙනදා ඔගොල්ලන් තොරණ ගහපු තැන ගොඩනැගිල්ලක් ඉදිකරපු නිසා තමයි මෙහි වටිනාකම නැති වුණේ.එම නිසා එය අයින් කර හදන්න ඕන. සැලසුම් කරලා මෙය අලුතින් හදන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී  රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා එතකොට මේ සම්බන්ධව තීරණේ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි යුඩ්සිටි සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කරනවා. ඒකෙ වෙනසක් නැහැ.

තීරණය

පොදු වෙළඳපොලෙහි සුළු මසුන් ව්‍යාපාරකයන්ට බලපෑ ප්‍රශ්නය සම්බන්ධව නිත්‍යානුකූලව කටයුතු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.02 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගබඩා භාණ්ඩ, ඉන්වෙන්ට්‍රි භාණ්ඩ,පුස්තකාල පොත් සමීක්ෂණය සඳහා නිලධාරීන් පත්කිරීම සම්බන්ධව ගොනුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ප්‍රධන ගබඩාවට පත්කරල තියෙනවා. සභාපති කේ.එම්.එම්.සංජීවනී මිය.සාමාජික ප්‍රභාවී නානායක්කාර මිය, රජිතා ක්‍රිෂාන්ති මිය ,සඳුන් ගුණවර්ධන මයා.මේ සඳහා අධීක්ෂණයට අපි මන්ත්‍රීවරුන් දෙදෙනෙක් පත් කළ යුතුයි . ගරු නගර සභා මන්ත්‍රා රාහුල මහතාට ඔබතුමාට ගබඩා පිළිබඳ හොඳ දැනීමක් තියෙනවා.ඊට අමතරව තව කවුද? ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රි ලාල් මහතා.එහෙනම් ප්‍රධාන ගබඩාව සඳහා රාහුල මන්ත්‍රීතුමා සහ සරත් මන්ත්‍රීතුමා අපි පත්කරනවා.

ඊලඟට ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණය සඳහා  සභාපති රේණුකා නිලන්ති මිය. සාමාජික කේ.පී.දුල්මිනී භාග්‍යා මිය, මධූෂා විතානාච්චි මිය. මේකට මන්ත්‍රීවරුන් දෙදෙනෙක් පත්කරගන්න. චම්පා මන්ත්‍රිතුමිය ඉදිරිපත් වෙන්න. අයිරාංගනී මන්ත්‍රිතුමිය .කොඩිකාර මන්ත්‍රීතුමා එනවාද? එහෙනම් ගරු නගර සභා මන්ත්‍රි ජේෂලා මන්ත්‍රීතුමියයි ගරු නගර සභා මන්ත්‍රි ධම්මික කොඩිකාර මන්ත්‍රීතුමායි පත්කරනවා.ඊලඟට ප්‍රධාන පුස්තකාලය සඳහා ගරු නගර සභා මන්ත්‍රි ධනසේන මහතා සහ තව කවුද එන්නේ. ගරු නගර සභා මන්ත්‍රි නන්දන මහතා පත්කරනවා. ශාඛා පුස්තකාලත් ඒ මන්ත්‍රීවරුන්ම පත් කරන්න.ඊළඟට ප්‍රධාන ගබඩාව රෂිනි නිලූෂිකා, එම්.ඩබ් නිලූෂිණී මිය , එච්.ඒ ජයලත් මහතා පත්කර තිබෙනවා. කවුද මෙයට

පත් කරන්නේ.ප්‍රධාන ගබඩාවට ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත මහතා ඔබතුමා මේ සඳහාත් පත් කරන්නම්. ඒ ගැන දැනුමක් තිබෙන හින්දා.ගරු නගර සභා මන්ත්‍රී ධර්මදාස මහතා. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ නලින් මාදුවගේ මහතා.

තීරණය

2019.12.31 දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණය සඳහා සමීක්ෂණ මණ්ඩලය ලෙස,

01. ප්‍රධාන ගබඩාව සභාපති කේ.එම්.එම්.සංජීවනී මිය.
සාමාජික ප්‍රභාවී නානායක්කාර මිය, රජිතා ක්‍රිෂාන්ති මිය ,සඳුන් ගුණවර්ධන මයා, සහාය සඳහා කේ.ටි.රෂිනි මිය , එම් .එම්. නිරෝෂානි මිය , ඒ.ජයලත් මයා

02. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ - සභාපති - රේණුකා නිලන්ති මිය
සාමාජික - කේ.පී. දුල්මිනි භාග්‍යා මිය , මධූෂා විතානාච්චි මිය සහාය සඳහා නලින් මාදුවගේ මයා

03. ප්‍රධාන පුස්තකාලය - සභාපති - ලසන්ති රුවනිකා මිය සාමාජික ෂෙහාරා මධුවන්ති මිය , සහාය සඳහා කේ.එම්. මානෙල් රංජනි මෙනවිය

04. ශාඛා පුස්තකාලය - සභාපති - අජන්තා සිරිමලි මිය , සාමාජික නිශාමලි වේවැල්වල මිය

ඉහත සඳහන් නිලධාරින් නම්කිරිම සම්බන්ධව අනුමැතිය ලබා දීම සුදුසු බවත් භාණ්ඩ සමීක්ෂණය වෙනුවෙන් අතිකාල පැය 120ක් අනෙකුත් සමීක්ෂණ සඳහා පැය 100 බැගින් ද තාක්ෂණ සේවා නිලධාරි මහතා සඳහා දින 04ක් සඳහා දින වැටුප්ද ගෙවීම සඳහා අනුමැතිය ඉල්ලීම සම්බන්ධයෙන්ද අනුමැතිය ලබා දීම සුදුසු බවටත් , පහත නම්කරනන ලද මන්ත්‍රිවරුන්ගේ අධික්ෂණය යටතේ සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

ප්‍රධාන ගබඩාව සඳහා - එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මන්ත්‍රිතුමා සහ ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මන්ත්‍රිතුමා

ඉන්වෙන්ට්‍රි භාණ්ඩ - ධම්මික කොඩිකාර මන්ත්‍රිතුමා සහ ජී.ජී. ආර් . පේෂලා කුමාරි මන්ත්‍රිතුමා

පුස්තකාල පොත් සමීක්ෂණය සඳහා - ධනසේන මාදුවගේ මන්ත්‍රිතුමා සහ නන්දන රාජපක්ෂ මන්ත්‍රිතුමා

**12.03 2019 ඔක්තෝම්බර් මස ක්‍රිඩා කමිටු විශේෂ තිරණ සභාගත කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය පසු සභාවකට ඉදිරිපත් කරන්න.

**තීරණය**

2019 ඔක්තෝම්බර් මස ක්‍රිඩා කමිටු විශේෂ තිරණ සම්බන්ධ ලිපිය පසුව සභාවකට ඉදිරිපත් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.04 කසළ කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා පූර්ණ කාලීනව කසළ අංගනයේ සේවය කිරීම සඳහා සේවකයින් බඳවා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කසළ කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා පූර්ණ කාලීනව කසළ අංගනයේ සේවය කිරීම සඳහා සේවකයින් බඳවා ගැනීම.අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ දිනකට කසළ ටොන් 17ක් 20ක් ප්‍රමාණයක් එකතු වන අතර හල්වතුර කසළ අංගණය තුළට D4 යන්ත්‍රයෙන් දමා තුනිකර පස් දමා වසයි.මේ සඳහා පහත ආයතනයට පහත පරිදි වියදම් දරා ඇත.2019.03.01 වවුචර් අංක 293 යටතේ කසළ තුනිකිරිම සඳහා රු.497000/= වශයෙන් වාර තුනකදි රු.1651400/= ක් වියදම් කර තිබෙනවා. මේ වසරේ කසළ වර්ගිකරණය සුළු වශයෙන් ක්‍රියාත්මක කර අතර 2019 ආදායම රු.45596/= ක ආදායමක් ලබා තිබෙනවා.කවුද මේ සෞඛ්‍ය කරන කෙනා සිටිනවාද ? මේ පස්වෙනි මාසයෙන් පසු ආදායමක් ලැබිලාම නැහැනේ. 2018.08.17 විගණන විමසුමට ලැබි ඇත. එම කාලයේ අනුව කසළ කළමනාකරණය දූර්වල මට්ටමේ ඇති අතර දිර්ඝ කාලින සැලසුමක් දක්වා නැත.ඒ අනුව 2017.04.20 දිනැති 1553 ගැසට් නිවේදනයට අනුව කැළිකසළ වෙන්කිරිම, එක්රැස් කිරිම, ප්‍රවාහනය කිරිම, තාවකාලිකව ගබඩා කිරිම , පිළියම් යෙදිම, බැහැර කිරිම , විකිණිම ආදි කටයුතු පළාත් පාලන ආයතන වල අත්‍යවශ්‍ය සේවාවක් බව .පළාත් පාලන ආයතන විසින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වෙනම ඒකකයක් ස්ථාපනය කළ යුතු බවට දන්වා ඇත. ඒ අනුව 2019.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි කසළ දිරන හා නොදිරන පරිදි වර්ගිකරණය කර එකතු කිරිමටත් නොදිරන කසළ පොලිතින්, ප්ලාස්ටික් , විදුරු, කාඩ්බෝඩ් ලෙස අලෙවි කිරිමටත් දිරන කසළ කොම්පෝස්ට් පොහොර බවට අලෙවි කිරිමටත් තීරණය කර ඇත. ඒ සඳහා කසළ අංගණයේ පූර්ණ කාලින සේවකයන් 4කු යෙදවුවහොත් එම සේවා අපේක්ෂිත වැටුප් හා වියදම් පහත පරිදි වේ. එක් සේවකයෙකු සඳහා දිනකට රු 1200 බැගින් රු.36000/=කි.වාර්ෂික වැටුප රු.402000/=කි.සේවකයන් 4කු සඳහා රු.1608000/=න්. පූර්ණ කාලින සේවකයන් කසළ අංගණයේ යොදවා සේවයේ යෙදවුවහොත් අපේක්ෂිත ආදායම ප්‍රතිචක්‍රකරණ වර්ගිකරණය කිරිම මාසයකට රු.48000/= බැගින් රු.576000/= කි.කොම්පෝස්ට් විකිණිම රු.40000 බැගින් 12 ක් රු.480000/=කි. ඒ අනුව රු.1056000/= ක ආදායමක් ඉපියිය හැක. එමෙන්ම කසළ කළමනාකරණය නොකිරිම පරිසරය අපිරිසිදු විම අති මහත්ය.මුල්‍යමය වශයෙන් මැනිය නොහැකි අතර එහි සඳහන් කළ හැකි අහිතකර විපාක කිහිපයකි. ස්වභාවික පරිසරයේ සුන්දර්තවය නැති විම. ප්‍රජා දූෂිත පරිසරය නිසා ප්‍රජාව මිය යාම,ජෛව විවිධත්වය අනුව සිදුවේ. පොලිතින් ප්ලාස්ටික් දිර්ඝ කාලිනව ජලයේ තැන්පත් වි

සාගර ජලයේ තැන්පත් සාගර ජලය දූෂණය වේ. සාගර ජීවින්ට හානි පමුණුවයි. පොලිතින් ප්ලාස්ටික් වැනි ද්‍රව්‍ය දහනය කිරිමෙන් ඔක්සිජන් වැනි වායු විනාශ වි පිලිකා කාරක වායු අග්‍රහණය කිරිමෙන් පිළිකා , ස්වශන , ස්නායු ආදි අබාධ කෙරෙහි මේවා බලපායි.මතුපිට හා භූගත ජලය දූෂණය විම. කාබන් වායුව අපහරණය කිරිමෙන් මිතෙන් වැනි අහිතකර වායු නිපදවයි. ඒ මඟින් ගෝලිය උෂ්ණත්වය ඉහල යයි.බැර ලෝහ ආදිය ජලය එක් වූ විට ස්නායු ආදි ආබාධ හට ගනිමින් විටෙක.අම්හිරි ප්‍රතිඵල වන මරණය පවා අත්වේ.ඉහත කරුණු සැලිකිල්ලට ගනිමින් කසළ අංගණයේ පූර්ණ කාලින සේවකයන් 4කු සේවයේ යෙදවීම වඩාත් සුදුසු වන අතර ඉහත කාර්ය සිදු කිරිම පූර්ණ කාලින සේවක මණ්ඩලය ප්‍රමාණවත් නොවන බවත් නව සේවකයන් 4කු සේවයේ යොදවා ගැනිම සුදුසු බවට යෝජනා කරනවා.පරිසර විෂයභාර නිලධාරි විසින් මේ සඳහා වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී   රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,  අපි ඔය සම්බන්ධව කලිනුත් කතාකළා. කොම්පෝස්ට් පොහොර හදන්න.ඔතන ගොඩනැගිල්ලකුත් හදලනෙ තියෙන්නෙ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සේවකයින් යෙදවීම සම්බන්ධව වාර්තාව මම යෝජනා කරනවා. අනුමත කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී   මන්ත්‍රී   රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

හරි අනුමත කරනවා. ගැටලුවක් නැහැ. මම කියන්නෙ මේක දීර්ඝ කාලීනව එන ප්‍රශ්න .ඉස්සරහට තවත් වැඩිවෙනවා. එම නිසා මේ අවස්ථාවේදි ඔබතුමා සාකච්ඡා කරලා මොනවා හරි තීරණයක් ගන්න. කොම්පෝස්ට් පොහොර හදලා හරි මොනවා හරි ව්‍යාපෘතියක් කරලා. කුලරත්නෙ විද්‍යාලයෙ ළමයින්ට ඉන්න බැහැ පස් දාලා වැහුවෙ නැති වුණොත්.මැස්සො නිසා බත් කන්න බැහැ. විසඳුමක් ගන්න.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

විසඳුමට යමු . එකඟද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී  රාහුල ලලිත වික්‍රම   මහතා කතා කරමින්</u>**

විසඳුමට එකඟයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී  ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මං දන්නෙ නැහැ සහෝදර මන්ත්‍රීවරු කැමති වෙයිද කියලා මන්ත්‍රීවරයෙකුට හම්බවෙනවා කියන ලක්ෂ පනහක්. අපි ඔක්කොමගේ ලක්ෂ 50ටික දමා පනහෙන් හැමෝගෙම සල්ලි දාලා ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රිකරණ ඒකකයක් හැදිය යුතුයි . මැෂින් මුකුත් ඕන නැහැ.එතකොට එය හැදුවාම අපට  කොම්පෝස්ට් විකුණන්නත් පුලුවන්.අම්බලන්ගොඩට අවශ්‍ය දෙයක්.

ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

හරි එකඟයි.

**තීරණය**

කසළ කළමනාකරණ ව්‍යාපෘති සඳහා පූර්ණ කාලිනව කසළ අංගනයේ සේවය කිරීම සඳහා සේවකයින් 04 දෙනෙකු බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.05 2020 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම සභාගත කරන ලදී.**

ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

2020 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම මම යෝජනා කරනවා. ඒ සැලැස්ම අනුව කටයුතු කරන්න අනුමත කරනවා.

**තීරණය**

අභ්‍යාන්තර විගණන නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති 2020 වර්ෂයට ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර ඇති අභ්‍යාන්තර විගණන සැලැස්ම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රි ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.06 පටබැදිමුල්ල ,පොල්වත්ත ආදාහනාගාරවල ගෑස් භාවිතය පිළිබදව සභාගත කරන ලදී.**

ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

පටබැදිමුල්ල ,පොල්වත්ත ආදාහනාගාරවල ගෑස් භාවිතය පිළිබදව පහුගිය සභාවේ නියමාකාරයෙන් නිරාකරණය වෙලා නැහැ . ඒ සම්බන්ධව අභ්‍යාන්තර විගණන නිලධාරි මහත්මිය විසින් නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කර තිබෙනවා.

01. ඉහත අනාවරණය වූ කරුණු අනුව අංක 08 සම්බන්ධව විශේෂ අවධානයක් යොමුකර ඒ සම්බන්ධව එදින සේවයේ නියුතුව සිටි ක්‍රියාකරු වන අයි.ඩී.චමින්ද මයාගෙන් කරුණු විමසීම සුදුසු බවට යෝජනා කරනවා.

02. එයට අමතරව අනෙක් ක්‍රියාකරු දෙදෙනාගෙන්ද ඒ සම්බන්ධව කරුණු විමසීම සුදුසු බව යෝජනා කරනවා.

03. ඉහත අංක 1,2 අනුව කරුණු සොයා බැලීමෙන් පසුව යම් අක්‍රමිකතාවයක් සිදුවී ඇති බව අනාවරණය වුවහොත්, ක්‍රියාකරුට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බව යෝජනා කරනවා.

ඒ අනුව ඒ යෝජනා පරිදි කටයුතු කරන්න අපි තීන්දු කරනවා.

තීරණය

පටබැඳිමුල්ල/ පොල්වත්ත ආදාහනාගාරවල ගෑස් භාවිතය පිළිබඳ වාර්තාවට අනුව අභ්‍යාන්තර විගණන නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති 01,02,03 යන නිර්දේශ හා යෝජනා අනුව කටයුතු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.07 කේ. ඩබ්. ලාල් විමලසිරි බස්නැවතුම්පොල ඉදිරිපිට ඇති අංක 25 කඩකාමරයේ ඉදිරිපස පැති වීදුරු හා ජනෙල් ප්‍රමාණයක් විශාල කරගැනිමට අනුමැතිය ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කේ. ඩබ්. ලාල් විමලසිරි බස්නැවතුම්පොල ඉදිරිපිට ඇති අංක 25 කඩකාමරයේ ඉදිරිපස පැති වීදුරු හා ජනෙල් ප්‍රමාණයක් විශාල කරගැනිමට අනුමැතිය ඉල්ලා තිබෙනවා.සම්පූර්ණයෙන් රාමුව ගලවලා වීදුරු අලවන්න ඉල්ලන්නේ. බස්නවතුම්පොළ උඩ. 25 කඩ කාමරය. කොළඹ පැත්තට වෙන්න. ඒ අනුව තාක්ෂණසේවා නිලධාරි වාර්තාව මෙසේ සඳහන් වෙනවා. දැනට පවතින වීදුරුව සවි වී ඇත්තේ කොන්ක්‍රීට් තට්ටුවේ සිට අඩි 03 ක් පමණ උසකිනි. බැම්ම සවි වී ඇති වීදුරුව කොන්ක්‍රීටයේ කෙළවරටම වන්නට සවි වී ඇත. බැම්ම අඩියයි අගල් 18 ක් තිබෙන සේ අලුතින් වීදුරුවක් දැමීම සුදුසු බව කියා තිබෙනවා. එසේම බැම් කොටස කඩා ඉවත් කිරීමට සභාවේ අනුමැතිය ලබාගැනීම සුදුසු බවටත් වාර්තා කරනවා. යම් දිනකදී කඩකාමරය සභාවට ලබාදීමට සිදුවුවහොත් එය යථා තත්ත්වයට පත්කර භාරදීමටද සුදුසු බව ප්‍රකාශ කර තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

මේ කඩ මොනවා හරි කරනවා නම් සභාවට මුදල් ගෙවන්න ඕනනේ. ඊට පස්සේනේ අපට හදන්න පුළුවන්.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැවත මේ තත්ත්වයටම පත්කිරීම සඳහා අවශ්‍ය මුදල සභාවෙන් අයකර ගන්න .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, මෙය පාරට පෙනෙන එකක්ද ඇතුළට තිබෙන එකක්ද?

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. ඇතුළේ. මේ අය ඉල්ලා සිටින්නේ අර බට අයින් කර විදුරුවක් අලවන්න. පෙනුමක් එමට. ඒ සඳහා අයකළ යුතු ගාස්තුවත් අයකරගෙන සිදුකිරීමට අනුමැතිය ලබාදෙනවා.

තිරණය

අම්බලන්ගොඩ බස්නැවතුම්පොල අංක  කඩකාමරයේ ඉදිරිපස පැති වීදුරු හා ජනෙල් ප්‍රමාණයක් විශාල  කරගැනි සඳහා අම්බලන්ගොඩ ශ්‍රී විජයාරාම පාර අංක 21/16 ඒ ලිපිනයෙහි පදිංචි කේ.කේ.ඩබ් විමලසිරි මහතා විසින් කරන ලද ඉල්ලීමට තාක්ෂණසේවා නිලධාරි වාර්තාව අනුව අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිඑම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින්කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.08** තරුණ බෞද්ධ සංගමය පෝරඹ, අම්බලන්ගොඩ.වෙසක් පොහොය නිමිති කරගෙන පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගනයේ මධ්‍යම ප්‍රමාණයේ තොරණක් හා වෙසක් කලාපයක් පැවැත්වීමට ක්‍රීඩාපිටිය වෙන්කර ලබාගැනීම සම්බන්ධ  ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

තරුණ බෞද්ධ සංගමය පෝරඹ, අම්බලන්ගොඩ.වෙසක් පොහොය නිමිති කරගෙන පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගනයේ මධ්‍යම ප්‍රමාණයේ තොරණක් හා වෙසක් කලාපයක් පැවැත්වීමට ක්‍රීඩාපිටිය වෙන්කර ගැනිමට අවශ්‍ය සහාය ලබා ගැනීම . අම්බලන්ගොඩ , පෝරඹ , ප්‍රදේශයේ බෞද්ධ කටයුතු සංවිධානය කිරීම උදෙසා අප විසින් පෝරඹ තරුණ බෞද්ධ සංගමය ලෙසත් සංගමයක් පිහිටුවා ගන්නා ලදී. පෝරඹ තරුණ බෞද්ධ සංගමය විසින් ප්‍රථම බෞද්ධ කටයුත්ත ලෙස වෙසක් තොරණක් සහ වෙසක් කලාපයක් පැවැත්වීමට සියළු කටයුතු සූදානම් කරමින් පවතී.මෙම තාක්ෂණික එල්.ඊ.ඩී බල්බ මඟින් තොරණ ප්‍රදර්ශනය කිරීම වෙසක් පෝය දිනට දින 10 ක් පමණ කාලයක් ගතවේ. ඉන්පසු පොහොය දින සිට දින 07 ක් 08,09,10,11,12,13 දක්වා තොරණ් ප්‍රදර්ශනය වෙසක් කළාපයේ සංදර්ශන පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇත.  ඉන්පසු තොරණ ගලවා ඉවත් කිරීමට දින 02 ක් ගත වේ.ක්‍රීඩාපිටිය පිරිසිඳු කර භාරදීම දක්වා දින 20 කට ආසන්න කාලයක් ගත වේ. මේ කටයුත්ත සඳහා පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය අප සංගමය වෙත වෙන්කර ලබාදීම සහ වෙන්කිරීම සඳහා නියමිත මුදල පිළිබඳව අවධානය යොමුකොට ඉතා අවම මුදලක් හෝ නොමිලේ අප වෙත ලබාදීමට කටයුතු කර බෞද්ධ කටයුතු සාර්ථක කර ගැනීමට  ලෙසත් ඒ සඳහා සහයෝගය ලබාදෙන ලෙසත් නගර සභාවේ අනුග්‍රහය ලබාදෙන ලෙසත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මෙම වෙසක් තොරණ සහ වෙසක් කලාපය අම්බලන්ගොඩ නගරයේ 2020 වර්ෂයේ පවත්වනු ලබන විශාලම ඉතා අලංකාර බෞද්ධාලම්භන ප්‍රීතිය බෞද්ධ ජනයා වෙත දක්වන සුවිශේෂී අවස්ථාවක් ලෙස සංවිධානය කිරීමට අප තරුණකැල ඉතාමත් වෙහෙස ගනිමින් මාස ගණනක් මුළුල්ලේ ක්‍රියා කරයි.එම බෞද්ධ කටයුත්ත සඳහා අප ජීවත් වන ප්‍රදේශය අයත් ගෞරවණීය අම්බලන්ගොඩ නගර සභාවේ විශාල සහයක් සහ නගර සභා සභාපතිතුමන් වන ඔබතුමාගේ සහය ඉතා ගෞරවයෙන් යුක්තව ඉල්ලා සිටිනවා. තරුණ බෞද්ධ සංගමයේ ලේකම් එම්.කේ.මලිත් මධුභාෂණ විසින් ඉල්ලීමක් කර තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී     නන්දන රාජපක්ෂ මහතා  කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මං ඕකට විරුද්ධත්වය එලකරනවා. මොකද පහුගිය කාලෙ පිට්ටනිය දීල තාමත් බැනුම් අහනවා. ක්‍රීඩාකරන තැන නිසා පිට්ටනියෙ වලවල් හාරන නිසා.පන්සලේ

හාමුදුරුවන්ගෙන් අවසර ගත යුතුයි.මොකද රෑ 12, 01 වෙනකන් තියෙන නිසා අපට බලපෑමක් වෙනවා. වෙන තැනක් ලබාදෙනවා නම් හොඳයි.මං විරෝධය එලකරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මං හම්බවෙන්නත් අවා . ඔය අවා පෝරඹ තරුණ බෞද්ධ සංගමයේ අය. එක් කෙනෙක් තමයි ජගත් ඉලෙක්ට්‍රිකල්ස්ගෙ පුතා. තව දෙන්නෙක් තුන්දෙනෙක් එක්ක ආවේ. මා ප්‍රකාශ කර සිටියා ගරු සභාපතිතුමා හම්බ වෙන්න කියා. වාහන දමන නිසා මං කිව්වා පිට්ටනිය සවුත්තු වෙන නිසා අවසර දේවිද දන්නෑ කියලා. ඇත්තටම වෙසක් කලාපයක් වශයෙන් මෙම තොරණ ඉදිකිරිම සම්බන්ධව බෞද්ධයො වශයෙන් අපි සතුටු වෙන්න ඕන.සුදුසු තැනක් දෙන්න පුළුවන් නම් හොඳයි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මං හිතන්නෙ මෙතන පොඩි පොඩි විනෝද ක්‍රීඩා තියෙනවා.මෙහෙම දෙයක් තියෙනවා. මේ අයගෙ දවස් ගැන නම් වැඩියි.දින ගාන දිහා බැලුවම ප්‍රශ්නයක් වෙනවා. මුළු මාසෙම දෙන්න වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

නැතිනම් අපිට ආයෙත් බැණුම් අහන්න වෙනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ප්‍රදේශයේ මන්ත්‍රිතුමා විරුද්ධ නම් එය කරන්න හොඳ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

මං ඒ අය දැනුවත් කළා ග්‍රවුන්ඩ් එක සවුත්තු වෙන නිසා අවසර ගන්න අමාරුයි කියලා කිව්වා. ඒ අයට ඕනේ ඒ පෝරඹ පොල්වත්ත අවට විරස්ථානයත් සමඟ එම උත්සවය කරන්න.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙම දින ගණන බැලුවාම අපිට ලොකු ප්‍රශ්නයක් වෙනවා. වෙසක් මාසයම දෙන්න වෙනවා මෙහෙම බැලුවාම. ඒ අයම කියනවා දින 20ක් විතර යනවා කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

එම උත්සවයේ අනාන්‍යතාවය තිබෙන්නේ එම පෝරඹ විහාරස්ථාන අවට කළොත් පමණයි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පෝරඹ පහළ තිබෙනවා තැනක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

මා ඒ අය දැනුවත් කළා. ගරු සභාපතිතුමා හා සභාව දැනුවත් කරන්න. ඕකට අවසර ගන්න ආමාරුයි කියා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පෝරඹ පන්සල පහළ ඉඩම තිබෙනවා. පුළුවන්නම් එහි කරන්න කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ඔබතුමා දැනුවත් කරන්න

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මොකද අපේ ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා කියන කතාවත් ඇත්ත. දින 20ක් විතර මෙය ගහගෙන හිටියොත් එහෙම . හදිස්සියේ ක්‍රිඩා තරඟයක් එහෙම තිබුණොත්. ඇත්තටම හරි ගැටළුවක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

පාපන්දු තරඟත් තිබෙනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපේ ගරු නගර සභා මන්ත්‍රි ධන්සේන මාදුවගේ මහතා, ගරු ස්වාමින් වහන්සේ මොනවා කියාවිද දන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

එම දැනුවත් කිරිමට කටයුතු කරන්න ඕන. ගරු ස්වාමින් වහන්සේගෙන් අවසර ගන්නත් ඕන.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මුලින්ම මේක දෙනවානම් මේයට විහාරස්ථානයේ අවසරය ගන්න ඕන. නැතුව දෙන්න බැහැ. ගිය පාර කරපු විදියට කරන්න කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ඔබතුමා ඔය ලිපිය සම්බන්ධව දැනුවත් කරන්න . ඒ අය පැමිණෙයි.

තීරණය

තරුණ බෞද්ධ සංගමය පෝරඹ, අම්බලන්ගොඩ.වෙසක් පොහොය නිමිති කරගෙන පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගනයේ මධ්‍යම ප්‍රමාණයේ තොරණක් හා වෙසක් කලාපයක් පැවැත්වීමට ක්‍රීඩාපිටිය වෙන්කර දෙන ලෙස කරන ලද ඉල්ලිම සඳහා අනුමැතිය ලබා දිය නොහැකි බවත්, මෙය ගිය වසරේ කරනු ලැබු ආකාරයට ඉටු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදී.

**12.09 අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ 90 කණ්ඩායම සංවිධානය කරන සංකල්පනා සංගීත ප්‍රසංගය 2020 විනෝද බද්දෙන් නිදහස් කිරිම පිළිබඳ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ධර්මාශෝක විද්‍යාලයීය විදුහල්පතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා.ධර්මාශෝක විද්‍යාලයීය පුස්තකාල සංවර්ධනය ව්‍යාපෘතියට අධාර පිණිස ධර්මාශෝක විද්‍යාලයී 90 වන කණ්ඩායම සංවිධානය කළ සංකල්පනා සංගීත ප්‍රසංගය 2020 පෙබරවාරි මස 29 දින පැවැත්වීමට කටයුතු යොදා ඇත. ඒ අනුව පහත සඳහන් කාරණා පිළිබඳව ඔබතුමා ප්‍රමුඛ නගර සභාවේ කාරුණික මැදිහත් විම සිදු කරන සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා ඇත. එම ලිපියේ පිටපතක් ඔබතුමාගේ අවධානයට ඉදිරිපත් කර ඇත.

01. ප්‍රසංගය සඳහා නගර සභාවට ගෙවිය යුතු විනෝද බද්දෙන් නිදහස් කරදෙන ලෙස ඉල්ලා ඇත.

02. පූර්ව ප්‍රචාරක කටයුතු සඳහා නගරයේ ස්ථාන 04 ක දැන්වීම් පුවරු සවිකිරීම සඳහා අවසරය ඉල්ලා ඇත. මෙම ප්‍රසංගය සම්පූර්ණයෙන්ම පාසල් ළමුන් වෙනුවෙන් ඉතා ඵලදායි කාර්යයක් සිදුවන බැවින් ඔබතුමා මැදහත්ව කාර්යය ඉටුකරනු ඇතැයි බලාපොරොත්තු වෙනවා. එම ලිපිය සමග ලිපියක් තිබෙනවා ප්‍රභා ඉනෝකාද සිල්වා ලේකම් 90 ආදි ශිෂය සංගමය. විනෝද බද්දෙන් නිදහස් කිරීම.ගරු විහල්පතිතුමා. පුස්තකාල සංවර්ධනයට ආධාර පිණිස 2020 පෙබරවාරි මස 29 දින අප කණ්ඩායමට විසින් පැවැත්වීමට නියමිත සංකල්පනා සංගීත ප්‍රසංගය සඳහා විනෝද බද්දෙන් නිදහස් කිරීමට නගර සභාවවෙත ලිඛිතව ඉල්ලීමක් සිදුකිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලා තිබෙනවා.

නීත්‍යානුකූල පදනම මත ලබාදෙන්න. මොකද දන්නවද මේ වගේ සංගම් කරනවා විදුහල්පති සහ අපේ ආරියදේව හාමුදුරුවෝ දෙපාරක් අපිව රවට්ටල තියෙනවා. එම නිසා මෙය නිත්‍යානුකූල පදනම මත ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා. එක පාරක් විදුහල්පතිතුමාගේ ලිපිය දමා විදුහලට රුපියල් ලක්ෂයක් දෙනවා. ඊට පසු තව එක්කෙනෙක් ගරු ආරියදේව හාමුදුරුවොන්ගේ ලිපිය දමා පනස්දාහක් දීල කරල තියෙනවා.මේ ලාභ ලබන දේවල්. අපේ පනතේ තියෙන්නේ මෙහෙමයි. ගෙවිය යුතු බද්ධ ගෙවිය යුතුයි. ලබන ලාභයෙන් 40% ක් හෝ අවම ප්‍රමාණයක් විද්‍යාලයට සැපයිය යුතුයි. විද්‍යාලයට ගෙව්වට පස්සෙ අපිට ඒ ගාස්තුව නිදහස් කරන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

අනේ සභාපතිතුමා ඒක පාසලට කරලා දෙන්න. විදුහල්පති අත්සන් කරනවනේ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔව්.විදුහල්පතිතුමා තමයි අර ලිපියෙත් අත්සන් කරලා තිබුණේ. මේ අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයෙ විදුහල්පතියි ධර්මාචාර්යය හාමුදුරුවොයි දෙන්නම වංචා කරලා තියෙනවා.

**තීරණය**

අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ 90 කණ්ඩායම සංවිධානය කරන සංකල්පනා සංගීත ප්‍රසංගය 2020 .විනෝද බද්දෙන් නිදහස් කිරිම නිත්‍යානුකුල පදනම මත සිදු කිරිම සුදුසු බවටත්, ප්‍රචාරණකටයුතු සඳහා දැන්වීම් පුවරු 4ක් සවිකිරිමට අවසර දීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.10 ආරක්ෂක මුරපොළක් වන බස්රථ නැවතුම්පොළ හා නගර සභාව අතර දහවල් කාලයේ සහ රාත්‍රී කාලයේ සංචාරය කිරීමට පාපැදියක් ඉල්ලා ආරක්ෂක අංශ විසින් ඉල්ලීමක්ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අප ආරක්ෂක මුරපොළක් වන බස්රථ නැවතුම්පොළ හා නගර සභාව තුළ ඇති මුරපල දහවල් කාලයේ සහ රාත්‍රී කාලයේදා මුර සංචාරය කිරීමට පාපැදියක් අවශ්‍යාව ඇත. ඒ සඳහා එම රාජකාරියට අවශ්‍ය වු පා පැදිය ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , දෙදෙනෙක් සිටිනවානේ එම නිසා පාපැදි දෙකක් අරන් දෙන්න.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ අය ඉල්ලලා තියෙන්නෙ එකයි. අපි වැඩිපුර දෙන්නෙක් අරන් තියෙනවා.දෙකක් ගන්න.යෝජනා කරන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , අපි කතා කළේ නගරයේ ආරක්ෂාව වෙනුවෙන් මුර හටයො දෙන්නෙක් ගත්තා. ඒ එක් කෙනෙකු ගෙන තිබෙන්නේ රාත්‍රියට එක්කෙනෙකුත් දහවලට එක්කෙනෙකුත් ලෙස මුර සංචාරයේ යෙදෙන්න. රාත්‍රියට මා හිතන්නේ නැහැ මුර සංචාරයේ යෙදෙන්න ඕන කියා.එම නිසා දහවලට මෙම කටයුත්ත කරන්න ඕන. එම නිසා යතුරු පැදි දෙකක් මෙම ආරක්ෂක සේවකයන් දෙදෙනාට ලබා ගන්න. නගරය ආරක්ෂා කිරිමට යතුරු පැදි දෙකක් ගැනිමට මා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මම ස්ථිර කරනවා.

**තීරණය**

නගර සභාව තුළ ඇති ආරක්ෂක මුරපොළෙහි සිටින සිවිල් ආරක්ෂක නිලධාරින් දෙදෙනාට නගරයේ මුර සංචාර කටයුතු සිදු කිරිම සඳහා පාපැදි 02ක් ලබාදීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

## 12.11 අම්බලන්ගොඩ නගර සභා ගොඩනැඟිල්ල සුදුසු පරිසරයක පවත්වාගෙන යාම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මේ සම්බන්ධව අපි කලිනුත් කතා කළා. අම්බලන්ගොඩ නගර සභා කාර්යාලය සුදුසු පරිසරයක පවත්වාගෙන යන්න කියලා කාර්යාලයේ සේවය කරන සියලුම දෙනා ඉල්ලීමක් කරලා තියෙනවා. ඒ පිළිබඳව කතා කළ නිසා නැවත කතා කරන්න අවශ්‍යතාවයක් නැහැ.

තීරණය

අම්බලන්ගොඩ නගර සභා ගොඩනැඟිල්ල සුදුසු පරිසරයක පවත්වාගෙන යාම සම්බන්ධව මිට ඉහත සාකච්ඡා කරන ලද බැවින් නැවත සාකච්ජා කිරිම අවශ්‍ය නොවන බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදි.

## 12.12 2020 වසර සඳහා පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීමේදි සිදුවී ඇති අසාධාරණය සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

2020 වසර සඳහා පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේදී සිදුවූ අසාධාරණය සම්බන්ධවයි. අම් බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කරගැනීමේදී එකී විදුහලේ ප්‍රාථමික පාසල පවත්නා ස්ථානය පදනම් කරගනිමින් සලකුණු කරනු ලබන අරයක් සහිත ආසන්න සීමාව මෙම වර්ෂයේ සිට 2020 වර්ෂය සඳහා පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කරගැනීමේ රජයේ චක්‍රෙල්ඛනයට පටහැනිව එම විද්‍යාලයේ ද්විතියික අංශය පවතින ස්ථානය පදනම් කරගනිමින් සලකුණු කිරීම මත ධර්මාශෝක විද්‍යාලය ආරම්භ කළ දින සිට ගිය වසර දක්වා කාලය අවුරුදු 80 ක් පුරාවට අම්බලන්ගොඩ නාගරික සීමාවේ පවතින හිරේවත්ත,මහාවීදිය,උස්වැල්ල පාර එකී සීමාවන් විස්ථාපනය කර ඇත. මේ නිසාවෙන් නගරයේ පදිංචි දරුවන්ට තම අයිතිය අහිමි වී ඇති අතර වෙනත් ප්‍රදේශයක අම්බලන්ගොඩ බල ප්‍රදේශයෙන් බැහැර දරුවන්ට අයිතිය හිමි වී ඇත.අම්බලන්ගොඩ ගා/ ශ්‍රි දේවානන්ද විද්‍යාලය, ගා ප්‍රජාපති විද්‍යාලය, කුලරත්න විද්‍යාලයයන තුන ආසන්නව සංගණය කිරිමේදි ධර්මාශෝක විද්‍යාලයේ ප්‍රාථමික අංශයට ගණනය කිරිම කර ඇත. හොඳම පාසල ළඟම පාසල යන තේමාව යටතේ අප දරුවන්ට ළඟම පාසල වන ධර්මාශෝක විද්‍යාලය අහිමි වී ඇත.පසුගිය රජයේ නගර සීමාවෙන් බැහැර මන්ත්‍රීලාගේ අවශ්‍යතාවය පරිදි ගනුලැබූ මෙම අත්තනෝමතික තීරණය වෙනස් කර තිබූ ආකාරයෙන් ප්‍රාථමික අංශයට ළමුන් ඇතුළත් කිරිමේ දුර චක්‍රලේඛණයේ සඳහන් පරිදි ප්‍රාථමික අංශය පදනම් කරගෙන සකස් කරන ලෙසද එ මඟින් දරුවන්ගේ අයිතිය ලබා දෙන ලෙසත් , අපගේ දරුවන්ට ළඟම පාසල වූ ධර්මාශෝක විද්‍යාලයේ අධ්‍යාපනය ලැබීමට අවස්ථාව ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරන මෙන් ඉල්ලමි. හය දෙනෙක් අත්සන් කරල තිබෙනවා. ආර්.එම්. කසුන් චින්තක , පි.එච් . හෂිනි දිල්රුක්ෂි, පී.ඊ.ඩබ්.විතානාච්චි, එච්. ප්‍රනීත් කුමාර,ලකීෂා නිරෝෂි,කේ.ඩබ්. රජිත මිහිරාන් යන අය ඉල්ලීමක් කරලා තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

එය සාධාරණ ඉල්ලීමක්.

**ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

බලන්න සභාපතිතුමනි හිරේවත්ත ළමයින්ට එන්නත් බෑ. ධර්මාශෝකෙව විද්‍යාලයට. ඔය ප්‍රශ්නය තිබෙන්නේ තල්ගස්ගොඩ , කෙරමිණියට විතරයි කියා. දැන් හිරේවත්ත , උස්වැල්ලේ සිටි ජනතාව තමයි සුනාමිය නිසා තල්ගස්ගොඩ ගිහින් ඉන්නේ. මේ පාසැල් පාලනය කරන විදුහල්පතිවරු එල්ලන්න ඕන. ගරුසභාපතිතුමනි, ඇත්තටම පාලකයො වශයෙන් ඔබතුමා මැදිහත් වෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. තල්ගස්ගොඩ ළමයි 20 ක් විතර ඉන්නවා. ඕකන්දෙ , කෙරමිණියෙ ඉන්නවා. පින්නදූවෙ ඉන්නවා.මෙහි විශේෂත්වය හිරේවත්ත, ඌරවත්ත , පටබැඳිමුල්ලෙ ළමයා තමයි තල්ගස්ගොඩ ඉන්නෙ සුනාමියට ගිහිල්ලා . මේ එක ළමවෙක්වත් අහුවෙලා නැහැ ඔප්පු නැහැ කියලා. මේ රජයේ ආයතනයකින් ඉඩම් බලතල තිබෙන්නේ ප්‍රාදේශිය ලේකම්ට. ප්‍රාදේශීය ලේකම්ගෙ ලියුම විදුහල්පතිට භාරගන්න බැරිනම් කාගෙ ලියුමද භාරගන්නේ. .ජනාධිපතිතුමයි අගමැතිතුමයි ඉඩම් අයිතිය පවරා තියෙන්නේ ප්‍රාදේශීය ලේකම්ට. මේ අම්බලන්ගොඩ ළමයින් ගන්නේ නැතිනම් කොහේ ළමයිද ගන්නේ. මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න. ගන්න ළමයින් නැහැ. අපි මේ පිළිබඳව හැමදාම කතාකරනවා.මේක කෙරෙන්නේ නැහැ. මං කියනනේ අපි හැමෝම අපි විසිදෙනාම පාරට බහින්න ඕන. එක්කෝ විදුහල්පතිවරුන් පාඩමක් ඉගෙන ගන්න ඕන.මේක කතා කර වැඩක් නැති නිසා. ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ ඉතා ඉක්මනින් ආණ්ඩුකාරතුමා හම්බවෙලා මේ දිපු ඉඩම් වලට එක්කෝ ප්‍රදේශිය ලේකම්ගෙන් ලිපියක් දි තිබෙනවා. මේවා නීත්‍යානුකූල හැටියට භාරගන්නා ලෙස සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට කියා සිටිය යුතුයි. දැන් අවුරුදු 14ක් වෙනවා තල්ගස්ගොඩට ගිහින්. ළමයි 20 ගණනක් ඉන්නවා. මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේක ක්‍රියාත්මක නොවුණොත් මං පාරට බහිනවා කියලා. ඔබතුමාලගේ සහයෝගය ලබාදෙන්න. එච්චරයි.

**ගරු නගර සභා මන්ත්‍රිනී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

සභාපතිතුමනි , උප සභාපතිතුමා කිව්ව එකට මාත් කියන්නෙ ඔය සර්කල් එකට ගන්නව කියල කියන්නෙ ධර්මාශෝක විද්‍යාලයේ ප්‍රාථමික පංති තිබෙන ස්ථානය. දැන් ප්‍රාථමික අංශයේ තිබෙන පංති දැන් පාසැලේ ලොකු පංති තිබෙන පැත්තට ගෙනහින්. එතන තියෙන දුර ප්‍රමාණය නිසා තමයි හිරේවත්ත ළමයි අහුවෙන්නෙ නැත්තේ. හිරේවත්ත කියන්නේ අම්බලන්ගොඩ නගර සීමාව තුළ ඉපදිච්ච ළමයා අහුවෙන්නෙ නැහැ. කන්දෙගොඩ ළමයා අහුවෙනවා..ගරු උප සභාපතිතුමා කිවු පරිදි අපි මන්ත්‍රිවරු හැමදෙනාම එකඟයි. එම නිසා මේ ප්‍රශ්නෙ හැමදාම මතුවෙනවා පාසල්වලට ළමයි දාන කාලයට. අපි මන්ත්‍රීවරු විදියට අපි පත්රල තියෙන්නේ කොට්ඨාස නියෝජනය කරන්න.මේකට අපි එක්වෙන්න. අපි පෙළ ගැහෙන්න . ඉතා ඉක්මනින්. මේක හරියන්නේ නැහැ.අපි උද්ඝෝෂණයක් කළ යුතුයි . දැන් ගරු උසස් අධ්‍යාපන ඇමති ඩලස් අලහප්පෙරුම මැතිතුමාගෙන් මෙයට පිළියමක් ඉල්ලන්න. මුලින් ආණ්ඩුකාරතුමා මුණ ගැහෙන්න. බැරි නම් ගරු අධ්‍යාපන ආමත්‍යතුමා මුණ ගැහෙන්න. ඔබතුමා උප සභාපතිතුමාත් එක්ක යන්න තව ඕන්නම් මන්ත්‍රීවරුත් ඒවි. ගිහින් මේකට අධ්‍යාපන ඇමතිතුමාගෙන් පිළියමක් ඉල්ලන්න.පිළියමක් නොලැබුණොත් අපි ඉස්කෝලෙ ළඟ වාඩිවෙනවා.

**ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මට කණගාටු පොල්වත්ත බුද්ධත්ත විද්‍යාලයට භාරගන්නෙත් නැහැ. කුලරත්නෙ ධර්මාශෝකෙ දේවානන්ද විද්‍යාල නම් කමකුත් නැහැ. මේ පොල්වත්ත ඉස්කෝලෙට භාරගන්නෙත් නැහැ. මේ පුදුම කරුමයක්.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. සෝභිත රංජිත් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ධර්මාශෝක විද්‍යාලයේ විදුහල්පතිතුමා කියන්නෙ තවම ගත්තෙ නැහැ කියලා. දුර පුමාණය අනුව ලබන අවුරුද්දෙ ගන්නව කියල තමයි දුර ප්‍රමාණෙට මේ ලකුණු 5 කපන්නේ. චක්‍රෙල්බෙ ඇත්තෙවත් නැහැ . ඒක සභාපතිතුමා අන්තිම වැරදියි . චක්‍ර ලේඛයේ ඇත්තෙත් නැහැ ලකුණු 5ක් කපන්න කියා. ඒ ගැන කතාකරලා දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

සභාපතිතුමනි,මෙම ලිපියේ ඉල්ලීම ඉතාම සාධාරණ ඉල්ලීමක්.මමත් ධර්මාශෝක විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ ඉන්නවා.නමුත් මේ ඉල්ලීමට මමත් එකඟ වෙනවා.සහයෝගය එලකරනවා. මෙච්චරකල් හිරේවත්ත හිටපු ළමයි නිකන්ම ඉවත්වෙලා යනවා. මෙච්චර කල් තිබුණ ප්‍රාථමික අංශය ලොකු පංති තිබෙන පැත්තට ගෙනියන්නෙ ඇයිද කියලා හේතුව මොකක්ද කියලා මං දන්නෙත් නැහැ. එහෙමනම් 01 වසරේ ඉඳලා 05 වසර වෙනකන් ලොකු පංති පැත්තට ගෙනියන්න ඕන. 01 වසර විතරක් ලොකු ඉස්කෝලෙට ගෙනියන හේතුව මං දන්නෙත් නැහැ. මම ආදි ශිෂ්‍ය සංගමයේ හිටියත් ආදි ශිෂ්‍යොයා විදියට මේ ලිපියට සම්පූර්ණ සහයෝගය ලබාදෙනවාඅපි මේ සම්බන්ධව ඉතා ඉක්මනින් ක්‍රියාත්මක විය යුතුයි

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඔය කතන්දරේ ඇත්ත. විදේශ ගතවීම පිළිබඳව ළමයි ඇතුළත් කිරීමේ ගණයට අනුව කෙරමිණියෙ ළමයෙක් ඉන්නවා. එහේ තමයි ඉපදිලි තියෙන්නේ.හැබැයි මාස තුනක් එහේ ඉඳලා නැහැ ඔපරේෂන් එකක් නිසා මාස 2 ½ න් මෙහේ ඇවිත්. ධර්මාශෝකෙට දැම්මා. බලනකොට තව දෙන්නෙක් ඉන්නවා.එක්කෙනෙක් තෝරගෙන තියෙනවා වතුගෙදර ළමයෙක්. මාස තුනක් රට ඉඳලත් නැහැ ඔය ප්‍රශ්නෙ නිසා ඇවිල්ලා තියෙනවා.පස්සෙ ඔය ප්‍රශ්නෙ ඇද්දහම ඔබතුමාගෙ ඥාතියෙක් ඉන්නවනේ කේ.ටී.රංජිත් කියලා. එතුමා තමයි අහල තියෙන්නේ. කෙරමිණියෙ දෙමව්පියො මං හම්බවෙන්න ආවා. වතුගෙදර ළමයා තමයි දැන් තෙරි වෙලා තියෙන්නේ. ධර්මාශෝකෙ විදුහල්පති කිව්වලු වතුගෙදර දෙමව්පියොන්ට කෙරමිණියෙ දෙමව්පියො හම්බවෙලා ශේප් කරගන්න කියලා. විදුහල්පතිතුමා පිරිසිඳුවයි වැඩකරනවා කියන්නේ. ඔන්න ඔය වගේ දේවල් තියෙනවා. මාත් එක්ක කිව්වා ඕන වෙලාවක ඉදිරිපත් කරන්න පුළුවන් කියලා.

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මං බ්‍රහස්පතින්දා කොළඹ යනවා. කවුද මාත් එක්ක යන්න එන්නේ.අපි මේ සම්බන්ධයෙන් ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා සමඟ සාකච්ඡා කරන්නම් . ආණ්ඩුකාරතුමා එක්කත් කතාකරලා බලන්නම්. උප සභාපතිතුමා මුලින්ම වාඩිවෙන්න කලින් අපි ගිහින් ඒ අදාළ අංශ එක්ක සාකච්ජා කරන්න ඕන.

ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

නෑ සභාපතිතුමා විදුහල්පතිවරුන්ට පාඩමක් උගන්නන්න ඕන.සමහර වෙලාවට විදුහල්පතිවරු ප්‍රකාශ කරනවා තල්ගස්ගොඩින් පන්තියක්ම එනවලු.සභාපතිතුමා එහෙම ප්‍රකාශ කරන්න පුළුවන්ද? පුදුම කතාවක්නෙ කියන්නේ.

ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

05 වෙනිදා තනායම රැස්වීම වෙනින් දවසකට දමන්න. මා එදින කොහොමත් කොළඹ ඉන්න ඕන.

ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, මට අවස්ථාවක් දෙන්න. අපි හැමෝම කැමති ළමයා ධර්මාශෝකෙට දාගන්න.ඒකට බැරිවුණොත් දේවානන්දෙට දාන්න. කුලරත්නේට දමන්න. එකටත් බැරි වුණොත් අඩුම තරමෙ පොල්වත්තෙ පාසැල්වලට දාන්න. ඇයි මේ. ඒ පාසැල්වල පහසුකම් තියෙනවා. විද්‍යාගාර පහසුකම් තියෙනවා. පුස්තකාල පහසුකම් තියෙනවා. නාන තටාක තියනවා. හොඳ ගුරුවරු ඉන්නවා. අනිත් ඒවට එහෙම නැහැ. දැන් පොල්වත්ත විද්‍යාලයේ ඒ පහසුකම් නැතිනම් බලන්න බටපොල පාසැලකම එම පහසුකම් තියෙනවා නම් ඒවට දාන්න අකමැති වෙන්නෙ නෑ. ඒ මිනිස්සු මෙච්චර මෙහේ එන්නේ නැහැ. මේවට ළමයි දාන්න පොරකන්නේ ඇයි? මේ විෂමතාවය. රටේ තියෙනවා පැලැන්තියක්.වරප්‍රසාද සහිත පුද්ගලයොන්ට අධ්‍යාපනය ලබන්න පුළුවන් මෙතන. මෙතන කොච්චර දුර වුණත් ධර්මාශොකෙට එන්න ඕන්නම් ලක්ෂ 05 ක් දුන්නම එන්න බැරිනම් ලක්ෂ 10ක් දුන්නම බැරිනම් 25 ක් 50 ක් දුන්නම පුළුවන්. මේක මුදල මත තීරණය වෙන්නේ.ප්‍රශ්නවල අග්ගිස්සේ ඉඳන් විසඳුම් හොයන්න බැහැ. කිසිකෙනෙක් කැමති නැහැ තමන්ගෙ දරුවා හැතැප්ම ගණන් දුර බස්රථවල ධර්මාශෝකෙට එවන්න. තමන්ගේ ගේ ළඟ තියෙන පාසැල් හොඳ නම් එවන්නේ නැහැ. අපි සමහර වෙලාවට ඒ පාසල්වලට ගිහිනුත් කියනවා අපේ ගමේ පාසැල කියලා. නමුත් මේ වගේ පහසුකම් නැහැ. අපේ අවශ්‍යතාවයෙදි අපි කියනවා මේක අපේ පාසැල කියලා.අපි ඒ ප්‍ර දේශවලටත් යනවා අපේ උවමනා වලට. එතනදි අපි කියන්නේ නැහැ. බොල ඇල්පිටියේ බොල එන්න බැහැ. මං මේ කතාකරන්නේ. ඒ මිනිස්සු වෙනුවෙනුත් තමයි මා මේ කතා කරන්නේ. අපේ අවශ්‍යතාවයදි අපි කියනවා මේ අපේ පාසැල කියලා . නමුත් රටේ පොදු ආදායමෙන් තමයි මුළු රටේම මිනිස්සුන්ගෙ ආදායමෙන් තමයි ධර්මාශෝකෙට දෙයක් ලැබෙන්නේ.ගොඩනැගිල්ලක් සැපයෙන්නේ.එහෙමනම් මුළු රටේම ජනතාවගේ ආදායමෙන් තමයි ධර්මාශෝකය රැකෙන්නේ. අපි එහෙම කතාරන එක අසාධාරණයි.

ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අපි මෙහෙම තීන්දු කරන්න. කවුද එන්නේ ආණ්ඩුකාරතුමා හම්බවෙන්න. මේකයි මෙහෙම දෙයක් තියෙනවා. මට මේ ප්‍රශ්නෙ එච්චර බලපාන්නේ නැහැ. උප සභාපතිතුමයි සෝභිත මන්ත්‍රීතුමයි එනවද? බ්‍රහස්පතින්දා මොහාන් ඇමතිතුමා වැඩ භාරගන්නවා. ඒ නිසා මට ඩලස් ඇමතිතුමා සම්බවෙන්න ලේසියි. බ්‍රහස්පතින්දා යන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී  ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔබතුමා දුරකථනයෙන් කතා කර දිනයක් ඉල්ලා ගන්න. ඉන්පසු අපට දැනුම් දෙන්න.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු ඩලස් ඇමතිතුමාගෙන් මට වේලාවක් ගත හැකියි. මා කතා කර කියන්නම්. කවුද එකට එන ගරු මන්ත්‍රිවරු.මාත්  එක්ක යන අය ලියාගන්න.ගරු උප සභාපතිතුමා, ගරු නගර සභා මන්ත්‍රි ලක්ෂ්මී මෙනවිය, ගරු නගර සභා මන්ත්‍රි ඉනෝකා මිය, ගරු නගර සභා මන්ත්‍රි අයිරාංගනී මිය, ගරු නගර සභා මන්ත්‍රි රාහුල මයා, ගරු නගර සභා මන්ත්‍රි සරත් මයා. සර්ට මං කතාකරල වෙලාවක් ගන්නම්.මොකද මෙය පළාත් සභා මේවා එකක් නිසා ඔප්පු නැතිවීම සම්බන්ධයෙන් කතාකරන්න ඕන ආණ්ඩුකාරතුමා එක්ක. ධර්මාශෝක විද්‍යාලය සම්බන්ධයෙන් කතා කරන්න ඕන ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා එක්ක.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී  නිලානි මෙනවිය  කතා  කරමින්</u>**

ගරු සභාපතිතුමනි , රෝහල දියුණු කරනකොට පහුගිය කාලෙ බලපිටියෙ ඉන්න අය අකමැති වුණා බලපිටියට ඕන කිව්වා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමිය පොල්වත්තට මහල් හයකින් යුක්ත බිල්ඩින් එකක් හම්බවෙනවා. ඒක ලැබෙව්. ඒ පිළිබඳව මං කතාකරලා තියෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී  නිලානි මෙනවිය  කතා  කරමින්</u>**

එහෙමනම් සිද්ධාර්ථයට , රේවත විද්‍යාලයට එම ළමයින් ටික දමා ගන්න.

තීරණය

2020 වසර සඳහා පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීමේදි සිදුවි ඇති අසාධාරණය සම්බන්ධ ලිපියට ඔප්පු නැතිවීම සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා මුණ ගැසිමටත්, ධර්මාශෝක විද්‍යාලය පිළිබඳව ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා මුණ ගැසිම සඳහා  ගරු උප සභාපතිතුමා, ගරු නගර සභා මන්ත්‍රි ලක්ෂ්මී මෙනවිය, ගරු නගර සභා මන්ත්‍රි ඉනෝකා මිය, ගරු නගර සභා මන්ත්‍රි අයිරාංගනී මිය, ගරු නගර සභා මන්ත්‍රි රාහුල මයා, ගරු නගර සභා මන්ත්‍රි සරත් මහතා මුණ ගැසිම සුදුසු බවට ගරු සභාපති එම් ඩබ් අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.13 කේ.කේ. දිලිනි නිලංකා තල්ගස්ගොඩ පෙරපාසලට  ගල්බංකු 02 ක් ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කේ.කේ. දිලිනි නිලංකා තල්ගස්ගොඩ පෙරපාසලට ගල්බංකු 02 ක් ඉල්ලා සිටිනවා. ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එය ස්ථිර කරනවා.

තීරණය-

**තල්ගස්ගොඩ පෙරපාසලට ගල්බංකු 02 ක් ඉල්ලා පෙර පාසැල් පාලිකා කේ.කේ. දිලිනි** නිලංකා විසින් කරන ලද ඉල්ලිමට අනුව එම ගල් බංකු දෙක ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.14 වැඩ පරිපාලක කේ.ජේ.ඒ. සිල්වා මහතා විසින් අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාගාරයේ වැසිකිළිය පද්ධතිය අලුත් වැඩියා කිරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභා ක්‍රිඩාංගනයේ වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම. මේ සඳහා වැඩ පරිපාලක මහතා විසින් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර අනුමත කර තිබෙනවා. වැසිකිළි පද්ධතිය පිටුපස පේමන්ට් එක සහ අලුත්වැඩියාව සඳහා පහත සඳහන් උපාංග ලබාදෙන ලෙස ඉල්ලීමක් කර තිබෙනවා. අඟල් 4 පී.වී.සී. පයිප්ප 4 යි. අඟල් 4 එල්බෝ 6 යි. අඟල් 4 පී.වී.සී. බෙන්ඩ් 5 යි. අඟල් 4 ½ ටි ෂොකට් 01, අඟල් 1 ½ එල්බෝ 04,අඟල් 1 ½ පී.වී.සී. පයිප්ප 01, ෂිශ්ටනයේ අලුත්වැඩියා කට්ටල 02 ,බ්ඩේට් ෂවර් 03, ඇන්ගල් වැල් 06, පෙප්සිපල් හොන් ( අඟල් 18 ) 03, සිමෙන්ති කිලෝ 50 බෑග් 04, වැලි කියුබ් ¼ , කොන්ක්‍රිට් ගල් කියුබ් 1/8 , ගඩොල් කැට 100, 10 කම්බි 02. ඒවගේ ඉල්ලිමක් කර තිබෙනවා. ටිකක් දිග ලැයිස්තුවක් තියෙනවා.එමනිසා මෙය සභා වාර්තාව ගසා අනුමත කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, වැසිකිළියට යන්න බැහැ. අළුතින් එකක් හදා දෙන්න.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔව්. මේ සඳහා අනුමැතිය දෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා මෙය මුල්ම රැස්විමේදි කිවුවා. මෙය ගෙවපු එක වැරදියි. මා මුලින් කිවුවා.

ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

තාක්ෂණසේවා නිලධාරි මහත්තයා ඕකට පිළියමක් යොදන්න. වතුර රැඳෙන්නේ නැතිවෙන විදියට ක්‍රමෝපායක් යොදන්න. උඩින් ටයිල් පෙලියක් හරි අල්ලන්න.

තීරණය

අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාකාරයේ වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා වැඩ ක්ෂේත්‍ර පරිපාලක කේ.ජී.ඒ. සිල්වා මහතා විසින් ඉල්ලා ඇති අංක 01 සිට අංක 15 දක්වා ඇති උපාංග හා ද්‍රව්‍ය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**12.15 මාර්ග තලනය භාවිතා නොකිරීම නිසා හේමගේ සුජිත් මහතා විසින් ගෙවූ මුදල් ආපසු ලබා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ, කෙරම්ණිය,පොකුණ පාර අංක 28 ලිපිනයේ පදිංචි හේවගේ අජිත් යන අය ඉල්ලීමක් කර තිබෙනවා. ඒ අනුව මා විසින් කෙරම්ණිය , පොකුණ පාරේ අතුරු මාර්ගයක් තැලීම සඳහා මාර්ග තලන යන්ත්‍රයට රු.7285/- ක මුදලක් ගෙවූ බවත් එම කටයුත්ත සිදු නොකළ බැවින් මුදල නිදහස්කරදෙන ලෙසත් ඉල්ලීමක් කර තිබෙනවා. ඒ අනුව ගල්රෝල ලබා නොගත් බවට වැඩ පරිපාලක මහතා විසින් දන්වා ඇත. ඒ අනුව ගාස්තු නිහදම් කිරිම පිළිබඳව 2019 අයවැය ලේඛණයේ කිසිඳු සඳහනක් නොමැත. එබැවින් මාර්ග තලනයට ගෙවූ මුදල් පිළිබඳව පහත සඳහන් පරිදි යෝජනා කරමි. මාර්ග තලනයට අයකර ඇති 25% ක මුදල රඳවාගෙන 75% ක මුදල ගෙවන ලෙසත් මාර්ගය නැවත ක්‍රියාකරු සඳහා අයකර ඇති සම්පූර්ණ මුදල ගෙවීමට සුදුසු බවටත් යෝජනා කර තිබෙනවා.

තීරණය-

අම්බලන්ගොඩ, කෙරම්ණිය,පොකුණ පාර අංක 28 ලිපිනයේ පදිංචි හේවගේ අජිත් මහතා විසින් කෙරම්ණිය , පොකුණ පාරේ අතුරු මාර්ගයක් තැලීම සඳහා මාර්ග තලන යන්ත්‍රය ලබා ගැනිමට ගෙවූ මිදලින් රු.4975/=ක (එය ලබා නොගැනීම හේතුවෙන් ඔහුට ගෙවිය යුතු) මුදලක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

වෙනත් කරුණු

ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. සෝභිත රංජිත් මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, අපේ අර ළමා ක්‍රීඩාංගනයේ අහුරලා දෙන්න.මං ගිය සභාවටත් ඉදිරිපත් කළා.ඒක මට කරන්න දුන්නේ නැහැ.ඒ අය භුක්ති විඳිනවා.කරුණාකරල ඒක කරලා දෙන්න.අපේ නිලධාරි මහතුන් යවා වැට ගසා දෙන්න. ලබා සභාවට කලින් කරලා දෙන්න . අනෙක සභාපතිතුමනි මෝදර දේවාල පාරෙ මාර්ග බාධක 05 ක් දාල ඉල්ලුවා මාස 05 ක් 06 ක් විතර වෙනවා.ගිය සතියෙ ළමයෙකුත් යටවුණා මෝටර් බයික් එකක ගිහිල්ලා.ඒක කරලා දෙන්න සභාපතිතුමනි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම නම් ඒකට විරුද්ධයි. මොකද මහපාරක මාර්ග බාධක දාන එකේ තේරුමක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ඔබතුමා කිව්වානෙ දාල දෙනවා කියලා. වැල්ල පාරෙ.සභා තීරණයක් දුන්නනෙ ඒක කරන්න කියලා. දැන් මාස හයක් විතර වෙනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මාර්ගය තියෙන්නෙ බාධක දාන්න නෙමෙයි. අපි විරුද්ධ නිසා වෙන්න ඇති ඒක නොකළේ.වැල්ල පාරෙ මම කිසිසේත්ම දාන්නෙ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

සභාතීරණයක් තියෙනවනෙ . සභා තීරණයක් ගෙන තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි, මම ලිපියක් ඉදිරිපත් කළා පොල්වත්තෙ කර්මාන්තෙ වැඩකරන චමින්ද ජයලත් කියන කෙනාට විදුලිය දැමීම වෙනුවෙන් 6 ටයි 10 ටයි. යම්කිසි මුදලක් ගෙවන්න කටයුතු කරන්න කියලා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මට තවම වාර්තාව ආවේ නැහැ. මං තාක්ෂණසේවා නිලධාරි මහතාට දමා ඇති.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අර සතියේ වැඩසටහනක් ගියානෙ කොට්ඨාසවල . මගේ වැඩසටහනට දැන් මාස 09 ක් විතර ගතවුණා. සභාපතිතුමනි දැන් කාණුවල පස් පිරිලා.කැළෑ වැවිලා. ඒක හරි ක්‍රමවත්ව ගියා සභාපතිතුමනි. ඔබතුමාටත් මෙයින් ප්‍රශංසාවක් හම්බ වුණා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මගේ කොට්ඨාසෙ ක්‍රියාත්මක කරන්න බැරිවුණා. මොකද හැමදාම ඔගොල්ලන් ක්‍රියාත්මක කරලා අපට නැතිව ගියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

කොට්ඨාශයේ මන්ත්‍රීවරයා මහන්සි වෙන්න ඕන. ඉතින් කවදද මට ලබාදෙන්නේ?

**<u>ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි මං බලන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , එකක් තමයි වතුර පයිප්ප කඩනවා. හැදීම තවම කරලා නැහැ. හැදුවෙ නැති වුණොත් පාරවල් ඩැමේජ් වෙනවා. අනිවාර්යයෙන්ම තාර ටික දම්මන්න වැස්ස නැවතුණාට පස්සේ.අනික් එක තමයි මට ලිපියක් දී තිබෙනවා කේ.ඩබ්.එල් විමලසිරි මහතා .මාර්ගය ප්‍රතිසංස්කරණය කර ගැනීම හා විථි පහන් සවි කිරිම.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

පසුගිය අයවැයේදි ඔය පාර හදන්න දැම්මා , විථි ලාම්පු හදන්න දැම්මා. ඔය මනුස්සයා අපිව සැහැල්ලුවට ලක් කරනවා නිතරම. ජනතාව කුපිත කරවනවා. අයවැය රැස්වීමට ජනතාව 50කට වැඩි පිරිසක් සහභාගි වුණා. අපි දිපු ඒවාට කැමති වුණා. අපි යෝජනාව දුන්නා. ඊට පසුවත් මොහු ජනතාව කුපිත කරලා. සභාව අපහසුතාවයට පත් කරලා ලිපි එවනවා. මේ අයවැය රැස්වීමටවත් ආවේ නැතිව මේ නිකන් සභාව අපහසුතාවයට පත් කරන වැඩ කරන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඒක වෙන්න ඇති .ඒත් සභාපතිතුමනි මෙහි වැදගත්කම බලා මේය කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම් නිලානි මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ධම්මකුසල විද්‍යාලය ඉස්සරහා පාරෙ ගෙවල් 08 ක් 10 ක් විතර තියෙනවා.ඒ ගෙවල් යටවෙනවා. ඒක හදලා දෙන්න සභාපතිතුමනි.ඒ අයිතිකාරයත් එක්කත් මං කතා කළා. එතුමා කැමතියි.සභාව ඉවර වුණාම අපි යමු එතනට සවස 4.00 ට විතර. ඒ අය ඇවිල්ල ඉදීවි එතන. ලක්ෂ්මී මන්ත්‍රීත්මියයි උප සභාපතිතුමයි හැමෝම එක්ක එන්නම් කිව්වා. ඔබතුමත් එන්න එතැනට. සාකච්ඡා කරන්න.

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඉතින් කාණුව අරන් දෙන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

තව ලිපියක් මට දිලා තිබෙනවා. උපාලි ප්‍රනාන්දු කියා. එතැන කාණුවට පස් දමා සැලැස්මේ විදියට නොමැති විදියට සකස් කරන පුද්ගලයෙකු ගැන එතුමා චෝදනා කරනවා. ඒ පුද්ගලයාට නිත්‍යානුකුල විදියට කටයුතු කිරිම පිළිබඳ ලිපියක් යවනවා නගර සභාවෙන්. ඊට පසු මේ ළඟදි මෙයාට ලිපියක් යවනවා කාරුණිකව කටයුතු කරන්න කියා. එතකොට මේ නිත්‍යානුකූලව කටයුතු කරන්න කියා දන්වා යැවූ නගර සභාව කොහොමද කාරුණිකව කටයුතු කරන්න කියා ඉල්ලා සිටින්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මොකක්ද වෙලා තියෙන්නේ කියලා ලිපිගොනුව බලන්න ඕන.මෙතනදි උත්තරයක් දෙන්න බැහැ

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා  කතා කරමින්**

ගරු සභාපතිතුමා හම්බ වෙන්න එන්නද?

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී ලක්ෂ්මි හේමන්තා මෙනවිය  කතා කරමින්**

සභාපතිතුමා විශේෂ දෙයක් කියන්න තියෙනවා . මේ නගර සභාවට වැඩ අධිකාරි කෙනෙක් ඉල්ලන්න. මෙය මූලිකයි. හරි කරදර දෙයක්. දැන් අර ඊයෙම කාණුව කඩන් වැටුණා. එතැන මනුස්සයකු මිය ගියා. එතැන හරියට බැලුවා නම් පෙනෙනවනෙ අධීක්ෂණ කටයුතු කරන්න. එම නිසා වැඩ අධිකාරි කෙනෙකු ගන්න. එය  මේ නගර සභාවට අවශ්‍ය දෙයක්.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා  කතා කරමින්**

රෙස්ට් හවුස් එක පිළිබඳව රැස්වීමක් එනවනෙ ඉදිරියට.පස් වෙනිදා එක කල්ගියා. සභාපතිතුමා ඒ තානායම පිළිබඳ ප්‍රශ්නෙදි අදාලබා චාට් එකක් මෙතැන දමා තිබෙනවා. බිල්ඩින් එකේ ප්ලෑන් එකක්වත් නැහැ .බාචාට් එක විතරයි දීල තියෙන්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔබතුමා බාචාට් එකක්නෙ ඉල්ලුවේ?

**ගරු නගර සභා මන්ත්‍රී  ලලිත් ධම්මික කොඩිකාර  මහතා  කතා කරමින්**

නෑ නෑ බාචාට් එකත් එක්ක ප්ලෑන් එකත් දෙන්න ඕන.කාමර 10ක එකක්ද , කාමර 2ක එකක් ද කියා. මොකක් හරි බාචාට් එකක් දුන්නාම දැන ගන්න පුළුවන්. අපට දැනගන්න ඕන තැන මොකක්ද කියලා. එහි සැලැස්මත් එක්ක ඉදිරපත් කරන්න.එමනිසා අපට එහි ජායා පිටපත හරි දෙන්න ඕන.

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒව අත්සන් කරලා යවන්න තමයි ඒ අය වෙලාව ඉල්ලන්නේ. පසුගිය සභාවෙ ඔයගොල්ලො ඉල්ලුවෙ ඒ කරන වැඩේ සම්බන්ධයෙන් බාචාට් එකක් දෙන්න කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී   ලලිත් ධම්මික කොඩිකාර  මහතා  කතා කරමින්**

බිල්ඩින් එකක ප්‍රමාණය දන්නෙ නැතුව කොහොමද තීරණය කරන්නේ?

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒක අත්සන් කරනකොට අපට එනවා. අපට ඇවිල්ල තමයි යූ.ඩී. එකට දාන්නෙ. ඒක ආවම සභාවට දානනම්.

**ගරු නගර සභා මන්ත්‍රී   ලලිත් ධම්මික කොඩිකාර  මහතා  කතා කරමින්**

මේ බාචාට් එක රීඩ් කරන්න අපිට ඒරියා එක ඕනනෙ. ඒ අනුවනෙ වෙලාව යන්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔහොම කරන්න ගියොත් මේ වැඩේ කෙරෙන්නේ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

බලන්න පුළුවන් කාටද ? කොහොමද ඒවා බලන්නේ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපිට මේවා නොකෙරෙන ගාණට නෙමේ කතා කරන්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අනෙක මම කතාකරාට පස්සෙ ඒක ගැන දෙවෙනි පාර කතාකරන එක සම්පූර්ණ වැරදියි. නීති විරෝධියි. නීතිඥ මහත්වරු කතාකරලා තියෙනවා. ඒක කතාකරලා තීන්දුවක් අරගෙන තමයි අපි ගියේ. නැවත නැවත කතාකරලා ඕන ඕන තීන්දු ගන්න එපා. තියෙනව නීතිඥ මහත්වරු.මෙහෙමයි මාස 30 ක් ගියත් රුම් 50 ක බිල්ඩින් එකක්. හෝටලයකට අවශ්‍ය කරන සියලු දේ මෙහි තියෙනවා.

**ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි , අපිට ඕන මේක නොකෙරෙන විදියට නෙමෙයි.ඒක තමයි අපට දැනගන්න වුණේ.මාස 30 කට තමයි සැලසුම් කර තිබෙන්නේ. මේක කවුරුවත් දන්නෙ නැහැ. හදන්නෙ කාමරයක්ද දෙකක්ද විස්සක්ද පනහක්ද කියල කවුරුවත් දන්නෙ නැහැ.ඒකනෙ අපට දැනගන්න ඕන.

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි ගිවිසුම්ගතවෙලා තියෙන්නේ කාමර 50 කට. අනිවාර්යයෙන්ම 50 ක් හදන්න ඕන.දන්නෙ නැහැ කියන්න බැහැනෙ. ඔය ගිවිසුම හදන විට මේ සභාවෙන් අනුමත කරලා ගිවිසුමේ සියළුම පිටපත් සභාවේ හැම මන්ත්‍රීවරයෙකුටම දුන්නා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගිවිසුම හැදුවට මෙහෙමනෙ පටන් ගන්න කාලයක් නැහැ ඉවර වෙන කාලයක් නැහැ.

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හරි හරි අඩුපාඩු ඇති. දැන් මේ බාචාට් එකක් දිලා තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

සියලු දෙනාගෙ මතේ හදන්න ඕන කියන එක. කියන කතාවෙ සත්‍යයක් තියෙනවා.ඔබතුමා ඒක බලල අනුගත වෙලා කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. නිලානි මෙනවිය කතා කරමින්**

සභාපතිතුමනි, මේකයි මේ කියන්නෙ කාමර පනහේ කතාව හරි.කාමර 50 ක් කිව්වට අපි දන්නෙ නැහැ තුනයි දෙකේ කාමරයක්ද දහයයි දහයෙ කාමරයක්ද ? අටයි දෙකේ කාමරයක්ද? කුස්සියක්ද, ?මොකක්ද කියලා නැහැ කියන එකයි කියන්නේ. එය ඇඳ පෙන්නුම් කරන්න කියන්නේ. එතකොට ප්‍රශ්නය ඉවරයිනේ.

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

බාවාට් එක ඉදිරිපත් කරල තියෙනවා ඒ අයගෙ සැලසුම් ඉදිරිපත් කරාම මා සභාවට ඉදිරිපත් කරන්නම්. එතකොට අපි අත්සන් කරලා ඉදිරිපත් කරන්නම්. නැත්නම් මේක කෙරෙන්නේ නැහැ. ඒක තේරුම් ගන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

මං පොඩි ඉල්ලීමක් කරන්නම් . ඒක A-4 ෂීට් එකකට දාල දෙනවනම් හොදයි. මොකද මෙතන හිටගෙන බලන්න දවස් දෙකක් විතර යනවා. සොෆ්ට් කොපි එක හරි. අපිට ගෙදර ගිහින් හරි බලන්න පුලවන්නෙ.

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මං හිතන්නේ ඕක බලන්න දැනුම තියෙනනේ මන්ත්‍රීවරුන් දෙන්නටයි. එක්කෙනෙක් ඔබතුමා.මං හිතන්නේ වෙන කිසි කෙනෙකුට ඕක තේරෙන්නේ නම් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපේ සභාවෙ වැඩ ආවරණය කරන මහජන සෞඛ්‍ය නිලධාරි මහතා සභාවේ වැඩ ආවරණය කරන්නේ මහජන සෞඛ්‍ය කාර්යාලයේ. එතකොට කිසිම බැදීමක් මේසභාවට නැහැ. එතකොට එතුමා කිසිඳු ගෙවීමක් කරන්නේ නැහැ.එතුමා මේ මන්ත්‍රීවරුන්ගෙන් බැනුම් අහන එක විතරයි එතුමා පැමිණ කරන්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එතුමා සභාවේ වැඩකටයුතුවලට සහභාගී වෙන්නේ නැති නිසා අපි වෙනත් මහජන සෞඛ්‍ය නිලධාරි කෙනෙකු ඉල්ලා යැව්වා. එයාට ගෙවන්නේ නැහැ. එයා සැලසුම් කමිටුවට විතරයි එන්නේ ඒකෙන් සල්ලි කීයක්හරි හම්බවෙන නිසා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ඒක තමයි සභාපතිතුමා ස්වේච්ජාවෙන් එන අයට සභාවෙන් කීයක් හරි මුදලක් ගෙවන්න තීරණය කරන්න.

**ගරු සභාපති ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සභාවේ වැඩකටයුතු අවසන් කරනවා.

පස්වරු 4.05 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

රණසි උත්පල ගුණවර්ධන මිය

ලේකම්

අම්බලන්ගොඩ - නගර සභාව

අරුණ ප්‍රදිප් මණිමෙල්වඩු

සභාපති

අම්බලන්ගොඩ - නගර සභාව

2020.01.03

වන දින

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය